I NEED YOU LIKE A HEART NEEDS A BEAT...

# සීගිරි 3

2019 SPRING COLLECTION



## සුජීව ප්‍රසන්න ආරච්චි

# SUJEEWA PRASANNA ARACHCHI

# සීගිරි 3

## සුජීව ප්‍රසන්න ආරච්චි

# 01

සීගිරි මහගෙදර මහ රෑ ගිනිගත්තේය. සුරංගිත් රුවන්තිත් මැද සාලයට ආවේ බෝම්බ අතේ තියාගෙනය. මේ සාකච්ඡාවට හිතාමතාම කෝසළුත් මිහිරංගත් ආවේ නැත.

"මේ ඉගෙන ගත්ත කොල්ලෝ දෙන්නෙත් ඉන්නවා. සුදු පුතාට ලක්ෂ දෙකක සැලරි එකකුයි වාහනේකුයි එක්ක හොඳම ජොබ් එකක් ඔෆර් කළා. ඒත් කොල්ලා ගියේ

නෑ. ඇයි ඒ. මේ සීගිරි එක නිසා. සීයගේ මූණ බලාගෙන ඒක කියන්නේ කොහොමද කියලා ඇහුවේ. එච්චර වටින කොල්ලෝ ඉන්නකොට තාත්තා මොනවද කළේ?"

සුරංගි කෑගැසුවේ සීගිරි එක මේ දැන් ගිනිගන්නවා වාගේය. මිහිරංග අම්මාව ලස්සනට රත්කර එව්වේය. අම්මාගේ හැටි දන්නේ පුතාය. ඒ ගින්දරට මලීෂාත් පිඳුරු මිටි පිටින් දැම්මාය. දැන් මේ ඇවිත් ඉන්නේ එහෙම ආවේස කර එවූ සුරංගිය.

රඹුක්වැල්ල මහතා සන්සුන්ව අසාගෙන උන්නේය. ඔහුට බැලුනේ මිලින්ද දෙසය.

"ඔච්චර කෑගහන්න තරම් දෙයක් සීගිරි එකේ වෙලා නෑ නැන්දේ. බිස්නස් එකක් කරනකොට

ප්‍රශ්න එනවා. ඒවා විසඳගන්නවා. එච්චරයි."

නේත්‍රා සන්සුන්ව කීවාය. රඹුක්වැල්ල මහතා ඇය දෙස බලා හිස වැනුවේය.

"සීගිරි එක ලස්සනට පල්ලම් බැහැගෙන ගියේ. ඩේලි කලෙක්ෂන් තිස්දාහට බැස්සා. පඩි ටික ගෙවාග න්න බැරිතරම් අපි වැටුණා. සප්ලයර්ස්ලා ගොඩක් කැඩුණා. පේමන්ට්ස් නොදී. එහෙම තත්වයක් තිබ්බ සීගිරි එක ගොඩගන්නවානම් හැමෝටම අවස්ථාවක් තිබුණා."

භාවනා අත් බැඳගෙන කීවාය. ඇය උන්නේ සෝපාවේ වාඩිවී නේත්‍රා උන් රෝද පුටුවද අල්ලාගෙ නය. තාරුකාද ත්‍රී ක්වාටර් එකක් ඇඳගෙන සාලයට ආවාය. ඇය

ඇවිත් ඉඳගත්තේ භාවනා ඉඳගෙන උන් සෝපාවේ වම් ඇන්ඩ්‍රේය. කෙල්ල ටිකකට පෙර හැමදේම තාරුකාට කීවාය. 'කොල්ලා පව්' ඇයද කීවාය.

"ඉතින්. එහෙම සීගිරි එක වැටුණානම් ගොඩගන්න තිබුනේ මෙහෙමද? තමන්ගේ අයට බලතල දීලනේ. නැතුව මේ කොහේවත් යන රස්තියාදුකාර හොරුන්ට පෝස්ට් දීලද? මොන ලෝකෙද මෙහෙම වෙන්නේ පිස්සුද ඇත්තටම."

රුවන්තිද කෑගැසුවාය. භාවනාගේ පපුව දාගෙන ගියේය. නැන්දා රස්තියාදුකාරයා කිව්වේ දේවකටය. ඔහුට එහෙම ගරහද්දී කෙල්ලට ඉවසාගෙන ඉන්නට බැරි විය.

"සීගිරි එක හදන මාස්ටර් ප්ලෑනක් අරන් දේවක ආවේ. එහෙම නැතුව මේ රස්තියාදුවේ යන ගමන් නෙමෙයි. ඒ වැදගත් කොල්ලෙක්. අපිටත් පාරක් පෙන්නුවේ එයා."

භාවනා කීවාය.

"ඔයාටත් දැන් ලොකු මේ කොහෙවත් යන හොරාව."

භාවනා නැඟිට්ටාය. හැමෝගේම ඇස් තිබුනේ ඇය වෙතය.

"නැන්දේ. වැදගත් විදිහට කතාකරන්න. කෙනෙක්ව නීතියෙන් වැරදිකාරයෙක් වෙනකල් එයා නිර්දෝෂයි. ස්ටෝර්ස්වල කීස් තිබුනේ මම ගාව. පර්ෆියුම් ස්ටොක් එක පන්නනවානම් පන්නන්න ඕන මම."

භාවනා වෙව්ලමින් කීවාය.

"දේවක වැඩකළේ මායි අක්කයි යටතේ. එයා දෙයක් කළානම් වගකියන්න ඕන අපි දෙන්නා. අක්කා ගන්න තීරණේ මම දන්නේ නෑ. ඒත් දේවක එහෙම දෙයක් කරලා කියලා ඔප්පු වුනොත්. මම ආයේ වැස්සකටවත් සීගිරි එකට ගොඩවෙන්නේ නෑ. නෙවර්. එතකල් කරුණාරලා මගේ ස්ටාෆ් එකට ගරහන්න එපා ප්ලීස්. මම මේ බොහොම කරුණාවෙන් කියන්නේ."

භාවනාගේ දෑසින් කඳුළු වැටුණි. නේත්‍රා දෑස් බරකරගත්තාය. කෙල්ල හරිය. ඒත් මෙතන මේ දේවල් කියන්නේ ඇයි.?

මිලින්ද සිනාසුනේය. ඔහු මේ සියල්ලම අසාගෙනය.

"සුද්දි හරි. එහෙම දෙයක්

වෙලානම්. මගේ කෙල්ල වුනත් සීගිරි එකට යන්නෝන නෑ. මම යන්න දෙන්නෙත් නෑ"

මිලින්ද කීවේය. භාවනාට තාත්තා ගැන පුදුම ආදරයක් ඇතිවිය. ඉඳුනිල්ද පැත්තක සිට සිනාසුනාය.

"මෙතන සුද්දිගේ වැඩක් නෑනේ."

රුවන්ති කීවාය.

"මමයි සීගිරි එක හෙට ඉඳලා හදන්නේ. ඒක කරන්නේ මම. කාටහරි ප්‍රශ්නයක් තිවෙනවානම් කියන්න. මම ඒක අතට ගන්නවා."

භාවනා කීවාය.

කිසිවෙක් කිසිවක් කීවේ නැත.

"එහෙම කරනවානම් හොඳයි ඉතින්."

රුවන්ති කීවාය. සුරංගි අත් බැඳගෙන උන්නාය.

"හිතන තරම් ඉක්මනට සීගිරි එක බෙදන්නේ නෑ කියලා විතරක් හැමෝම මතක තියාගන්න. මේක අපේ කාගේවත් නෙමේ. අපි කියන්නේ අපි හැමෝගෙම. ඒනිසා බෙදීමක් නෑ. කවදාවත් නෑ. කියන්න සීයා."

භාවනා වෙව්ලමින් කීවාය.

"ඔව්. කවදාවත් බෙදීමක් නෑ. කරනවානම් හැමෝම එකට."

රඹුක්වැල්ල මහතා කීවේය.

"අපි මෙතන බෙදීමක් ගැන කතාකරන්න ආවේ නෑනේ."

සුරංගි කීවාය.

"සීගිරි එක හදලා තියෙන්නේ සීයයි තාත්තයි පොඩි නැන්දයි. එයාලගේ දාඩිය මහන්සියට අද අපි වගකියන්න ඕන. මැරිලා හරි

කරනවා. ඒත් මේක කාටවත් කන්න දෙන්නේ නෑ. එළියෙන් ආවත් ඇතුළෙන් ආවත්"

භාවනා කීවාය. සුරංගිත් රුවන්තිත් මුහුණට මුහුණ බලාගත්තෝය.

ඒත් මොහොතේ රඹුක්වැල්ල මහතාගේ ජංගම දුරකථනයට ඇමතුමක් ආවේය. ඇමතුම ආවේ පොලීසියේ ස්ථානාධිපතිගෙනි.

"මිස්ටර් රඹුක්වැල්ල මම ඕ අයි සී දසනායක."

ඔහු කීවේය. රඹුක්වැල්ල මහතාට මොකක්ද දැනුණි.

"ආ කියන්න මිස්ටර් දසනායක. මට දවල් කතාකළේ."

"ඔව්. අපිට සීගිරි එකේ කේස් එක ගැන ඔත්තුවක් ආවා. ඔය පන්නලා

තියෙන පර්ෆියුම් ස්ටොක් එක තැනක තියෙනවා කියලා."

රඹුක්වැල්ල මහතා පිරිස දෙසම බැලුවේය.

"ඔව් මිස්ටර් දසනායක."

රඹුක්වැල්ල මහතා කතාකළේ තරමක තිගැස්මකිනි.

"ඒකට සමාන ස්ටොක් එකක් ෆැන්සි ෂොප් එකක තිබිලා හම්බවෙලා තියෙනවා. අපිට ඔත්තුවක් ලැබුණා."

"ඒත් මිස්ටර් දසනායක මේක කොමන් බ්‍රෑන්ඩ් එකක්නේ."

"ට්‍රූ මිස්ටර් රඹුක්වැල්ල. ඒත් මේක එතනට අන්ඩර් මාකට් විකුණාපු ස්ටොක් එකක්. සෑහෙන අඩුවට."

"ආ"

"අපි ෂොප් එකේ මිනිහගෙන්

දැන් කට උත්තරයක් ගන්න ඇරියා. අපි බලමු ආවාම. මම ඒක කියන්න කතාකළේ.”

“හොඳයි මිස්ටර් දසනායක. මට කියන්න. අනේ තැන්කියු.”

“ඒක මොකක්ද? මම උදේට කතාකරන්නම්.”

දුරකථනය තබා රඹුක්වැල්ල මහතා මිලින්ද දෙස බැලුවේය.

“ඒ පර්ෆියුම් ස්ටොක් එක ෂොප් එකකට විකුණලා. දැන් ඒ ෂොප් කාරයාගෙන් කට උත්තර ගන්න යන්නේ. උදේ ඕ අයි සී කතාකරයි.”

රඹුක්වැල්ල මහතා කීවේය. රුවන්තිත් සුරංගිත් මුහුණට මුහුණ බලාගත්තේ සමච්චල් සිනාහවක් සහිතවය.

“ඔය එළිවෙන්නේ වැදගත්

මහත්තයලගේ වැඩ ගැන. බලමුකෝ. සීගිරි එක හදන්න ආව මහලොකු ප්‍රමෝෂන් මැනේජර්."

සුරංගි කීවේ භාවනා දෙසද බලාගෙනය. භාවනාගේ හිතට මොකක්ද දැනුණි.

"සීයා"

ඇය කතාකළාය.

"පුතේ."

"මෙච්චර ඉක්මනට සීයා හොරු අල්ලනවද මේ රටේ. ඇරත් මේ එකපාරම ෂොප් එකකින් ඔය පර්ෆියුම් ස්ටොක් එකම හම්බවුනේ. මේ දවසක්වත් ගියේ නෑනේ. මාර ඉන්විස්ටිගේෂන් ලයින් එකක්නේ. නේද? මෙතන මේ ජුවලරි ෂොප් එක මහ දවල් කැඩුවනේ. බයික් දෙකකින් ඇවිත්. තාම හොයාගන්න බැරිවුණා

සීසීටීවී කැමරා තිබ්ලත් මේක. කවුද දන්නේ නෑ මේක කරපු සී අයි ඩී ඉන්ස්පෙක්ටර්."

භාවනා කීවාය. මිලින්දටද එය පුදුම දෙයක් විය.

"මටත් හිතාගන්න බෑ."

"දැන් මෙතන වැරදි පොලීසියද? හොරු අල්ලයි. ඊට පස්සේ හොරු අල්ලගෙනම යයි. බලන්නකෝ. එහෙම අල්ලගෙන යනකොට ඔයා ගිහින් පොලීසියෙන් අහන්න කොහොමද ඇල්ලුවේ කියලා. කියයි ලස්සනට."

සුරංගි කීවාය. භාවනා සිනාසුනාය.

"ම්. ඒක අහන්නම ඕන නැන්දේ."

ඇය කීවාය.

# 02

"ඇයි පුංචි මහත්තයෝ."

කොල්ලාව දුටුවනම ජීවන් ඇසුවේය. අප්පච්චි තමාගේ මුහුණ දුටුවනම එහෙම කිව්වේ කොහොමද කියා දේවක සිතුවේය. ඒත් මේ තමාගේ අප්පච්චීය. ලේ වලට දැනෙන දෙයක් ඇත.

දේවක අසරණව සිනාසුනේය.

"අද රෑ ඉන්නවා කියලනේ කිව්වේ පුංචි මහත්තයෝ."

ජීවන් ඇසුවේය. කොල්ලාට මොකක් නමුත් වී ඇත.

"මට අප්පච්චි මේ පොඩි ප්‍රශ්නයක් ඇවිත්නේ. ඉතින් මේ"

කවදාවත් කොල්ලා මේ තරම් අසරණව කතාකර නැත. කොල්ලාගේ මුහුණ ගන්න දෙයක් නැත. වෙහෙසත් අසරණකමත් කළකිරීමත් එක්වූ මහා දුක්බර පාටක් හදිස්සියේම කොල්ලාගේ මුහුණට ආවේ කෙසේද?

"කියන්න පුංචි මහත්තයෝ."

දේවක එහෙමම කටු සිමෙන්ති දැමූ දොරකඩ පඩියේ වාඩිවුනේය. ජීවන්ගේ පපුවට මොකක්ද විය. කවදාවත් එහෙම බියක් ඔහුට දැනී නැත.

දේවක සීගිරි එකේ සිදුවූ

සියල්ලම අප්පච්චිට කීවේය. ඒ ටික කියද්දී කොල්ලාගේ ඇස්වල තුනී තෙතමනයක් විය. ජීවන් දේවකගේ හිස අතගාමින් මොහොතක් නිහඬව උන්නේය.

"පුංචි මහත්තයෝ."

"අප්පච්චි."

"බුදු හාමුදුරුවෝ කියලා තියෙනවා කාරණා තුනක් හංගන්න බෑ කියලා. ඉරයි හඳයි ඇත්තයි. කවදාහරි මේ ටික එළිවෙනවා. බයවෙන්න එපා."

"මම කවදාවත් එහෙම කරන්නේ නෑ අප්පච්චි."

ජීවන් සිනාසුනේය.

"එහෙම කියන්න එපා. පොඩි සරම් කොටේ ඇඳගෙන දහම් පාසල් ගිය ඔයාට කවදාවත් එහෙම කරන්න

බෑ. කරන්නෙත් නෑ. ඒත් මේ ලෝකය මෙහෙමයි"

ජීවන් කළකිරීමෙන් කීවේය.

"මාව විශ්වාස කරන්නේ භාවනායි නේත්‍රා අක්කයි විතරයි. සීයටත් මාව විශ්වාස ඇති. ඒත්."

ජීවන් දිග සුසුමක් පිටකළේය.

"ඔයාව මම සීගිරි එකට යැව්වේ අපරාදේ. අම්මා නිසා එහෙම කළේ. මේකෙන් නිදහස් වෙන්නකෝ ඔයා. මම ඔයාව හොඳ තැනකට දාන්නම්. ඔයා දුක් වින්ඳට මට කමක් නෑ. ඒත් මගේ දරුවා අපිරිසිදු වෙනවට මම ආස නෑ."

ජීවන් කීවේය. දේවක ඔහු දෙස බලාගෙනම උන්නේය.

"අළුපච්චි."

"පුංචි මහත්තයෝ."

"සමහරවිට මට පොලීසියට යන්න වෙන්න වෙයි. එහෙම වුනොත් අප්පච්චට එන්න බෑනේ. කවුද ඉන්නේ."

ජීවන් කොල්ලාගේ හිස අතගෑවේය.

"අපි ඒක ඒ වෙලාවට බලමු පුතේ."

ජීවන් කීවේය.

*** *** *** *** ***

භාවනා දේවකට කතාකළේ මහ රෑ එකොළහටය. මේ තරම්ම ප්‍රමාද වූයේ අක්කලා නංගිලා උඩ කාමරයේ කියවමින් උන් නිසාය. පොඩි අක්කාගේ හිතේ ඇති සතුට නැතිකරන්නට භාවනාට සිතුනේ

නැත. ඇය හදවතේ තිබූ දැවැන්ත දුකක් තදකරගෙන උන්නාය.

"දැන් මොනවත් කතාකරන්න එපා අක්කා."

නේත්‍රා දේවක ගැන කතාකරන්නට යද්දී භාවනා කීවාය. කෙල්ල මෙහෙම කියන්නේ දුක නිසා බව ඇය දැනගෙන උන්නාය.

"ඉතින් සුදූ. කියන්නකෝ විස්තර"

භාවනා හැම දුකක්ම අමතක කර තාරුකාගෙන් ඇසුවාය. කෙල්ල මෙහෙම හැසිරෙන්නේ තමාගේ සතුට නැතිකරන්නට බැරි නිසා බව තාරුකා දැනගෙන උන්නාය. ඒ අතින් කෙල්ල පව් යැයි ඇයට සිතුණි.

"ඒ අතින් ඔයා නිදහස්. නේද අක්කා."

භාවනා කීවාය. නේත්‍රාගේ දෑස්

කඳුළින් පිරුණි.

"අනේ. ඇයි මේ."

"දවසක මමත් සීගිරි එකෙන් අයින් වෙනවා. දාලම යනවා. මට බෑ"

භාවනා කීවාය. තාරුකාත් නේත්‍රාත් කෙල්ලගේ හිත හදන්නට හැදුවෝය. එහෙත් ඒ හිත මෙහෙම හැදෙන්නේ නැති බව දෙන්නාම දැනගෙන උන්නෝය.

අනම් මනම් කියවමින් උන් භාවනා ඇගේ කාමරයට ආවේ දැන් ටිකකට කළිනි. අද හිතම තෝන්තුවෙන් මෙන්ය. ඇය ඇඟ ටිකක් සෝදාගෙන රෑ ඇඳුමද දමාගෙන පැමිණ ඇඳ මත ඉඳගත්තාය.

"මොකක්හරි ඔයා වටේ වෙනවා."

භාවනාට එය දැන් විශ්වාසය. ඒ සැකය තහවුරු වූයේ අද සුවඳ විලවුන් තොගය ෆැන්සි කඩයකින් ඇල්ලූ බව පොලීසියෙන් කියූ පසුය. හොරුන්ව එහෙම ලේසියෙන් අල්ලන්න අමාරුය. අනික හොරු එහෙම ලේසියෙන් බඩු අහුවෙන්නට දෙන්නේද නැත. හොරු හොරකම් කරන්නේ පුරුදු වෙන්නට නොවේ.

භාවනා දේවකට ගත්තාය.

“මොනවද කරන්නේ”

“මම මේ සී ආර් පොතක් අරගෙන සීගිරි එකේ කන්ස්ට්‍රක්ෂන් වැඩ ටිකයි අලුත් සැළසුම් ටිකයි වෙන වෙනම ලියනවා. සුද්දිට මේක කරගෙන යන්න පුළුවන්.”

එහෙම කියද්දීත් කෙල්ලගේ පපුවට මොකක්ද විය.

"හෙට සීගිරි එකෙන් අස්වෙනවා වගේනේ කතාකරන්නේ."

දේවක සිනාසුනේය.

"හෙට මොනවා වෙයිද කියලා කියන්න බෑ සුද්දි. මට මොකක්ද දැනෙනවා."

"මටත්. දැන් වෙච්ච දේවල් කියන්නම්. ම්"

සීගිරි පවුල මැද වූ කතාබහත් පොලීසියෙන් ලද ඇමතුමත් ගැන භාවනා කීවාය.

"එහෙනම් හරි ඉක්මනට මාව ඇතුළට යවයි සුද්දි. ඒක ෂුවර්. ජෙනරාල් සරත් ෆොන්සේකාගේ පරීක්ෂණේවත් මෙච්චර ඉක්මනට කළේ නෑ මං හිතන්නේ"

දේවක කීවේය.

"එහෙම හිතෙනවද දේවකයියට."

"ඔව් සුද්දි."

"ඒකම මටත් හිතෙනවා. අපි බලමු."

සමහරවිට බලන්නටවත් ඉඩක් නොදෙනු ඇත.

"මම හැමදේම අප්පච්චිට කිව්වා. අප්පච්චිට හරි දුකයි. මේ චෝදනාවෙන් නිදහස් වුණාට පස්සේ."

"පස්සේ. ඇයි මොකක්ද?"

භාවනා උගුරෙන් මෙන් ඇසුවාය.

"කියන්න දේවකයියේ."

"නෑ සුද්දි. මම."

"මට පොරොන්දු වුණා."

"ම්. කාටවත් එහෙම වෙලා නෑ."

ඔහු කීවේය. භාවනා දෙනෙත් පිසදාගත්තාය.

"හෙට උදේම ටිකක් එන්න. අපි මේක හොයන්න ඕන."

"මී. කෑවද?"

දේවකගේ ළයේ පැත්තක් කකියාගෙන එන්නට විය. සීගිරි එක දමා කොහේවත් යන්නේ නැතැයි ඔහු සිතාගත්තේය.

"බත් ටිකක් කෑවා."

"මං උදේ ඉඳි ආප්ප ගේනවා. පොඩි අක්කට ආසයි කියලා ගෙදරම හෙට හදනවා."

"මේ මගේ ප්‍රශ්නයක් නිසා පොඩි අක්කා එක්කවත් කයියක් දාගෙන ඉන්න බැරිවෙන්න ඇති."

දේවක කීවේය.

"එයාටත් දුකයි. ගොඩක් රෑ වෙනකල් ඕවා ලියන්න එපා"

"නෑ සුද්දි මේක ලියන්නම

ඕනමේ මගේ ඩ්‍රීම් එක. ඒක එහෙම බොඳවෙන්න දෙන්න බෑ."

දේවක කීවේය. ඔහු පුදුමාකාර කෙනෙක්යැයි ඇයට සිතුණි. මේ තරම් දුෂ්කර මොහොතක එසේ සිතන්නේ කෙසේද?

"මොනවා වුනත් යන්න එහෙම හිතන්න එපා හොඳේ."

ඇය කරුණාබරව කීවාය. දේවක සිනාසුනේය.

"කවදාවත් නෑ"

"ම්. බුදු සරණයි"

භාවනා දුරකථනය තබා මොහොතකට දෑස් පියාගත්තාය. පසුව ඇය හදිස්සියේම ඕවර් කෝට් එකද දමාගෙන සීයාගේ කාමරයට ගියාය. ඔහු පුරුදු ලෙසින්ම කාමරයෙන් පිටත බැල්කනියට වී

උන්නේය. සීයා සමහර දිනවලට එතනට වී බ්‍රැන්ඩි ටිකක් බොන බව භාවනා අත්දැකීමෙන් දනී.

"පුතේ."

භාවනා රඹුක්වැල්ල මහතා අසරළම වූ පුටුවට බරවූවාය.

"සීයා දුකෙන්."

ඔහු සිනාසුනේය.

"දුකක් නෑ කියලා කියන්න බෑ මැණික. බිස්නස් හැදුවේ අපරදේ කියලා හිතෙනවා දැන්."

භාවනා ඔහුගේ සුරත පිරිමැද්දේය.

"එහෙම හිතන්න එපා. සීගිරි එක අපේ. ඒක අපේ ගරුත්වය අභිමානය. ඒක නැතිවෙන්න දෙන්න බෑ."

ඇය කීවාය.

"මෙතන සීයා."

"ම්."

"මොකක්හරි තියෙනවා කියලා හිතෙන්නේ නැද්ද?"

රඹුක්වැල්ල මහතා සිනාසුනේය.

"කොල්ලට විරුද්ධව."

භාවනා හිස වැනුවාය.

"ම්."

"දේවක එහෙම කොල්ලෙක් නෙමෙයි"

"කී එක තිබුනේ මම ගාව සීයා. දේවක ඔය පර්ෆියුම් බොට්ල් ටික පැන්නුවාමයි කියලා හිතන්නකෝ. ඒක දෙන්නෝන මාකට් ප්‍රයිස් එකට වඩා අඩුවෙන්නේ. හොර බඩු ගන්නේ එහෙමනේ. නේද සීයා."

"ඔව්."

"මම නිකමට ගණන් බැලුවා. දෙනවානම් දෙන්න පුළුවන් උපරිමෙ ලක්ෂ දෙකහමාරයි. ගන්න කෙනා සීයා මේක ලොකු රිස්ක් එකක් අරන් විකුණන්නත් ඕන. පර්ෆියුම් බොට්ල් එච්චර ස්ටොක් එකක් එක්කෙනෙක් ගනියිද? මේ සාමාන්‍ය ෆැන්සි ෂොප් කාරයෙක්. මිනිහා අවුරුදු පහක් වික්කත් විකුණලා ඉවරකරන්න බෑ."

කෙල්ලගේ දැණුම පුදුමාකාර යැයි රඹුක්වැල්ල මහතාට සිතුණි.

"චීත් දේවක කන්ට්‍රැක්ටර්ස්ලගෙ න් ලැබිච්ච කොමිෂන් එක ලක්ෂ හතරකට ළංවෙන්න අපට දුන්නා."

ඔහු හිස වැනුවේය.

"අනික මේක මෙච්චර ඉක්මනට අහුවෙච්ච එක. නිකං පොල්ලෙන් ගැහුවා වගේ. හොර බඩු කොහොමද

සීයා එහෙම අල්ලන්නේ. මේක කොමන් බ්‍රෑන්ඩ් එකක්. ෂොප් එකක වික්කා කියලා අල්ලන්න බෑ."

"මාත් ඇහුවේ."

"අපි බලමු සීයා දෙයක් වෙනවා. ඒක වෙන්නේ මේ කොල්ලට විරුද්ධව විතරක් නෙමෙයි. මේ සීගිරි එකේ අලුත් නැඟීසිටීමටත් විරුද්ධවයි"

ඇය කීවාය.

"මම මේක අතට ගන්නම්. මාව සීයා විශ්වාස කරන්න. අපි මේක ගොඩනඟමු."

භාවනා ඔහුගේ අත තදකර කීවාය.

"මගේ හිතට දැන් සහනයක් ආවා පුතේ."

භාවනා සිනාසුනාය.

"සිගිරි එක අපි හදනවා. ඒවගේම

මේ කොල්ලවත් රැකගන්නවා."

ඇය අවසානයට කීවේ එයයි.

එහෙත් මේ කතාකරන වෙලාවේදීම දේවකව අත්අඩංගුවට ගන්නට සියළු කටයුතු සූදානම් වෙමින් පැවතුණි. ඒ බව කිසිවෙක් දැනගෙන උන්නේ නැත.

"හෙට ගත්තොත් හෙටම උසාවියට දානවා. සමහරවිට ඇප ඉල්ලයි. ඇප නොදී ඉන්නම අපි බලනවා."

මිහිරංගගේ මිතුරු පොලිස් ඉන්ස්පෙක්ටර්වරයා කීවේ තවත් රෙඩ් ලේබල් විස්කි ටිකක් උගුරට හලාගනිමින්ය.

# 03

භාවනාට ඇහැරුණේ පාන්දර හතරටත් පෙරය. කොහොමත් පෙරදා රැයේ ඇයට සුව නින්දක් ගියේ නැත. පාන්දර එකට පමණත් ඇය මොකක්දෝ බියජනක සිහිනයක් දැක අවදිවිය.

වැස්ස වහින්නට ගත්තේ පාන්දර තුනට පමණ බව භාවනාට මතකය. මේ වැටෙන්නේ එසේ මෙසේ වැස්සක් නොවේ. හරහට වහින

ධාරානිපාත වැස්සකි. කාමරයේ වීදුරුවට මොරගෙඩි ගසන්නාක් මෙන් ශබ්දයක් ඇසෙන්නේ එවැනි ධාරානිපාත වැස්සක් වැටෙන විටය.

ඇයගේ හිතට මොකක්ද දැනෙන්නට විය. මතක ඇති දවසක මෙහෙම මළ පාළු හැඟීමක් සිතට ඇවිත් නැත. එහෙම හිතෙන්නේ මේ වැස්ස නිසාද නොවේනම් හදවතේ ඇති කුමක් හෝ අනියත බියක් නිසාද කියා ඇයට තේරෙන්නේ නැත.

භාවනා ඇඳටම වී පොරවනය පපුව දක්වාම ගෙන වැස්සේ හඬ අසාගෙන උන්නාය. වෙන දෙයක් වෙච්චදෙන් කියා හිත හදාගෙන ඉන්නට බැරි ගතියක් ඇයට දැනෙන්නට විය. ඇය එහෙමම

පාන්දර පහ පසුවෙන තුරු උන්නාය. භාවනා දේවකට ඇමතුමක් ගත්තේ පාන්දර පහයි පහටය.

පුදුමයකට මෙන් දුරකථනය එක්වරක් නාදවෙද්දීම ඔහු ගත්තේය. 'ඒ කියන්නේ ඔයත් නිදි නෑ' ඇය සිතුවාය.

"නිදාගත්තේ නැද්ද?"

ඇය ඇසුවාය.

"අර ටික ලියලා ඉවරවුනේ මේ දැන් ටිකකට කලින් සුද්දි. ලේසි නෑනේ."

"ඇයි එහෙම කළේ. මට අහගන්න ළඟ ඉන්නවනේ. ඇරත්."

භාවනා ගොත ගැසුවාය. තමාට දැනෙන බියම ඔහුටත් දැනෙනවාද?

"සමහරවිට එහෙම නොවෙන්නත් පුළුවන්. කෝකටත් හොඳයි සුද්දි."

භාවනා සුසුමක් හෙළුවාය.

"මටත් කඩින් කඩ නින්ද ගියේ. හතරේ ඉඳලා ඇහැරලා. දන්නවානම් මම ගන්නවා."

"දැන් ටිකක් නිදාගන්න. තාම පාන්දරනේ."

ඔහු කරුණාවෙන් කීවේය.

"ම්හ්. එහෙම නින්ද යන්නේ නෑ. මම උදෙන්ම එන්නම්."

"මේ ටික මට විස්තර කරලා කියාගන්න ලැබුනොත් ඇති."

ඔහු කීවේය. අද ඒ තරම්ම භයානක දවසක්ද?

"දේවකයියේ."

"ම්."

"ඇයි"

ඇය කෙළ පොදක් ගිලිමින්ම

ඇසුවාය. දේවක අසරණ හඬකින් සිනාසුණේය.

"තේරෙන්නේ නෑ සුද්දි. ඒත්."

"මොනවාහරි දැනෙනවද?"

"ම්. ඒත් මම බය නෑ"

"බයවෙන්නත් එපා"

ඇය කීවාය.

"උදේ දහයට විතර යුනිෆෝම්වල සාම්පල් අරගෙන එනවා. මම ෆයිනල් දෙකක් සිලෙක්ට් කළා. ඒ දෙකෙන් එකක් අපි තෝරගන්න ඕන. සර්ටත් පෙන්නලා නේත්‍රා මිස්ටත් පෙන්නලා සුද්දිත් බලලා එකක් සිලෙක්ට් කරන්න."

ඔහු කීවේය.

"ඇයි ඔයා."

"මාත් ඉන්නවා."

"සීගිරි එක අපේ දේවකයියේ. එහෙම එක එකාට ඕන විදිහට මේකේ දේවල් කරන්න දෙන්නේ නෑ. ඔයා බයවෙන්න එපා."

ඇය කීවාය. එසේනම් තමා බියවෙන්නේ ඇයිදැයි භාවනා සිතින් ඇසුවාය.

"ම්. මම උදෙන්ම එනවා. අප්පච්චි එක්ක ටිකක් කතාකරලා එන්නම්."

ඔහු කීවේය.

*** *** *** *** ***

දේවක උදේ පාන්දර හයයි තිහ වෙද්දී සීගිරි එකට ආවේය. ඔහු හිතාමතාම කළු කලිසමට සුදු කමිසය ඇඳ තැඹිලි පැහැගත් ටයි පටියද පැළඳගත්තේය. කාරණා

සිදුවෙන විදිහට අද යමක් වෙන්නට පුළුවන. සූදානමින් යන එක හොඳය.

"මොකක්හරි වුනොත් පුංචි මහත්තයෝ මම රන්ජන් අන්කල්ට එවනවා. මී."

ජීවන් කීවේ දුක්බරවය. යනගමන් පඬුරක්වත් දමා යනවා කියා ජීවන් සිතාගත්තේය.

"මම යන්නම් අප්පච්චි."

කොල්ලා ජීවන්ට වැන්දේ අසරණවය. ඔහුට ඇත්තටම දුකය.

උදෑසන ආ විගසම දේවක සියළු වැඩ ඉක්මනින් පරීක්ෂා කළේය. සීගිරි එක අලුතෙන් ගොඩනඟන වැඩවලට මේ කිසිඳු දෙයක් නිසා බාධාවක් විය යුතු නැත. ඔහු අද ආවේ පිටු එකසිය හැටක සී ආර් පොතක අවශ්‍ය සියළුම උපදෙස් භාවනාට දෙන්නට ලියාගෙ

නය. එහි වූයේ සීගිරි සුපර් ගෙ
ාඩනැඟීමේ සම්පූර්ණ සැළසුමය. එය
පොතකට ගැනීම දේවක සිතූ තරම්ම
පහසු දෙයක් වූයේ නැත. එහෙත්
ඔහු එය කළේය. දැන් දේවකගේ සිත
නිදහස්ය. එන ඕනම අභියෝගයකට
මුහුණ දෙන්නට දේවක සූදානම්ය.

ඔහු පෙරදා රාත්‍රියේ කළ සියළු
වැඩ පරීක්ෂා කළේය. කිසිඳු අඩුවක්
නොමැතිව ඒ වැඩ සිදුවී තිබුණි.
අවශ්‍යම දේ ඒකය.

භාවනා ආවේ මෙරූන් පැහැගත්
සාරියකින් සැරසීය. පසුගිය දින
කිහිපයේම කැෂුවල් ඇඳුමින් සීගිරි
එකට ආ ඇය අද ආවේ සාරියක්
ඇඳගෙනය.

යුවතිය වාහනයෙන් බැස එනවා
දේවක වීදුරුව අතරින් බලාගෙනය.

ඇය ඇවිදගෙන එන්නේ මේ හදවත මතින්යැයි දේවකට සිතුණි. ඒ අඩි තබන රිද්මයට හදවත ගැහෙන්නේ ඒ නිසාද?

ඔහුගේ දෙතොලතර වූ අහිංසක අසරණ සිනහව යුවතියගේ හදවතේ පලුවක් ගලවා දැම්මේය. භාවනා අත් බෑගයද දමාගෙන දේවක අභියසටම ආවාය.

"ඇයි දේවකයියේ?"

ඇය ඇසුවාය.

"නැහැ සුද්දි"

ඔහු දෙනෙත් එහෙට මෙහෙට කර කීවේය.

"අද තව කොහේහරිත් යන්න බලාගෙනද ආවේ. මි."

ඇය ඇසුවාය. ඒ ප්‍රශ්නයම ඇගෙන් අහන්නට පුළුවන.

"එහෙම දන්නේ නෑ."

"එන්නකෝ."

එසේ කියාගෙන භාවනා ඇගේ කාර්යාල කාමරය විවර කරන්නට යතුර ගෙන ඇතුළට ගියාය. දේවක ඇගේ පිටුපසින් ඇවිදගෙන ගියේය. දොරට යතුර දමද්දී භාවනා හැරී බැලුවාය. දේවකගේ දෙනෙත් තිබුණේ ඇගේ මුහුණ මතය.

භාවනා පපුවම හිස්කර මෙන් සුසුමක් හෙළුවාය. පසුව දොර විවර කර ඇතුළට ආවාය.

"ඉඳි ආප්ප ගෙනාවා චුට්ටක් කමු හොඳේ."

ඇය කීවාය. දේවක හිස වැනුවේය. භාවනා වතුර බෝතලයත් ඉඳි ආප්ප මුලත් ගෙන මේසයට ආවාය. ඔහුගේ මුහුණේ අඳ ගන්නට

දෙයක් නැතැයි ඇයට සිතුණි.

"මේක ගලවලා දාන්නකෝ."

ඇය ඔහු අතට දුන්නේ කිරි හොදි බෑගයයි. දේවක එය පරිස්සමින් ගැලෙව්වේය.

"අපේ පොඩි අක්කට කිරි හොදිම ඕන ඉඳි ආප්ප කන්න."

"එහෙම රහයිනේ සුද්දි."

"මී. කමු."

දේවක ඉඳි ආප්ප මුලේ අයිනකින් කන්නට ගත්තේය. දෙදෙනාගේ හිස් තිබුනේ එක ළඟම වාගේය.

"ඔම්ලට් කන්නකෝ."

ඇය ඔම්ලට් එකෙන් ලොකු පලුවක් කඩා ඔහුගේ පැත්තට දැම්මාය. දේවකගේ දෙනෙත් තිබුනේ තෙත්වය. භාවනා එය දැක්කේ හදිස්සියේ වාගේය.

"අනේ මේ ඇයි දේවකයියේ."

ඇය හිරවී ගිය උගුරෙන් ඇසුවාය.

"එහෙම නෑ සුද්දි. නිකං."

හදවත ඇකිලීගෙන ගොස් පුපුරා ගියා සේ විය. කුමක් කරන්නද කියා භාවනාට සිතාගන්නට නොහැකි විය.

"මේ බලන්න."

ඇය කීවාය. දේවක පිටි අත්ලෙන් දෙනෙත් පිසදාගෙන ඇය දෙස බැලුවාය. භාවනා මොහොතක් ඒ තෙත් දෙනෙත් දෙස බලාගෙන උන්නාය.

"මේ සීගිරි එක හදන්න දුක් වින්ඳ ඔයාට හොරෙක් කියලා කිව්ව නිසාද?"

ඇය ඇසුවාය. දේවක කතාකළේ නැත.

"ජීවිතේ කොහොමත් කරදර සුද්දි. ඒ හැටි. එන විදිහකට මුහුණ දෙනවා."

ඔහු කීවේය.

"මේක කමු. කවුරුහරි එන්න කලින්. මි"

"මි."

ඔහු ඉඳි ආප්ප කටවල් හත අටකට වඩා කෑවේ නැත.

"මටත් අද කන්න බෑ."

ඇය ඉඳි ආප්ප මුල ගුලිකර ගනිමින් කීවාය.

"මේ බලන්න"

ඇය මෘදුව කරුණාබරව කීවාය.

දේවක දෙනෙත් එසෙව්වේය.

"මං ඉන්නවා කවුරු නැතත්."

ඇය කීවාය. දේවක හිස

වැනුවේය. භාවනා ගුලිකරගත් ඉඳි ආප්ප මුලත් ගෙන නැඟිට යද්දි පිටුපසින් පැමිණ ඔහුගේ හිස වමතින් පිරිමැද්දාය. දේවකගේ දෙනෙත් අලුතින් තෙත්විය.

"හිත ශක්තිමත් කරගන්න."

ඇය මුහුණා මෙන් කීවාය. ඉන් පසුව පැය එකහමාරක් පමණ ගෙන දේවක භාවනාට සීගිරි සැළසුම ගැන විස්තර කළේය. පසුව රැයක්ම දුක් විඳ ලියූ පොතද ඇය අත දුන්නාය.

# 04

උදේ සීගිරි හි සේවක රැස්වීමක් කැඳවිණ. හැමෝම තැන තැන කරන කතාවලට රඹුක්වැල්ල මහතා කැමති වූයේ නැත. මේ සීගිරි එක අලුතින් නිර්මාණය කරන මොහොතය. ඒ නිසා මේ යන කට කතා නැවැත්විය යුතුය.

සේවක රැස්වීම පැවැත්වූයේ රාක්ක ඉවත්කර තිබූ සීගිරි සුපර් එක මැදය. සියල්ලෝම එක්රැස්වී

බලාගෙන උන්නේ රඹුක්වැල්ල මහතා එනතුරුය. දේවක පසෙකට වී උන්නේය. සීගිරි සුපර් හී සේවකයන් දැන් තමාව ගණන් ගන්නේ නැති බව දේවකත් දැනගෙන උන්නේය. ඒ ගැන ඔහුගේ හිතේ කහටක් තිබුනේ නැත.

කෝසළත් මිහිරංගත් මලීෂාත් සේවකයන් ඉදිරියෙන් දැමූ පුටුවල වාඩිවී ගෙන උන්නෝය. මිහිරංග දිගටම ජංගම දුරකථනයෙන් ඇමතුම් ගනිමින් උන්නේය.

"මොකද වෙන්නේ."

ඔහු කෙනෙක්ගෙන් ඇසුවේය.

"දැන් ඉන්ස්පෙක්ටර් වසන්ත ආවා."

කතාකළ කෙනා කීවේය. මිහිරංගගේ මුවඟ ලස්සන සිනාවක්

සටහන් විය. ඔහු බැලුවේ අත් බැඳගෙන බිම බලාගෙන උන් දේවක දෙසය.'උඹ ඉවරයි බුවා. සුබගමන්' මිහිරංග සිතින් කීවේය.

රඹුක්වැල්ල මහතා ආවේය. ඒත් සමඟම භාවනාත් නේත්‍රාත් ආවාය. භාවනා ආවේ නේත්‍රාගේ රෝද පුටුවද තල්ලුකරගෙනමය. ඇය එය තල්ලු කරගෙන පැමිණ ඇය අසළම නවතා වීල් ලොක් එක දැමුවාය. ඊටත් පසු එතන වූ පුටුවට බරවූවාය.

භාවනාට බැලුනේ දේවක දෙසය. ඔහු ඉන්නේ කිසිවෙක් දෙසවත් නොබලා දෙනෙත් බරකරගෙ නය.'ඔයා පව්' ඇය අසාමාන්‍ය දුකකින් යුතුව සිතුවාය.

"ගුඩ් මෝනිං දරුවනේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ගුඩ් මෝනිං සර්."

සියල්ලෝම කීවේ එකටය.

"මේක කතාකර කර ඉන්න ඕන වෙලාවක් නෙමෙයි. අපි ඔක්කොම හෝ හෝ ගාලා වැඩකරන්න ඕන වෙලාවක්. ඒත් මට හිතුණා ටිකක් කතාකරන එක හොඳයි කියලා. ඔයාලටත් ප්‍රශ්න ඇතිනේ කතාකරන්න."

රඹුක්වැල්ල මහතා සන්සුන්ව කීවේය. දේවක තොල්පට මුව තුළට දමාගෙන දෙනෙත් බරකරගෙනම උන්නේය. විටින් විට සේවකයන් තමා දෙස බලා මුමුණනු දේවක දෙතුන් වරක්ම දැක්කේය. 'අද එක්කෙනෙක් පර්ෆියුම් නාලද කොහෙද ඇවිත් ඉන්නේ. යනකොටත් සුවඳයි' ස්ටාෆ් එකේ කිසිවෙක් කියනවා දේවකට

යන්තමට ඇසුණි. ඔහු සියල්ලම දරාගෙන උන්නේය.

"සීගිරි එකේ කවදාවත් වෙච්ච නැති දෙයක් වෙලා තියෙනවා. අපේ ස්ටෝර්ස්වල තිබ්බ බඩු ස්ටොක් එකක්."

කියාගෙන ආ දේ කියන්නට රඹුක්වැල්ල මහතාට හැකිවූයේ නැත. පොලිස් ඉන්ස්පෙක්ටර් වසන්ත ගමගේ තවත් පොලිස් නිළධාරීන් හතර දෙනෙක් සමඟ සීගිරි සුපර් වෙතට ඇතුළු විය. මිහිරංග තමා ළඟ උන් කෝසළගේ අතක් හෙම්හිට තදකළේය.'ඩන්' ඔහු රහසින් මෙන් කීවේය.

භාවනා පොලිස් නිළධාරීන් දෙස බැලුවේ පුදුමයෙනි. පොලීසිය මේ තරම්ම සීගිරි එකට ආදරේද කියා

ඇය සිතුවේ පුදුමයෙනි. දේවක සන්සුන්ව උන්නේය. සිදුවෙන ඕනම දෙයකට ආත්ම ශක්තියෙන් මුහුණ දෙනවා කියා ඔහු සිතාගෙන උන්නේය.'සමහරවිට අම්මේ මට යන්න වෙයි.' ඔහු කිව්වේ මැරිච්ච අම්මාටය.

"ගුඩ් මෝනිං මිස්ටර් රඹුක්වැල්ල."

පොලිස් පරීක්ෂක වසන්ත ගමගේ කීවේය.

"ගුඩ් මෝනිං ඉන්ස්පෙක්ටර්. උදෙන්ම."

ඔහු ඇසුවේය.

"අපිට මිස්ටර් රඹුක්වැල්ල කෙනෙක්ව ඇරෙස්ට් කරන්න තියෙනවා."

පොලිස් පරීක්ෂක වසන්ත

කීවේය. භාවනාගේ පපුව දවාගෙන ගියේය. ඇය වෙව්ලන අතක් රෝද පුටුවේ ඇන්ද මත තිබූ අක්කාගේ අත මත තැබුවාය.

"කවුද ඉන්ස්පෙක්ටර්."

"අපි මෙහෙන් පන්නපු පර්ෆියුම් ස්ටොක් එක තැනකින් හොයාගත්තා මිස්ටර් රඹුක්වැල්ල. ඒ ස්ටොක් එකමයි කියලා අපිට සහතිකයි. ෂොප් එකේ කෙනා අපිට හැමදේම කිව්වා. එයා මේක හොර බඩු ස්ටොක් එකක් කියලා දැනගෙන නෙමේ අරන් තියෙන්නේ. නමුත් අරන් තියෙනවා. එයත් තාමත් පොලිස් බාරයේ ඉන්නේ."

"ම්."

සීගිරි ස්ටාෆ් එකම හින්දි චිත්‍රපටයක් බලාගෙන ඉන්නාක්

මෙන් කටවල් ඇරගෙන බලාගෙන උන්නෝය.

"එතනට මේ පර්ෆියුම් ස්ටොක් එක විකුණලා තියෙන්නේ මෙතන කෙනෙක් මිස්ටර් රඹුක්වැල්ල."

"ම්. කවුද ඉන්ස්පෙක්ටර්."

"දේවක කියලා කෙනෙක්. අපිට එයාව ගන්න ඕන."

දේවක යටිතොළ හපාගත්තේය. අම්හිරි ලේ රසයක් ඔහුට දැනුණි. භාවනාගේ අත දැඩි විය. එහෙමම භාවනා නැගිට්ටාය. සීගිරි ස්ටාෆ් එකම බලාගෙන උන්නේ දේවක දෙසය.'බඩුම තමයි' හැමෝම කීවෝය.

"කෙනෙක් කියපු පළියට එහෙම ඇරෙස්ට් කරන්න පුළුවන්ද ඉන්ස්පෙක්ටර්. එයාට පුළුවන්

බොරුවක් කියන්නත්. නේද?"

හාවනා වේගයෙන් පැමිණ කීවාය. පොලිස් පරීක්ෂකවරයා පවා ඇගේ ගැහැණු බැල්මට සෙලවිණ.

"ඔව් මිස්. ඒත් ක්ලූ එකක් ලැබුණාම අපට ඇරෙස්ට් කරන්න වෙනවා. ඒක නීතිය."

පොලිස් පරීක්ෂකවරයා කීවේය.

"මෙතන වෙන කෙනෙක් ඒ හොර බඩු විකුණලා විකුණුවේ දේවක කියලා කියන්න පුළුවන්නේ."

හාවනා ඇසුවාය. දේවක ඉදිරියට ආවේ වේගයෙනි. අසාමාන්‍ය ලෙස ඔහුගේ දෑස් තෙත්ව තිබුණි. රඹුක්වැල්ල මහතා දේවක දෙස බැලුවේ අසරණ බැල්මෙනි.

"මිස් ඉන්න. යන් ඉන්ස්පෙක්ටර්. මම එන්නම්. මට සහතික කරලා

කියන්න පුළුවන් ඒ ස්ටොක් එක මම කාටවත් වික්කේ නෑ කියලා. හඳුනාග උනීමේ පෙරට්ටුවකට උනත් මම ලෑස්තියි. යමු ඉන්ස්පෙක්ටර්."

දේවක පැහැදිළිව කීවේය. රඹුක්වැල්ල මහතාට පුදුම සිතුණි.

"තමුන්ද දේවක."

පොලිස් පරීක්ෂකවරයා ඇසුවේය. දේවක හිස වැනුවේය. ඔහු දේවක දෙස මොහොතක් බලාගෙන උන්නේය. අපරාධකරුවන් මංකොල්ලකරුවන් දහස් ගණන් අල්ලා තිබූ පොලිස් පරීක්ෂක වසන්ත ගමගේට බොහෝ දේ සිතුණි. එහෙත් සාක්ෂි ඉදිරිපත්ව ඇත්තේ දේවකට විරුද්ධවය.

"අපිත් එක්ක තමුන්ට එන්න වෙනවා."

භාවනා ඉදිරියට ආවාය.

"මට දෙයක් දැනගන්න පුළුවන්ද ඉන්ස්පෙක්ටර්."

මිහිරංග පසෙකට වී සියල්ලම බලාගෙන උන්නේය. 'මේකට පුදුම අමාරුවක් තියෙන්නේ උඹ ගැන. පොරව අරන් යන්න දෙන්නෙම නෑ.'

"ඔව් මිස් කියන්න."

"දැන් මේ දේවකව අරන් යන්නේ. කට උත්තරයක් ගන්නද නැත්නම්."

ඇය ඇසුවාය. පොලිස් පරීක්ෂක වසන්ත ගමගේ බැලුවේය. කෙනෙක්ව අත් අඩංගුවට ගන්නට යද්දී කිසිවෙක් මෙසේ අසා නැත.

"කට උත්තරයක් ගන්නත් වෙනවා මිස්. සාක්ෂි තියෙන්නේ විරුද්ධව නිසා අපට රිමාන්ඩ් කරන්නත් වෙනවා."

ඔහු කීවේය.

"ඇප දෙන්නේ."

ඇය ඇසුවාය. රඹුක්වැල්ල මහතාට පුදුම සිතුණි.

"කියන්න ඉන්ස්පෙක්ටර්. පොලිසියට පුළුවන් නිවැරදිකාරයෙක්ව වැරදිකාරයෙක් කරන්න. එක වංචාකාරයෙක්ගේ බොරු සාක්ෂියක් නිසා. ඒත් මේ අපේ ප්‍රමෝෂන් මැනේජර් ඉන්ස්පෙක්ටර්. මම යටතේ ඉන්න මැනේජර් කෙනෙක්. මට එයා ගැන වගකීමක් තියෙනවා."

දේවකගේ දෑස් තෙත්විය. ඔහු අසරණව නේත්‍රා දෙස බැලුවාය. නේත්‍රා හිස වැනුවාය.

"අපිට උසාවියට දාන්න වෙනවා මිස්. ජජ් තමයි තීරණය කරන්නේ

ඇප දෙනවද නැද්ද කියලා.”

ඔහු කීවේය.

“යමු මාත් එනවා පොලීසියට. මොකද මේ පර්ෆියුම් ස්ටොක් එක තිබ්බ ස්ටොක් රූම් එකේ කීස් තිබුනේ මම ගාව. මෙතන වංචාවක් කරනවානම් දේවක කරන්නෝන මාත් එක්ක හවුලේ. යමු.”

භාවනා සියල්ලන්ම බලාගෙන සිටිද්දී කාමරයට ගොස් ඇගේ අත් බෑගය ගෙන ආවාය.

“මම දේවක එක්ක යනවා සීයා.”

“මාත් එනවා පුතේ.”

සීගිරි සුපර් හී සේවකයන් සියල්ලන්ම බලාගෙන සිටිද්දී දේවකව පොලිසීයෙන් රැගෙන ගියෝය. හැමෝවම පුදුමයට පත්කරමින් භාවනාද ඒ පිටුපසම

ගියාය. මිහිරංග කෝසළ දෙස බැලුවේ අවඥා සහගත ලෙස සිනාසෙමිනි. නේත්‍රා යන්තමට මිහිරංගත් කෝසළත් දෙස බැලුවේය. 'දෙන්නගේ හැසිරීම සැකයි' ඇයට සිතුණි. මිහිරංග දුරකථන ඇමතුමක් ගෙන එතනින් ඈතට යනවා නේත්‍රා බලාගෙන උන්නාය.'බලමුකෝ'

"ලොකු පුතේ."

රඹුක්වැල්ල මහතා නේත්‍රා ළඟට විත් කතාකළේ අසරණවය. ඔහුට මේ සිදුවූ සිදුවීම් මාලාවම දරාගන්නට අමාරුය.

"කෙල්ල කරපු දේ හරි සීයා. දේවක අපේ මැනේජර් කෙනෙක්. තමන්ගේ අය වෙනුවෙන් පෙනී සිටින්නේ එහෙමයි. අමාරුම වෙලාවේදී එයාලව තනිකරන්න

හොඳ නෑ."

නේත්‍රා සේවකයන් ඉදිරියට ආවාය. හැමෝම බලාගෙන උන්නේ පුදුමයෙනි. ඇය රෝද පුටුව කරකවාගෙන පැමිණ පසුව එයට වීල් ලොක් එක දමාගත්තාය.

"සමහරවිට ඔයාලට සතුටු ඇති. යටි හිතින් ඔයාලා හිනාවෙනවා ඇති. ඊත් අර පොලීසියෙන් අරගෙන ගියේ අපේ ස්ටාෆ් එකේ කොල්ලෙක්ව. ඒක අපිටනම් සතුටක් නෙමෙයි. එහෙම අරන් ගියේ දේවකද මේ අනූවද නැත්නම් ආරියරත්නවද කියන එක වැඩක් නෑ. ඒ අරන් ගියේ අපේ කෙනෙක්. භාවනා මිස් අරම ඇවිත් කතාකළේ අපේ කෙනෙක් වෙනුවෙන්. දැක්කා නේ මිස් එයා එක්කම ගිය හැටි. අපි අපේ

සේවකයන් වෙනුවෙන් පෙනී සිටින්නේ එහෙමයි. ඔයාලත් ඒක ඉගෙන ගන්න. තමන්ගේ එකාව එහෙම කුදලගෙන යනකොට හිනාවෙන්න එපා. සමහරවිට හෙට එහෙම අරන් යන්නේ ඔයාලව වෙන්න පුළුවන්. හරි වුනත් වැරදි වුනත් තමන්ගේ එකා වෙනුවෙන් පෙනී සිටින්න ඉගෙන ගන්න."

නේත්‍රා කීවාය. සේවකයන් අසාගෙන උන්නේ පුදුමයෙනි.

"එක දෙයක්මම අර බුදු රූපේ දිහා බලාගෙන මේ කියන්නේ. මම හොඳටම දන්නවා දේවක මේක කළේ නෑ කියලා. සමහරවිට ඔයාලා එහෙම විශ්වාස කරන්නේ නැතුව ඇති. ඒත් අපට ඒක විශ්වාසයි. භාවනා මිස් අරම ගියේ ඒකයි. එයත්

ඒක දන්නවා.”

නේත්‍රා කියාගෙන ගියාය. මිහිරංගත් කෝසලත් මේවා අසාගෙන උන්නේ අසීරුවෙනි.

“මතුපිටින් පේන දේ අහලා ඒකම විශ්වාස කරන්න එපා. තමන්ගේ හිතත් එක්ක ටිකක් කතාකරන්න. කොහොම වුනත් අපි සීගිරි එක හදන එක නවත්තන්නේ නෑ. ඒක අපි ලස්සනට හදනවා. මේක පොඩි ඉන්සිඩන්ට් එකක් විතරයි. ගිහින් ඔයාලට බාරදීලා තියෙන වැඩටික කරන්න.”

ඇය කීවාය. පසුව ඇය එහෙමම ආවාය.

# 05

"මිස් කා එකේ එන්න. මේකේ එන්න එපා."

දේවක කීවේ ඇයත් ඔහුත් සමඟම පොලිස් ජීප්රියට ගොඩවෙන්නට හදද්දීය. ඔහුගේ දෙනෙත්වල වූ අසරණ තෙත් බව භාවනාගේ හදවත කම්පනයට පත්කළේය.'මම මේ ඇස්වල තෙතමනයටත් වගකියනවා දේවකයියේ' ඇය සිතින් කීවාය.

"මිහ් මාත් මේකෙම එනවා. ඩ්‍රයිවර් අන්කල් වාහනේ අරන් පොලීසියට එන්න."

භාවනා රියදුරුට කීවාය. පොලිස් පරීක්ෂක වසන්ත ගමගේට මේ යුවතිය ගැන පුදුම සිතුණි. ඇයගේ මේ විශ්වාසය බොහෝ විට හරියන්නට පුළුවන් යැයි පොලිස් පරීක්ෂකවරයාට සිතුණි. 'මේ කොල්ලා දිහා බැලුවාම කියන්න පුළුවන් එයා එහෙම දෙයක් කළේ නෑ කියලා. බලමුකෝ' ඔහු සිතුවේය.

භාවනා පොලිස් ජීප්රියට ගොඩවනවා සීගිරි ස්ටාෆ් එකම බලාගෙනය. රඹුක්වැල්ල මහතාත් එය දැක්කේය. ඔහු තමාගේ මිණිපිරිය ගැන ආඩම්බර විය. ඇය මේ හැමෝටම වඩා වෙනස්ය.

දේවකත් භාවනාත් පොලිස් ජීප් රියේ ගියේ එක ළඟ ඉඳගෙන නය. ඔහුගේ මුහුණේ බියක් නැත. එහෙත් කියාගන්නට බැරි මහා වේදනාවක් විය. පිටුපස උන් පොලිස් කොස්තාපල්වරුන් තිදෙනා ගැන තැකීමක් නොකළ භාවනා දේවකගේ අතක් මත සුරත තැබුවාය.

"හැමදේම හරියයි. මම ඉන්නවනේ."

ඇය රහසින් මෙන් කීවාය. දේවක ඇස් පිහාටු ගහමින් හිස වැනුවේය.

"මට අප්පච්චිට කතාකරන්න ඕන."

"යන්කෝ. මොනවද වෙන්නේ කියලා බලලාම අප්පච්චිට කතාකරමු දේවකයියේ. මී. මම ඉන්නවනේ."

ඇය ඒ කතාව යළිත් කීවාය.

ඔහුත් සමඟම මේ පොලිස් ජීප්රියේ එන්නට තිබූ ශක්තිය ගැන භාවනා තම හදවතට ස්තූති කළාය. 'ඔයා වෙනුවෙන්.' ඇය සිතින් කීවාය.

ඉතා ඉක්මනින් පොලිස් ස්ථානයට ජීප්රිය ළඟා විය.

"අපට කට උත්තරයක් අරන් දේවකව රිමාන්ඩ් කරන්න වෙනවා මිස්. සොරි."

පොලිස් පරීක්ෂකවරයා කීවේ වාහනයෙන් බසිමිනි. භාවනා ඔහු දෙස තිබුණු දෙනෙතින් බැලුවාය.

"වැරදි සාක්ෂියක් උඩ මෙහෙම කළොත් ඉන්ස්පෙක්ටර්."

"ඒක නීතිය"

ඔහු කීවේය. භාවනා දේවකගේ අතක් අල්ලාගත්තේ නිහඬවමය. ඇයගේ දෙනෙත් අසාමාන්‍ය ලෙස

තෙත්ව තිබුණි.

"මම ඔයාව කොහොමහරි පැය විසිහතරක් ඇතුළත එළියට ගන්නවා."

ඇය දෙනෙත් බරකරගෙනම කීවාය. දේවක ඒ දෑස් දෙස බලාගෙන නම උන්නේය.

"මගේ අප්පච්චිට කියන්න මිස්. සුද්දි. මී. මගේ ෆෝන් එක. එයාට එන්න අමාරුවෙයි අද. කොළඹ නෑ. අන්කල් කෙනෙක්ව එවනවා කිව්වා."

භාවනා හිස වැනුවාය. දේවක කට උත්තරය දෙනතුරු ඇය එතනටම වී උන්නාය. ඇය පොලිස් පරීක්ෂක වසන්ත ගමගේගේ කාමරය අද්දරට ගියේ නිකමටය.

"කැන් අයි ටොක් විත් යූ ඉන්ස්පෙක්ටර්."

භාවනා විනීතව ඇසුවාය. පොලිස් පරීක්ෂක වසන්ත ගමගේ සිනාසුණේය.

"එන්න මිස්."

"මම භාවනා. භාවනා රඹුක්වැල්ල. සෙනරත් රඹුක්වැල්ලගේ මිණිපිරී"

"මම දන්නවා භාවනා. කියන්න. මොකක්ද මගෙන් කෙරෙන්න ඕන."

භාවනා මොහොතක් නිහඬව උන්නාය. පසුව හිස ඔසවා පොලිස් පරීක්ෂකවරයා දෙස බැලුවාය.

"ඉන්ස්පෙක්ටර්ට මෙහෙම කියන්න වුණාට සොරි. ඒත් හිතෙන්නේ නැද්ද මෙතන මොකක්හරි දෙයක් වෙනවා කියලා. හිතන්නකෝ මේ පොලීසිය මෙච්චරම කාර්යක්ෂම වුනේ කොහොමද කියලා. ඊයේ මේක අපි දැනගත්තා. හවස කම්ප්ලේන් එක

දැම්මා. උදේ බඩු ඇල්ලුවා. හොරුත් එක්කම. මම කියන්නේ නෑ පොලිස් ඩිපාට්මන්ට් එක මෙතන ඩීල් එකක් කළා කියලා. ඒත්."

"කතාව තේරෙනවා මිස්. ඔයා කියන්නේ මෙතන කෙනෙක් පගාවක් අරන් මේක කරනවා කියලනේ."

පොලිස් පරීක්ෂකවරයා කෙළින්ම ඇසුවේය. භාවනා සිනාසුනාය.

"එහෙම හිතන්න වෙනවා. මේක හරි බොළඳ රහස් පරීක්ෂක කතාවක් වගේ. මට දැනගන්න පුළුවන්ද ඉන්ස්පෙක්ටර් ඔය පර්ෆියුම් ස්ටොක් එක තිබ්බ ෂොප් එක කොහොමද හොයාගත්තේ කියලා. මේකනේ දැන් සරත් කියලා කෙනෙක් මේ පර්ෆියුම් ස්ටොක් එක ගත්තා කියමුකෝ. කමක් නැද්ද මම මෙහෙම

කතාකළාට."

භාවනා හදිස්සියේ ඇසුවේ පොලිස් පරීක්ෂකවරයා සිනාසුණා නිසාය.

"නෑ කමක් නෑ මිස් කියන්න."

"ඉන්ස්පෙක්ටර් හිනාවුන නිසා ඇහුවේ."

භාවනා කීවාය.

"මට මගේ වයිෆ්ව මතක් වුණා. ඒකයි."

භාවනා දෙනෙත් බරකළාය.'මං වගේ තර්ක කරගෙන එනවා ඇති ගෑනිත්.' ඇය සිතුවාය.

"ඉතින් ඉන්ස්පෙක්ටර් මේ ලක්ෂ පහක හයක ස්ටොක් එකක් ගන්නකොට එයා දන්නවා මේක හොර බඩු කියලා. නේද?"

"ඔව්. නොදැන ගන්නේ නෑ

තමයි.”

“මොකද මේක පොපියුලර් බ්‍රෑන්ඩ් එකක්නේ. එක සප්ලයි කරන කම්පනි එකක් තියෙනවනේ. මේ ගෙනාවේ ඒ කම්පනි එකෙන් නෙමේනේ. නේද?”

“ඔව්.”

“ඉතින් එහෙම ගන්නකොට ගන්නේ මාකට් ප්‍රයිස් එකට වඩා අඩුවෙන්. ගොඩක් අඩුවෙන් ලක්ෂ පහක ස්ටොක් එක ගන්නේ දෙකහමාරට වගේනේ.”

පොලිස් පරීක්ෂකවරයා හිස වැනුවේය.

“එහෙම ගන්න දැන් ලක්ෂ දෙකක් තුනක් හිරකරනවා කියන්නකෝ. මේ පොඩි ෂොප් එකක්. මි”

“හරි.”

“එයා මේ ස්ටොක් එකම එයාගේ

කඩේ විකුණන්නද ගන්නේ. එහෙම පුළුවන්ද?"

"බෑ තමයි. පොඩි ෆැන්සි ෂොප් එකක්."

"එහෙම ෂොප් එකක මාසෙකටම යයි පර්ෆියුම් බොට්ල් විස්සක්. මම මගේ සුපර් මාර්කට් සේල්ස් අත්දැකීමෙන් කියන්නේ. ඉතින් ගන්න කෙනා මේක ගන්නේ තවත් අයට විකුණන්නනේ."

"හරි"

"එයා ලක්ෂයක ලාබයක් තියාගෙන විකුණනවා කියමුකෝ. එතකොට හොර බඩු ගත්තේ දෙකහමාරට. එයාට ලක්ෂයක් තියාගෙන තුනහමාරකට විකුණනවා. හරිද?"

"හරි."

"එතකොට එයා විකුණන්න ඕන කාටද ඉන්ස්පෙක්ටර්"

"තවත් ෂොප්වලට."

"ඔව්. පොඩි පොඩි කොටස් වලට කඩලා. මේ ස්ටොක් එකම කවුරුවත් ගන්නේ නෑනේ."

"නෑ තමයි."

"එතකොට එයා මේක වෙන කඩවලට විකුණන්න යනකොට ඒ කඩවල අය දන්නේ නැද්ද මේව හොර බඩු කියලා."

"දැනගන්නවනේ. මොකද මේක වෙන කම්පනි එකකින් ගෙනත් දානවනේ."

"ඉන්ස්පෙක්ටර්ට තේරුණා. ඒ පොඩි කඩවලින් මේවා ගන්නවාම කියලා කියමුකෝ. ඒ ගන්නේ මාකට් ප්‍රයිස් එකටද?හොර බඩු."

"නෑ. එයාටත් වැඩිපුර ලාබයක් තියෙනවානම් තමා ගන්නේ."

"එතකොට මේ ස්ටොක් එක ඒ කඩවලටත් විකුණන්න වෙන්නේ අඩුවට. නේද?"

"ඕ."

"එහෙම දෙන්න බෑ ඉන්ස්පෙක්ටර්. මොකද මේ පර්ෆියුම් කම්පනි එක මේ පර්ෆියුම් දාන්නේ ගොඩක් අඩුවට. කඩවලට සියයට හතළිහක් දෙනවා කමිෂන් එක. මේ පර්ෆියුම් බොටිල් එකක් හාරසිය පනහයි. කඩේට දාන්නේ දෙසීය හැත්තෑවට. ඉන්ස්පෙක්ටර්ට මම සප්ලයර්ගේ නම්බර් එක දෙන්නම් අහලා බලන්න කඩයකින් වගේ. මේ ගාණට දෙන්නේ. එතකොට ඉන්ස්පෙක්ටර් මේ බොටිල්ස් ලක්ෂ

තුනක විතර ගන්නවානම් එයාලා සියයට පනහක් විතර දෙයි. මොකද අපිට එහෙම දෙනවා”

පොලිස් පරීක්ෂකවරයාට පුදුම සිතුණි.

“එතකොට ඉන්ස්පෙක්ටර් තේරෙනවා නේද මේ හොර බඩු අරන් අවදානමක් ගන්නවට වඩා හොඳයි කම්පනි එකෙන්ම ලොකු ස්ටොක් එකක් ගන්න එක කියලා. නේද? සේම් ප්‍රොෆිට්”

ඔහු හිස වැනුවේය. කෙල්ලගේ තර්කය හරිය.

“මේක කවුරුහරි ප්ලෑන් කරලා කළා ඉන්ස්පෙක්ටර්. කවුද කියන්න මම දන්නේ නෑ. සීගිරි සුපර් ඇතුළේ කෙනෙක් මේකට සම්බන්ධයි තමා. එයා එහෙම කළේ මේ දේවකව

අල්ලන්න මේකට. දේවක සීගිරි සුපර් එකට ආවේ අලුතෙන්. එයා තමයි සීගිරි සුපර් එක අලුතින් හදන්නේ. අලුත් විදිහකට. ඒ පත්වීමට ගොඩක් දෙනා කැමති නෑ. ඒක පැත්තක තියමුකෝ. මෙච්චර ඉක්මනට මේ ෂොප් එකයි හොර බඩුයි අල්ලලා වික්ක කෙනාගේ නමත් දැනගන්න තරමට පොලීසිය කාර්යක්ෂම වුනේ ඇයි කියලා මට හිතාගන්න බෑ”

“හරියට කියන්න මිස්.”

“මේ කතන්දරේ ගොතන්න මේ පොලීසිය ඇතුලේ කෙනෙකුත් සම්බන්ධයි ඉන්ස්පෙක්ටර්.. මගේ චූටි මොළේට ඒක හිතෙනවා. මම වැරදිත් ඇති. ඒත් හිතෙනවා. කොහොමද මේ හොර බඩුයි ෂොප් එකයි ඇල්ලුවේ. නිකං අංජනමකින්

කිව්වද මෙතන හොරබඩු තියෙනවා කියලා. නැත්නම් කවුරුහරි ඔත්තුවක් දුන්නද?"

පොලිස් පරීක්ෂකවරයා බලාගෙන උන්නේය. මේ යුවතියගේ කතාව ඔහුගේ පොලිස් වෘත්තියටම කළ අභියෝගයක් විය.

"මට මේක ඉන්විස්ටිගේට් කරන්න දෙන්න මිස්. අපි බලමු මොනවද වෙලා තියෙන්නේ කියලා. මිස් කියපු කාරණා මම හිතේ තියාගන්නම්. අසාධාරණයක් වෙලානම් මම තරාතිරම නොබලා ඇක්ෂන් ගන්නවා"

භාවනා හිස වැනුවාය.

පොලිස් පරීක්ෂක වසන්ත ගමගේ ඔහුගේ කාමරයට වී සෑහෙන වෙලාවක් කල්පනා කළේය. තව

පැයකින් මේ කොල්ලාව උසාවියට ඉදිරිපත් කළ යුතුව ඇත. එසේ කළ විට මේ කෙල්ල නීතිඥයෙකුගේ මාර්ගයෙන් ඇප ඉල්ලන බව වසන්ත ගමගේ දැනගෙන උන්නේය. මේ තරම් කැක්කුමකින් මේ කෙල්ල කතාකරන්නේ හේතුවක් ඇතුවය. ඇය යටතේ ඉන්නා කළමණාකරුවෙකු වෙනුවෙන් මේ තරම් කැක්කුමකින් කතාකළ යුතු නැත. 'සමහරවිට කෙල්ල කොල්ලට ආදරේ ඇති. නැත්නම් ලොකු බැඳීමක් ඇති.' ඔහු සිතුවේය.

මෙතනට වී ඇය කියූ දේවල් එහෙම ලේසියෙන් නොසළකා ඉන්නට පොලිස් පරීක්ෂක වසන්ත ගමගේට නොහැක. ඒවා බරපතල චෝදනාය. ඇය ඒ චෝදනා කළේ සමස්ථ පොලිස් දෙපාර්තමේන්තුවටමය. මේ

පොලීසිය ඇය කියන්නාක් මෙන් පිරිසිඳු තැනක් නොවන බව වසන්ත ගමගේත් දනී.

මේ පරීක්ෂණය කළේ උප පොලිස් පරීක්ෂක ඇන්ටන් රංජිත්ය. ඔහුගේ අපිරිසිඳු වෘත්තීය ජීවිතය ගැන වසන්ත ගමගේ හොඳින්ම දනී. එහෙත් සාක්ෂි ඇතිවිට කිසිවක් කළ නොහැක. සාක්ෂි බොරුයි කියා ඔප්පු කළ හැක්කේ උසාවියකදීය.

භාවනා එද්දී දේවකව ඇතුළට දමා අවසානය. දේවක අඳුරු පොලිස් සිර මැදිරියේ යකඩ පොලු අල්ලාගෙන බලාගෙන උන්නේය. ඒ දර්ශනය භාවනාට කිසිම ලෙසකින් අමතක කරන්නට නොහැකි විය. ඇය ඔහු අසළටම ගියාය. යුවතියගේ දෑස්වල කඳුළුය.

"මට සමාවෙන්න දේවකයියේ."

ඇය බිඳුණු හඬකින් කීවාය.

"එහෙම කියන්න එපා. මට මේක දරාගන්න පුළුවන්."

"මට එක දෙයක් පොරොන්දුවෙන්න."

ඇය පිටි අත්ලෙන් කඳුළු පිසදමාගෙන කීවාය.

"මොකක්ද?"

"සීගිරි එක දාලා. යන්නේ නෑ කියලා. මට බයයි."

දේවක මොහොතක් ඇය දෙස බලාගෙන උන්නේය. යකඩ පොල්ල මත තිබූ භාවනාගේ සුරත මත ඔහු සුරත තැබුවේය.

"මෙතන ඉන්න එපා. සුද්දි යන්න."

ඔහු මෘදුව කීවේය. සමහරවිට ඔහු සීගිරි එක දමා යනු ඇතැයි

ඇයට සිතුණි.

රඹුක්වැල්ල මහතා පොලීසියට ආවේ ඒත් සමඟය. ඔහුට කොල්ලා ළඟට එන්නට බැරි ගතියක් දැනුණි. දේවක රඹුක්වැල්ල මහතා දෙස බලා අසරණව සිනාසුනේය.

"මාව ඇතුළට දැම්මා සර්."

ඔහු කීවේය. ඒ වචන අස්සේ අහිංසක කොල්ලාගේ අවංකකම ඕනවටත් වඩා ඇතැයි රඹුක්වැල්ල මහතාට සිතුණි.

"මම ඕ අයි සී මහත්තයා එක්ක කතාකරලා එන්නම් පුතා."

රඹුක්වැල්ල මහතා කීවේය.

# 06

භාවනා දේවකගේ අප්පච්චීට ඇමතුමක් ගත්තේ දැඩි අසීරුවකිනි. ඔහුට මෙහෙම පණිවිඩයක් කියන්නට කතාකරන්නට වේයැයි ඇය කවදාවත් සිතුවේ නැත. එහෙත් නොසිතූ දේම සිදුවිය.

භාවනා ඇමතුම ගත්තේ දේවකගේ දුරකථනයෙන්මය.

"පුංචි මහත්තයෝ."

ජීවන් කතාකළේ ඒ තරම්ම

ආදරයකිනි.'ඔයාගේ පුංචි මහත්තයා දැන් ඇතුලේ අප්පච්චි. මම කොහොමද ඒක කියන්නේ.' භාවනා සිතුවාය.

"අප්පච්චී මම භාවනා. සීගිරි එකේ. දේවක නෙමෙයි."

භාවනාගේ කටහඬේ වූයේ ඇඹුම්බර බවකි. ජීවන්ට කුමක්ද දැනුණි. 'මිලින්දගේ පොඩි කෙල්ල කතාකරන්නේ. මේ ඇයි. මගේ කොල්ලට මොකක්හරි.' ජීවන් සිතුවේය.

"කියන්න දුව. මගේ කොල්ලා පුතේ."

ජීවන් ඇසුවේය.

"මට සමාවෙන්න අප්පච්චි. මෙහෙම දෙයක් කියන්න අප්පච්චිට කතාකරන්න වුනානේ."

භාවනාට ඇඬුණි.

"අනේ දුවේ. ඇයි කියන්න මේ."

ඔහු ඇසුවේය. 'මගේ කොල්ලව ඇතුළට අරන් ඇති' කොල්ලාව සීගිරි එකට යැවූ එක ගැන ජීවන් තවත් වරක් පසුතැවිලි විය.

"එයාව පොලීසියෙන් ඇතුළට ගත්තා අප්පච්චි. මම කරන්න පුළුවන් හැමදේම කරනවා. ඔයා දුක්වෙන්න එපා. හවස් වෙන්න කලින් මම දේවක අයියව එළියට ගන්නවා. එයාට එහෙම වෙන්න දෙන්නේ නෑ."

භාවනා අඬමින්ම කීවාය. ජීවන් යටිතොල හපාගත්තේය. 'මම කළේ වැරද්දක් සුදු නෝනා. අනේ මගේ කොල්ලා.' ඔහු සිතුවේය. භාවනා ජීවන්ට සියල්ලම විස්තර කළේය.

"අදම උසාවි දායි. දොළහට

විතර. මම ගිහින් ඇප දෙනවා. අප්පච්චි එන්න එපා. එයා එහෙම ඉන්නවා බලන්න බෑ. දුකයි. ඔයාට ගොඩක් දුක හිතෙයි. එහෙම එන්න එපා.”

“මම පුතේ ටිකක් දුර ඉන්නේ. මගේ යාළුවෙක්ව මම එවනවා. මගේ කොල්ලා වැරැද්දක් කරන්නේ නෑනේ. ඒකව දෙවියෝ රකිනවා”

“නෑ අප්පච්චි. දෙවියන්ට තිබුණා මෙහෙම නොකර ඉන්න. මගේ විශ්වාසේ අද බිඳුණා. ඔයා ඒ අන්කල්ව එවන්න. මේ නම්බර් එකට කතාකරන්න කියන්නකෝ. මගේ සීයත් දේවක අයියව එළියට ගන්න බලනවා. එයත් දන්නවා දේවක අයියා මේකට සම්බන්ධ නෑ කියලා. ඒත්.”

"මං දන්නවා පුතේ"

ජීවන් ඒ මොහොතේම ක්‍රියාත්මක විය. 'මොනවා නැතත් උඹේ පොඩි කෙල්ල මගේ කොල්ලා වැරදි නෑ කියලා හිතනවනේ මිලින්ද? මට ඒ ඇති.' ඔහු කීවේ ඔහුගේ මස්සිනාටය. භාවනාගේ තාත්තාටය.

"ජීවා බයවෙන්න එපා. මම එක වෙද්දී කොල්ලව එළියට ගන්නවා."

රන්ජන් කීවේය.

"මේ දරුවට ටිකක් කතාකරගෙ නම පලයන් මචං. කෙල්ලත් කොල්ලව එළියට ගන්න ගොඩක් ට්‍රයි කරනවා පොලීසියේ ඉඳගෙන."

ජීවන් භාවනා ගැනද රන්ජන්ට කීවේය.'මලක් වගේ හදපු මගේ කොල්ලවත් එහෙනම් පොලිස් ලකප් එකට දැම්මා.' ජීවන් සිතුවේ

වේදනාවෙනි. ඔහුට සිහිවූයේ භාවනා කියූ කතාවය.'දෙවියෝ ගැන මගේ හිතේ තිබ්බ විශ්වාසේ බිඳුණා අප්පච්චි. දෙවියන්ට තිබුණා එහෙම නොකර ඉන්න' සැබෑය. දෙවියන්ට එහෙම නොකර ඉන්නට තිබුණි.

# 07

පොලිස් සිර මැදිරියේ උන් පැය දෙක තුළදී දේවක බොහෝ දේවල් සිතුවේය. අද සිදුවූ මේ දේ ඔහුගේ සිත තරමක් කම්පනයට පත්කළේය. පොලිස් සිර මැදිරියක පැයක් දෙක තුනක්වත් ඉන්නට වේයැයි දේවක කෙදිනකවත් සිතුවේ නැත. එහෙත් තමාට වඩා බොහෝ වැදගත් පිරිසිඳු මිනිසුන්ට මෙසේ ඉන්නට සිදුවී ඇත.

අරමුණක් කරා යද්දී අම්හිරි

කටුක අභියෝගවලට මුහුණ දෙන්නට වෙන බව ඔහු අසා තිබුණි. දේවකට දුකක් දැනුණේ භාවනා නිසාය. ටිකකට පෙර මේ සිරි මැදිරිය අසළදී ඇගේ දෑසින් ගැලූ කඳුළු ඔහු හොඳින් මතක තබාගත්තේය. මැරෙන මොහොතේදීත් ඒ කඳුළු තමාට සිහිවේයැයි ඔහුට සිතුණි.

"ඔයා හරි බයෙන් ඉන්නේ මම මේ දේවල් නිසා සීගිරි එක දාලායයි කියලා.මං ඔයාගේ ජීවිතේ එච්චරම වැදගත් කෙනෙක් වුනේ කොහොමද කියලා හිතාගන්න බෑ."

භාවනා ටිකකට කළින් ජීවන් විසින් පොලීසියට එවූ රන්ජන් සමඟ දේවක හමුවට ආවාය.

"බයවෙන්න එපා පුතා. අප්පච්චිත් මඟ එනවා. මායි මේ දුවයි දැන්

ලෝයර් කෙනෙක්ව හම්බවෙන්න යනවා.”

රන්ජන් කීවේය.

“කිරි පැකට් එකක් ගෙනාවා දේවකයියේ. බොන්න. අපි ඉක්මනට එනවා. දොළහට උසාවි දාන නිසා ඉක්මනට ලෝයර්ව කතාකරගන්න ඕන. හොඳේ.”

දේවකට ඒ ඇස් යළිත් සිහිවිය.

ඇත්තටම මේ සිදුවූයේ කුමක්දැයි සිතාගන්නට අමාරුය. ගබඩායේ යතුරු තිබුණේ තමා ළඟ නොවේ. භාවනා ළඟය. ඇය ඒවා දැමූ තැනම එහෙමම තැබූ බව ඔහුට විශ්වාසය. එසේ වී තිබියදී වසා තිබූ ගබඩාවෙන් සුවඳ විලවුන් තොගය පන්නා සීගිරි එකෙන් පිටකළේ කෙසේද? එය කළේ කවුද? එසේ කළ අය තමාව මෙයට

සම්බන්ධකර කට උත්තර දුන්නේ ඇයි.? දේවකට මේ සියල්ල අමුණාග න්නට මහ වෙලාවක් ගියේ නැත.

"මේක සීගිරි එකෙන් පැන්නුවේ ඇතුලෙම කෙනෙක්. ඒකට හිතාමතාමයි මගේ නම ගෑව්වේ. එක ගලෙන් කුරුල්ලෝ දෙන්නෙක් බාගත්තා. බලමුකෝ."

පොලිස් සිර මැදිරිය තුළ දේවක ඇරෙන්නට තවත් වූයේ නගරයෙන් අල්ලාගෙන ආ කුඩුකාරයෙකුත් සුළු අපරාධකාරයෙකුත්ය. දේවක ඔවුන් දෙදෙනා දෙසද බලා සිනාසුනේය. තවාව පොලිස් අත් අඩංගුවට පත්වූවා යැයි ඇසූවිට අප්පච්චීට මොනවා සිතෙන්නට ඇත්දැයි දේවක සිතුවේය. 'සමහරවිට අප්පච්චී කියයි ආයේ සීගිරි එකට යන්න එපා

කියලා. එයාට දුකයි මාව සීගිරි එකට යවන්න වුණාට.නවතින්න කියලා කියයි.' එසේ වුවහොත් ගන්නා තීරණය කුමක්දැයි දේවක සිතුවේය.

"එහෙම දාලා ගියොත් මම පරාජය බාරගත්තා වෙනවා. අනික ඔයාට පොරොන්දුවුණා එහෙම යන්නේ කියලා. ඔයාට වෙච්ච පොරොන්දුවක් එහෙම කඩන්න බෑ."

දේවක සිතුවේය. මොනවා කරන්නත් මේ චෝදනාවෙන් නිදහස් වෙන්නට අවශ්‍යය. එය කරන්නේ කෙසේද? තමාට එරෙහිව සාක්ෂි පවා ඇතිවිට නිවැරදිකරු යැයි ඔප්පු කරන්නේ කෙසේද? දේවක දැහ අතේ සිතුවේය. නීතිය හෑද සාක්ෂිය දකින්නේ නැත. එය සාක්ෂියක්

ලෙස අධිකරණයෙන් පිළිගන්නේද නැත. හෘද සාක්ෂිය එකම සාක්ෂිය ලෙස පිළිගන්නේ දෙවියන් පමණය. උසාවියේ දෙවියන් නැත.

දේවක අන්තයටම අසරණ විය. මෙය කළ කෙනා හොඳින් සැළසුම්කර එය කරන්නට ඇත.

"මල්ෂා මට ස්ටෝර්ස්වල කීස් බාරදුන්නේ හදිස්සියෙන් වගේ. එයා මාව ඇදගෙනම ගිහින් ස්ටෝර්ස් පෙන්නුවේ. ගෑණි මට පර්ෆියුම් ස්ටොක් එක විශේෂයෙන් පෙන්නුවා. ඇයි ඒ. මගේ මූණවත් බැලුවේ නැති අය කිසිම ප්‍රශ්නයන් නැතුව මට ඇයි ස්ටෝර්ස්වල කීස් බාරදුන්නේ"

දේවක සිතුවේය.

"මිහිරංගටයි කෝසළටයි මල්ෂාටයි ලොකු ඕනකමක් තියෙනවා

සීගිරි එක අලුතෙන් හදන එක වළක්වන්න. මම මේක බාරව වැඩකරන එකත් එයාලට ලොකු ප්‍රශ්නයක්. ඒත් ඒක උසාවියට කිව්වා කියලා මාව නිදහස් කරන්නේ නෑ. මම මේ පර්ෆියුම් ස්ටොක් එක ගත්තේ නෑ කියලා ඔප්පු කරන්න වෙනවා. අනිත් අතට මේක කවුද ගත්තේ කියලා හොයන්න වෙනවා. මේ මොනවත් කරන්න මම නෑ. මාව දිගටම ඇතුළේ තියාගත්තොත් මේ මොනවත් කරන්න බෑ."

තමාට යළිත් සීගිරි සුපර් එකට යා හැකිදැයි දේවක සිතුවේය. තමාව පොලීසියෙන් අල්ලාගෙන ආවේ මුළු සීගිරි ස්ටාෆ් එකම බලාගෙන සිටිද්දීය.

මේ චෝදනාවෙන් නිදහස්

වෙනතුරු යළිත් සීගිරි එකට යා නොහැකි යැයි දේවක සිතුවේය.

"එහෙම කරන්න බෑ. හොරෙක් කියලා හංවඩු ගැහුවට පස්සේ මට බෑ ආයේ ගිහින් වැඩකරන්න. මට කාගෙන්වත් වැඩක් ගන්නවත් බෑ. ලක්ෂ ගාණක් මගේ අතින් හැඩිල් වුනේ. හොරෙක් කියලා කිව්වට පස්සේ කොහොමද මේවා කරන්නේ"

මොන දේ කරන්නත් මේ චෝදනාවෙන් සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතු බව දේවක පොලිස් සිර මැදිරියේ ඉඳගෙනම සිතුවේය.

"මිනිස්සු හරිම කුහකයි. විසයි. පොලීසිය එන්න කලින් පවා එයාලා මට සෑහෙන දේවල් කිව්වා. මෙහෙම වෙයි කියලා මම හිතුවේ නෑ. මට බෑ භාවනා මිස්ගේ බලය අරගෙන

සීගිරි එකේ වැඩකරන්න. එයා මට විශේෂත්වයකින් සළනවා කියලා හිතලා සීගිරි එකේ වැඩකරන්න බෑ. මම මේ චෝදනාවෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වෙන්නෝන. ඒත් කොහොමද?"

එයට මඟක් දේවකට සිහිවෙන්නේ නැත.

# 08

මිලින්ද කතාකරද්දී භාවනා උන්නේ උසාවියේය. පොලීසියෙන් ගෙන ආ සැකකරුවන් අතර දේවකද උන්නේය. ඔවුන්ව එහෙමම උසාවියේ පසෙක වූ සිර රැඳවුම් කුටියක තබනු ලැබීය. භාවනා සියල්ල දරාගෙන අන්නේ දැඩි දුකකිනි.

මිලින්ද කතාකළේ උසාවියේ වැඩ යළිත් පටන් ගන්නා තුරුය. ඇය උන්නේ ජීවන් දේවකට ඇප දෙන්නට

එවූ රන්ජන් සමඟය. කෙල්ල තමාව හඳුනා නොගන්නා බව ජීවන්ට විශ්වාසය. තමාගේ පින්තූරයක්වත් සීගිරි පවුල සතුව නැත. එහෙත් උසාවියට රඹුක්වැල්ල පවුලේ කිසිවෙකු එන්නට පුළුවන. ඒ කවුරු ආවද ඔවුන් තමාව හඳුනාගන්නා බව ජීවන්ට විශ්වාසය.

එසේ වෙනවා දකින්නට ඔහු කැමති වූයේ නැත.

"සුද්දි කොහෙද ඔය ඉන්නේ."

මිලින්ද ඇසුවේ තරමක කේන්තියකිනි. භාවනා උසාවියේ බව මිලින්ද දැනගත්තේ සුරංගිගෙනි. සුරංගිව ඇවිලෙව්වේ මිහිරංගය. ඔහු උසාවියට නාවද හැම දෙයක්ම බලාගෙන කියන්නට ඔත්තුකරුවෙක් එවා තිබුණි.

"මම තාත්තා මේ. මේ."

භාවනා ගොතගැසුවාය.

"කියනවා සුද්දි. කොහෙද ඉන්නේ."

"මේ උසාවියට ටිකකට ආවා තාත්තා. මේ."

ඇය අමාරුවෙන් කීවාය.

"උසාවියේ ඔයා මොනවද කරන්නේ. ආ. ලැප්ප නැද්ද?"

මිලින්ද කෑ ගැසුවේය.

"මම තාත්තා."

"දැන් ඔයාද ඔය කොල්ලට ඇපදෙන්න යන්නේ. සීගිරි එකේ මිනිස්සු මොනවද එතකොට කියන්නේ."

මිලින්ද ඇසුවේය. භාවනා හුස්මක් ඉහළට ගත්තාය.

"දේවක මේක කළේ නෑ තාත්තා. මං යටතේ එයා ඉන්නේ. මම කොහොමද මෙහෙම කරන්නේ. මේක මොකක්හරි කුමන්ත්‍රණයක්"

භාවනා කීවාය.

"තාත්තා."

භාවනා කතාකළේ මෘදුවය.

"එහෙම කරන්න බෑ තාත්තේ. එයා අවංකව මේක හදන්න කැපවුණේ. මං ඒක දැක්කා. ස්ටෝර්ස්වල කීස් තිබුනේ මම ගාව. මම මේ කොල්ලට අද ඇප දෙන්න ආවේ නැත්නම් මම කොහොමද මගේ හිතට උත්තර දෙන්නේ. දේවක හරියි කියලා මම දැනගෙනත්."

මිලින්දට පුදුම සිතුණි.

"දැන් ඔය කොල්ලට ජජ් ඇපදුන්නේ නැත්නම්."

"එහෙම නොදී ඉන්න බෑ තාත්තා. මේ කොහෙද යන ෂොප් කාරයෙක්ගේ සාක්ෂියක් උඩ කෙනෙක්ව රඳවගෙන ඉන්න බෑ. ඒකයි නීතිය. මට පැයක් දෙන්න තාත්තා. ඊට පස්සේ මම සීගිරි එකෙන් ඕනනම් අයින්වෙලාම ගෙදර ඉන්නම්."

භාවනා කීවාය. මිලින්ද කතාකළේ නැත. ඈ සමඟ මේ වෙලාවේ තර්ක කරගෙන යන්නට මිලින්ද කැමතිවූයේ නැත. එක අතකට ඇය කියන කතාව ඇත්තය. ද්‍රේවක සේවය කළේ භාවනා යටතේය. තමා යටතේ ඉන්නා සේවකයෙක්ට කරදරයක් වූ විට මඟහරින්නට හොඳ නැත. එහෙත් ද්‍රේවක එල්ලවී ඇති චෝදනාවද සුළු පටු නැත. එය සීගිරි එක සම්බන්ධ බරපතල ප්‍රශ්නයකි.

මිලින්දට නේත්‍රා කතාකළේ ඒ මොහොතේමය. නේත්‍රා කතාකරද්දීම මිලින්ද එක දෙයක් දැනගත්තාය.'කෙල්ල අක්කට කියන්න ඇති මට කතාකරන්න කියලා.'

"තාත්තා."

නේත්‍රා කතාකළාය.

"කියන්න ලොකු දූ."

"කෙල්ලට අරම කතාකරන්න එපා. මෙතන වෙන ප්‍රශ්නයක් යන්නේ. ඒකා එහෙම කොල්ලෙක් නෙමෙයි. මමත් ඇපවෙනවා ඒකා වෙනුවෙන්. මේ වීල් චෙයාර් එක නැත්නම් මාත් අද උසාවියේ."

නේත්‍රා කීවාය. මිලින්දට පුදුම සිතුණේ දේවක ගැනය. 'මෙච්චරම බැඳීමක් මේ අක්කලා නංගිලා එක්ක

හදාගන්න මේ කොල්ලා දක්ෂ වුනේ කොහොමද' ඔහු සිතුවේය.

"උසාවිය කියන්නේ ලස්සන තැනක් නෙමේ ලොකු දූ."

"දන්නවා තාත්තා.මේ ලෝකේ කරන්න තියෙන්නේ ලස්සන දේවල්ම නෙමේ තාත්තා. අපිරිසිඳු කුහක පව්කාර මිනිස්සු එක්ක. මේ කොල්ලා පව්. මාව ලබන සතියේ පේරාදෙණියේ එක්කගෙන යන්න ඇඟිලි ගැනපු කොල්ලා. මංනේ දන්නේ ඒකා මාව උස්සගෙන ගිය හැටි. මල්ලි කෙනෙක් උන්නානම් ඒකවත් කරන්නේ නෑ එහෙම. කෙල්ලට පැයක් දෙන්න."

ඇය කීවාය.

"ඔච්චරම මේ කොල්ලා ගැන ඇපවෙන්න පුළුවන්ද ඔයාලට."

මිලින්ද ඇසුවේය.

"සමහරුන්ට තාත්තා කොහොමටවත් බෑ. ඒත් මේකා වෙනුවෙන් පුළුවන්. කෙල්ල පොඩි එකී කියලා පැත්තක තියන්නකෝ. මම මේ එහෙම කෙනෙක්ද? මේ ලෝකේ ඉන්න තරමක් නරක පිරිමි දැකපු මම."

නේත්‍රාගේ තර්කය ඉදිරියේ මිලින්ද අසරණ විය.

"ඉක්මනට එන්න කියන්න. එයා තාම පොඩි කෙල්ලෙක්."

මිලින්ද කීවේය.

"මං කියන්නම්. සොරි තාත්තා."

නේත්‍රා සමාව ඉල්ලුවාය. මිලින්ද තනිවම සිනාසුනේය.

# 09

භාවනාත් රන්ජනුත් ඇල්ලුවේ උසාවියේ නඩු කතාකරන දක්ෂම නීතිඥයාවය. ඒ නිසා දේවකට ඇප ලැබුණි. ඇප කොළවලට අත්සන් කර දේවක උසාවියෙන් පිටතට ආවේ භාවනාත් රන්ජනුත් සමඟය. භාවනා ජීවන්ට කතාකළේ දේවක පිටතට ආ පසුය.

"අප්පච්චි අපි දේවකයියව එළියට ගත්තා."

ඇය ඇඬුම්බරව කීවාය.

"ඔයාට පින් පුතේ."

ජීවන් එහෙමම කීවේය. ඒ කතාවට ඇයගේ දෙනෙත් යළිත් තෙත්විය.

"අද ඇප ගත්තා වගේම එයාව අපි මේ චෝදනාවෙනුත් නිදහස් කරනවා අප්පච්චි. ඔයා බයවෙන්න එපා. දේවක ගැන කවුරු නැතත් මම දන්නවා."

මේ වචන දේවක එහෙමම අසාගෙන උන්නේය. භාවනා දුරකථනය දේවකට පෑවාය.

"මට ඇප දුන්නා අප්පච්චි."

ඔහු අසරණව කීවේය.

"මට සමාවෙන්න පුංචි මහත්තයෝ."

අප්පච්චි එහෙම කියන්නේ ඇයිදැයි දේවක දැනගෙන උන්නේය.'ඔයා හිතනවා ඇති ඔයාගේ

කීමට මම සීගිරි එකට ගිය නිසයි මේ ඔක්කොම කියලා.එහෙම නෑ අප්පච්චි.’ දේවක සිතින් කීවේය.

“ටිකක් වේලාසන එන්න මහත්තයෝ.”

“හොඳයි අප්පච්චි.”

දේවකත් භාවනාත් උසාවියෙන් පිටතට ආවේ රන්ජන්ද සමඟය.

“බයවෙන්න එපා පුතා. කම්පනියක වැඩකරද්දී මේ වගේ දේවල් වෙනවා. ඒවා දරාගන්න පුරුදුවෙන්න. අනික කොල්ලෙක්ට පුතා ජීවිතේ එකපාරක් හරි නඩුවක් වැටෙන්න ඕන. මොන නඩු දාගත්ත් කමක් නෑ කවදාහරි දික්කසාද නඩුවක් දාගන්නේ නැතුව.”

රන්ජන් සිනාසී කීවේය.

“ඇයි අන්කල් එහෙම.”

“මේ මම පේන්නේ නැද්ද පුතා.

බැඳලා අවුරුදු දෙකෙන් අපි දෙන්නා දික්කසාද වුනා. දැන් අවුරුදු දාහතරක් වෙනවා. දැනුයි තේරෙන්නේ ඒ ගෑණි විතරයි මට ආදරේ කළේ කියලා. අපරාදේ."

දේවක භාවනා දෙස බැලුවාය. 'ඉතින් මොකද මගේ මූණ දිහා බලන්නේ' ඇය සිතින් කීවාය.

"මම එහෙනම් යනවා පුතා. යනවා දුව. මම ගිහින් අප්පච්චිට විස්තරේ කියන්නම්."

"හොඳයි අන්කල්. හවසක බත් කටක් කාලා යන්න එන්න අන්කල්."

"එනවා පුතා. යන්නම් පුතා"

භාවනාත් දේවකත් උසාවිය ඉදිරිපට රූස්ස මැයි මාර ගස පාමුළ තනිවිය. භාවනා ඔහු දෙස බැලුවේ යටිතොල හපාගෙන මෙන්ය.

"චුට්ටක් මාත් එක්ක තැනකට යන්. මී."

දේවක හිස වැනුවේය.

*** *** *** *** ***

භාවනා රජමහා විහාරය ළඟින් බැස තනිවම ආවාය. දේවක ආවේ ත්‍රී විලරයකිනි.

"එන්න."

ඇය තෙල් මල් කිසිවක් නොමැතිව පන්සලට යමින් කීවාය. දේවක අසරණව ඇය පසුපස ආවේය.

"මම ඔයාව අරන් යද්දී බාරයක් වුණා. රිමාන්ඩ් එකෙන් එළියට ගත්තට පස්සේ ඔයා එක්කගෙනම බාරේ ඔප්පු කරන්න එනවා කියලා."

භාවනා කීවාය. දේවක අදහාගත

නොහැකිව මෙන් බලාගෙන උන්නාය.

"ඇයි ඔහොම බලන්නේ. මී."

"මම සුද්දි."

"සුද්දි තමයි බාරේ වුනේ. එන්න දැන් ඉතින්."

ඇය කීවාය. දේවකට ඇය ගැන තවමත් පුදුමය.'මේ දහසක් දුක් කරදර මැද්දේ ඔයා වගේ කෙනෙක් ළඟ මට ඉන්න ලැබුනනේ. ඒකම ඇති.' ඔහු සිතුවේය.

"මේක පූජ කරන්න. ඒ ඇති. අලුත් සමාධි පිළිමය හදන්න ආධාරයක් කරනවා කියලා බාරවුනේ. හරි හාස්කම්. පිළිමේ හදන්නත් කළින්."

ඇය කීවාය. භාවනා දේවක අත තැබුවේ රුපියල් තුන් දහසකි. මේ වෙලාවේ කෙල්ලගේ අතෙත් තියෙන්නේ එච්චරය.

"සුද්දි පව්."

ඔහු කීවේය.

"පව් තමයි."

ඇය මුමුණා මෙන් කීවාය. පසුව සිනාසුනාය. අද හදවත කම්පනයට පත්වූ දවසකි.

"පිළිමේ හදලා ඉවරවුණාම එමු. ධාතු තැන්පත් කරන්නේ ලබන පෝයට. මං එන්න ඉන්නේ."

"මාත් එන්නම් සුද්දි."

"ම්."

බාරය ඔප්පු කළ පසු දෙදෙනාම මළුවේ ඇවිදගෙන ආවේ නිස්කලංකයේය.

"සුද්දි."

හදිස්සියේම මෙන් දේවක භාවනාගේ අතකින් අල්ලාගත්තේය. ඇත්තටම ඔහුට ඇයගේ අත

ඇල්ලිණ. භාවනා පුදුමයෙන් බැලුවාය. ඔහුගේ අත වෙව්ලන බව ඇයට විශ්වාසය.

"ඇයි දේවකයියේ."

භාවනා ඇසුවාය. දේවක ඇය දෙස මොහොතක් බලාගෙන උන්නාය. 'මේ හදිස්සියේ ඔයා මොනවාහරි මට කියන්න යනවද' ඇය සිතුවාය.

"ඇයි කියන්නකෝ. බයකරනවනේ. මොකක්ද වුනේ. මොනවද ඔය මතක් කරන්නේ."

ඇය ඇසුවාය.

"සී සී ටී වී කැමරාස් සුද්දි."

දේවක වෙව්ලමින් මෙන් කීවේය.

"ඇයි. ඒවා ගැලෙව්වනේ. නැත්නම් අපරාදේ ඒවලින් බලාගන්න තිබුනා."

ඇයගේ අත අල්ලාගෙන උන් ඔහුගේ අත තදවිය.

"නෑ සුද්දියේ ඒවා ගැලෙව්වේ නෑ. බජට් එක ඕවර් ගිය නිසා මම ඒවා එහෙමම තියන්න කිව්වා. ලයින් ඩිස්කනෙක්ට් කළේ නෑ. සීලින් එක ගලවන්නෙත් නෑ කියලා තීරණය කළානේ. ඒ නිසා."

භාවනා කෙළ පොදක් ගිල්ලාය.

"හොඳට මතකද?"

"ඔව් සුද්දි."

ඔහු කීවේය.

"මොන ගොන් බූරුවෙක්ද පිස්සෝ. පොලීසිය අල්ලගෙන යන වෙලාවේ ඒක කියන්න එපැයි. රිමාන්ඩ් එකෙත් ඉඳලා උසාවියෙන් ඇපත් ගත්තට පස්සෙද ඒක මතක් වුනේ. මෝඩයා පිස්සා. කොච්චර පිච්චුණාද කියලා දන්නවද? ගොන් හරකා"

ඇය හැම සතෙක්ගේම නම්

කියා දේවකට බැන්නාය. දේවක ඒ බැණුම අසාගෙන උන්නේ අනාගතයේ සිටය. ඔහු ඇස් අයාගෙන උන්නේය. මේ බණින්නේ කවුද? ඔහු සිතුවේය.'කොච්චර පිච්චුණාද කියලා දන්නවද ගොන් හරකා' මේ වචන. දේවක සිත කැළතිණ.

"මමට සුද්දි."

"මට මට ගගා ඉන්නේ නැතුව එන්ඩ යන්න. මොන පිස්සෙක්ද මේ. එන්ඩ. ඉතුරු කරන්නේ නෑ මම උන්ව."

භාවනා වේගයෙන් ඉදිරියට ආවාය. දේවක තවමත් ඉන්නේ ඇගේ අත අල්ලාගෙනය.

"දේවකයියේ."

ඇය නැවතී කතාකළාය.

"සුද්දි."

ඔහු උගුරෙන් මෙන් ඇසුවේය.

"මගේ අත අයියේ. අතාරිනවද නැත්නම් අල්ලගෙනම යනවද?"

ඇය ඇසුවාය. දේවක ලැජ් ජාවෙන් සිනාසුනේය. පසුව අත ලෝබකමින් මුදාහැරියේය. 'ඔයාගේ අතත් අල්ලගෙන ඉඳලා' ඔහු සිතින් කීවේය.

දෙදෙනාම පන්සලෙන් පිටතට ආවේ බිම බලාගෙන සිනාසෙමිනි. 'මං කිව්වේ ඕනනම් අත අල්ලගෙන යන්ඩ කියලනේ. මෝඩයෙක්ම තමයි. හරක් රැළක්.' ඇය තනිවම සිනාසෙමින් සිතුවාය.

"ඉක්මනට යන්. ගිහින් සීසීටීවී රෙකෝඩර් අදිමු. යන්."

ඇය කිවාය.

"මම සුද්දි."

ඇය මොහොතක් නතරවූවාය.

"දේවකයියේ."

"සුද්දි."

"එපා. ඔයා ඔහොමම ගෙදර යන්න. මම සීසීටීවී රෙකෝඩර් අදින්නම්. අද රෑ එළිවෙනකල් ඉඳලා හරි මම ඒක බලාගන්නම්. අයියා යන්න. මම හෙට එන්න ඕන වෙලාව කියන්නම්. රෑට ගන්නම්. දැන් එන්න එපා. එහෙම සීගිරි එකට පයතියන්න එපා. එහෙම වෙන්න බෑ."

තමා සිතූ දේ ඇයට තේරුණේ කෙසේද?

"කමක් නැද්ද සුද්දි."

ඇය සිනාසුනාය.

"ගෙදරම යන්නහොඳද?"

"හොඳයි සුද්දි."

"වෙන කොහේවත් යන්නේ නෑ නේද?"

"නෑ. ගෙදරම යනවා."

ඇය සිනාසුණාය. පසුව දෙන්නාම එකටම පාර පැන්නෝය.

"තරහද"

ඇය ඇසුවාය.

"මොකටද සුද්දි."

"සත්තු වත්තේ ඉන්න ඔක්කොම සත්තුන්ගේ නම් කියලා බැන්නට."

ඇය ඇසුවාය. ඔහු සිනාසුනේය.

"එච්චරම කවුරුවත් බැණලා නෑ තමයි."

ඔහු කීවේය.

"ඉතින්."

"නෑ ඔය කොල්ලෝ කියන්නේ. තල් අත්තට ගල් ගහනවා වගේ බණිනවා කියලා. මම බැලුවා කවුරුවත් මට

එහෙම බැණ්නේ නැත්තේ ඇයි කියලා."

දේවක එහෙමම කීවේය. භාවනා ඇස් ලොකුකරගත්තාය. ඒ කියූ කතාවේ තේරුම කුමක්ද?

"කවුරුද කොල්ලන්ට එහෙම බනිනවා කියන්නේ. ආ දේවකයියේ."

දේවක එයට උත්තර දෙන්නට ගියේ නැත. ඇය රැව්වාය.

"පරිස්සමින් යන්න."

ඇය උගුරෙන් මෙන් කීවාය.

# 10

"ඉක්මනට යන් අන්කල්."

ඇය රියදුරුට කීවාය. සීසීටීවී කැමරා උපාංගවලට කිසිවෙක් අත තබා තිබුනොත් ඉඳලා වැඩක් නැත. දේවකව මේ චෝදනාවෙන් ගලවාග න්නට ඇති එකම මාර්ගය එය පමණී. ගබඩාවේ ඉදිරිපස දොරට මෙන්ම පිටුපස දොරටද සිසීටීවී සවිකර ඇත.

දේවක හැමෝටම කීවේ සීසීටීවී

ගැලෙව්වා කියාය. තමා පවා දැනගෙන උන්නේ ඒවා ගලවා ඇති බවය. එහෙත් ඔහු ඒවා ගලවා නැත. ස්ටෝර්රුවට ඇතුල්වූ හොරා පවා සිතාගෙන ඉන්නට ඇත්තේ සීසීටීවී කැමරා උපාංග ගලවා ඇති බවය.

"යන්කෝ අන්කල්."

ඇය රියදුරුව ඉක්මන් කළාය. භාවනා උන්නේ පුදුමාකාර හදිස්සියකිනි. හැකි ඉක්මනට සීසීටීවී කැමරා රෙකෝඩර් පරීක්ෂාකර පොලිස් ඉන්ස්පෙක්ටර්වරයාට කතාකළ යුතුව ඇත.

ඔහු අවංක පොලිස් නිළධාරියෙකැයි භාවනාට සිතෙයි.

"අක්කා."

භාවනා මඟදීම නේත්‍රාට කතාකළාය.

"සුද්දි දේවක."

"එයාව එළියට ගත්තා. මං ඇවිත් විස්තර කියන්නම්. සීසීටීවී යුනිට් තියෙන රූම් එක ලොක් කරන්න අක්කා. දැන්මම. කාටවත් ඇතුලට යන්න දෙන්න එපා. මම දැන් එනවා."

"ඒත් සුද්දි"

"කියන දේ කරන්නකෝ අක්කා."

භාවනා කීවාය.

ඊටත් විනාඩි කිහිපයකට පසු භාවනා කඩාගෙන සීගිරි එකට ආවාය. සීගිරි එකේ සියල්ලන්ම ඇය දෙස බැලුවෝය. භාවනා ඒ කිසිවෙක් දෙස බලන්නටවත් ගියේ නැත. 'ඔයාලා එක්ක බේරගන්න වෙනම ගනුදෙනුවක් තියෙනවා. එතකල් මම එක්කෙනෙක්ගේවත් මූණ බලන්නේ නෑ.' භාවනා සිතාගත්තාය.

"මිස්"

අනු දුවගෙන ආවාය. ඇය ආවේ දේවක ගැන අසන්නටය.

"දීලා තියෙන වැඩේ කරන්න අනු. මට හදිස්සියි."

භාවනා ඇය දෙසවත් නොබලා කීවාය.

භාවනා කෙළින්ම ආවේ සීසීටීවී කැමරා වල ප්‍රධාන මෙහෙයුම් උපාංගය තබා ඇති තැනටය. එහි කොළ පැහැගත් බල්බය හොඳින් දැල්වෙයි. 'ඒ කියන්නේ තාම වැඩ. මාරයි' ගලවා ඇත්තේ සීසීටීවී කැමරා සම්බන්ධකළ මොනිටර් පමණි. 'මොනිටර් ටික ඕෆ් කරලා නිසා හැමෝම හිතන්නේ කැමරා වැඩ නෑ කියලා. මේකා ගොන් පිස්සෙක්.' ඇය තනිවම

සිතුවාය.

නේත්‍රා රෝද පුටුවත් කරකවාගෙන කාමරයට ආවාය.

"දොර වහන්න අක්කා."

භාවනා කීවාය. කෙල්ලගේ මේ හැසිරීම නේත්‍රාට පුදුමය.

"මොකක්ද වුනේ කියන්නකෝ බබා"

භාවනා නේත්‍රාට සියල්ල විස්තර කළාය.

"අනේ කොල්ලට බනින්න එපා. ඒකා බයවුණා. පොඩි කොල්ලෙක්නේ. ඒකයි."

නේත්‍රා කීවාය.

"මං හොඳටම බැන්නත් එක්ක. ගොන් හරකා බූරුවා පිස්සා මෝඩයා ඔක්කොම කියලා බැන්නා."

භාවනා කීවාය.

"ඒකා ඒවා හිතන්නේ නෑ."

නේත්‍රා කීවාය. භාවනා බැලුවාය.

"නෑ එයා ඒක හිතනවා. එහෙම කවුරුවත් බැණලා නෑලු."

භාවනා කීවාය. නේත්‍රා සිනාසුනාය.

"අම්මා හිටියානම් එහෙම බණියි. කොල්ලන්ට බනින්නේ එහෙමනේ."

"ඊට පස්සේ."

"ඊට පස්සේ ඉතින් කෙල්ල. ඊටත් පස්සේ වයිෆ්."

"එහෙම බනිනවද මහත්තයට."

ඇය ඇසුවාය.

"ම්. බණිනවා. ආදරේට."

"ම් මටත් ඇහිලා තියෙනවාතෝ මාව කෑවා මිනිහෝ කියනවා."

නේත්‍රා කෙල්ලට ගැසුවාය.

"මට බොන්න මොනවාහරි අක්කා. හරි පිපාසයි. අද රෑ දොළඹ වෙනකල් ඉඳලා හරි මේක අදිනවා. තත්පරෙන් තත්පරේ බලනවා. බලන්නකෝ."

නේත්‍රාට ඇය ගැන පුදුම නැත.

භාවනා දේවකට ගත්තේය.

"මේක වැඩ. මොනවද කරගත්තේ. මතක් වුනේ නැද්ද?"

ඇය ඇසුවාය. දේවක කතකළේ නැත.

"දේවකයියේ."

ඔහුගෙන් කතාවක් නැති තැන ඇය යළිත් කතාකළාය.

"ම්."

"ඇයි කතානැත්තේ."

භාවනා ඇසුවාය.

"මම මේ බණිනකල් උන්නේ."

ඔහු කීවේය. ඇය රෙකෝඩ්වී ඇති මෙනුව ඔස්සේ පිටුපසට ගියාය.

"බැන්න එක ඇයි එච්චර හිතන්නේ."

ඇය ඇසුවාය.

"බැන්න එක හොඳයි. මගෙත් මෝඩකම. සුද්දි මෙනූ එකට ගියාද?"

"මේ ගියා. මට අද රෑ වෙනකල් ඉන්න වෙයි. ෆාස්ට් රිවයින් දාන්න බෑ. තත්පරෙන් තත්පරේ බලනවා. මේක වුනේ රෑද දවල්ද කවදද කියලා දන්නේ නෑනේ."

ඇය කීවාය.

"මං සුද්දි රෑට එන්නද"

"බලමු. මං කතාකරන්නම්කෝ. මොනවාහරි කන්න දැන්."

ඇය කීවාය.

"මේ දැන් ගෙදර ආවා සුද්දි."

"ටිකක් මහන්සි අරින්නකෝ. වෙච්ච දේ ගැන හිතන්න එපා."

"ම්. මට දුක සුද්දි ගැන."

"ඒ ඇති මට"

ඇය මුමුණා මෙන් කීවාය.

භාවනා ඇගේ ඇඟිලි තුඩු වේගවත් කළාය. මේ සිදුවූ දේ පුදුමය. උදේ දේවකව පොලිසීයට අල්ලාගෙන ගිය තැන සිට උන්නේ ඇත්ත තමාමද කියා භාවනා සිතුවාය.

"ඔයා එක්කම පොලිස් ජීප් එකේ නැඟලා ගියේ මමමද? අරම ඉන්ස්පෙක්ටර් එක්ක තර්ක කරගෙන ගියේ. පස්සේ ලෝයර්ස්ලා හොයන්න ගියේ. උසාවියට එළියෙන් විතරක් දැකලා තිබ්බ මම කොහොමද ඒක

ඇතුළටම ගිහින් ඔයාව නිදහස් කරගත්තේ. ඔයාට ඇප දීලා ගත්තේ මමමද? එහෙම වුනේ කොහොමද? මං එච්චර කෙනෙක් නෙමේනේ. ඒත් ඇයි මේ. තාත්තට අම්මට පුදුම හිතෙන එක අහන්නත් දෙයක්ද?"

භාවනා තනිවම සිතුවාය.

ඇය සීසීටීවී හී පටිගත වී තිබූ දර්ශන නරඹන්නට ගත්තාය. සීසීටීවී එකක මේ දර්ශන පටිගතවන්නේ එයට අදාල දිනයත් වෙලාවත් සමඟය. කිසිවෙක්ට ඒවා වෙනස් කළ නොහැක. ඒ නිසා සීසීටීවී දර්ශන ඕනම නඩුවකදී සත්‍ය සාක්ෂි ලෙස අධිකරණය පිළිගනී.

භාවනා සීසීටීවී දර්ශන නරඹන්නට ගත්තේ මල්ෂා විසින් ස්ටෝර්රූවේ යතුරු දේවකට බාරදුන්

දිනයේ සිටය. ඒවා ලස්සනට සීසීටීවී දර්ශනවල පටිගත වී ඇත.

නේත්‍රා කෙල්ලට චොකලට් කේක් කෑල්ලක් සමඟ තේ එකක් අරගෙන ආවාය. ඇය ඒවා සේවිකාවක් අතේවත් එව්වේ නැත. කෙල්ල මේ මොහොතේ කරන දේ කිසිවෙක් දැනගත යුතු නැත.

"අනේ ඔයාම අරන් ආවද?"

"මේක ටිකක් ඉහිරුණා බබා."

භාවනා අක්කා දෙස දයාබරව බැලුවාය. නේත්‍රා සිනාසුනාය.

"එයා පොලිස් ලකප් එකේ යකඩ කූරු අල්ලගෙන බලාගෙන හිටපු හැටි අමතක කරන්න බෑ අක්කා පව්. මේ චෝදනාවෙන් දේවකව නිදහස් කරන්නෝන. මම ඒක කරනවා. එතකල් එයාට සීගිරි එකට එන්නත්

එපා කිව්වා මම. මුන් මහ කැත මිනිස්සු"

ඇය කීවාය.

"මේ ලෝකෙම එහෙමයි බබා. මිනිස්සු ගැන කතාකරලා තේරුමක් නෑ."

"එයාගේ අප්පච්චිට මම පොලිසියේදී කතාකළා. හරිම හොඳ අන්කල් කෙනෙක්. හරිම හොඳයි."

කෙල්ල ඉන්නේ දෙදරාගිය හදවතින් බව නේත්‍රා දනී. මේ හැම වේදනාවක්ම යට ඇත්තේ කුමක්දැයි ඇයට දැන් සැඟවිය නොහැක.

එහෙත් දේවකත් තම සොයුරියත් එහෙම බැඳීමක් ගැන කතාකර නැති බව නේත්‍රා දැනගෙන උන්නාය. කතාකර හදාගන්නා බැඳීම්වලට වඩා ඉබේ හැදෙන බැඳීම් ශක්තිමත්ය.

"මම ඔයා කිව්ව විදිහට මේ වැඩකරන අයගේ වැඩ බැලුවා."

"හෙට ඉඳලා දේවකම ඇවිත් ඒවා බලයි. එයාට තරම් ලස්සනට ඒවා කරන්න මටත් බෑ."

"ඒත් බබා."

"එයාව මම නිදහස් කරනවා. අද මේ රෙකෝඩර් එක මම ගෙදර අරන් යනවා. මොනිටර් එකත් එක්කම. ස්ටාෆ් එකට පේන්න අරන් යන්න බෑ. එයාලා යනකල් ඉන්න වෙනවා."

භාවනා සිතාගෙන උන්නේ ගෙදර ගොස් රෑ එක දෙක වෙනතුරු හෝ මේවා නරඹන්නටය. එය ලේසි දෙයක් නොවේ. පැය හැත්තෑදෙකක දර්ශන පැය හත අටකදී නැරඹීම පහසු දෙයක් නොවේ.'මම ඇයි මෙච්චරම ඔයා ගැන වදවෙන්නේ.

කියන්න තේරෙන්නේ නෑ දේවකයියේ.'

මේ විසඳන්නට යන්නේ දේවකගේ දෛවයද? නැත්නම් සීගිරි හී දෛවයද? ඒත් නොවේනම් තමාගේ දෛවයද? මේ සියල්ල එකට බැඳී ඇතැයි භාවනාට සිතෙයි.

"ඔයාවත් ළඟ තියාගෙන තේ එකක් බිබී මේක බලන්න තිබ්බානම් කියලා දැන් මට හිතෙනවා. මේක ඇත්තටම වසංගත ලෙඩක්. මහ පුදුම දේවල් මට හිතෙන්නේ."

මේ ඇතිවෙන හැඟීම් කොහෙන් කෙළවර වේවිදැයි දන්නේ නැත. අද පන්සලේදී තමාගේ මුවින් පිටවුණු කතාව ඇය සිහිකළාය. 'මගේ අත අතාරිනවද නැත්නම් අල්ලගෙ නම යනවද දේවකයියේ' එය

සිහිවී ඇය සිනාසුනාය.'මෝඩයා. එහෙමම අල්ලගෙන යන්නේ නැතුව අතෑරියා. ඔයා උන්නේ බයවෙලා.' ඒ විනීතකමට ඇය ආසය.

ඔහු වැනි කොල්ලෙක්ව ආයේ පෙරලා ගන්නට අවශ්‍ය නැතැයි භාවනාට සිතෙයි. බොහෝ කොල්ලන්ව එහෙම පෙරලා ගන්නවත් අමාරුය. එහෙම පෙරද්දී ඔවුන්ගේ ජීවිතයම පෙනේරයේ රැඳෙයි.'ඒ තරමට රොඩු' ඇය සිතුවාය.

# 11

වෙලාව රාත්‍රී දහයය. භාවනා උන්නේ කාමරයේ තනිවමය. ඇය ඇඳ අද්දරටම කුඩා ටීපෝවක් ඇදගෙන ඒ මත සීසීටීවී සම්බන්ධකළ රෙකෝඩරයත් එහි මොනිටරයත් තබාගත්තාය. සමහරවිට අද රෑ නිදාගන්නට ලැබෙන එකක් නැත. ඒ ගැන භාවනාට කිසිම දුකක් නැත.

කිරි පැකට් දෙක තුනකුත්

චොකලට් බිස්කට් පැකට් එකකුත් පමණක් තබාගෙන ඇය වැඩ පටන් ගත්තාය. නේත්‍රා පැය දෙකක් පමණ කෙල්ල ළඟට වී උන්නාය. කෙනෙක්ගේ නිර්දෝෂීභාවය වෙනුවෙන් තවත් කෙනෙක් මේ තරම් වදවෙනවා නේත්‍රා දැක නැත. ඒ අතින් තමාගේ සොයුරියගේ උතුම් ගතිගුණ ගැන ඇය සතුටු වූවාය. 'මේ පුංචි කෙල්ල ඇතුලේ මේ තරම් ශක්තිමත් කෙල්ලෙක් ඉන්නවා කියලා මම හීනෙකින්වත් හිතුවේ නැහැ. කෙල්ලෙක්ව මෙහෙම ශක්තිමත් කරන්නේ ආදරයද?' නේත්‍රා සිතුවාය. එය ඇත්තනම් කෙල්ලෙක්ව දුර්වල කරන්නේත් ඒ ආදරයමය. හොඳම උදාරහරණය තමාගේ ජීවිතයය.

නේත්‍රා හැමදාම පතන එක පැතුමක් ඇත. ඒ තමාට මුහුණ

දෙන්නට වූ අපුල දුක තමාගේ සොයුරියන් දෙදෙනාට විඳින්නට වෙන්න එපා කියන කියාය. එය ඒ තරම්ම අප්පිරිය දුකකි.

තාරකා ගැන ඇයට බයක් නැත. ඇයට මේ සමාජය ගැන හොඳ අබබෝධයක් ඇත. නේත්‍රා තැවුනේ ඇගේ බාල සොයුරිය ගැනය. එහෙත් ළඟකදී සිට ඇයට ඒ බිය දැනෙන්නේ නැත. ඒ ඇයිදැයි ඇය සිතන්නට ගියේ නැත.

"කිසිම හැල හොල්මනක් නෑනේ බබා."

නේත්‍රා මොනිටරය දෙස බලාගෙන කීවාය.

"මේ තාම දවල් අක්කා. බලමුකෝ. අක්කා ගිහින් නිදාගන්න."

නේත්‍රා නිදාගන්නට ගියේ තවත්

පැයක් පමණ කෙල්ල ළඟට වී සිටය. භාවනා රෑ ඇඳුම පමණක් ඇඳගෙන කොට්ටයක්ද පපුවට ගෙන ඇඳට වී මොනිටරය දෙස බලාගෙන උන්නාය.'ඔයා මොනවද දන්නේ නෑ කරන්නේ.තව ටිකකින් කතාකරයි' භාවනා සිතුවාය. එහෙම දැනෙන්නේ ඇයිදැයි භාවනා දන්නේ නැත. එහෙත් බොහෝ විට සිතෙන දේ වෙයි.

ඉඳි ආප්ප කැවුණා වැඩිද කියාත් භාවනා සිතුවාය. ඕනවට වඩා කෑ විට නිදිමත එයි. පරිප්පු තෙම්පරාදුවේ රසට වශීවී ගොස් භාවනා ඉඳි ආප්ප ටිකක් වැඩිපුර කෑවාය. දැන් දෑස් පියවෙන්නට මෙන් එයි.

තව ටිකකින් ගොස් ඇඟ සෝදාග

න්නවා කියා ඇය සිතාගත්තාය. එවිට නිදිමත යනු ඇත.

එහෙම හිතා විනාඩි දෙක තුනක්වත් ගියේ නැත. දේවක ගත්තේය.

"මං මේ දැන් මතක් කළා විතරයි."

"ගොන් හරකා ගෙදරට වෙලා සැපට ඇති. මං මේ සීසීටීවි ඇදගෙන නානවා කියලා හිතුවා නේ."

දේවක විහිළුවට කීවේය. භාවනාට දුක සිතුණි.

"සුද්දි."

ඇය කතා නැති තැන ඔහු කතාකළේය.

"ම්."

"අනේ මං විහිළුවට කිව්වේ."

"ගොන් හරකා දැන් හිතන්නේ මම එහෙම හිතුවා කියලද?ආ."

ඇය දුක්බරව ඇසුවාය.

"ඇයි ඒකම හිතන්නේ."

ඇය යළිත් ඇසුවාය.

"ඒකම හිතෙනවා තමයි."

දේවක ඇත්තම කීවේය.

"පටන් ගත්තද?"

"ම්. මං තනියම. කිරි පැකට් එකක් දෙකක් තියාගෙන වැඩේ පටන් ගත්තා."

"අනේ. සීගිරි එකේ බැලුවානම් මම මේ දැන් එනවා."

ඔහු කීවේය. ඇත්තටම එහෙම උන්නානම් හොඳය. එහෙත් දැන් පරිස්සම් විය යුතුය.

"කමක් නෑ. මම මහ රෑ හරි ගන්නවා හොඳද? ෆෝන් එක ඕෆ්

කරන්න එපා."

ඇය කීවාය.

"අප්පච්චි දැන් ටිකකට කලින් ආවේ. දැන් කිව්වා ටිකක් කතාකරන්න ඕන කියලා. මම මේ ළිඳ ළඟට ආවා ඇඟ ටිකක් හෝදගන්න."

දේවක කීවේය.

"ඇයි කතාකරන්න ඕන කිව්වේ."

"එයා මොනවාහරි කියයි. දුක ඇති එයාට."

"සීගිරි එකෙන් අයින්වෙන්න කියයි."

ඇය ඇසුවාය. ඔහු කිසිවක් කීවේ නැත.

"එමෙමද දේවකයියේ."

"මං යන්නේ නෑ කියලා සුද්දිට පොරොන්දු වුණා."

"ම්. ඒක එහෙමම වෙන්නෝන."

ඇය බරපතල ලෙස කීවාය.

"ළිඳේ වතුර සීතලද?"

"ම්. ඒත් ඇඟ ටිකක් සෝදගත්තාම හරි සනීපයි."

"මටත් ආසයි"

"ආවනම් වතුර ඇදලා නාවනවා."

ඔහුට කියවිණ. භාවනා මොනිටරය දෙස බලාගෙන සිනාසුනාය.

"දවසක මම එනවා."

"මමත් අද රෑ නිදාගන්නේ නෑ."

ඔහු කීවේය.

"කමක් නෑ නිදාගන්න. මම ඇහැරලා මේක බලන්නම්."

"එහෙම බෑ."

භාවනා දුරකථනයට ශබ්ද

නොඇසෙන ලෙස සුසුමක් පිටකළාය.

"මං රෑ වෙලා ගන්නම් සුද්දි එහෙමනම්."

"මී. උදේට ලස්සන ඇඳුමක් අඳින්න වෙයි. හොඳද?"

දේවකට මේ වචන පුදුමය. ඇයගෙන් මේ දකින මව් ගුණය හැම කෙල්ලෙක්ගෙන්ම දැනෙන දෙයක්ද? දේවක තනිවම සිතුවේය.

# 12

දේවක දොරකඩ පඩියට වී බලාගෙන උන්නේ අප්පච්චී එනතුරුය. පරිසරයෙන් එන සුවදායක බව ඔහුගේ හදවතේ තිබුනේ නැත. දේවකට හතර අතින්ම අද මැව් මැවී පේන්නේ පොලිස් හිර කූඩුයේ යකඩ පොලු අතර උන් අයුරුය. ඊටත් පසු උසාවියේ තාවකාලික සිර මැදිරියේ උන් අයුරුය.

එය කොහොමටවත් සාමාන්‍ය

දෙයක් නොවේ. ඇතිවූ කම්පනය පහව ගියේ ඇය ළඟ උන් නිසාය. එසේ නොවන්නට අද මේ හදවතට සෑහෙන තුවාල සිදුවන්නට තිබුණි. ඒ තුවාල ලේසියෙන් සුව නොවන්නටද පුළුවන.

අන්ධකාර මීදුමක් මැදින් ඇගේ මුහුණ ඔහුට පෙනෙයි. මේ ජීවිතයේ හාස්කමක් යැයි දේවක කවදාවත් සිතුවේ නැත. එහෙත් දැන් එවැනි හාස්කම් ජීවිතයේ ඇතැයි ඔහුට සිතෙයි.

ඇය එවැනි හාස්කමකි.

දේවක පඩියට වී කල්පනා කළේ ඒ හාස්කම ගැනය.

“මගේ අත අතාරිනවද නැත්නම් අල්ලගෙනම යනවද අයියේ.”

පන්සලේදී ඇය කියූ අයුරු ඔහුට

සිහිවිය. අවශ්‍යතාවයක් වී නම් අල්ලාගෙනම යන්නට තිබුණි. එහෙත් ඒ වෙලාවේ හදවත තිබුනේ සාමාන්‍ය තත්වයේ නොවේ.

අද සිදුවූ බොහෝ දේවල් අමතක කළ නොහැක. සමහරවිට මේ ජීවිතයේ තීරණාත්මක මොහොතක් වන්නට ඇත.

ජීවන් සරමක් පමණක් දාගෙන චිත් කොල්ලා ළඟ ඉඳගත්තේය. අද ජීවන් ඔහුගේ එකම පුතා ගැන ඇරෙන්නට අන් කිසිවක් ගැන සිතා නැත. ජයවර්ධනපුර රෝහලේ ලේබර් රූම් එකේදී කොල්ලා ඉපදුන දවසේ සිට සිදුවූ සියල්ල අද ජීවන් සිහිකළේය. ඉන්පසුව ඔහු හුදෙකලාවේම වැල්ලවත්ත කෝවිළට ගොස් බාරයක් වූවේය.

අද ජීවන් ආවේ පූජා වට්ටියක් දී ඒ බාරය ඔප්පුකරය.

අද ගෙදර ආ මොහොතේදී ජීවන් දේවකව වැළඳගෙන ඇඬුවේය. ඒ මොහොත දේවකට සිහිකරන්නට පවා දුක හිතෙනා මොහොතකි. අප්පච්චී මේ තරම් තමාට ආදරය කරන බව ඔහු දැනගෙන උන්නේය. එහෙත් එය මේ තරම් සංවේදි ආදරයක් කියා ඔහු තේරුම් ගෙන තිබුනේ නැත. නොවේනම් එය අද ඔහු තේරුම් ගත්තේය.

“මගේ බොස්ගේ පුතා ඩයලොග් කම්පනි එකේ මාකටින් ඩිරෙක්ටර් කෙනෙක් පුංචි මහත්තයෝ.”

ජීවන් කීවේය. අප්පච්චි මේ කතාව මීට කලිනුත් කියා ඇත.

“මම අද එයාට කතාකළා. බොස්

පුතාට කිව්වා මට කරන්න පුළුවන් හැම උදව්වක්ම කරන්න කියලා. අපි ඒ පැත්තෙන් යන්න බලමු."

ජීවන් කීවේය.

දේවක තවම කතාකළේ නැත.

"අපි දෙන්නා හෙටම යන්."

ඔහු කීවේය.

"අප්පච්චි."

දේවක කතාකළේ මෘදු හඬකිනි.

"පුංචි මහත්තයෝ."

"ඒක නෙමේ අප්පච්චි කරන්න තියෙන හොඳම දේ. පැනලා යන එක නෙමේ. මේක අම්මගේ ආත්මේ තියෙන තැන. එහෙම හොරෙක් කියලා කැත නම අහගෙන මට බෑ සීගිරි එකෙන් යන්න. දවසක එතනින් එනවානම් ඒ සීගිරි එකම හොල්ලලා විතරයි. මට මාස හයක් දෙන්න.

එදාට බැරිවුනොත් මම එන්නම්. ආයේ සීගිරි එක පැත්තකින්වත් යන්නේ නෑ. ඊත් දැන් බෑ අප්පච්චි. එහෙම කරන්න බෑ. එහෙම කරන්න හොඳ නෑ. මම දන්නවා මං ගැන."

දේවක කීවේය.

"ඊත් පුංචි මහත්තයෝ."

"ඔයාට අම්මා ඇවිත් කියයි. කොල්ලව තියන්න එපා ජීවා කියලා කිව්ව දවසට මට කියන්න. මම එන්නම්. දැන්ම බෑ. අප්පච්චි බයවෙන්න එපා. ආයේ මෙහෙම දෙයක් වෙන්නේ නෑ. කවදාවත් වෙන්නේ නෑ. අනික මේක මොකක්ද අප්පච්චි. මේ පොලිස් කූඩුවේ පැය දෙක තුනක් ඉන්න එක. ඕක ගේමක්ද?"

දේවක කීවේය. ජීවන්ට පුදුම

නැත. මේ තමාගේම පුතාය. එහෙම ලේසියෙන් කොල්ලා පරාජය බාරග න්නේ නැත.

"ඒ කියන්නේ ඔයා යනවා."

"ඔව් අප්පච්චි. දෙයක් තැනක ඉතුරුකරලා මිසක් එතනින් එන්න මට හිතෙන්නේ නෑ. දවසක මම එනවා. මම නැති අඩුව එයාලට දැනෙන්න දීලා. එහෙම නැතුව බෑ. ඕකා ගිය එක හොඳයි කියලා හිතෙනවානම් වැඩක් නෑ. මාව හදපු එකත් අපරාදේ අප්පච්චි."

ජීවන් සිනාසුනේය.

"මේ වැඩේ පුතේ."

"අර කෙල්ල මහ රෑ දාගෙන සීසීටීවී බලනවා අප්පච්චි. මම ඔයාට කිව්වේ. මං හිතාගෙන හිටියේ සීසීටීවී ගලවන්න. ඒත් බපට

මදිවෙයි කියලා මම ඒවා ගැලෙව්වේ නෑ. පොලිසීයෙන් අල්ලගෙන යන වෙලාවේ මාව ටිකක් ෂොක්වුණා. මට මේවා මොනවත් මතක්වුනේ නෑ. ඒත් භාවනා මට බැන්නා. පල් මෝඩයා බූරු පැටියා කියලා බැන්නා."

ජීවන් සිනාසුනේය.

"මං හිටියංනම් මාත් බනිනවා."

"ම්. ඔයත් බනී තමයි. එයත් බැන්නා."

ජීවන් තම පුතා දෙස බලාගත්වනම බලා උන්නේය. මේ තරම් දෙයක් වීත් කොල්ලාගේ ආත්ම ශක්තිය බිංදුවක්වත් අඩුවී නැත්තේ මේ සියල්ල පිටුපස ඇය ඉන්නා නිසාද? 'කෙල්ලව බලන්න හරි ආසයි' ඔහු සිතුවේය.

"මට මේක සාමාන්‍ය දෙයක් නෙමේ

තමයි අප්පච්චි. ටිකක් බර දෙයක්. මාත් හිතනවා. ඒත් යන්න නෙමේ. ඉන්න."

ජීවන් දේවකගේ පිට පිරිමැද්දේය.

"ඔයා කැමති දෙයක් කරන්න. ඒත් පරිස්සමින්. මට ඉන්නෙ ඔයා විතරයි."

ඔහු දයාබරව කීවේය.

"අද මම ගොඩක් බය වුණා. දුකත් හිතුණා. කෝවිළට ගිහින් පැය දෙකක් හිටියා."

දේවක අප්පච්චී දෙස දුක්බරව බැලුවේය.

"ඒකට මට සමාවෙන්න අප්පච්චි."

"දෙමව්පියන්ගේ දුකට සමාවක් නෑ පුතේ. ඒක විඳින්නම ඕන දුකක්."

ජීවන් කීවේ කොල්ලාගේ හිස අතගා නැගිටින ගමන්ය.

# 13

වේලාව මැදියම් එකය. මේ ටිකට භාවනා දෙවරක්ම ගොස් ඇඟ සෝදාගෙන ආවාය. ඇය පහළට ගොස් ටිකක් තදට කෝපි එකක් හදාගෙන ආවේ මේ දැන්ය.

මේ දක්වා සීසීටීවී දර්ශනවල කිසිම අමුත්තක් නැත. එහෙත් තව නරඹන්නට පැය හතළිස් ගණනක දර්ශන ඇත. ඇහැරිගෙන සිටීම කොතරම් දුකක්දැයි භාවනා තේරුම්

ගත්තේ අදය. තනිවම ඇහැරී සිටීම ඊටත් වඩා දුකකි.

ඔහු මේ වෙද්දී දෙවරක්ම කතාකළේය. උණු ආප්ප අරගෙන ගේට්ටුව ළඟට එන්නද කියාත් ඇසුවේය. එහෙමවත් ඔහු එනවානම් කෙල්ල ආසය. ඒත් ඕනම දේ ඔහු මෙතනට වී සිටීමය. එය කොත්රම් භයානක දෙයක්ද කියා භාවනා සිතුවාය. 'අපි දෙන්නා රෑක' ඇය සිතුවාය.

අක්කාගේ කකුලේ ප්‍රතිකාර ගන්නට නුවර ගියදා අමායා හිල්ස් හෝටලයේ ගෙවීගිය රාත්‍රිය ඇය සිහිකළාය. 'හරි ආසාවෙන් ඉන්නේ ට්‍රීට්මන්ට් පටන් ගන්න නුවර යන්න. කොහොමහරි යනවා' ඇය සිතාගත්තාය.

දේවක යළිත් කතාකළේ එක පසුවී විනාඩි දහයටය.

"අනේ සුද්දි මේක දුකක්"

ඔහු කීවේය. භාවනා සිනාසුනාය.

"මං රෑට ගොඩක් කෑවනේ. ඒකයි වුනේ. ඇදලා ඇරියා පරිප්පුයි චිකනුයි එක්ක. කොහොමත් බඩගින්නේ හිටියේ. අද රෑ වැඩක් තියෙනවා කියලා හිතුනේ නෑ."

භාවනා කීවාය.

"දැන් නිදිමත එනවා නේද?"

"දැන් ඇවිත් කී පාරක් ගියාද?"

ඇය සිනාසී කීවාය.

"අනේ අපි හෙට බලමු. දැන් නිදාගන්න."

"එහෙම නිදාගන්න පුළුවන්ද? මුන්ව අල්ලන්න ඕන."

"මං හිටියනං නිදාගන්න කියලා මම බලනවා."

"ඒක තමා. මේ වස පාළුයි. ගෙදරම නිදිනේ අනේ. මේ දැන් කෝපි එකක් හදාගෙන ආවා. තිත්ත කෝපි. නිදිමත යන නිසා."

ඇය විඳින දුක දැන් තේරුම් ගන්නට පුළුවන. ඒ සියළු දුක් වේදනා පිටුපස ඇත්තේ කුමක්ද? දේවක සිතුවේය. සීගිරි එකට පය තැබූ දා දුටු මේ පුංචි දෙව්දුව ගැන ඔහුගේ සිතේ ඇති භක්තිය නොවේනම් සෙනෙහස කොහොම සිතේ තබාගන්නද කියා දේවකට තේරෙන්නේ නැත.'හැමදේටම දවසක් එයි සුද්දි' ඔහු සිතින් කීවේය.

"හෝඩුවාවක් හම්බවුනොත් මම පාන්දර කියලා බලන්නේ නෑ

හොඳද? කතාකරනවා"

ඇය කීවාය.

"මම අද නිදාගන්නේ නෑ."

"ඇයි."

"සුද්දි ඇහැරගෙන මෙහෙම දුක් විඳිනකොට නිදාගන්නේ කොහොමද?"

ඔහු කීවේය.

"ම්. මං ගන්නම්. ටිකක් ඇලවෙලා ඉන්න."

ඇය කීවාය. තවත් මොනවා හෝ කියවන්නට තිබුණානම් හොඳය.

"අප්පච්චි බණින්න ඇති."

"මට. එහෙම නෑ. එයා ටිකක් දුකින් හිටියේ. දැන් හරි. මම හැමදේම තේරුම් කරලා දුන්නා. කවදාවත් සීගිරි එකෙන් යන්නේ නෑ."

"යන්න දෙන්නෙත් නෑ."

ඇයට කියවිණ. එහෙම කිව්වේ ඇයිදැයි ඔහු අසන්නට ගියේ නැත. අහනවානම් දාහක් දේවල් අසන්නට තිබුණි.

*** *** *** *** ***

සීසීටීවී මොනිටරයේ එකම මොහොතක රූප දාසයක් පෙනෙයි. ඒ සීගිරි සුපර් හී තැන තැන සවිකළ කැමරා දාසයකින් ලැබෙන රූප රාමුය. මේවා එකම මොහොතක එකම විට මොනිටරයේ පෙනෙයි. අවශ්‍යනම් එක් කැමරාවකින් ලැබෙන රූප රාමු විශාල කර බලන්නට පුළුවන.

සීසීටීවී හි රූපරාමුවල වේලාව

සටහන් වී තිබුණේ පාන්දර තුනයි හතළිස් පහ ලෙසය. මේ දේවක සීගිරි සුපර් හී නයිට් එක කළ දවසය. එදා ඔහු රෑ දොළහටත් භාවනාට කතාකළේය.

භාවනාට මේ රැයේ යම්කිසි අමුත්තක් දැනුණේ දැන් ටිකකට කලිනි. ඒ අමුත්ත කුමක්ද කියා ඇය සිතුවාය. ඇය සීගිරි සුපර් හී රෑ සේවා මුරයේ උන් ආරක්ෂක නිළධාරියාගේ හැසිරීම සියුම්ව පරීක්ෂාකළාය.

ඔහුගේ හැසිරීම අමුතුය. කලින් දවසේ ආරක්ෂක කුටියටම වී සිටි ඔහු අද පාන්දර දෙකට තුනටත් සිටින්නේ සීගිරි සුපර් හී කා පාක් එකේ ඇවිදිමිනි. එහි යම් අමුත්තක් ඇතැයි ඇයට සිතුණි. භාවනා මහ

පාන්දර සීසීටීවී නැරඹීම ටිකකට නවතා ප්ලාස්ක් එකෙන් කෝපි එකක් දමාගෙන යළිත් ඉඳගත්තාය. ඒ වඩාත් ඕනෑකමින් මෙය නැරඹීමටය.

දැන් සීසීටීවී රූපරාමුවල වේලාව සටහන්ව ඇත්තේ පාන්දර හතර ලෙසය. සීගිරි එක ඇතුලේ සිට දේවක පිටතට ආවේ මේ දැන්ය. භාවනා පරිස්සමින් බැලුවාය. ඔහු පිටත තිබූ වතුර ටැප් එකකට අත අල්ලා වතුර දෝතක් ගෙන මුහුණට දමාගෙන ඉන් දෝතක් ගෙන බොනවා භාවනා දැක්කාය.

"ඔයා හරි මහන්සියෙන් ඇතුලේ ඉඳලා ආවේ. වතුර ටිකක් අරගෙන මූණ තෙමාගත්තේ නිදිමත නිසා පව්."

භාවනා ඔහු සීගිරි එකෙන් පිටව

යනු බලාගෙන උන්නාය. ආරක්ෂක නිළධාරියා ඒ මොහොතේදීත් උන්නේ පිටතය. දේවක ඔහු සමඟ කතාකළේවත් නැත. ඔහුට ඒ තරමටම වෙහෙස වන්නට ඇත.

භාවනා දේවක සීගිරි එකෙන් පිටවූ වෙලාව කොළයක ලියාගත්තාය. ඇය වඩාත් සියුම්ව රූප රාමු බලන්නට ගත්තේ ඉන් පසුය. 'වෙන දෙයක් වෙන්නෝන ඔයා සීගිරි එකේ නැතිවෙලාවකමට හිතෙන්නේ එහෙමයි' ඇය සිතුවාය.

දේවක සීගිරි එකෙන් පිටවී දැන් විනාඩි දහයක් ගතවී ඇත. කිසිම වෙනසක් නැත.

භාවනා එක රූප රාමුවක් ලොකු කළාය. එහි උන්නේ ආරියරත්නය. සේල්ස් අංශයේ ආරියරත්න මේ

පාන්දර සීගිරි එකේ ඉන්නේ ඇයි? ඇය සිතුවාය. දේවක ඔහුට වැඩක් පැවරුවාද?

භාවනා සීසීටීවී නැරඹීම නවතා දේවකට ඇමතුමක් ගත්තාය.

"එදා පාන්දර ආරියරත්න සීගිරි එකේ උන්නා දේවකයියා දැක්කද?"

දේවක කල්පනා කළේය.

"මං දැක්කා. ඒත් එයාට විශේෂ වැඩක් මම පවරලා නෑ. ගොඩක් වැඩ තිබ්බ නිසා මම ඒවා ගැන හොයන්න ගියෙත් නෑ."

"හරි. මං ටිකකින් ගන්නම්."

ඇය කීවාය.

භාවනා යළිත් සීසීටීවී නරඹන්නට ගත්තාය.

ඇයගේ දෙනෙත් තිබුණේ

ස්ටෝරුව දෙපස තිබූ කැමරාවලින් ලැබෙන රූප රාමු වෙතය. එහෙත් හදිස්සියේම සීගිරි හී ප්‍රධාන දොරටුව වෙත යොමුකර තිබූ කැමරාවෙන් ලද රූප රාමුවක වෙනසක් ඇය දැක්කාය. භාවනා එය ලොකු කරගත්තාය.

සීගිරි වෙත සුදු පැහැගත් හයිඒස් වාහනයක් ඇතුල්වෙනවා එහි සටහන්ව තිබුණි. 'මේ මහ පාන්දර ඇයි වාහනයක් එන්නේ. කන්ට්‍රැක්ටර්ස්ලා උදේ වෙද්දී වැඩ නතර කළොත් කිව්වනේ දේවක' ඇය සිතුවාය.

ආරක්ෂක නිළධාරියා වාහනය ගැන කිසිම අවධානයක් යොමුකළේ නැත. ඔහු එයට කිට්ටු වී යන්න කියනවා ඇය දැක්කාය. එහෙත්

සිදුවිය යුත්තේ එය නොවේ. වාහනයේ අංකය ආ කාරණාව ආවේ කවුද යන්න ගැන සටහන් කර ගත යුතුය. මේ සීගිරි එකට අයිති වාහනයක්ද නොවේ.

භාවනා පුදුමයට පත්කරමින් හයි එස් වාහනය ගියේ සීගිරි එක පිටුපසටය.

ස්ටෝරුවට ගෙනෙන බඩු තොග ලෝඩින් අන්ලෝඩින් කරන්නේ එහිය. චීත් සමඟම සීගිරි ආයතනයේ සිට ආරියරත්න ආවේය. ඔහු ආරක්ෂක නිළධාරියා සමඟ මොනවද කතාකරන රූප රාමු හොඳින්ම භාවනා දැක්කාය. ඇය උන්නේ වෙව්ලමින් මෙන්ය. එය තේරුම් ගන්නට පුළුවන් හැඟීමක් නොවේ. කවුරු හෝ තමා ළඟ උන්නානම්

හොඳයි කියා භාවනාට දැණුනි. එහෙත් කවුරු කියා මේ පාන්දර ඉන්නද?

ස්ටෝරුවේ පිටුපස දොරටුව වෙත යොමු වූ කැමරාවෙන් ලද රූප රාමුවල වෙනසක් හදිස්සියේම භාවනා දැක්කාය. ඇය ඒ රූප රාමුව විශාල කර පපුවට අතක් තබාගත්තාය.

පුදුමයකට මෙන් සීගිරි එකට ඇතුල්වූ හයි එස් වාහනයේ ඉදිරිපස බොඩිය කැමරාවේ කොණක සටහන් වී තිබුණි.

භාවනා කෙළ පොදක් ගිල්ලාය. ඊටත් පසු වඩාත් ඕනාකමින් විශාල කර රූප රාමු බලන්නට පටන් ගත්තාය. ඇතුලේ සිට කලබලයෙන් දුවගෙන ආවේ ආරියරත්න බව

හඳුනාගන්නට භාවනාට අමාරු නොවීය. ඒත් සමඟම වාහනයේ උන් දෙදෙනෙක්ද බැසගෙන ආවේය.

"බල්ලෝ"

ඇය ලේ රස දැනෙන තරමට යටිතොළ හපාගත්තාය. භාවනාව වෙව්ලන්නට වූයේ අසාමාන්‍ය ලෙසිනි. එය කෙසේවත් සාමාන්‍ය හෘද ස්පන්ධනයක් නොවීය. උගුර කට වේලී ගොස් දෙතොල් වෙව්ලනවා ඇයට නියත ලෙසම දැනුණි.

රූපරාමුවල වෙලාව නිසිලෙස සටහන්ව තිබුණි. එය වාසනාවකි.

ඒත් සමඟම ස්ටෝරුවේ පිටුපස දොරකඩ පෙනෙන ලෙස අල්ලා තිබූ සීසීටීවී කැමරාවෙන් සියල්ලම පෙනුණි. ආරියරත්න ස්ටෝරුව ඇතුළට ගියේ වෑන් රියේ ආ තවත්

දෙදෙනෙක් සමඟය. ඔවුන් ඇතුළට දුව ගොස් පෙට්ටි දෙක ගානේ ඔසවාගෙන එනවා ලස්සනට එහි සටහන්ව තිබුණි. භාවනාගේ දෑස් කඳුළින් තෙත්විය. 'ඔයා පව්. ඒත් මම ඔයාට වෙච්ච හැම නින්දාවක්ම මගේ අත් දෙකින්ම සෝදලා දානවා දේවකයියේ.' භාවනා පපුවට අතක් තබාගෙන කීවාය.

සියල්ල සිදුවූයේ විනාඩි හතරක් තුළය. භාවනා වෑන් රිය සීගිරි එකෙන් පිටවෙනවා ඉදිරිපස සීසීටීවී කැමරාවෙන් නැරඹුවාය. ආරක්ෂක නිළධාරීයා කිසිවක් කළේ නැත. ඔහු බලාගෙන උන්නා පමණය.

දැන් මෙහෙයුම ඇරඹිය යුතුය.

මේ දේ ආරියරත්න පමණක් මුල්වී කළ වංචාවක් නොවේ. ඔහු පිටුපස

කිසිවෙක් සිටිය යුතුය. ඒ සිටින්නේ කවුදැයි භාවනාට සිතාගන්නට අමාරු නැත. කිසිම බයක් සැකක් නොමැතිව සීගිරි හී ආරක්ෂකයන්ද අල්ලාගෙන මේ වැඩේ කරන්නට ඇත්තේ ඒ නිසාය.

සැළසුම හොඳය. එහෙත් සැළසුම ආධුනිකය. ඇරත් මේ ලෝකයේ දෙවියන් කියා කෙනෙක් සිටින්නට ඇත. 'ඔයා නිකමට හරි හිතිලා සීසීටීවී කැමරා ගැලෙව්වේ නැති එක කොච්චර හොඳද' භාවනා සිතුවාය.

ඇගේ බඩ පපුව කොරවී ගොස් තිබුණි. භාවනා නාන කාමරයට වැදී විනාඩි දහයක් පමණ උන්නාය. සියල්ල දැන් පැහැදිළිය. ඇය සීසීටීවී කැමරාවලින් ගත් දර්ශන ටික වෙනමම පරිගණකයට කොපි

කළාය. ඒ වැඩ හොඳටය.

භාවනා දේවකට ගත්තේ මහ පාන්දරය. ඒ වෙද්දී පාන්දර තුනත් පසුවී තිබුණි.

"සුද්දි."

ඔහු නිදි නැත. කෙනෙක් නිදාගෙන සිටිද්දී කතාකරනවානම් දුරකථනයෙන් ඒ බව හඳුනාගන්නට පුළුවන.

"නිදාගන්නේ නැතුව මොනවද කළේ."

දැන් හදවත නිදහස්ය. ඒ නිසා නිවනකින් කතාකරන්නට පුළුවන.

"මේ පරණ පොතක් තිබුණා බැලුවා සුද්දි."

"මොනවත් බිව්වේ නෑ."

"ටිකකට කලින් තේ එකක්

හදාගෙන බිව්වා. සුද්දි කතාකරනකල් උන්නේ.”

ඔහු කීවේය.

“දැන් නිදාගමු සුද්දි. අපි හෙට බලමු.”

ඔහු කීවේය.

“හෙට බලන්න ඕනවෙන එකක් නෑ දේවකයියේ.”

ඇය කීවාය.

“කිව්වේ.”

ඇය මොහොතක් නිහඬව උන්නාය. ටිකකින් ඇසුනේ ඇගේ ඉකිබිඳුම් හඬය.

“අනේ සුද්දි. ඇයි මේ. මොනවත් ක්ලූ එකක් ලැබුනේ නැති නිසාද?”

ඔහු ඇසුවේය.

“ම්හ්.”

"එහෙනම්."

"ඔයා පව්."

"ඇයි මම පව්. සුද්දිනේ පව්. මේ රෑ ඇහැරගෙන."

දේවක කීවේය.

"මොකක්ද හේතුවක් නිසා සීගිරි එකට ඇවිත්. ඒක ගොඩගන්න විඳින්න තියෙන දහදුකම විඳිනකොට මුළු ස්ටාෆ් එකක්ම නින්දා අපහාස කරද්දී පොලිසියෙන් අල්ලගෙන ගියේ. අන්තිමට පොලිස් රිමාන්ඩ් එකෙත් ඉන්න වුණා."

භාවනා කීවාය. මේ මහ පාන්දර ඇය මේවා කියන්නේ ඇයි.?

"ඒත් ඔයා මං කිව්වා වගේ මී හරකෙක්. ගොන් බූරු තඩියෙක්."

හදිස්සියේම කෙල්ල කීවාය. දේවකට මේ කිසිවක් සිතාගන්නට

බැරිවිය.

"මට කියන්න සුද්දි."

"මේ චෝදනා ඔක්කොමගෙන් මම ඔයාව නිදහස් කළොත් මට මොනවද දෙන්නේ. ම්."

එවර යුවතියගේ කටහඬ හුරතල්විය. දේවක පිටදීගෙන උන් ගඩොල් බිත්තියෙන් මෑත් විය. කපරාරු නොකළ ගඩොල් බිත්තියේ කටු සළකුණු ඔහුගේ පිට මතය.

"සුද්දි මාව නිදහස් කළත් නැතත් මම ඕන දෙයක් දෙනවා."

"ඕන දෙයක් කිව්වේ."

"හැමදේම. දෙන්නේ තියෙන දේනේ. තියෙන හැමදේම කියලා හිතන්නකෝ."

"ම්. තියෙන දෙයක්නේ ඉල්ලන්නේ."

"දුන්නා කියලා හිතාගන්නකෝ."

ඔහු කීවේය. ඉන්පසු ගෙවුණේ නිහඬතාවයකි.

"පර බල්ලෝ කරපු සේරම සීසීටීවී එකේ හින්දි ෆිල්ම් එක වගේ තියෙනවා. මේ දැන් ඔක්කොම කැප්ච කරගත්තේ. මුන්ට මම යහතින් ඉන්න දෙන්නේ නෑ. ඔක්කොමල්ලව අල්ලනවා."

භාවනා සියල්ලම දේවකට කීවේය. දේවක ගඩොල් බිත්තියේ ටිකක් උඩට වන්නට ගසා තිබූ බුදු රුව දෙස බැලුවේය.

"හිතාගන්නවත් බෑ."

ඔහු කීවේය.

"ඔයා උදේ පාන්දර යනවා එළියේ ටැප් එකෙන් මූණත් හෝදගෙ නහැමදේම වෙලා තියෙන්නේ ඊට

පස්සේ.”

“සුද්දි පුදුමයි.”

“නෑ දේවකයියේ. මොකක්හරි තියෙනවා. අපි වටේ. මොකක්හරි බලවේගයක්.”

ඇය කීවාය.

“මට තේරෙන්නේ නෑ. කොහොම වුනත් හෙට මේක මහජන ප්‍රදර්ශනයට දානවා. මුළු ස්ටාෆ් එකම ඉස්සරහ. මම පොලිසියේ ඉන්ස්පෙක්ටර්ටත් එන්න කියනවා. ඔයා එන්න මම කියන වෙලාවට. ළඟකට වෙලා ඉන්න. මම කිව්වාම එන්න හොඳද?”

“මම එන්නම්.”

ඔහු අසරණාව කීවේය. හදවතට දැනෙන නිවන මෙතෙකැයි කිව නොහැක.

"මං හරි බයේ සුද්දි උන්නේ."

"මං දන්නවා ගොඩක් බයවුණා කියලා. හොඳ අයට ඒ බය දැනෙනවා. මේ බලු ලෝකයක්. ඒත් අපිට එහෙම වුනේ නෑ."

"ගොන් වස්සට කෙනෙක් පිහිටවුනානේ."

ඇය මිහිරි ලෙස සිනාසුනාය.

"මට ඕන දෙයක් ළමයා දෙනවා කිව්වා."

"ඉල්ලන්නකෝ."

"මී. නුවර යනකොට හොඳේ. මේ දවස් හොඳ නෑ."

ඇය සතුටින් කීවාය.

"දැන් නිදාගමු."

"නින්ද යන්නේ නෑ දේවකයියේ."

"අනේ ඉතින් රෑම හිටියනේ

සුද්දි."

"මී. ටිකක් ඇලවෙලා ඉන්නවා. ගඟ වුනොත් මට මිස් කෝල් එකක් දෙන්න හොඳද?"

ඇය සිනාසී කීවාය.

# 14

දේවක පාන්දරම සියල්ලම අප්පච්චීට කිව්වේය. ජීවන්ට දේවකගේ අම්මාව සිහිවිය. 'කොල්ලව රකින්නේ ඔයාගේ අයියගේ දුව නෝනා' ජීවන් කීවේය.

"මට දැන් ඔළුව කෙළින් තියාගෙන එතනට යන්න පුළුවන් අප්පච්චී."

ඔහු කීවේය.

"ඔයා හරි. මට මේ දරුවට

කෝල් එකක් අරන් දෙන්න පුංචි මහත්තයෝ.”

ජීවන් කීවේය. දේවක භාවනාට ඇමතුමක් ගත්තාය. ඇයට කතාකරන එක යුතුකමය.

“අප්පච්චිට ටිකක් කතාකරන්න ඕනලු. මම දෙනවා.”

දේවක අප්පච්චීට දුරකථනය දුන්නේය.

“ගුඩ් මෝනිං අප්පච්චී.”

කෙල්ල කතාකළේ සතුටිනි. ඇගේ මුහුණ ටිකක් බලාගන්නට ජීවන්ට ආසය. පුංචි කාලයේ ඇයව දුටුව මුත් ඒ මුහුණ මතක නැත.

“ගුඩ් මෝනිං පුතේ. ඔයාට පින් දෙන්න මම කතාකළේ. පුංචි මහත්තයා සේරම කිව්වා.”

ජීවන් කීවේය.

"ඒක මගේ යුතුකම අප්පච්චී. මං දන්නවා දේවක කවුද කියලා. ඔයාගේ පුංචි මහත්තයා නිසා කියනවා නෙමේ. මේක කිව්වා කියලා එයාට කියන්න ඕනත් නෑ. ඒත් මම දැකපු හොඳම පිරිමි ළමයා එයා."

භාවනා එහෙමම කීවාය. ජීවන්ගේ දෑස්වල තෙතමනයක් විය. අප්පච්චීගේ දෑස් තෙත්කරන්නට තරම් දෙයක් ඇය කීවාදැයි දේවක සිතුවේය.

"ඔයාව දවසක බලන්න ආසයි පුතේ."

"ඉතින් මම එන්නම්කෝ අප්පච්චිව බලන්න. නිවාඩු දවසක එන්නම් අප්පච්චී පුංචි මහත්තයට කියන්න මට ආරාධනා කරන්න කියලා."

කෙල්ල ගත්කටම කීවාය.

"මම ආරාධනා කරනවනේ පුතේ."

"එනවා අප්පච්චී. දේවකව සීගිරි එකට එවන්න. එයාට නරකක් වෙන්න දෙන්නේ නෑ. එහෙම වෙනවානම්. එයාට මුළින්ම සීගිරි එකෙන් යන්න කියන්නේ මම අප්පච්චී."

"මං දන්නවා පුතේ."

"මං අද එයාව මේ හැම චෝදනාවකින්ම නිදහස් කරනවා. අප්පච්චී එයාව එවන්න."

"හොඳයි පුතේ. ඔයාට තෙරුවන් සරණයි."

කෙල්ලට කතාකළ පසුව ජීවන්ට බොහෝ දේවල් සිතුණි.

"මොනවද අප්පච්චී එයා කිව්වේ"

ජීවන් සිනාසුනේය.

"ඔයාව සීගිරි එකට යවන්න

පොඩි බයක් තිබුණා. දැන් ඒක නෑ. කෝකටත් පරිස්සමින් පුංචි මහත්තයෝ."

"මං දැන් ඒක හිතේ තියාගෙන අප්පච්චී ඉන්නේ. පරිස්සම් වුනා මදි තමයි."

දේවක කීවේය.

"අපි දවසක ඒ දරුවට එන්න කියලා කෑමක් දෙමු."

"එයාටයි නේත්‍රා අක්කටයි අප්පච්චී."

ජීවන්ගේ පපුව ගැස්සිණ. කෙල්ලට තමාව මතක නැති බව විශ්වාසය. එහෙත් නේත්‍රාට තමාව හොඳින්ම මතකය.

"ලොකු දූට මාව මතකයි පුංචි මහත්තයෝ. දැක්ක ගමන් සේරම එයා දැනගන්නවා."

දේවක බලාගෙන උන්නේය.

"අප්පච්චි."

"පුංචි මහත්තයෝ."

"මේක සීගිරි එකටම හංගගෙන ඉන්න පුළුවන්. ඒත් මේ කෙල්ලෝ දෙන්නට බොරුවක් කරන්න දුකයි."

දේවක කීවේය.

"මටත් අද දුක හිතුණා. අපි බලමුකෝ. ඔයා මුලින්ම ඔය වැඩේ කරලා ඉන්නකෝ."

ජීවන් කීවේය.

දේවක වෙනදාටත් වඩා ලස්සනට පිළිවෙලට ඇඳගත්තේය. අද දේවක සීගිරි එකට ගිය මුල් දවසේ වාගේය. ඔහු හිතාමතාම වෙලාගෙන ඇන්දේය. කොහොමත් අදින් පසුව සීගිරි එකේ ඉන්නේ වෙනස් දේවක කෙනෙකි. මේ ලෝකයට ඕනවට වඩා හොඳ වී

තේරුමක් නැත. හොඳවිය යුත්තේ හදවතේ තබාගෙන ඉන්නා අයට පමණය.

උදෙන්ම ඔහු රැවුළ කැපුවේය. එහෙම කැපූ විට දේවකගෙන් එන්නේ ළාබාල පෙනුමකි. එහෙත් හදවතින් ළාබාල වී තේරුමක් නැතැයි ඔහුට සිතුණි. පොලිස් හිර කූඩුව, උසාවිය ජීවිතයට බොහෝ දේ ඉගැන්වීය.

එකවර සීගිරි එකට යා නොහැක. ඇය කතාකරන තුරු සිටිය යුතුය. දැන් ඇය ගැන සිතෙන්නේ වෙනම ජීවිතයක් ලෙස නොව මේ ජීවිතයේම කොටසක් ලෙසය. එසේ විය හැකිද? විය හැකිනම් ඊට වඩා ලැබීමක් මේ ජීවිතයේ නැතැයි දේවක සිතුවේය.

*** *** *** *** ***

සීගිරි හී කාර්ය මණ්ඩල රැස්වීම යොදාගෙන තිබුනේ උදේ නමයටය.

"මට විශේෂ හේතුවක් නිසා අද ස්ටාෆ් මීටින් එකක් කෝල් කරන්නෝන සීයා. කළාට කමක් නැද්ද?"

රඹුක්වැල්ල මහතා සිනාසුනේය.

"ඔයාට කියන්න දෙයක් තියෙනවානම් කට්ටියම එකතුකරලා කියන්න ප්‍රශ්නයක් නෑ සුද්දි."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඔයත් අද ඉන්නම ඕන සීයා."

"මං එනවා පුතේ."

පාන්දරම භාවනා අම්මාගේත් තාත්තාගේත් කාමරයට ගියාය. ඉඳුනිල් ඇහැරී උන්නද මිලින්ද උන්නේ නින්දේය.

"තාත්තා නිදිද?"

ඉඳුනිල් සිනාසුනාය. ඇය තාත්තා ළඟින් ටිකකට ඇලවී ඔහුගේ වත බදාගත්තාය. මිලින්ද පොඩි දුවගේ රස්නයට ඇහැරුණේය.

"සුද්දි අපි ළඟ නිදාගන්න දවසක් මතක නෑ."

මිලින්ද කෙල්ලගේ වතට අතක් දමාගෙන කීවේය.

"මං දවසක එන්නම්. අපි තුන්දෙනෙක්ට මේ ඇඳේ ඉඩ මදි."

"නිදාගන්නවානම් ඉතින් බිම රෙද්දක් දාගෙන උනත් බැරියෑ නිදාගන්න."

ඉඳුනිල් කීවාය.

"උදේ තාත්තා යනවද කොහේහරි."

"ටිකක් දවල්වෙලා යන්න

තියෙන්නේ සුද්දි.ඇයි."

"නෑ නමයට ටිකක් සීගිරි එකට එනවද? මම අද ස්ටාෆ් මීටින් එකක් කෝල් කළා. තාත්තිත් ටිකක් එන්න. මට කියන්න දෙයක් තියෙනවා."

මිලින්දට මොනවද දැනුණි.

"මොකක්ද කරන්න යන්නේ."

"එහෙම කියන්න බෑ අනේ. එන්නකෝ."

"ම්. අදින් පස්සේ පොලීසිවලට උසාවිවලට යන්න බෑ හොඳද? මට ඒක දරාගන්න බෑ."

භාවනා සිනාසුනාය.

"දරුවෝ හදන්නෝන තාත්තා ජීවිතේ හැමදේකටම මුහුණ දෙන්න පුළුවන් වෙන විදිහට."

ඉඳුනිල් සිනාසුනාය.

"අහගත්තද දුවගෙන්. මං ඒකනේ

මොනවත් කියන්න යන්නේ නැත්තේ."

ඉඳුනිල් කීවාය.

"ඒත් බයවෙන්න එපා. මම දවසක මේ හැමදේකින්ම අයින්වෙනවා. ඒක මම හිතාගෙන ඉන්නේ."

භාවනා එයද කීවාය.

භාවනා ඇඳගන්නට ගත්තේ වෙනදා නැතිතරම් උනන්දුවකිනි. ඇය සාරියක් තෝරන්නට සෑහෙන වෙලාවක් ගත්තාය. අවසානයේ භාවනා තේරුවේ මෙරූන් පැහැගත් සාරියය. එහි මොකක්ද ලස්සනක් ඇත. සමහර විට මේ පැහැයේ වෙන්නට ඇත.

හැන්දෑවට මේ දැනෙන සතුට සැමරිය යුතුයැයි භාවනා සිතුවාය. එය වෙන කෙනෙක් සමඟ සමරා තේරුමක් නැත. එය සැමරිය යුත්තේ

ද්වේකත් සමඟාමය.'ගොන් හරකා කිව්ව එක ගැන සෑහෙන හිතනවා.' ඇය සිනාබරව සිතුවාය.

** ** ** ** ** ** **

භාවනා පොලිස් පරීක්ෂක වසන්ත ගමගේට කතාකළේ නිවසේ සිටය. ඔහු අවංක පොලිස් නිළධාරියෙක්යැයි ඇයට ඉවෙන් මෙන් දැනුණි. මේ පොලිස් දෙපාර්තමේන්තුවම දූෂිත විය නොහැක. කිඩාරම් මල් ගොඩේ සමන් පිච්ච මල්ද ඉඳහිට හෝ තිබිය හැක.

"හෙලෝ. ගුඩ් මෝනිං ඉන්ස්පෙක්ටර්."

"ගුඩ් මෝනිං. මේ කවුද?"

ඔහු ඇසුවේය.

"ඉන්ස්පෙක්ටර් මම භාවනා රඹුක්වැල්ල. සීගිරි එකේ. ඊයේ කතාකළේ පොලිසියේදී."

ඔහු සිනාසුනේය.

"මතකයි මිස්. කියන්න."

'මං කතාකරනකොට වයිෆ්වත් මතක්වුණා කිව්වේ. ලේසියෙන් මාව එහෙම අමතක වෙන්න බෑනේ' භාවනා සිතින් කීවාය.

"මම හැමදේම හොයාගත්තා. ඉන්ස්පෙක්ටර්ට අද නමයට සීගිරි එකට එන්න පුළුවන්ද? මම දන්නවා එහෙම කියන්න බෑ. ඒත් ඒ වෙලාවට මේකට සම්බන්ධ අයවත් ඇරෙස්ට් කරන්න පුළුවන්."

"ද්වක නෙමේ"

"ඒක මේක ඇතුලේ කෙනෙකුයි පොලිසියේ කෙනෙකුයි එකතුවෙලා

කරපු දෙයක් ඉන්ස්පෙක්ටර්. සොරි මෙහෙම කියන්න වුණාට. මම හැමදේම හොයාගත්තා.”

භාවනා කීවාය. එය බරපතල චෝදනාවකි.

“හරි මිස් මම එන්නම්. තැන්කියු.”

භාවනා ඊළඟට කතාකළේ මිහිරංගටය. මේ මහ පාන්දර කෙල්ලගෙන් ඇමතුමක් එද්දී මිහිරංගට පුදුමත් සිතුණි.

“ගුඩ් මෝනිං අයියේ.”

ඇය තරමක් මෘදුව කතාකළාය. කෙසේ හෝ අද මිහිරංගවත් කෝසලවත් සීගිරි එකට ගෙන්වාගත යුතුය.

“මෝනිං බබා. උදෙන්ම මාව මතක්වුණාද?”

‘උඹව මට පාන්දර ඉඳලා

මතක්වෙනවා.' ඇයට කියන්නට සිතුණේ එලෙසිනි.

"මී. උදේ ස්ටාෆ් මීටින් එකක් අයියේ. අයියා ඉන්නම ඕන."

"දැන් අලුත් තත්වයක්නේ තියෙන්නේ නේද බබා."

"ඒකනේ. සමහරු නෑනේ සීගිරි එකේ. අපි ඇවිත් ටිකක් බලමු අයියේ."

භාවනා බයාදු ලෙස කීවාය. මිහිරංග කෙල්ලගේ ගැටේට අසුවිය. 'ගෑණිගේ ගෑස් බැහැලා.'

"මං එනවා බබා. ඔයා මේ රෙස්පොන්සිබිලිටීස් ටික ගන්න. අයල් හෙල්ප් යූ."

"තැන්කියු. එන්නකෝ අයියා."

භාවනා තොල්පට තදින් හපාගත්තාය. ඇය කෝසළටත්

කතාකර එන්නැයි කීවාය.

*** *** *** *** ***

සීගිරි හී කාර්ය මණ්ඩල රෑ ස්වීම ඇරඹුනේ හරියටම උදේ නමයටය. භාවනා එය ලස්සනට සංවිධානය කළාය. කෙල්ල කරන්නට යන්නේ මොනවාදැයි නේත්‍රාවත් හරියටම දැනගෙන උන්නේ නැත. එහෙත් එකක් විශ්වාසය. සීසීටීවී දර්ශනවලින් කෙල්ල දෙයක් දැනගන්නට ඇත. මේ අද ලස්සනට ඇඳගෙන විත් ඉන්නේ ඒකය.

භාවනා සීගිරි හී සේවකයෙක් යොදාගෙන සීසීටීවි දර්ශන ඇති රෙකෝඩරය විශාල මොනිටරයට සම්බන්ධ කළේ උදේ හතට පමණ

පැමිණාය. කැෂියර් කවුන්ටරය අසළ එවැනි රූපවාහිනී තිර දෙකක් තබා ඇත.

රඹුක්වැල්ල මහතා ආවේ මිලින්දත් සමඟමය. මිහිරංගත් කෝසලත් මේ වෙන්නට යන දේ ගැන හාංකවිසියක්වත් දැනගෙන උන්නේ නැත. එහෙත් පුටු තබා තිබුනේ ස්ටාෆ් එකට මෙන්ම සීගිරි හී පාලක මණ්ඩලයටත් රූපවාහිනී තිරය පෙනෙන ලෙසය.

පොලිස් පරීක්ෂක වසන්ත ගමගේ ආවේ ඒ මොහොතේය. භාවනා ඔවුන්ව සාදරයෙන් පිළිගත්තාය.

"තැන්කියු ඉන්ස්පෙක්ටර්."

ඇය පොලිස් පරීක්ෂකව පිළිගෙන ඔහුට රඹුක්වැල්ල මහතා අසළම ආසනයක් දුන්නාය.

"ඔක්කොම ඩෝස් වහන්න."

භාවනා සේවකයෙක්ට කීවාය. සියල්ලන්ටම පුදුම සිතුණි. භාවනා යටැසින් ආරියරත්න දෙස බැලුවාය. ඔහු කිසිවක් නොවූ ලෙස ස්ටාෆ් එක අතරට වී උන්නේය.

"හැමෝටම සුබ උදෑසනක්. අද මේ විශේෂ ස්ටාෆ් මීටින් එක කෝල් කලේ විශේෂ දෙයක් දැණුම් දෙන්න. ඇත්තටම කිව්වොත් විශේෂ දෙයක් පෙන්නන්න. හිතන්නකෝ ෆිල්ම් එකක් කියලා. ඊයේ පෙරේදා මේ සීගිරි එකේ කවදාවත් වෙන්නේ නැති දෙවල් ගොඩක් වුණා. මේ වගේම ස්ටාෆ් මීටීන් එකක් වෙලාවේ මෙතන සේවකයෙක්ව මේ පොලීසියේ මහත්තයලා පොලීසියට අරගෙන ගියා. එයාව කූඩුවටත් දැම්මා පස්සේ

උසාවියත් දැම්මා. හදවතට දෙයක් දැනුන නිසා මම උසාවියට ගිහින් අවශ්‍ය හැමදේම කළා."

මිලින්ද සිනාසුණේය. කෙල්ල මේ කරන්නට යන්නේ කුමක් වුවද ඔහුට දෙයක් දැනුණි.

"ස්ටෝර්ස්වල ලක්ෂ හයකට ආසන්න පර්ෆියුම් ස්ටොක් එකක් තිබුණා. ඒක අතුරුදහන් වුණා. පස්සේ ඒක වෙන තැනක ෂොප් එකක තිබිලා අහුවුණා. ඒක එතනට වික්කේ දේවක කියලා පොලිසියට ඔත්තුවක් ලැබිලා තිබුණා. ඒ අනුව තමයි පොලීසියෙන් දේවකව අත්අඩංගුවට ගත්තේ. මට දෙයක් දැනුණා. සමහර දේවල් ගැන එහෙම දැනෙනවානේ. ඒ නිසා ඒක පස්සේ මම ගියා."

වසන්ත ගමගේ හොඳින් අසාගෙන උන්නේය. මේ සාමාන්‍ය කෙල්ලෙක් නොවන බව ඔහු ඊයේම තේරුම් ගත්තේය.

"මේක කළේ කවුද? දේවකද නැත්නම් වෙන කෙනෙක්ද?ඒක පස්සේ යන කෙනෙක්ට මුළින්ම හිතන්න වෙන්නේ සීසීටීවී කැමරාස් ගැනනේ. ඒත් නරක වෙලාවට ඒවා ඩිස්කනෙක්ට් කරලා තිබුණා."

මිහිරංග භාවනාගේ කතාවට බාධා කළේය.

"සීසීටීවී කැමරාස් ඩිස්කනෙක්ට් කළේ දේවක. එයා ඒක කළේ මේ වංචාව කරන්නමයි. ලස්සනට එයා ප්ලෑන් කළා මේක."

මිහිරංග කීවේය. භාවනා අත් බැඳගෙන මිහිරංග දෙස සිනාබරව

බැලුවාය.

"සම්පූර්ණ ඇත්ත. දේවක මේ සීසීටීවී කැමරාස් ඩිස්කනෙක්ට් කළේ මේ වංචාව කරන්න හිතාගෙ නමයි. ක්ලූ එකක් නැතිවෙන්න. අපි එහෙමනේ හිතන්නේ."

වසන්ත ගමගේ පවා පුදුමයෙන් බැලුවේය.

"ඒත් ඇත්ත ඊට වඩා වෙනස්. ඇත්තම කිව්වොත් දේවක මේ සීසීටීවී කැමරාස් ඩිස්කනෙක්ට් කළේ නෑ. එයා ඒවා එහෙමම තිබ්බා. මොකද බජට් ප්‍රශ්නයක් නිසා. සීසීටීවී කැමරාස් තිබ්බ විදියටම තිබ්බා."

මිහිරංගව පත්තුවූයේ එවිටය. ඔහුට බැලුවේ ආරියරත්න දෙසය. ආරියරත්නව වෙව්ලන්නට ගත්තේය.

භාවනා ඔවුන් දෙදෙනා දෙසම කතාව නවත්වා බැලුවේය.

"ඇත්තටම සීසීටීවී කැමරාස් ඩිස්කනෙක්ට් කළේ නෑ මිහිරංග අයියේ. ඒවා එහෙමම තියෙනවා."

භාවනා මිහිරංග දෙසම බලාගෙන කීවාය. පොලිස් පරීක්ෂක වසන්ත ගමගේත් මිහිරංග දෙස බැලුවේය. මිහිරංගට කිසිවක් කියාග න්නට නොහැකි විය. ඔහු උන්නේ අසරණවය. කෝසළගේද බඩ පපුව පත්තුවුනේ මේ කතාව ඇසූ විටය.

"දැන් අපි බලමු ඒ රාත්‍රියේ මොකක්ද ඇත්තටම වුනේ කියලා. නිශාන්ත ඩෝස් ඔක්කොම වහලා නේද?"

භාවනා යළිත් ඇසුවාය.

"ඔව් මිස්."

"ඒක හොඳයි. එහෙනම් දාන්න. හැමෝටම දැන් බලා ගන්න පුළුවන්. රොබරීස් ඔෆ් සීගිරි"

සීසීටීවී දර්ශන රූපවාහිනී තිරය මත පතිත විය. නියම දර්ශන එන්නේ තව විනාඩි කිහිපයකිනි.

"මේ සීගිරි එක ඇතුලේ ඉඳලා එන්නේ දේවක. බලන්න එයා මොනවද කරන්නේ කියලා."

භාවනා ඒ දර්ශනය ලොකු කළාය. මිලින්ද පවා අවධානයෙන් බැලුවේය. 'කොල්ලා මහන්සියෙන් එන්නේ.'

දේවක පිටතට එන අයුරුත් ඔහු එළියේ ටැප් එකකින් මුහුණ සෝදාගෙන ඉන් වතුර දෝතක් බොන අයුරුත් දර්ශනවල අපූරුවට සටහන්ව තිබුණි.

"මේ දැන් දේවක යනවා. දැන්

බලන්න මොනවද වෙන්නේ කියලා."

භාවනා කීවාය. පසුව ඇය හැරී මිහිරංග දෙස බැලුවේය.

"අයියට ඔතනට පේනවද හොඳට. නැත්නම් මෙතනට එන්න."

භාවනා කීවාය. මිහිරංග ඇතුළතින් දැවුණේය. 'ඉවරයි දැන්' මිහිරංග තනිවම කීවේය. ඔහු ආරියරත්න දෙස බැලුවේය. ආරියරත්න ඉන්නේ වෙව්ලමිනි.

"මේ වෙලාවේ සීගිරි එකට හයිඑස් වෑන් එකක් එනවා. මේ මහ පාන්දර. බලන්නකෝ අපේ සිකියුරිටි ඔෆිසර් එයාගේ අයියගේ වාහනේ කියලා හිතාගෙන වගේ කිසිම වග විභාගයක් නැතුව වෑන් එක සීගිරි එකට ගන්න හැටි"

පොලිස් පරීක්ෂක වසන්ත ගමගේ

හොඳින් නිරීක්ෂණය කළේය. මේ ආරක්ෂක නිළධාරියාද මෙයට සම්බන්ධ බව ඔහු නිගමනය කළේය.

"දැන් බලන්න මේ සයිඩ් කැමරාවේ දර්ශන. අපේ ප්‍රධාන නළුවා එනවා."

භාවනා කීවේය. ආරියරත්න වෙව්ලන්නට ගත්තේය. ඒත් සමඟම සියළු දර්ශන සියල්ලෝම දැකගත්තෝය.

"මේ පුතේ"

"ඔව් සීයා. ආරියරත්න තමයි. සේල්ස් එකේ තව කෙනෙකුයි එක්ක."

රඹුක්වැල්ල මහතාට දරාග න්නට නොහැකි දුකක් දැනුණි. ඒ දේවක ගැනය. ඔහුගේ මුහුණ අඹිහිරි දුකකින් තැම්බී තිබුණි.

මිලින්දට පුදුම සිතුනේ නැත.

තමාගේ බාල කෙල්ල දේවක වෙනුවෙන් අර තරම් අවධානමක් ගෙන උසාවි පවා ගියේ මේ විශ්වාසය නිසාය. අද ඇය ඒ විශ්වාසය ඔප්පු කර ඇත.

"මෙන්න ස්ටෝර්ස්වලින් බඩු ටික පන්නනවා."

මිහිරංගට කිසිවක් කරකියා ගත නොහැකි විය. කෝසළ උන්නේ ආරියරත්නට වඩා වෙව්ලමිනි.

"තවත් ක්ලූ ඕන නෑනේ ඉන්ස්පෙක්ටර්. ඇරෙස්ට් කරන්න. තව දෙයක්. මම හිතන්නේ නෑ මේක ආරියරත්න තනියම කළා කියලා. එහෙම නේද ආරියරත්න."

ආරියරත්න බිම බලාගෙනම උන්නේය. ඔහුගේ මුහුණ පුරා තිබුනේ වියරු බියකි.

"නන්දන ගන්නවා මිනිහව."

පොලිස් පරීක්ෂකවරයා අණ දුන්නේය. ඒත් සමඟම ආරියරත්නව පොලිස් අත්අඩංගුවට පත්විය.

"දැන් ඉන්ස්පෙක්ටර් මේකයි ප්‍රශ්නේ. මෙතන මේ හොරකම සිද්ධවුණා කියමුකෝ මෙහෙම. ඒත් කොහොමද මේ බඩු තවත් තැනකින් හම්බවුණා කියලා පොලීසිය හදිස්සියේ දැනගත්තේ කියන එක. එහෙම නේද? එතනින් දේවකගේ නම කියවුනේ කොහොමද"

පොලිස් පරීක්ෂකවරයා හිස සැලුවේය.

"අපි හොයනවා මිස්."

භාවනා සිනාසුනාය.

"අපි මේ ඉන්වෙස්ටිගේෂන් එකට හෙල්ප් කරමු නේද මිහිරංග අයියේ."

භාවනා මිහිරංග දෙසට හැරී කීවාය. මිහිරංගගේ බඩ පපුව පත්තු විය. මිලින්දද බැලුවේ මිහිරංග දෙසය.

"මෙන්න ඉන්ස්පෙක්ටර් සීසීටීවි කොපි එක. උසාවියට දාන්න ඕනනේ."

භාවනා සීසීටීවි දර්ශනවල කොපියක් ඩීවීඩි තැටියකට දමා පොලිස් පරීක්ෂක අතට දුන්නාය. නේත්‍රා තනිවම සිනාසුනාය.

භාවනා මේ සියල්ල වෙන අතරවාරයේ දේවකට කෙටි පණිවිඩයක් දැම්මාය.

"දැන් එන්න. ඉක්මනට."

ඇය දැම්මේ එලෙසය. විනාඩි පහක් ඇතුළත දේවක සීගිරි එකට ආවේය. ඇය කියූවාක් මෙන්ම

ඔහුද අද ලස්සනට ඇඳගෙන විත් උන්නේය. දේවක සීගිරි හී දොරෙන් ඇතුල්වෙද්දී සියල්ලන්ටම ඔහු දෙස බැලුණි. මිලින්ද විශේෂයෙන් කොල්ලා දෙස බැලුවේය. 'ඔයා මගේ කෙල්ලගේ හිතේ මෙච්චරම විශ්වාසයක් ඇතිකළේ කොහොමද?' ඔහු සිතින් දේවකගෙන් ඇසුවේය.

භාවනා ඔහු එනවා අත් බැඳගෙන බලාගෙන උන්නාය. යුවතියගේ මුව මත සුන්දර සිනාවක් විය.

"සර්."

දේවක රඹුක්වැල්ල මහතා ළඟටම පැමිණ කතාකළේය. රඹුක්වැල්ල මහතා කොල්ලාගේ දෑතින්ම අල්ලාගත්තේය.

"මට සමාවෙන්න පුතා."

ඔහු සියල්ලන් ඉදිරියේදි කීවේය.

"එහෙම කියන්න එපා සර්."

දේවක මිලින්ද දෙසද බැලුවේය.

"ඔයා වැඩටික කරගෙන යන්න දේවක. මේ වෙච්ච දේවල් හිතට ගන්න එපා."

මිලින්ද කීවේය.

"එන්න දේවක."

භාවනා කීවාය. ඔහු ඇය ළඟටම පැමිණ නතරවිය.

"ඊයේ දේවකව පොලීසියට අරගෙන යනකොට දේවක නිවැරදිකරුද වැරදිකරුද කියලා මම දන්නේ නෑ. ඒත් මම එක දෙයක් විශ්වාස කළා. දේවක කවදාවත් එහෙම දෙයක් කරන කෙනෙක් නෙමේ කියලා. ඒ ඇතිවෙච්ච විශ්වාසයට මම ගරුකරනවා. එයා පොලීසියේ කූඩුවේ යකඩ

කූරු අල්ලගෙන ඉන්නකොට මට ඒ විශ්වාසය වැඩිවුණා. ඒ නිසාම මම උසාවියට ගිහින් දේවකට ඇපගත්තා. ඊටත් පස්සෙයි මේ දේවල් හෙව්වේ. ඒත් ඔයාලා මොනවද කළේ. මොනවද දේවකට නොකිව්වේ. මනුස්සයෙක්ට චෝදනා කරන්න කලින් තමන්ගේ හදවතට තට්ටු කරලා අහන්න මම මේ කරන්නේ හරිම දේද කියලා. දැන් ඔයාලට මේ දේවකගේ මූණ බලන්න බෑ. ඇයි. එහෙම බලනකොට ඔයාලටම ලැජ්ජයි ඔයාලා ගැන. ඒත් මට එහෙම නෑ. සීගිරි එක අලුතින් හදන වැඩපිළිවෙල මේ ප්‍රශ්න නිසා ටිකක් අවුල්වුණා. දේවක සීගිරි එකෙන් අයින් වෙන්න ගියේ. එයා අයින්වෙන්න කලින් සීගිරි එක හදන අලුත් වැඩ පිළිවෙලම මේ සී ආර්

පොතේ ලියලා එයා මට දුන්නා. එහෙම කළේ මේක හදන්න තිබ්බ අවංක ඕනකම නිසා. ඒකට මම ගරු කරනවා. ඒත් මේක හදන්න පුළුවන් ඒක හදනවා කියලා හිතපු මනුස්සයටම තමා. ඒක දේවක අද ඉඳලා කරයි. එහෙම නේද දේවක."

භාවනා ඇසුවාය. දේවක ඉදිරියට ආවේය.

"ඔව් මිස්. ඒක එහෙමම කරනවා. ඊයේ මගේ ජීවිතේ ගොඩක් දේවල්වුනා. කවදාවත් වෙයි කියලා හිතුවේ නැති දේවල් වුනේ. මගේ අප්පච්චී ඊයේ රෑ මගේ අත අල්ලගෙන ඇඬුවා. එයාට මේ දුක දරාගන්න බැරි නිසා. ඒත් මම ඊයේ එක දෙයක් විතරක් තේරුම් ගත්තා. මේ ලෝකයේ මිනිස්සු හරිම

දුෂ්ඨයි. කුරිරුයි. ඒ කුරිරු මිනිස්සු අතර දෙවි දේවතාවියෝ වගේ අයත් ඉන්නවා. කොච්චර චෝදනා ආවත් කොච්චර දෙනා ගැරහුවත් කොච්චර නින්දා අපහාස විඳින්න වුනත් සමහර තැන්වල රැඳෙන්නම හිතෙනවා. ඇයි ඒ. අර මම කියපු එක දෙවියෙක් දේවතාවියක් ළඟට වෙලා ඉන්න ලැබෙන නිසා. මේ සීගිරි එකෙත් එහෙම දේවතාවියක් ඉන්නවා. මම අද උදේ මේ ආවේ ඒ දේවතාවියට මේ ළඟ පන්සලට ගිහින් පිනුත් දීලයි. ඒ දේවතාවියට පින්දෙන ගමන් මම ඒ දේවතාවිය හදපු අම්මටයි තාත්තටයිත් පින් දුන්නා. අපේ මිලින්ද සර්ටයි ඉඳුනිල් මැඩම්ටයි. මට එච්චරයි කියන්න තියෙන්නේ. ස්තූතියි."

දේවක දෑස් සඟවාගෙන බිම

බලාගෙන පසුපසට ආවේය. භාවනාගේ දෙනෙත්වලින් කඳුළක් ගිලිහිණ. මිලින්දද දෑස් බිමට බරකළේය. 'ඇයි මෝඩයෝ මේ ස්ටාෆ් එක ඉස්සරහම මාව ඇඬෙව්වේ.' භාවනාට දේවකගෙන් අසන්නට සිතුණි.

ඒ වෙලාවේදී භාවනා රඹුක්වැල්ල තවත් දෙයක් දැඩිව සිතාගත්තාය. ඒ මේ ආත්ම භවයේ ආදරය කරනවානම් කරන්නේ මේ අඩි දෙකකට එහා සිටින කොල්ලාට පමණක් කියාය.

# 15

මිහිරංග වාහනය ගෙන ඉගිල්ලුනේය. එක දෙයක් වහා කළ යුතුය. ආර්යරත්න සියල්ලම වමාරන්නට ගත්තොත් මේ සීගිරි එකේ පමණක් නොව රටෙත් ඉන්න නැත.

ඔහු කෙළින්ම ගියේ ආර්යරත්නගේ නිවසටය. ඒ වෙද්දී ආර්යරත්නගේ ගෙදරටත් මේ වූ දේ ආරංචි වී තිබුණි. මිහිරංග

ආරියරත්නගේ බිරිඳ පොලීසියට යන්නට පෙරම අල්ලාගත්තේය.

"මොකක්ද සර් දැන් මට කියන්නේ."

ඇය අමුතුම තාලේ ගැහැණියකි. ඒත් දැන් කරන්නට දෙයක් නැත.

එල්ලෙන්නට ඇත්තේ ඇගේ සාරි පොටේ පමණි.

"කලබල නොවී මේ අහන්නකෝ අක්කා. අක්කා කලබල වෙනවනේ."

මිහිරංග ඕනවටත් වඩා බයාදු විය.

"ආරිට කියන්න මොනවත්ම කියන්න එපා කියලා. මම ලෝයර් කෙනෙක්ව අල්ලලා ආරිට ඇප ගන්නම්. ඒක මහ දෙයක් නෙමේ. ආරිට කියන්න වෙන කාගෙවත් නමක් මේකට ගාවන්න එපා කියලා

අක්කා. මම ලක්ෂයක් දෙන්නම්"

මිහිරංග කීවේය.

"ලක්ෂෙකට හිරේ යන්නේ කවුද සර්. මම රෙදි මහලුත් ලක්ෂයක් හොයනවා. මට ගාණක් කියන්න. මම ආරි එක්ක කතාකරන්නම්. මම කියන දේ එයා කරනවා. දරුවන්ටත් දැන් ලැජ්ජයි. උසාවි ගානේ ගිහින් ඇප අරන් එනකොට ලක්ෂේ මඟදී ආප්ප කන්නත් මදි."

මිහිරංග අසරණව බැලුවේය.

"අක්කා කීයක්ද ඉල්ලන්නේ."

"මට පහක් දෙන්න. මම මේක සෙට්ල් කරන්නම්. පුළුවන්නම් කියන්න. නැත්නම් මට කොයිකත් එකයි."

ඇය එහෙමම කීවාය. මිහිරංගට කරකියා ගන්නට දෙයක් නැති විය.

'කමක් නෑ කෝසලගෙන් ඉතුරු එක ගන්නවා.' ඔහු සිතුවේය.

"අක්කා එහෙනම් කතාකරලා මට කෝල් එකක් ගන්නකෝ"

"ආයේ කතාකරන්න දෙයක් නෑ. මට හතරට කලින් පහක් ගෙනත් දෙන්න. මේක සෙට්ල්"

ඇය කීවාය. 'මේ ගෑණි හොඳයි දේශපාලනේට ඩීල් දාන්න.' මිහිරංග ඇයට හොඳ කුණුහරුප දෙකකින් සිතින් බැණ්නේය.

"මං ආරිගේ රස්සාව නැතිවෙන්න දෙන්නෙත් නෑ."

"ඒක අපි බලාගමු. සර් හතරට කලින් ආවොත් විතරක්. මම දැන් යනවා ආරිව බලන්න. මම කියන විදිහට එයා කරන්නේ."

මිහිරංග පෙරලා ආවේ මේ වූ

දේ සිතාගන්නවත් නොහැකිවය. 'මූ සීසීටීවී ගැලෙව්වා කිව්වනේ. ෂිහ්. ඒක ටිකක් ඩබල් චෙක් කරගන්න බැරිවුණානේ. ආයේ කට උත්තර නෑ.' මිහිරංග බියම වූයේ භාවනා මේ දර්ශන යන අතරවාරයේ තමා දෙසම වරින්වර බැලූ නිසාය. 'බලමුකෝ. මේ පාර උඹ දින්නා දේවක. ඒත් ආයේ දෙනවා ගේම.' ඔහු තොල්පට ලේ රස දැනෙන තරමට හපාගෙන කීවේය.

දැන් කරනා දෙයක් කළ යුත්තේ පරිස්සමින් බව මිහිරංග දැනගෙන උන්නේය. භාවනා ඉන්නේ තමා දෙස ඇහැ ගසාගෙන බව මිහිරංග දනී.

"උඹ ඔහොම ටිකක් නටපන්කෝ. බලපං මම උඹට කරන දේ. ඒක අද හිතාගත්තා. සීගිරි එක විතරක්

නෙමේ. මම උඹවත් ක්ලෝස් කරලා නවතින්නේ.”

මිහිරංග දැඩිව සිතාගත්තේය.

*** *** *** *** ***

රඹුක්වැල්ල මහතා දේවකවත් භාවනාවත් නේත්‍රාවත් තමාගේ කාමරයට කැඳෙව්වේ ටිකක් කතා කරන්නට ඕනා නිසාය. ඔහුගේ හිතට හරි නැත. දැන් තමා ඉගෙන ගත යුත්තේ වෙන කාගෙන්වත් නොවේ. තමාගේම මිණිපිරියගෙනි. කෙල්ල තමාට වඩා උසස්ය.

රඹුක්වැල්ල මහතාගේ කාමරයට යද්දී භාවනා දේවක දෙස නෙත් ඔසවා බැලුවාය. ඔහුගේ ඇස්වල වූයේ කියාගත නොහැකි

කෘතඥතාපූර්වක හැඟීමකි. මේ දැන් හදවතට දැනෙන නිවන දුන්නේ ඇයය. ඒ වෙනුවෙන් දවසක් දාගෙන පින්දෙන්නට ඔහු සිතාගෙන උන්නේය. මෙහෙම යන එනගමන් වචනයක් දෙකක් කීම මදිය.

ඔහු ඉන්නේ දාහක් දේවල් කියන්නට බලාගෙන බව භාවනාද දැනගෙන උන්නාය.

"වැඩ ටික බැලුවද පුතා."

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"ඔව් සර්. ආයෙත් වැඩ පටන් ගත්තා. ප්‍රශ්නයක් නෑ සර්."

දේවක කීවේය.

"ප්‍රශ්නයක් වෙන්න තිබුණා. ඔයාව අපිට නැතිවුණානම්."

රඹුක්වැල්ල මහතා කීවේය. එසේ කියා ඔහු බැලුවේ භාවනා දෙසය.

ඇයගේ මුහුණ අද පිපි කුසුමක් වාගේය. ඒ තරම්ම පිපී ඇත.

"ඔයාගෙන් ඉගෙන ගන්න ගොඩක් දේවල් තියෙනවා සුද්දි."

භාවනා සිනාසුණාය.

"ඒවා මට ආවේ මගේ පවුලෙන්ම තමයි සීයා. විශේෂයෙන් ඔයාගෙන්."

ඇය කීවාය.

"නෑ පුතේ. ඒවා හැමෝ ළඟම නෑ. මට ඒක අද ගොඩක් තේරුණා."

මුවින් නොකීවද රඹුක්වැල්ල මහතා බොහෝ දේවල් සිතුවේය.

"මේක පිටිපස්සේ තවත් අය ඉන්නවා කියලා මම දන්නවා."

ඔහු කීවේය.

"මම සීගිරි එක වෙනුවෙන් දෙයක් කියන්නද සර්."

ද්වක ඇසුවේය.

"කියන්න පුතා."

"මේ කතන්දරේ මෙතනින්ම නතරකරමු සර්. අපි අලුතින් නැගිටින්න යන්නේ. එහෙම නැගිටින්න යන වෙලාවක මේක අස්සේ තියෙන වෙන ප්‍රශ්න ගැන එළියට යන්න හොඳ නෑ නේද? යනවානම් යන්න ඕන ලස්සන නිව්ස් එකක්. මේ හොරකම අස්සේ ගොඩක් දේවල් තියෙනවා. ඇත්ත. අපි ඒක සර් ආරියරත්නගෙන්ම ඉවර කරමු. අපිට හිතන්න වෙන දේවල් තියෙනවා. කරන්න වැඩ තියෙනවා."

රඹුක්වැල්ල මහතා බැලුවේ භාවනාත් නේත්‍රාත් දෙසය.

"මල්ලි කියන කතාවේ ඇත්තක් තියෙනවා සීයා. නේද සුද්දි."

භාවනා කතා කළේ නැත.

"ආයෙත් මේ වගේ දෙයක් වෙන්න බෑ සීයා. එදාට අපිට ගොඩක් පසුතැවෙන්න වෙයි."

භාවනා කීවාය.

"මම දන්නවා."

රඹුක්වැල්ල මහතාගේ ස්වරයේ වූයේ පරාජිත බවකි.

"ඒත් දේවකට කරදරයක් වෙන්නේ නෑ. මට ඒක විශ්වාසයි. එයාම ඔය කියන්නේ දේවතාවියක් ඉන්නවා කියලා ආරක්ෂා කරන්න. තව මොනවද?"

රඹුක්වැල්ල මහතාගේ කතාවට භාවනාගේ මුහුණ රතුවිය. එහෙත් මේ කතාව කීම ගැන ඇයට ආඩම්බරයක් දැනෙයි. දේවක අසරණව ඇය දෙස බැලුවේය.

"මේ සීගිරි එක සදහටම වහලා දානවාට ගොඩක් අය කැමතියි සීයා. එහෙම වෙනවානම් මේ කරන දේවල ප්‍රතිඵලයක් නෑ. හැමෝටම ඕනේ මේක වහලා දාලා මේ ප්‍රොපටී එක බෙදාගෙන තමන්ගේ කොටහ ගන්න. අරන් හොඳ ගාණකට දෙන්න."

ඒ කතාව ගැන රඹුක්වැල්ල මහතා නොදන්නවා නොවේ.

"මං දන්නවා. මේක මම කවදාවත් වහන්නේ නෑ. ඒ වගේම මේ සීගිරි එක කවදාහරි මම දෙන්නේ මේක කරගෙන යන්න ආසාවක් තියෙන අයට විතරයි."

"මම එහෙම කිව්වේ මේවා ගන්න හිතාගෙන නෙමේ සීයා."

ඇය බියාදුව කීවාය.

"ඔයා දේපොළවලට කෑදර

නෑ කියලා මම දන්නවා පුතේ. ඒක කියන්න එපා. ඒත් මේක මම දෙන්නේ කාටද කියලා හිතාගෙන ඉවරයි."

නේත්‍රා සිනාසුනාය. දෙනවානම් මේ සීගිරි එක දිය යුත්තේ කෙල්ලටත් කෙල්ල විවාහවෙන කොල්ලාටත්ය. අනෙක් අයට දෙන දෙයක් සීගිරි එකේ ලාබයෙන් දෙන්නට පුළුවන. එහෙත් සීගිරි එකේ අයිතිය දිය යුත්තේ කෙල්ලටය. නේත්‍රා සිතුවේ එහෙමය.

# 16

භාවනා කීවාක් මෙන්ම සීගිරි හී කාර්ය මණ්ඩලයට ද්වේකට මුහුණ දෙන්නට ලැජ්ජාවක් විය. බොහෝ දෙනා ඔහු හා සිනාසුනේ සමාව ඉල්ලන්නාක් මෙන්ය. එහෙත් ද්වේක කිසිවක් නොවුනා සේ සියල්ලන්ම සමඟ වැඩ කළේය.

මිහිරංගවත් කෝසළවත් පෙනෙන්නට උන්නේ නැත. භාවනා මෙන්ද ද්වේකද ඇත්ත දැනගෙන

උන්නෝය. එසේම රඹුක්වැල්ල මහතාද ඒ ඇත්ත දැනගෙන උන්නේය. මිහිරංගට හෝ කෝසළට එරෙහිව ක්‍රියාමාර්ගයක් ගන්නවා කියන්නේ සීගිරි පවුල සීසීකඩ යාමය. ඒ පවුලේ ප්‍රශ්න උත්සන්න වීමය. සහෝදරයෝ සහෝදරියෝ ඇණ කොටා ගැනීමය. ඒ තත්වයට සීගිරි පවුල ඇද වැටෙන්නට නොදී රැකගැනීම වෙනුවෙන් බොහෝ දේ ඉවසාගෙන ඉන්නට රඹුක්වැල්ල මහතා තීරණය කළේය.

"මේක අදින්න යන්න එපා සුද්දි. දේවකට දැන් වැඩකරගෙන යන්න පුළුවන්නේ. මෙතනින් එහාට ඕවා ගැන අදින්න එපා."

මිලින්ද කතාකර කෙල්ලට කීවේය. භාවනා එකඟ වූවාය. ප්‍රශ්න දාගෙන

යන්නට ඇයද කැමති නැත.

"මට තේරෙනවා තාත්තා."

භාවනා මෘදුව කීවාය.

"ඒත් මම ඔයාව අතාරින්නේ නෑ මිහිරංග. දේවක පොලිස් රිමාන්ඩ් එකේ යකඩ කූරු අස්සේ ඉන්නවා මැවෙන මැවෙන පාරට මම ඔයාට වෛර කරනවා"

ඒත් කෙනෙක් වෙනුවෙන් තවත් කෙනෙක්ට වෛරයක් ඇතිවෙන්නේ ඇයි? ඒ තරම් බැඳීමක් හදවතේ ඇති නිසාද? කැක්කුම කියන්නේ මේකටද? තමාගේ දරුවාට නරකක් කරන කෙනෙක් ගැන අම්මා කෙනෙක්ගේ හිතේ ඇතිවෙන්නේ මේ කැළඹීමද? මේ කැක්කුමද? භාවනා ඇගේ කාමරයට වී තනිවම සිතුවාය.

දේවක ආවේ සියල්ල පෑදෙන

තුරු බලා හිඳය. දැන් සීගිරි එකේ කිසිම හැල හොල්මනක් නැත.

කාමරයේ දොර අසළ පිය ගැටෙන හඬින්ම ඒ දේවක බව භාවනා ඇළිින්නාය. ඇය නෙත් බර කරගෙ නම උන්නාය. ඔහු ආවේ ඇගේ වරළයේ මැද බෙදුම් රේඛාවට දෙනෙත් තබාගෙනමය.

දේවක පැමිණ සන්සුන්ව ඇය ඉදිරියේ වූ පුටුවට බරවුනේය.

"සුද්දි."

ඔහු ගොරෝද හඬකින් කතාකළේය.

"දේවතාවියන්ට සුද්දි කියන්නේ නෑනේ."

ඇය තොල්පට තද කරගෙන නෙත් බරකරගෙනම කීවාය. දැනේ දැන් සිනාවක් පනීයැයි ඇයට සිතුණි.

එහෙත් ඊට සමාන්තරව දෙනෙත් තෙත්ව ගොස් ඇත්තේ ඇයි. ?

"දෙයියෝ අවසර දුන්නාම පුළුවන් ඉතින්."

ඔහු කීවේය.

"මට සුද්දි."

ඇය ඔහු යමක් කියන්නට යද්දීම එය වැළැක්වූවාය.

"දැන් මොනවත් කියන්න එපා පස්සේ කතාකරමු. ම්. මොකද කට්ටිය කියන්නේ. බලනවද අමුතු විදිහට."

ඇය ඇසුවාය.

"නෑ. සුද්දි කියපු කතාවට දැන් එයාලටම මං දිහා බලන්න ලැජ්ජයි. ඒත් මම වෙනසක් පෙන්නුවේ නෑ. මිනිස්සු කොහෙත් එහෙමයි"

"ම්. ඒක ඇත්ත."

ඇය ප්‍රථම වරට දෙනෙත් ඔසවා

බැලුවාය. අද ලස්සනය. එහෙත් එය කියන්නට සිතෙන්නේ නැත.

"බඩගිනියි."

ඇයට කියවිණ. පුදුමය. එහෙම කියන්නේ ඇයි? බඩගිනිනම් කෑම එක ගෙන්වාගෙන නොකන්නේ ඇයි? එය දේවකට කියන්නේ කවර හේතුවක් නිසාද?

"මට හිතුණා. මේ ආවෙත් ඒකයි. උදේත් කාලා නැතුව ඇති."

ඇය සිනාසුනාය. කන්නට එහෙම සිහියක් තිබුනේ නැත.

"ම්. බත් කන්න අප්පිරියයි. අනාගෙන කන්නත් බෑ. වෙන මොනවාහරිනම් කන්න පුළුවන්"

දේවක සිනාසුනේ හුරතල් දුවෙක්ගේ කතාවකට සිනාසෙන ලෙසිනි.

"මං ගිහින් ආස හිතෙන දෙයක් කන්න අරන් එන්නම්කෝ."

එවර සිනා ගියේ ඇයටය.

"මං කන්න ආස දේවල් දන්නවැයි."

ඇස් ගැටිණ. භාවනා දෙනෙත් බර කළාය.

"මං හිතනවා මම දන්නවා කියලා."

"මි. දැනගන්න එපැයි ඉතින්. මෙච්චර ආරක්ෂා කර දේවතාවිට මොනවද පූජාවට අරන් යන්නේ කියලා. නේද?"

සිනාබර ඇස්වල තෙතමනයක්ද විය. දේවක සිනාසුනේ ආධුනික නළුවෙකු සේය.

"දේවතාවී පොටේටෝ චිප්ස් එක්ක බර්ගර් එහෙම කන්න ආස ඇති නේ."

ඔහු ඇසුවේය.

“දෙනවානම් තුන්වේලටම එහෙම කන්න ආසයි. සෝස් කප් එකකුත් ඕන හොඳේ. රසම රස තක්කාලි සෝස්.”

දේවක නැඟිට්ටේය.

“කොහෙටද දැන් ගේන්න යන්නේ.”

“මෙතන තැනක් තියෙනවා. මං අරගෙන එන්නම්.”

“කාවහරි යවමු.”

“බෑ. මමම අරන් එන්නෝන. ඉන්නකෝ. අක්කා කාලද?”

ඔහුගේ ගුණය ඇත්තේ මෙතනය.

“අක්කටත් එක්කම ගේන්න අයියේ එහෙනම්.”

කාමරයෙන් පිටවී යන්නට ගිය දේවක දොර ළඟදී හැරුණේය. භාවනාගේ දෙනෙත් තිබුනේ පිටුපා යන ගිය දේවක වෙතය. ඔහු

හදිස්සියේ හැරෙද්දී ඇගේ හොරය අසුවිය.

"මං ඉක්මනට එන්නම්."

ඔහු එහෙම කියා ගියේය. භාවනා තනිවම සිනාසුනාය. 'එයාටත් හැරිලා බලන්න ඕනකම තිබුණා.' ඇයට දැන් එය විශ්වාසය.

** ** ** ** ** ** ** **

සීගිරි එකේ සිදුවූ සියල්ල ඉඳුනිල් දැනගත්තේ නේත්‍රාගෙන්ය. ඉඳුනිල්ට දේවකව බලාගැනීමේ අලුත් ආසාවක් ඇතිවිය.

"කොල්ලා පින් දුන්නේ අපේ කෙල්ලට නෙමේ. කෙල්ලව හදපු අම්මටයි තාත්තටයි. නමින්ම කිව්වා අපේ මිලින්ද සර්ටයි ඉඳුනිල්

මැඩම්ටයි කියලා. පව්. අපේ කෙල්ලගේ ඇස්වල කඳුළු උතුරනවා ඒ වෙලාවේ. මටත් අඬුනා අම්මා.”

නේත්‍රා කතාකර කීවාය. ඒ කතාව අසා ඇගේ දෙනෙත්වලටද කඳුළු පිරුණේය. ඇත්තම කියනවානම් තමාගේ දරුවෙක් ගැන ඉඳුනිල් ඇසූ ලස්සනම කතාව එයය. එය කියූ කොල්ලාව මේ දැන් සීගිරි එකට ගොස් බලන්නට තරම් ආසාවක් ඇයට ඇතිවිය.

භාවනා එසේ ආවාට ගියාට පිරිමි දරුවෙක්ගේ ජීවිතයට එහෙම අතගසන්නේ නැති බව ඉඳුනිල් දැනගෙන උන්නාය. හදවතේ බරපතල හැඟීමක් නැත්නම් ඇය එහෙම කරන්නේ නැත. කෙල්ලගේ ජීවිතයට ඇයට ආදරය කරනවා

පමණක් නොව ගෞරවද කරන කොල්ලෙක් පැමිණිය යුතුය. ඒ මේ කොල්ලාමද කියා ඉඳුනිල් දන්නේ නැත. එහෙත් මීට සති කිහිපයකට පෙර කොල්ලාව දුටු පළමු දවසේ හදවතට ආ හැඟීම ඉඳුනිල් සිහිකළාය. පිරිමි දරුවෙක්ගෙන් කළාතුරකින් පෙනෙන වැදගත් විනීත බව එදා දේවකගෙක් ඇය දැක්කාය.

මිලින්ද ඇයට කතාකළේ දහවලේය.

"ආරංචිද සීගිරි එකේ වෙච්ච දේවල් ඉන්දු."

මිලින්ද ඇසුවේ සිනාබරවය.

"මට ලොක්කි කිව්වා."

ඉඳුනිල් සිනාබරව කීවාය.

"දේවතාවියක් කියලා කියන්නේ අපේ කෙල්ල. කොල්ලා පින් දුන්නේ

එයාව හදපු අම්මටයි තාත්තටයි."

මිලින්ද කීවේය. 'එයාටත් ඒ කතාව වැදිලා.' ඉඳුනිල් සිතුවාය. තාත්තා කෙනෙක් එහෙම අහන්න ආසය.

"මටත් ලොක්කි කිව්වා. දරුවෝ හොඳ දෙයක් කළාම එහෙම තමයි. හොඳ අහන්නේ අම්මයි තාත්තයි"

ඉඳුනිල් කීවාය.

"ඔතන මොකක්හරි තියෙනවා."

මිලින්ද කීවේ සැකයෙනි.

"අපි බලාගෙන ඉමුකෝ. නරකම කොල්ලෙක් නෙමේනේ."

"ඒකා අහිංසකයා."

මිලින්ද කීවේ සැහැල්ලුවෙනි.

"ඒත් මේක මෙතනින් නවත්තන්න කියලා මම සුද්දිට කිව්වා. මේක පිටිපස්සේ ඉන්දු මිහිරංගයි කෝසලයි ඉන්නවා. මට ඒක දැනුණා. තාත්තත්

කිව්වා."

ඉඳුනිල්ද එය දැනගෙන උන්නාය.

"මටත් හිතෙනවා. කොල්ලා සීගිරි එක අලුතින් හදන්න බාරගත්තට මේ දෙන්නා කැමති නෑ."

"මේ හේතුව නිසා පවුලේ ප්‍රශ්න ඇතිවෙනවට මම කැමති නෑ"

"ම්."

ඉඳුනිල් මේ ප්‍රශ්න ගැන කතාකරන්නේ නැත. ඒ ඇයගේ ප්‍රතිපත්තියය.

"සුද්දිට ඉන්දුත් කියන්න."

"මං කියන්නම්. මාත් කැමති නෑ කෙල්ල මේ ප්‍රශ්නවලට හිරවෙනවට."

ඉඳුනිල් කීවාය.

# 17

භාවනා උන්නේ දේවක සමඟ තනිවී කතා කිරීමේ දැඩි අවශ්‍යතාවයකිනි. එහෙත් මේ කලබල සීගිරි එක මැද වදන දෙකක් පවා කතාකරන්නේ අමාරුවෙනි.

"අද නයිට් එක අදින්නද යන්නේ."

ඇය දේවකගෙන් ඇසුවාය.

"අද අප්පච්චිත් බලාගෙන ඉන්නවා කතාකරන්න සුද්දි. ඒ නිසා හත විතර වෙනකල් ඉඳලා යන්න

බැලුවේ. රෑට වැඩකරන අයට වැඩ ඔක්කොම පැවරුවා. එළියේ බේකරි ෂොප් එක හදන්න හිටියේ රෑ. උදේ එයාලට එන්න කිව්වා."

දේවක විස්තර කළේය.

"මට චුට්ටක් කතාකරන්න ඕන. ෆයිව් තර්ටි විතර බෝ සෙවණට යනවද?"

ඇය ඇසුවාය. දේවකගේ දෙනෙත් දීප්තිමත් විය. 'එන්න කිව්වේ වෙන දෙයක් කියන්න නෙමේනේ. ඔච්චර දිලිසෙන්නේ' ඇය සිතින් ඒ දිස්නය රස වින්ඳාය.

"මම යන්නම් සුද්දි."

"ම්. මම ෆයිව් තර්ටි එන්නම්. හොඳේ"

දේවක සිනාසුනේය. බෝ සෙවණ උඩ නිස්කලංකය. එහෙත් ඇය මේ

එන්න කියන්නේ කුමක් කියන්නද?

මිහිරංග සීගිරි එකට ආවේ හවස හතරට පමණය. භාවනා උන්නේ අලුත් කැෂියර් සිස්ටම් එක පරීක්ෂා කරමිනි. මිහිරංගව දැක ඇය ඇතුළතින් දැවුණාය. 'තාත්තයි සීයයි කියන නිසා මම ඉවසගෙන ඉන්නවා. අහිංසක කොල්ලව හිරේ දාලා මෙතන පොරක් වෙන්න ගියේ. ඒත් හිතන්න එපා මම අත්අරියි කියලා මේක.' භාවනා සිතින් කීවාය.

මිහිරංගගේ මුහුණ ගන්නට දෙයක් නැතැයි භාවනාට සිතුණි.

"උදේ එකපාරටම අතුරුදහන් වුණානේ. අපිත් බැලුවා කෝ කියලා."

භාවනා ඇඟට පතට නොදැනී කීවාය. 'මේකී මාවමයි සැක කරන්නේ. බලමු මොකද වෙන්නේ

කියලා.' මිහිරංග සිතුවේ චකිතයෙනි.

"මගේ යාළුවෙක් අද යූ කේ ඉඳලා ආවා බබා. කොල්ලව ගන්න එයාපෝට් ගියා."

ඔහු කීවේය. භාවනා තොල්පට තදකරගෙන සිනාසුනාය. ඒ සිනාව මිහිරංගව කුප්පවනු ලැබීය.

"ආරියරත්න ඔක්කොම වමාරයිද දන්නේ නෑ නේද මිහිරංග අයියේ. අපිත් කතාවුණා."

භාවනා කීවේ පරිගණක මොනිටරයට දෑස් තබාගෙනය.

"ඕක සුළු හොරකමක්නේ. මාස තුනක් ඇතුළට දායි"

මිහිරංග ගණනකට නොගෙන කීවේය.

"ඇයි අයියමනේ කිව්වේ මේක ක්‍රිමිනල් කේස් එකක් කියලා. ලක්ෂ

හයක බඩු කියන්නේ සුළු හොරකමක් වෙන්නේ කොහොමද කියලා ඔයාමනේ කිව්වේ නේද. මතක නෑ. සීයයි මායි අක්කයි ඉන්න තැනමනේ දැන් ඇයි මේ කතාව"

භාවනා කීවාය. මිහිරංග උන්නේ දැඩි අපහසුතාවයකිනි.

"තිබ්බ කැෂියර් සිස්ටම් එක හොඳයිනේ"

ඔහු මාතෘකාව මාරු කළ බව භාවනා තේරුම් ගත්තාය. පන්න පන්න යන්න ඇගේ සිතේද ආසාවක් නැත.

"මේක හොඳයි. පරණ සිස්ටම් එක පුදුම අවුල්. ස්ටොක් එක ගන්න ගියාම පැයක් යනවා. අපි අලුතෙන් හැදෙන එකේ හැමදේම අලුත්වෙන එක හොඳයිනේ"

භාවනා කීවාය. මිහිරංග ඒ කතාව ගණනකට ගත්තේ නැත.

"මං යනවා බබා"

භාවනා හිස පමණක් සෙලවූවාය. පිටුපා යන මිහිරංග දෙස ඈය බැලුවේ තොල්පට තදකරගෙන කේන්තිය යටපත් කරගෙනය. 'කොල්ලව හිරකරන තවත් ක්‍රමයක් ගැන හිතන්නේ නෑ කියලා මම හිතන්නේ නෑ. දෙවෙනි පාර ප්ලෑනක් ගහන්නේ මෙහෙම වරදින්න නෙමේ කියලත් මම දන්නවා. කෝකටත් එයාට පරිස්සම් වෙන්න කියනවා.' භාවනා සිතුවාය.

මිහිරංග කෝසළට ඇමතුමක් ගත්තේ කිසිවෙක් නැති තැනකට ගොස්ය.

"කොහෙද යකෝ උඹ."

මිහිරංග ඇසුවේය. උදේ සිට කෝසළ පෙනෙන්නට නැත.

"මම ඔය සීගිරි එක පැත්ත පළාතේ එන්නේ නෑ බං. පිස්සු හැදෙනවා. මාර ලෙඩක්නේ වුනේ. මූ වමාරන්න ගත්තොත් උඹත් ඉවරයි මාත් ඉවරයි. මං සිරාවට බයවෙලා ඉන්නේ. අපි ලස්සනට නාගත්තා."

කෝසළ කියාගෙන ගියේය.

"උඹ මාර පොරක්නේ. එකට ගේම දුන්නනම් එකට හිටපන් යකෝ."

"දැන් මොනවා කරන්නද?"

"මං ආරියරත්නයගේ කේස් එක වහනවා. ඌට ගාණක් දෙනවා. උඹත් ෂෙයා වෙන්නෝන"

"අතේ සතේ නෑ බං."

"එහෙනම් යන්න බලාගෙන ඉඳපන්. මං බේරෙනවා. උඹ තමයි

හිරවෙන්නේ මස්සිනා."

කෝසළ රත්විය.

"පිස්සු කියවන්නෙපා මිහිරංගයා"

"එහෙනං රෑට වරෙන්. ගේම සෙට්ල් කරන්න ඕන. අනික මේ පැත්තේ රවුමක් දාලා ඉඳපන්. නෝන්ඩි වෙන්නේ නැතුව. මේකී හැමදේම බලාගෙන ඉන්නේ."

මිහිරංග කීවේ භාවනා ගැනය.

"ඒකීගේ මූණ බලන්නත් බයයි. මේකී සිරාවට මූව රෙස්කියු කළානේ."

මිහිරංගටත් තියෙන එකම ප්‍රශ්නය එයයි. ඇය නැත්නම් හෙට දේවක ඇතුළේය. නැවැත්විය යුත්තේ දේවක නොව භාවනාය. දැනට එයට සැළසුමක් අත නැත.

මිහිරංග එද්දී දේවක උන්නේ

ඕපන් ඇක්ෂන් කිචන් එක ළඟය. දේවක හිස ඔසවා මිහිරංග දෙස බැලුවේය. ඔහුගේ ඇස්වල තිබූ තියුණු බව මිහිරංගට දරාගෙන ඉන්නට අසීරු විය. ඔහු වහා දුරකථනය කණේ තබාගත්තේය.

දේවක දෙනෙත් ඉවතට ගත්තේය. බොහෝ ඉවසීමෙන් වැඩකළ යුතුය. 'සීගිරි පවුල නිසා උඹ බේරුනා කියලා හිතාගනින් මිහිරංග. ඒත් දවසක් එනවා. එදාට මං පෙන්නන්නම් මං කවුද කියලා. දැනට මෙහෙම යනවා' දේවක සිතින් කීවේය.

*** *** *** *** ***

දේවක ත්‍රී වීලරයට ගොඩවූයේ

ටයි පටිය ගලවා කළිසම් සාක්කුවේ දාගන්නා ගමන්මය. අද මේ ජීවිතයේ උදාවූ වෙනස්ම දවසකි. ඇය නොවන්නට තමා තවමත් ඉන්නේ පොලිස් අත්අඩංගුවේ බව දේවක දැනගෙන උන්නේය. ඒ ගැන ඇයට ස්තූති කරනවාද නැත්නම් පින් දෙනවාද කියා දේවක සිතුවේය. කොහොම කළත් හිතට මදිය.

නගරයට ඉහළ අහස අඳුරුය. පොදයක් යන්තමට වැටෙමින් තිබුණි. මේ වැහිබර සැන්දෑවේ ඇයව රහසිගත තැනකදී හමුවෙනවා කියන එකත් අපූරු දෙයකැයි දේවකට සිතුණි.

එහෙම හමුවෙන්නට කාරණාවක් තිබිය හැකිද? ඇගේ කුඩා හදවතේ තමා ගැන ඇත්තේ කවරාකාර

හැඟීමක්දැයි හරියටම දන්නේ නැත. ඒත් තමා වෙනුවෙන් විශේෂ දෙයක් කළ පළමු කෙනා ලෙස ඇය ගැන මේ හදවතේ අති විශේෂ හැඟීමක් ඇත. 'ඔයා හිතේ ඉන්න තැන වෙන කවුරුවත්ම උන්නේ නෑ කියලා විතරක් මට කියනෑකි. ඒ වගේම ඔයා හිතේ ඉන්න තැනට එහෙම වෙන කෙනෙක්ව ගන්නෙත් නෑ කියලා මට පොරොන්දුවෙන්න පුළුවන්' දේවක සිතින් කීවේය.

බෝ සෙවණ අද පාළුය. ඒ මේ කඩා වැටෙන පොදය නිසාදැයි දේවක සිතුවේය. දේවක තේ එකක් පමණක් ඇණවුම් කළේය.

සිකුරාදා නේත්‍රාගේ ප්‍රතිකාර පටන් ගන්නා දවසය. දේවක වෑයම් කළේ එදිනට පෙර සෑහෙන වැඩ

ටිකක් ඉවරකරගන්නටය. ඒ ගමන නිවනකින් යන්නට පුළුවන් වන්නේ එවිටය. දේවක ඊයේ සිට බියෙන් උන්නේ ඒ ගමන යාගන්නට නොහැකි වේයැයි කියාය. ගියවර ගිය ගමනේ හැම තත්පරයක්ම හදවතේ තැන්පත්ව ඇත්තේ විශේෂ මතකයක් ලෙසිනි. 'ඒ ඔයා නිසා' දේවක සිතුවේය.

කෙල්ල බෝ සෙවණට ආවේ වැස්ස අතරිනි. රූස්ස ගස් දෙකක් නිසා බෝ සෙවණේ පොල් අතු උඩු මහළ පාරට පෙනෙන්නේ නැත. එතනට බොහෝ දෙනා කැමතිත් ඒ නිසාය.

භාවනා බෝ සෙවණේ උඩුමහළට ගියේ දෑස් බරකරගෙනය. 'දැන් ඇයි මං ඔයාට බෝ සෙවණට එන්න

කිව්වේ. ඔයත් බලනවා ඇති මොකද මේ කියලා. උදේ ඉඳලා කියෙව්වනේ. මේකිට පිස්සු කියලා හිතනවත් ඇති.' භාවනා තමාගේම වැඩවලට සිනාසුනාය. එක අතකට ඔහු එහෙම සිතන්නේ නැත. ඔහු තමා ගැන සිතනා හැටි උදේ සියල්ලන්ම ඉදිරියේ කීවේය. ආයේ කිසිවක් කියන්නට අවශ්‍ය නැත.

දෑස් හමුවූයේ ඇය උඩු මහළට එනවාත් සමඟමය. භාවනා ලැටිස් අතරින් පෙනෙන ඒ රුව දෙස යන්තමට බැලුවාය. හදවත ආසා කළ රුවක් දකිද්දී යළි යළිත් ළයට ඇතිවෙන ප්‍රසාදජනක සිතුවිලිවලට කියන්නේ කුමක්ද?

ඔහු දෙනෙත් ගත්තේම නැත. භාවනා තොල්පට තදකරගෙන

පැමිණ ඉඳගත්තාය. පසුව අත් බෑගය ගෙන මේසය මත තැබුවාය. ඔහු එය අයිනට කළේ ඇයගේ මුහුණ හරියට නොපෙනන නිසාය. භාවනා සිනාසුනාය.

"ආප්පයක් කනවද සුද්දි."

දේවක ඇසුවේය.

"කමුකෝ. නැත්නම් අපි දෙන්නව එළවයි මෙතනින්. ප්ලේන්ටියක් බීලා පැයක් ඉන්නවා කියලා."

දේවක ගොස් ආප්පත් සීනි සම්බෝලත් ඇණවුම් කළේය. ඒ අතරවාරයේ ඇය දේවක බොමින් උන් තේ එකේ ඉතිරිව තිබූ අඩ බිව්වාය.

"ඉන්න මං තේ එකක් ඕඩර් කරන්නම්."

"මේ ඇති."

ඇය කීවාය. 'මං බාගේ බිව්වාම මොකෝ.' ඇය තනිවම කියෙව්වාය.

"අප්පච්චි කතාකළාද සුද්දිට."

දේවක ඇසුවේය. ඇයට කතාකරන්නටම ඕනා කියා කීවේ ජීවන්මය.

"ඔව් මේ දැන් එන ගමන් ගත්තේ. පව් හරියට පින් දෙනවා"

අප්පච්චි එහෙම කරන්නට ඇත.

"දවසක බලන්න ඕනමයි කිව්වා. පුංචි කාලෙනේ දැකලා තියෙන්නේ."

දේවකට කියවිණ. කියවුණු කාරණාවේ බරපතලකම ඔහුටද තේරුනේ පසුවය. භාවනා දෙනෙත් ලොකු කරගත්තාය.

"පුංචි කාලේ දැක්කයි කිව්වේ. මාව පුංචි කාලේ දකින්නේ කොහොමද අයියේ අප්පච්චි"

ඇය වහා ඇසුවාය. දේවක තමාගේම ඔළුවට ටොක්කක් ඇණගත්තේය. දැන් මොනවා කියන්නද?

“නෑ මේ එයා කිව්වා දුවලට ආසාවෙන් උන්නා කියලා පුංචි කාලේ එහෙම හිතලා”

“ඉතින් මාව.”

“සුද්දි වගේ සුරංගනාවියක් දකින්න ඇති ඉතින්.”

දේවක එහෙම කීවේය. භාවනා සිනාසුනාය.

“අප්පච්චිටයි පුතාටයි දෙන්නටම පිස්සුනේ අනේ”

එහෙමවත් කියා ගැලවුණා එක හොඳයි කියා දේවකට සිතුණි. එහෙත් දවසක ඇයට මේ කතාවම කියන්නට වෙයි. ‘මම ආස නෑ ඔයාට

බොරුවක් කියන්න. එහෙම බෑ' දේවක සිතුවේය.

"මොනවද අයියේ හිතුවේ."

ඇය ඇසුවාය.

"අද මගේ ජීවිතේ පුදුමම දවසක්."

හදිස්සියේම දේවක මේසය මත එක්ව තිබූ භාවනාගේ සුරත දෑතින්ම බොකුටුකර අල්ලාගත්තේය. භාවනාගේ ළය ඇකිලීගෙන ගියේය. 'අනේ දෙයියනේ එහෙම ඇල්ලුවේ'

"සුද්දි මගෙන් මගේ ජීවිතේම ඉල්ලන්න. මම දෙනවා. මේ කරපු උපකාරයට නෙමේ. හිතට සුද්දි ගැන කියාගන්න බැරි තරම් විශේෂ විදිහට හිතෙන්නේ. උදේ අරම කිව්වනේ."

"ඇයි එහෙම කිව්වේ"

ඇය කඳුළු පුරවාගෙන ඇසුවාය.

"අර නලින් පෙරේරා සිංදුවක කියන්නේ"

"මොකක්ද?"

"මගේ හිතේ තියෙන හැඟුම් කෝටියයි. මා එයින් ඔබට කිව්වේ බාගයයි කියලා"

"මී. කෝටියම කියන්න."

ඇයට කියවිණ.

"ඒක කියන්න මගේ සිංහල දැනුම මදි කියලා මට හිතෙන්නේ"

"දන්න සිංහලෙන් කියන්නකෝ."

භාවනාට කියවිණ. පසුව දෙදෙනාගේම සිනාබර දෙනෙත් එකට ගැටුණි.

"මේක හරි පුදුමයි"

"මටත්. කාටවත් මෙහෙම කරලා නෑ."

"මං දන්නවා."

"මොනවද දන්නේ"

"සුද්දි වගේ කෙල්ලෙක් මෙහෙම කරන්නේ නෑ. සාමාන්‍ය කෙනෙක් නෙමේ."

"මං."

"ම්"

"භූතියෙක් නෙමේනේ."

"එහෙම කියනවද? කවුද කියලා මම උදේ කිව්වනේ"

ඇය දෙනෙත් එසෙව්වාය. ආප්ප අරගෙන ආ නිසා ඔහු ඇයගේ අතින් දෑත් ගත්තේය. භාවනාට හීල්ලින.

"චිකන් කරියක් ගේන්නද මහත්තයා."

"නෑ මේ ඇති."

"බිත්තර ආප්ප"

"මේ හොඳයි"

භාවනා තොල්පට හපාගෙන සිනාව තදකරගත්තාය. වේටර්වරයා ආවේ හොඳම වෙලාවකය. ආයේ ඔහු මේ අත අල්ලාගන්නේ නැත.

දේවක ගත්තේ එක පිඟානක් පමණි. ඔහු එයට ලුණු මිරිසුත් සීනි සම්බෝලත් දැම්මේය. පසුව උණු ආප්පයක් ගෙන ඇයට දුන්නේය.

"අම්මටත් ආප්ප ටිකක් අරන් යමු"

දේවක ඇසුවේය.

"ගන්නෝන තමයි. අක්කා කතාකරලා අම්මට කියලා."

භාවනා කීවාය.

"දැන් ගිහින් කතාවම කියනවා."

ඒ තරම් විශේෂයෙන් මේ කතාව කියන්නේ ඇයි? මේ කතාවේ ප්‍රධාන

චරිතය තමා නොවේද කියා දේවක සිතුවේය.

"වාටි කන්නද ආස."

"මී. වාටි රසයි."

ඇය කීවාය.

"මං නම් මදෙත් කනවා"

දේවකගේ කතාවට ඇයට ඉස්පොල්ලේද ගියේය. ඔහු නැඟිට පිටට තට්ටු කළේය. ඇය සිනාව තදකරගත්තේ අමාරුවෙනි.

"ඒක කුණුහරුපයට ගත්තනේ. මං මොනවා කරන්නද?"

දේවක ලැජ්ජාවෙන් කීවේය.

"ආ එහෙනම් මගේ මදෙත් කන්න."

භාවනා ඇය කමින් උන් ආප්පයේ මදේ කඩා ඔහුට දුන්නේය. ඒ කතාවට දෙදෙනාටම සිනා ගියේය.

භාවනා ඔහුගේ අතට ගැසුවාය. කඳුළු එන තරමට සිනාසී ඇය ඒ බැබලෙන දෑසින්ම ඔහු දෙස බැලුවාය. දෑස් හමුවූයේ සිනාව මැදිනි. කතාකරන ඇස් කියන්නේ කොතරම් රසබර කතාවක්ද?

"සිකුරාදා අපි යනවනේ නේද?"

"හරි බයෙන් උන්නේ ඒ ගමන යන්න බැරිවෙයි කියලා."

දේවක කීවේය.

"මාත් ආසාවෙන් ඉන්නේ"

"රෑට සිංදුවක් කියනවනේ"

"අසන්නන්ගේ ඉල්ලීම් අනුව තමයි"

"සෑහෙන ඉල්ලීම් තියෙයි"

"ම්. එහෙනං කියමු. ඩුවට් එකක් කියන්න එනවද?"

ඇය ඇසුවාය. යුග ගීයක්

කියන්නත් ආසය.

"මම."

"ම්"

"හොඳ වෙයිද?"

"කියලා බලමුකෝ. සිංදු කියන්න බැරිවුණාට කමක් නෑ. වචන ටික කියන්න."

"ඒක මොකක්ද?"

"පුරුදුත් ඇතිනේ ඩුවට් කියලා"

"මම එහෙම කාත් එක්කවත් ඩුවට් කියලා නෑ."

"ෂුව"

"හන්ඩ්‍රඩ් ප්‍රසන්ට්."

"එහෙනං හොඳයි"

ඇය දෙවන ආප්පයෙත් වාටිය කා මදය ඔහුට දුන්නාය.

"මදෙත් රසයිනේ සුද්දි"

"මදේ කන්න. එතකොට ලේසියි. මං වාට්ටිය ඔයා මදේ. ආප්ප තුනක් ඇති අපි දෙන්නට."

ඇයට කියවිණ. දේවක දෙනෙත් ඔසවා බැලුවේය. භාවනා ඒ ඇස්වල බැල්ම දරාගත්තේ පැහැදිලි හදවතකිනි.

"චුට්ටක් පරිස්සම් වෙන්න වෙයි හොඳේ අයියේ."

"මම දන්නවා සුද්දි"

"මේ ගේම එයාලා අත්අරින්නේ නෑ."

"අද බලාගෙන ගියා. මාත් බලාගෙනම හිටියා පස්සේ ෆෝන් එක කනේ ගහගත්තා."

"ඔයාට අනතුරක් කරන්න බෑ"

"සුද්දි ඉන්නකල්"

"එහෙම හිතනවද?"

"හැමදාම."

"මී. එහෙනම් මොනවත් වෙන්නේ නෑ. වෙන්න දෙන්නෙත් නෑ මම"

ඇය ශපත කර කීවාය.

"පේරාදෙණියේදී."

"ඔව් සුද්දි."

"කතාවක් කියන්න තියෙනවා."

"මං අහගෙන ඉන්නම්."

"එහෙම බෑ. අයියටත් කතාවක් කියන්න වෙයි."

දේවක සිනාසුණේ අසරණවය.

"මට ගොඩක් හිත හිත ඉන්න බෑ."

එසේ කීවේ ඇයිද කියාවත් භාවනා දන්නේ නැත. එහෙත් හදවතේ ඇති දේ කියවෙන එක පුදුමයක් නොවේ. එහෙම කියවෙන

එකත් හොඳයි කියා ඇයට දැන් සිතෙයි. දවසක හදවතේ ඇති මේ සියල්ලම ඔහුට කියවෙන්නට පුළුවන. එදාට ඔහු කුමක්නම් කියාවිද? භාවනා ආසාවෙන් ඉන්නේ ඒ ටික බලාගන්නටය.

"අයියේ."

කෙල්ලගේ වචන ආවේ ගොරෝදයක් සමඟය.

"කියන්න සුද්දි."

"මොකක්හරි දෙයක් හැමවෙලාවේම හිතනවා. මං හොඳට දැකලා තියෙනවා. හිතේ තියෙන දෙයක් කියන්නේ නැත්තේ ඇයි."

දේවක දෑස් ඔසවා බැලුවේය. හැමදේකම ඇත්ත ඇයට කියා දැම්මානම් සැනසීමකි. කෙල්ලට කිව්වා කියා කිසිවක් වෙන්නේ නැත.

"හැමෝටම කියන්න කතාවක් තියෙනවා සුද්දි."

"කියන්නේ."

"දවසක ඇහුවේ මං සීගිරි එකට ආපු එකේ මොකක්හරි විශේෂයක් තියෙනවද කියලා."

"ම්."

"එහෙම දෙයක් තියෙනවා. මං නුවර යද්දී කියන්නම්."

භාවනා බලාගෙනම උන්නාය.

"අයියා ආපු එකේ මොකක්ද තියෙනවා කියලා මටත් හිතෙනවා තමයි."

දේවක ඒ ඇස් දෙසම බලාගෙන උන්නේය. භාවනා ඇස් ගත්තේ නැත. හදවත මේ ඇස් බැල්මට තෘෂ්ණාවෙන් ඉදී. ඉතින් ඇස් ගන්නේ කුමකටද?

"රෑ වෙන්න එනවා. සුද්දි දැන් යන්න. අම්මා බලයි."

ඔහුගේ මේ රැකබලාගැනීමට භාවනා ප්‍රිය කළාය. හැම පිරිමියෙක්ගේම සිතේ ඇති ජාගර බව ඔහු තුළ නැත. ඔහු කිව්වානම් මෙතනට වී රෑ අට නමය වෙන තුරු ඉන්නට තමා සූදානම්ය. එහෙත් ඔහු එහෙම තමාව රඳවාගන්නේ නැත.

"පරිස්සමින් ගෙදර යන්න හොඳද? ගිය ගමන් මට මැසේජ් එකක් දාන්න. ආවා කියලා. ඒක අද ඉඳලා කරන්නම ඕන."

හදවත කරා ඇල්පෙනිති තුඩු කෝටි ගණනක් කඩාගෙන ආවාක් මෙන්ය. එය පුදුමාකාර කතාවකි. ජීවිතයක් සම්බන්ධයෙන් ගත්කළ බරපතල කතාවකි.

"මං ඒක හැමදාම කරන්නම්."

"මං යන්නම්."

"ඉන්න සුද්දි මං ආප්ප ටික අරන් දෙන්නම්."

පහළට යද්දී සිමෙන්ති පඩි උඩදී ඔහු පිටුපසින් පැමිණි ඇයගේ හිස පිරිමැද්දාය. දෑස්වලට කඳුළක් කඩාගෙන එනවා භාවනාට දැනුණි. මෙහෙමම හැරී ඔහුව වැළඳගැනීමට තරම් ආශාවක් නොවේනම් තණ්හාවක් ඇයට ඇතිවිය.

"කොණ්ඩේ ඉටි වගේනේ සුද්දි."

දේවක කීවේය.

"ඒකනේ අනේ. මේ ගාන ෂැම්පූ එක කිසි කමකට නෑ."

"ඉතින් අක්කට කිව්වානම් හොඳ ෂැම්පූ එකක් ඩුබායිවලින්ම ගෙනත් දෙයිනේ."

"ඒක තමයි. අද කියන්නෝන."

භාවනා හැරුණාය.

"ඕනදෙයක් තියේනම් කියන්න. මම අක්කට කියන්නම්."

ඇය ඇසුවාය. දේවක සිනාසුනේය.

"මං අමු ලෝකල් ඩයල් එකක් සුද්දි. ලයිෆ්බෝයි කෑල්ලක් ගාලා ළිඳෙන් නාලා පරිප්පුයි පානුයි කාලා නිදාගන්න පුළුවන්. එහෙම මොනවත් ඕන නෑ."

දේවක කීවේය. භාවනා වැළඹිටෙන් ඇන්නාය.

"මටත් එහෙම පුළුවන්."

"පුළුවන් කියලා මම දන්නවා."

ඔහුද කීවේය.

"පරිස්සමින් යන්න. බුදු සරණයි. මං යනවා."

ඇය යන දෙස දේවක බෝ සෙවණ ඇතුළත සිට බලාගෙන උන්නේය. හදවත සීරීගෙන යන්නාක් මෙන්ය. 'ඔයා නුවරදී මට මොනවද කියන්න යන්නේ.' දේවක සිතුවේය. ඉක්මනට සිකුරාදා එනවානම් හොඳයි කියා ඔහුට සිතුණි. ඇගේ හිසට මොහොතකට පෙර අත තබද්දී දැනුණු හැඟීම් මාත්‍රාව දේවක ගණන් කළේය. අදින් පසුව අන් කිසිම ගැහැණියකගේ හිසකට අතක් තබන්නේ නැතැයි ඔහු අද සිතාගත්තේය.

** ** ** ** ** ** ** ** **

අම්මාත් අක්කාත් කතාකරමින් සිටින්නට ඇත්තේ තමා ගැන බව

දෙන්නාගේ ඇස් දකිද්දීම භාවනා සිතාගත්තාය. නේත්‍රා උන්නේ රෝද පුටුවටම වී තේ එකක් බොමිනි. අම්මා ඇය පුටුවක් ඇඳගෙන උන්නාය.

භාවනා ආවේ ආප්ප පාර්සලයද අරගෙනය. 'අද හවස කොල්ලත් එක්ක ආප්ප කන්න යන්න ඇති. මූණෙන් පේනවා පෙරහැරක් යනවා කියලා' නේත්‍රා සිතුවාය. තම බාල සොයුරිය ගැන නේත්‍රාගේ සිතට බියක් දැනෙන්නේ නැත. ඒ ඇයිදැයි ඇය සිතුවේය. 'කෙල්ලගේ ජීවිතේ ඇම්ණෙනවානම් ඇම්ණෙන්නේ දේවක එක්ක. කොල්ලා අහිංසකයා' ඇය තීන්දුකළාය.

"හරි මහන්සියි අනේ."

භාවනා ඇස් මැඬහරිමින් කීවාය.

ඉඳුනිල් සිනාසුනාය.

"අපිනම් අහලා තියෙන්නේ දේවතාවියන්ට මහන්සි දැනෙන්නේ නෑ කියලා."

භාවනා හරි ලස්සන අයිස් ක්‍රීම් සිනාවක් පෑවාය. ඒ සිනාවට අතීතයක් ඇත. මේ කෙල්ලගේ ලස්සනම සිනාව බව ඉඳුනිල් පමණක් නොව නේත්‍රාද දන්නීය. හිතට අධික සතුටක් දැනෙන වෙලාවකදී පමණක් කෙල්ලගේ මුවට මේ සිනාව එයි.

"යන්න අනේ."

භාවනා කීවාය. කෙල්ලගේ කම්මුල් පවා රතුවී ඇත. 'මේ පිස්සා කතාවක් කියලා දැන් ඒක හතර අතේ යනවා.' භාවනා සිතුවාය. එය කොතරම් මිහිරි කතාවක්ද?

"මං ආප්ප ගෙනාවා ඔයාට."

භාවනා ආප්ප පාර්සලය අම්මාගේ අතට දුන්නාය.

"කාත් එක්කද ආප්ප කන්න ගියේ."

ඉඳුනිල් ඇසුවාය. තමාට මෙන්ම අම්මාටද ඉව ඇත. දූලා හදන අම්මලාට එහෙමය.

"ගෙනාවාමත් එක එක කතානේ. ආයේ ගේන්නේ නෑ රොටි කෑල්ලක්වත්."

භාවනා ඇසූ ප්‍රශ්නයට උත්තර නොදී කීවාය. එයට උත්තර නොදුන්නේ බොරුවක් කිව නොහැකි නිසාය.

"යන්න ගිහින් ඇඳුම් මාරුකරගන්න. ඕක පටලගෙන ඉන්නේ කීයේ ඉඳන්ද?"

ඉඳුනිල් කීවාය.

"මට තේ එකක් ඕන. බීලා චුට්ටක් ඇලවෙනවා. හරි මහන්සියි. නින්ද ගියොත් කතාකරන්න අම්මා."

භාවනා ඊයේ රාත්‍රියම නිදි මැරුවාය. ඇඟට දැනෙන මේ අධික වෙහෙස ඒ නිසාය. උඩට යන භාවනා දෙසම බලා ඉඳ ඉඳුනිල් නේත්‍රා දෙස බැලුවාය.

"කතාවක් නොගියොත් තමා පුදුම."

ඇය කීවාය. නේත්‍රා සිනාසුනාය.

"කතාවක් ගියත් අම්මා බයවෙන්න එපා. සමහරවිට කතාවක් යයි තමයි. ඒත් කෙල්ලට කවදාවත් වරදින්නේ නෑ."

වැරදුනේ තමාටය. නේත්‍රා නොකියා කීවේ එයය.

"කෝකටත් ඔයත් ටිකක් බලන්න."

ඉඳුනිල් කීවාය.

"බලනවා අම්මා. මම ඒක කොහොමත් කරනවා. මට වෙච්ච දේවල් මේ කෙල්ලෝ දෙන්නට වෙන්න මම ඉඩ තියන්නේ නෑ. කොහොමටවත් නෑ."

නේත්‍රා කීවේ දෑස් බරකරගෙ නය. ඉඳුනිල්ට සුසුමක් පිටවිය. ඇය කිසිවක් නොකියා රෝද පුටුවේ උන් නේත්‍රාගේ හිස පිරිමැද්දාය. නේත්‍රාගේ ඇස්වලට කඳුළු ආවේ නිතැතිණි.

# 18

දේවක වතුර බාල්දි අසූ ගණනක් ඇදගෙන නෑවේය. හිත ඇත්තේ වෙන තැනකය. කරන දේ වෙලාවකට දන්නේ නැත. ගතට අමුතු සීතලක් දැනෙද්දී දේවක බැලුවේය. මේ රෑ මේ තරම් වතුර බාල්දි ගණනක් ඇදගෙන නෑම හොඳ නැත. නහයත් බරවී ඇත්තේ ඒ නිසාය. ඔහු තමාටම සිනාසුනේය.

“මොනවද වෙලා.”

ඔහු තමාගේම සිතට කියාගත්තේය. දේවක ඉක්මනින් සබන් ගාගෙන තවත් වතුර බාල්දි හත අටක් ඇඟට දමාගෙන හදිස්සියෙන් තුවාය අතට ගත්තේය.

හදවත වටේට මල් පාත්තියක් දැම්මාක් මෙන්ය. මේ දැනෙන අසීමිත සතුට ඒ නිසාය. එක පැත්තකින් අද සම්පූර්ණයෙන් චෝදනාවලින් නිදහස් වූ සැනසීමය. අනිත් අතින් හදවතට දැනෙන ඒ රහසිගත සතුටය.

"පෙඟෙනවනේ පුංචි මහත්තයෝ ඔහොම නෑවාම."

හේරත් කීවේ දේවක තුවායත් කරේ දාගෙන එද්දීය. දේවක සිනාසුනේය.

"මහන්සියට ටිකක් නෑවා හේරත්

මාමා. කුකුල් මස් හොද්දේ සුවඳ මාරයිනේ."

"අද පහේ ටිකක් එහෙම බැදලා අරන් හැදුවේ. නියමෙටම ආවා. අල ටිකක් තෙල් දාලා පරිප්පු තෙම්පරාදුවක් එහෙම හදලා ගන්නවා. අද ස්පෙෂල් දෙන්නෝනනේ."

දේවක සිනාසුනේය.

"හේරත් මාමා හදන හැමදේම ස්පෙෂල් තමයි. ඊයේ අර සැමන් බැදුම මාරයිනේ."

හේරත්ගේ ඇස් දිලිසෙයි.

"මට ජීවන් මල්ලි හැමදේම කිව්වා."

"අප්පච්චි ආවද?"

හේරත් හිස වැනුවේය. ජීවන් ඇඟ ටිකක් සෝදාගන්නට ආවේ

එවිටය.

"අප්පච්චි."

"හැමදාම රෑට නානවනේ පුංචි මහත්තයෝ. ලෙඩක් හදාගන්නද. මටත් තිහෙන් පීනස ආවා."

"මට දැන්මම පීනස වගේ අප්පච්චි."

ඔහු කීවේය. ජීවන් සිනාසුනේය.

"අදින් පස්සේ හවස නාලා අහුවෙන්නේ නෑ."

දේවක සිනාසුනේ හිස වනමිනි.

"මං ඇඟ ටිකක් හෝදගෙන එන්නම්."

ජීවන් ගියේය. හේරත් බැලුවේය.

"අද ටිකක් දාලා ඉන්නේ. තව බාගයක් ගෙනත්. මටත් ටිකක් දාලා දුන්නා."

හේරත් කීවේය. අප්පච්චි බොන්නේ එහෙමත් දවසකටය.

"මං ඒත් බැලුවා මේ ආව ගඳ විනාකිරි ගඳද කියලා."

දේවක කීවේය.

"මේව මහ ජරා බීම පුංචි මහත්තයෝ. පුරුදුවෙන්න එපා."

ආයේ මත්වෙන්නට කිසිවක් බොන්නට ඕන නැත. හිත හොඳට මත්වී ඇත. 'මාව පාවෙනවා වගේ සුද්දි. බෝතලක් ගැහුවා වගේ වෙලාවකට' ඔහු සිතින් කීවේය.

*** *** *** *** ***

දේවක පපඩමක් කමින් බලාගෙන උන්නේ අප්පච්චී එන තුරුය. මෙතන පඩිය උඩ සනීපයය.

අප්පච්චී මෙතනට නෑවිත් කුස්සියට වී කරන්නේ කුමක්ද කියා දේවක දැනගෙන උන්නේය. 'හේරත් මාමා බයිට් එකක් හදලා ඇති' ඔහු සිතුවේය.

කිච්චාක් මෙන්ම ජීවන් ආවේ දේවකට බැදපු කුකුල් මස් කෑල්ලක් අරගෙනය.

"ඉස්සර අප්පච්චි හදන අර ගම්මිරිස් දාපු කුකුල් මස් බැදුම මරුනේ"

"දවසක හදමු."

"ඒකත් එක්ක අපි පාන්නේ කෑවේ. නියමයි"

ජීවන් පොඩි එකාට පාන් පෙතිවල බටර් ගා දුන්නේය. දේවක බටර් පාන් කෑවේ කුකුල් මස් සමඟය. මාසයකට දවසක් එහෙම

කන අප්පච්චීලා පුතාලා අනිත් සේරම දවස්වලට කෑවේ බොහෝ විට පරිප්පුත් පාන්ය. නැත්නම් පොල් සම්බෝලයත් බතුත්ය. කොල්ලා මේ හැමදේකටම පුරුදු බව ජීවන් දනී.

"අප්පච්චි කතාකළා කියලා මැරෙන්න යනවා."

දේවක කීවේය. කොල්ලා කියන්නේ කවුරු ගැනද කියා ජීවන් දනී. ඇය ගැන කතාකරන හැම විටකම කොල්ලාගේ ඇස් බැබලෙයි. 'ද්‍රෝණියන්දෑව මට දීපන් මිලින්ද' දවසක කතාකර මිලින්දට කියන්නට ජීවන්ට සිතෙයි.

"පුදුම දරුවෙක් තමයි."

ජීවන් කීවේය. දේවක සිදුවූ හැමදෙයක්ම අප්පච්චිට කීවේය.

"මම එහෙම කිව්වා අප්පච්චි.

නොකියා බැරිවුණා."

"විශේෂ කෙනෙක් ගැන එහෙම කියන්න වෙනවා පුංචි මහත්තයෝ."

ජීවන් කීවේය.

"ඒත් අප්පච්චි"

"ඇයි පුංචි මහත්තයෝ."

"එයාටයි නේත්‍රා අක්කටයි බොරුවක් කරන්න බෑ. මට හරි දුකයි. එහෙම රවට්ටන්න බෑ."

දේවක කීවේය.

"මේවා දැන්ම කියලා පුංචි මහත්තයෝ."

"ඒ දෙන්නට විතරක් කියන්න වෙනවා. දවසක නැත්නම් මං ගැන මොනවාහරි හිතනවා. මට ඒක අමාරුයි. ඇරත්."

"ඇයි."

"දවසක එයාලා මෙහේ එනවා. නොකියම. මං ඒක දන්නවා."

ජීවන්ද එය දනී.

"ඔයාට හිතෙන දෙයක් කරන්න. වෙන කවුරුවත් මේක දැනගන්න ඕන නෑ."

දේවක හිස වැනුවේය.

"දැන් ආයේ වැඩ පටන් ගත්තද?"

"ඒවා නියමෙට යනවා අප්පච්චි. අද හවස සීයා මාත් එක්ක වටයක් ගියා. එයාට දුකයි"

"සීයා ඔයා ගැන ලොකු විශ්වාසයකින් ඉන්නේ."

"මං ඒක දන්නවා. කාගේවත් විශ්වාසයක් මම බිඳින්නේ නෑ."

"කෝකටත් පරිස්සමින්. සීගිරි එකට ගොඩක් දෙනෙක් බැල්ම දාගෙන ඉන්නේ."

"මට සීගිරි එකක් ඕන නෑ අප්පච්චි."

"මං දන්නවා."

එහෙත් දවසක සීගිරි එක තම කොල්ලාටත් හිමි බව ජීවන් දැනගෙන උන්නේය. ඒ හිමිකම එන්නේ අම්මාගෙනි.

"මේ වැඩ ඉවරවුණාට පස්සේ අපි හිම්හිට නුවර ගිහින් එමු. ඒ ඉඩම විකුණන්න දාන්න ඕන. අපිට ආයේ නුවර යන්න බෑ. මෙහෙන් ඉඩමක් බලලා ගමු. හිම්හිට ගෙයක් හදන්න ගන්න පුළුවන්."

ජීවන් කීවේය.

"නියමෙට ගෙයක් ගහමු නේද අප්පච්චි"

"ඒක කරගන්න පුළුවන් පුංචි මහත්තයෝ."

තමාගේ දෛවය කෙසේ විසඳෙයිද කියා දේවක සිතුවේය. සමහරවිට එයට මහා දවසක් නොයනු ඇත. ඉක්මනින් බොහෝ දේ සිදුවෙයි කියා ඔහුගේ සිත කියන්නට විය. 'ඔයා මගේ ජීවිතේ මායිමටම ඇවිත් කියලා මට නිකමට හිතෙනවා.' දේවක සිතුවේය.

# 19

දේවකව මේ සීගිරි එකෙන් ඉවත්නොකර කිසිවක් කරගන්නට බැරි බව මිහිරංග අද තේරුම් ගත්තේය. දේවක පිටුපසින් ඉන්නේ භාවනාය. ඇය මේ තරම්ම දේවකව ආරක්ෂා කරන්නේ ඇයිදැයි මිහිරංග සිතුවේය.

"උන් දෙන්නා ලව්ද?"

මිහිරංග සිතුවේය. එහෙත් භාවනා මේ හම්පඩ සේවකයෙක්ට

ආදරය කරයි කියා මිහිරංග කිසිදාක සිතුවේ නැත.

"ඒකී අපිටත් පඩ සෝ දාන ගෑනිනේ. හිතන් ඉන්නේ අලි ඔළුවෙන්. කවදාහරි දවසක තදම පොරක් ඇවිත් උස්සයි කියලා හිතාගෙන ඒකී ඉන්නේ. මේ ගස් ගඳයට ලව් කරන්නේ නෑ."

මිහිරංග එතනින් එහා සිතන්නට ගියේ නැත. ආදරය ගැන ඔහු දන්නා ටික එපමණය.

"මූ සීගිරි එකේ හිටියොත් මේක ඇදගෙන යනවා. සීගිරි එක බ්ලාස්ට් කරලා දාලා අපේ ෂෙයා එක ගන්න නාකියා මැරෙනකල් ඉන්නම වෙනවා. ඒත් දෙයිද කියලා සැකයි. මෑන් මේක භාවනාගෙයි නේත්‍රාගෙයි නමට ලියලා වලකජ්ජ ගැහුවොත්.

බිලාස්ට්ිනේ."

ඒ ටික ඔහු කරයි කියා මිහිරංගට ටික දවසක සිට සැකයක් ආවේය. තමාට හිමි දේපොළක් එහෙම තමන් කැමති කෙනෙක්ට ලියන්නට පුළුවන. සීයා කියන්නේ තාත්තා නොවේ. දරුවන්ට අයිති තාත්තාගේ දේපොළය. සීයාගේ දේපොළ එහෙම මුණුපුරුන්ට අයිතිමයි කියා නීතියක් නැත.

මිහිරංග එය දැනගෙන උන්නේය.

"ආයේ ලයිෆ් එක ගොඩදාගන්න විදිහක් ඇත්තෙත් නෑ. කරුමෙට බිස්නස් කට්ටක් සෙට්වෙන්නෙත් නෑ. මේකේ රස්සාවකරගෙන ඉන්න වෙනවා. ඊකත් දැන් මුන්ට ඕන විදිහට."

සියල්ල වෙනස් කළේ මේ

දේවකය. ඊට කලින් සීගිරි සේල්ස් එකෙන් මිහිරංග රුපියල් ලක්ෂයක් දෙකක් කපාගත්තේය. ඒ ගැන කිසිවෙක් දැනගෙන උන්නේද නැත. වතාවක් ඔහු කැෂියර් එකේ කෙල්ලෙක්ව සෙට් කරගෙන කලෙක්ෂන් එකෙන්ද දවසකට රුපියල් පන්දාහක් පමණ පැන්නුවේය. එය කළේ කැෂියර් මැෂින්වල කලෙක්ෂන් රිපෝට් එක වෙනස් කරන හැටි ඉගෙන ගෙනය. මිහිරංග කෙල්ලනව ඉරිදාට බීච් රූම් එකකට එක්කාගෙන ගොස් ලස්සන හීනයක් පෙන්නුවේය. කෙල්ල මිහිරංගට වශීවී ඔහු කියන කියන දේ කළාය.

අවසානයේ කලෙක්ෂන් එකේ අඩුවීම ගැන භාවනා දැනගත්තාය. ඇය ඒ ගැන සොයන්නට පෙර

මිහිරංග කෙල්ලව බයකර ඇයව රස්සාවෙන් ඉවත්කළාය.

දැන් මේ කිසිවක් කරන්නට නොහැක්කේ දේවක නිසාය. ඔහු සීගිරි එකේ සම්පූර්ණ වගකීම් කරට ගෙන උන්නේය.

“ප්ලෑනක් ගහන්නම වෙනවා මූව යවන්න. ගිය පාර වගේ කැඳවෙන ප්ලෑනක් බෑ.”

මිහිරංග හතර අතේ සිතුවේය. දවසක් දෙකක් යනවිට හොඳ ප්ලෑනක් හිතට එන බව ඔහු දැනගෙන උන්නේය.

“බලමු.”

හැමදාම එකම දේ වෙන්නේ නැත. දවසක තමාගේ පැත්තටත් බඹරය කැරකෙන බව මිහිරංග දැනගෙන උන්නේය. එදාට

සීගිරි එකේ සම්පූර්ණ මෙහෙයුම තමාගේ අතට ගන්නවා කියා ඔහු සිතාගත්තේය.

මිලින්ද ඉඳුනිල්ට කතාකළේ විශේෂ දෙයක් කියන්නටය. මිලින්ද භාවනාට කතාකරන්නට ප්‍රථම ඉඳුනිල් කතාකළාය. ඇයට මිලින්ද කතාකළේ දැන් ටිකකට කළිනි.

"සූරියි වයිෆුයි කොල්ලයි අද අපේ ගෙදර ඩිනර් එකට එනවා ඉන්දු. කෙල්ලටත් වේලාසන ඇවිත් ඉන්න කියන්න."

මිලින්ද විශේෂයෙන් කෙල්ල යැයි කිව්වේ කාටද කියා ඉඳුනිල්ට එකවර හිතාගන්නට නොහැකි විය. ඇයට කෙල්ලෝ තුන්දෙනෙක් ඇත.

"කෙල්ල කිව්වේ."

"කෙල්ල කිව්වේ සුද්දිට. මට

නිකමට සූරි කිව්ව කතාවකින් තේරුණා එයාලා එන්නේ කෙල්ලව බලන්නද කියලත්. මම කිව්වේ ඉන්දු මට දවසක් තාත්තවයි පුතාවයි හම්බවුණා කියලා එයාපෝට් එකේදී. ෂෝක් කොල්ලා. දැන් ලෝයර් කෙනෙක්. මේ ඊයේ පෙරේදා දිව්රුම් දුන්නේ. මගේ යාළුවෙක් නිසා කියනවා නෙමේ. සූරි හරිම හොඳ මිනිහෙක්. අනික හොඳම ෆැමිලි එකක්. සූරිගේ වයිෆ්ව ඉන්දුට මතකයිනේ"

ඉඳුනිල්ගේ පපුවත් එක්ක වෙව්ලන්නට විය. මිලින්ද මේ තරම් ඉක්මනට කෙල්ලව දෙන්නට සිතුවේ ඇයි?

"මතකයි."

"මොකද ඉන්දු."

"ඔයාම කෙල්ලට කියන්නකෝ. මේ කෙල්ල මගෙන් දාහක් ප්‍රශ්න අහනවා."

මිලින්ද සිනාසුණේය.

"ඉන්දු පොඩි දෝණිට ඔච්චර බයද? මමත් කියන්නම්. ඉන්දු කියලා තියන්න. එහෙමම කියලා නෑ. ඒත් කෙල්ල ඉන්නෝන. මේ කෙල්ල සීගිරි එකේ ඉඳලා කීයට එයිද දන්නේ නෑනේ. මට ආසයි කෙල්ලව සූරිට පෙන්නන්නත්."

ඉඳුනිල්ට දාඩියත් දැම්මාය. මේ වෙලාවේ කෙල්ල ඉන්නේ මොකක්ද සතුටකිනි. එය ඉවෙන් මෙන් ඉඳුනිල්ට දැනෙයි. ඇරත් මේ දෝණියන්දලෑ සමඟ මේවා කතාකරන්නට ගොස් වෙන්නේ කොහොමත් බැණුම් අහන්නටය.

පොඩි කෙල්ලගේ හැටි ඉඳුනිල් දනී.

"මෙච්චර ඉක්මනට කෙල්ල ගැන එහෙම හිතුවද"

"ඇයි ඉන්දු හිතාගෙන ඉන්නේ කෙල්ලව තම කොච්චර කාලයක් තියාගෙන ඉන්නද? ආ. විසි එකක් දැන් භාවනාට. අනිත් කෙනා ගැන හෙට අනිද්දා හිතන්න බෑනේ. එයා දවස ගානේ ෆ්ලයි කරනවනේ. මට නේත්‍රා ගැනත් හිතන්න තියෙනවා ඉන්දු. මුලින්ම මේවා ගැන හිතලා ඉමු."

මිලින්ද කීවේය. ඉඳුනිල්ට මිලින්ද ගැන දුකත් ඇතිවිය. ඇය සිතුවේ ඔහු මේ කිසිවක් ගැන මේ දවස්වල හිතන්නේවත් නැතැයි කියාය. මේ කියන කතාවක් ඇත්තය.

"අපි නේත්‍රාගෙන් ලොකු පාඩමක්

ඉගෙනගත්තා. ඒකට අපි තාමත් දුක් විඳිනවා. මම ආයේ කෙල්ලෙක්ව දෙන්නේ ගොඩක් හිතලා ඉන්දු. එහෙම ආවට ගියාට කෙල්ලෝ දෙන්නව දෙන්නේ නෑ."

මිලින්ද වගකීමෙන් කීවේය.

"කෑම ටිකක් හොඳට හදන්න වෙයි නේද"

"ඔව්. මාත් මොනවාහරි අරන් එන්නම්. දැන්ම කතාකරලා සුද්දිට කියන්න"

"මං කියන්නම්."

වෙන මොනවා කරන්නද කියා ඉඳුනිල්ද සිතුවාය. ඉඳුනිල් කතාකරන මොහොතේදී භාවනා උන්නේ සීගිරි එක යළිත් විවෘත කිරීමේ අවසන් සැළසුම දේවක සමඟ කතාකරමිනි. දේවක අද සීගිරි එකට ඇවිත්

තිබුනේ පාන්දර පහටය. මේ කැපවීම කෙනෙක්ට පුදුමයක් ඇතිකරවන එකකි. උදේ සීගිරි එකට යනවිටත් ඔහු කොන්ත්‍රාත්කරුවන් සමඟ වැඩ සියල්ල ලබන සතියට පෙර නිමා කිරීම ගැන කතාකරමින් උන්නේය. භාවනාටනම් කලන්තයක් වාගේ ආවාය. මේ සියල්ල ලබන සතිය වෙද්දී ඉවරවෙනවා කියා හිතනකොටත් පුදුමය.

“මීට් සෙක්ෂන් එකයි ඕපන් කිචන් එකෙයි වැඩ හෙට ඉවරවෙනවා. මන්ඩේ වෙද්දි කා පාක් එකයි එළියේ බේකරි ෂොප් එකයි හදලා ඉවරවෙනවා. ඊට පස්සේ අපිට රැක්ස් ටික ඕගනයිස් කරගන්න පුළුවන්.”

දේවක කීවේය. නේත්‍රා දේවක

දෙස බැලුවාය.

"අලුත් යුනිෆෝම් එක ස්ටාෆ් එක ප්‍රිටෝන් කරන්න වෙයි නේද මල්ලි."

"එයාලත් සඳුදා එනවා අක්කා. කැෂියර් සිස්ටම් එකටත් මන්ඩේ එනවා. මම එයාලට කියලා තියෙන්නේ අපි නෙක්ස්ට් මන්ඩේ ඕපන් කරනවා කියලානමුත් අපි නෙක්ස්ට් ෆ්‍රයිඩේනේ ඕපන් කරන්නේ."

නේත්‍රා භාවනා දෙස බැලුවාය. අක්කාගේ ඇස්වලද කුතුහලයක් විනැයි භාවනාට සිතුණි.

"පුළුවන් වෙයි නේද මල්ලි."

නේත්‍රා ඇසුවේ බියෙන් මෙන්ය.

"අපි සියයට අනූවක් අපි හිතපු විදිහටම කරමු අක්කා. හැමදේම."

ඔහු කීවේය. භාවනා ඇය අත

රැළි පෑන කටේ ගසාගෙන දෙනෙත් බරකරගෙන උන්නාය.

"මේ ෆ්රයිඩේ අපි පේරාදෙණියේ යන එක මල්ලි අමාරුයි නේද?"

නේත්‍රා ඇසුවාය. පේරාදෙණියේ යනවානම් කොල්ලත් යා යුතුමය. එහෙත් ඔහු ඒ දවස් දෙකේ කොළඹ සිටිය යුතුමය.

"නෑ අක්කා. ඒක හිතන්න එපා. අපි යනවා. මම අද උදේ වෙද මහත්තයට කතාකළා. මාළිගාවට පඬුරකුත් දාගෙන එන්න කියලා වෙද මහත්තයා කිව්වේ. අපි යනවා. හැමදේම මට ෆෝන් එකෙන් බලලා කරන්න පුළුවන්."

භාවනාත් බයේ උන්නේ නුවර ගමන යන්නට නොහැකි වේ යැයි කියාය. ඒ ගමන ගැන ඇගේ

හදවතේ කියාගත නොහැකි අසීමිත ආසාවක් ඇත. නුවර නවතින සිකුරාදා රාත්‍රිය හදවතට රහස් උමඟකින් අලුත් එළියක් ගලන රැ යක් වැනිය.

ඉඳුනිල් කතාකළේ එවිටය. අම්මා මේ අවේලාවේ කතාකරද්දී භාවනාට බයකුත් ඇතිවිය.

"අම්මා ඇයි මේ වෙලාවේ අක්කා"

භාවනා ඇමතුම සම්බන්ධ කරගත්තේ එහෙමත් කියාය. නේත්‍රා පමණක් නොව දේවකද කෙල්ලගේ කට දෙස බලාගෙන උන්නෝය.

"අම්මා. කියන්න."

"ඔයා වැඩකද සුද්දි."

"ඔව් අනේ වැඩ. කතාකළේ ඇයි කියන්නකෝ."

භාවනා ඇසුවාය.

"නෑ මේ තාත්තා දැන් කතාකළා"

"ඇයි තාත්තා."

"නෑ නෑ හදිස්සියක් නෑ. මේ පණිවිඩයක් කියන්න කතාකළේ"

අම්මාගේ වචනවල අමුත්තක් ඇතැයි භාවනාට සිතුණි.

"ඇයි අම්මා. මොකටද තාත්තා කතාකළේ"

"මේ හවස කට්ටියක් ඩිනර් එකට එනවා කියන්න."

"ඔයාටත් පිස්සු අනේ. මාව බයත් කරනවා. හවස කට්ටියක් ඩිනර් එනවා කියලා මේ හදිස්සියේ මට කියන්න කතාකළේ. අපි මෙතන බයත් වෙනවනේ."

භාවනා කීවාය. නේත්‍රා සිනාසුනාය.

"මේ තාත්තා කිව්වා මේ."

අම්මා කියන්නට හදන්නේ කුමක්ද? භාවනාගේ හිතට නැති බියක් ආවේය. 'හවස එන්නේ කවුද' ඇය සිතුවාය.

"කියන්නකෝ අනේ. ඇයි"

නේත්‍රාගේත් දේවකගේත් පපුව අලුතින් ඇවිලිණ. 'මේකි අම්මා එක්ක කතාකරන විදිහට අපෙත් පපුව පිච්චෙනවනේ' නේත්‍රා සිතුවාය.

"ඔයාටත් ටිකක් වේලාසන එන්න කියලා කිව්වා."

ඉඳුනිල් කීවාය. ඇය එය කීවේ ටිකක් සැර බාල කරය. කෙල්ලගේ හැටි ඉඳුනිල් හොඳින් දනී.

"ඇයි මට විශේෂයෙන් වේලාසන එන්න කියන්නේ. ආ අම්මා. කවුද රෑට ඩිනර් එකට එන්නේ."

නේත්‍රාට යමක් සිතුණි. ඇයට

බැලුවනේ දේවක දෙසය. කොල්ලා නෙත් ඔබාගෙන උන්නේය.

'කොල්ලටත් මොනවාහරි තේරෙනවා ඇති'

"මේ අර සූරි අන්කල්ලා. මතකයි නේද සූරි අන්කල්ව. අර නාවල ඉන්නේ."

"මතකයි ඉතින්. එයාලද එන්නේ"

"ඔව් සූරි අන්කලුයි ඒ ඇන්ටියි එයාලගේ පුතයි. පුතා දැන් ලෝයර් කෙනෙක්ලු"

සූරි අන්කල්ගේ පුතා ගැන විශේෂයෙන් කියන්නේ ඇයි? භාවනා සිතුවාය. ඇයට බැලුනේ හාෆ් ෂීට් එකට නෙත් ඔබාගෙන මොනවද ලියන දේවක දෙසය. 'ඔයත් ළඟ. මේ මොනවද අම්මා කියන්නේ'

"ඉතින් මට මොකද අම්මා"

භාවනා ගත් කටටම කීවාය. නේත්‍රාට ඇගේ සැකය වැඩිවිය.

"එහෙම දෙයක් නෑ. වේලාසන අක්කත් එක්කම එන්නකෝ. ඔයා පරක්කුවෙනවනේ නැත්නම්."

"මේ දවස්වල වැඩනේ අම්මා. මම අද නමය විතර වෙලා එන්න උන්නේ"

"එහෙම එපා. හය වෙද්දී ඇවිත් ඉන්න. තාත්තා ඒකයි වේලාසනම කිව්වේ"

තාත්තා විශේෂයෙන් අම්මාට කතාකර එවැන්නක් කීවේ ඇයිදැයි භාවනා සිතුවාය. විශේෂ යමක් නැත්නම් තාත්තා එහෙම කරන්නේ නැත.

"ගෙදරට අමුත්තෙක් එනකොට ගෙදර අය ඉන්න එපැයි. පොඩි

අක්කත් නෑනේ."

අම්මා තමාගෙන් යමක් සඟවනවා කියා භාවනාට සිතුණි.

"කියන දෙයක් කියන්න අම්මා. ඇයි ඒ."

දේවකද බැලුවේය.

"එහෙම නෑ. තාත්තා නිකං කියන්න ඇත්තේ. ඔයා එන්නකෝ වේලාසන. එනකොට හොඳ කේක් එකකුත් අරන් එන්න. චොකලට් කේක් එකක් වගේ"

"ම්. හතවත් වෙයි මම එන්න. මෙතන වැඩනේ."

"මං දන්නේ නෑ. තාත්තා කතාකළාම කියන්න. එයත් දැන් කතාකරයි."

"ආයේ තාත්තත් කතාකරන්නේ මොකටද. දෙන්නත් එක්ක මොනවා

කරනවද මන්දන්නේ නෑ."

භාවනා කීවාය. දේවකට යමෙක් දැනුණි. භාවනා දුරකථනය තබා නේත්‍රා දෙස බැලුවාය.

"ඇයි සුද්දි."

"පිස්සු අනේ මෙයාලට. සූරි අන්කලුයි ඒ ඇන්ටියි එයාලගේ මොකෙක්ද පුතෙකුයි ඩිනර් එනවලු. මටත් වේලාසන ඇවිත් ඉන්නලු. මෙතන මාව මොකටද?"

දේවක බැලුවේ සරල සිනාවක් සමඟය. 'ඔයාව දෙන්නද දන්නේ නෑ යන්නේ. තේරෙන්නේ නැද්ද සුද්දි තාත්තා කරන්න යන දේ' දේවක පෑනෙන් මැදගිල්ලට ඇනගත්තේය. භාවනා ඔහුගේ අතට ගැසුවාය.

"පිස්සුද අතට ඇණගන්නේ."

දේවක පමණක් නොව නේත්‍රාද

සිනාසුනෝය.

"නිකං වෙන්න ඇති බබා"

නේත්‍රා කීවාය.

"නිකං නම් හොඳයි. මට ඇල්ලුවේ නෑ අම්මගේ කතාව."

භාවනා විවෘතවම කීවාය. දේවක දිගටම දෙනෙත් බිමට බරකරගෙන උන්නේය. 'මෙයා මොකද මූණ දෙක කරගෙන' භාවනා දේවකගේ මුහුණ දෙස බලා සිතුවාය. කිසිවෙකුට කිව නොහැකි බයක් මේ දැන් ටිකකට කලින් භාවනාටද ඇතිවිය. එය කොහොම විස්තර කරන්නද? 'ඇයි පුතෙක් ගැන හරි විශේෂයෙන් කියන්නේ. මම දැකලා තියෙනවයෑ සූරි අන්කල්ගේ පුතාව. එයා ලෝයර් කෙනෙක්ලු. මොකද මම නඩුවක් තියෙවයෑ ලෝයර්ස්ලා ගැන

කියන්න.' ඇය සිතුවාය.

මිලින්දද ඒත් සමඟම කතාකළේය.

"මෙන්න ඒ පාර අනිත් එක්කෙනත් ගන්නවා. අනේ ඔයාහරි අහන්නකෝ අක්කේ ඇයි මේ කියලා. මෙතන බ්‍රේකින් නිව්ස් දදා අපේ පපුව පුච්චනවනේ පිස්සු."

දේවක බලා සිටිද්දීම භාවනා කීවාය. දේවක සිනාසුනේ නැත. නේත්‍රා සියල්ල බලාගෙනය. 'මොකක්හරි වෙනවා තමයි. තාත්තා විශේෂම දෙයක් නැත්නම් කතාකරන්නේ නෑ. කෙල්ලවම කොටුකරගෙන වගේ' ඇයට සිතුණි.

භාවනා ඇමතුම සම්බන්ධකරගත්තාය.

"තාත්තා"

කෙල්ලගේ උගුර කටත් වියලිණ. මෙච්චර බයක් හිතට අද ඇතිවෙන්නේ ඇයි?

"සුද්දිට අම්මා කතාකළාද"

"ඔ..ඔව් තාත්තා. මේ දැන් කතාකළා"

දේවක නේත්‍රා දෙස බැලිණ. 'කෙල්ල හොඳටම බයවෙලා ඉන්නේ. කොල්ලටත් ඒක තේරිලා' නේත්‍රා සිතුවාය. මොනවා හෝ ගෙදර වෙන බවක් නේත්‍රාටත් දැනුණි.

"අද සූරි අන්කල්ලා එනවා ඩිනර් එකට. සුද්දිත් වේලාසන ඇවිත් ඉන්න. එයාලට ඔයාවත් බලන්න ආසයි කියලා කිව්වේ."

මිලින්ද කීවේ සැහැල්ලුවෙනි.

"ඇයි තාත්තා මාව. මම මේ ප්‍රියංකා චොප්රා නෙමේනේ"

භාවනා කියූ කතාවට වෙන වෙලාවකනම් බඩ අල්ලාගෙන සිනාසෙන්නට තිබුණි. එහෙත් නේත්‍රාවත් දේවකවත් සිනාසුනේ නැත. මෙතන ගිනි ගොඩක් ඇවිලෙමින් පවතින බවක් දෙදෙනාටම සිතුණි. කාටත් වඩා භාවනාට සිතුණි.

"කවුද දන්නේ එයාලට ඔයාව ප්‍රියංකා චොප්රා වගේ පේනවද කියලා. සූරි අන්කලුයි ඇන්ටියි මෙන්දක පුතයි එන්නේ"

මිලින්ද කිවේය. 'මේක මාර වැඩක්නේ යකෝ. නමත් අහගෙන තාත්තා. මටත් කියනවා' භාවනා සිතුවාය. පපුව දිගේ දහදිය දහරාවක් ගලනවා භාවනාට දැනුණි.

"මම ඉන්නම ඕනනෑනේ තාත්තා."

"සුද්දි ඇවිත් ඉන්න. ඔයා ඉන්නම ඕන. හත වෙද්දී එයාලා එයි."

මිලින්ද අණ කළේය. එසේ කියූ පසුව ආයේ වෙන දෙයක් කළ නොහැක. තාත්තා අණක් දෙන්නේ කලාතුරකිනි.

"එන්නම්"

අවසානයේ භාවනා පරාජිත හඬකින් කීවාය.

"මාත් වේලාසන එන්නම්. සුද්දි ඇවිත් ඉන්න."

මිලින්ද අවසානයට කීවේය. භාවනා දුරකථනය වසා පසුව එය දෙසම බලාගෙන එහි බටින් කිහිපයක් අවශ්‍යතාවයක් නොමැතිව ඔබමින් කල්පනා කළාය.

"අක්කා"

භාවනා කතාකළේ දෙදෙනා

දෙසම නොබලාය.

"ඇයි සුද්දි"

'ඔයාවත් පිච්චෙනවා වගේ'

දේවකට සිතුණි. ඒ දැවිගිය පාට කෙල්ලගේ මුහුණ පුරාම ඇත.

"ගෙදර මොනවාහරි වෙනවා අක්කා."

ඇය කීවාය. නේත්‍රාට කිසිවක් කියාගන්නට නොහැකි විය. ඇයට එය දැනුනේ අම්මා කතාකරන වෙලාවේදීය.

"සූරි අන්කල්ව මතකද?"

භාවනා ඇසුවාය.

"මතකයි. එයාලා ලංකාවට ටයිල් ගෙන්නන අයනේ."

නේත්‍රා කීවාය.

"පුතා දැන් ලෝයර් කෙනෙක් කියලා කියවන්නේ දෙන්නම. ඉතින්

මට මොකද නේද? මෙතන මම නඩුවක් කතාකරන්න ලෝයර්ස්ලා හෙව්වේ නෑනේ."

භාවනා 'චස්' ගාමින් කීවාය. ඇය කතානොකරම ටික වෙලාවක් උන්නාය.

"මම මේ චෙක්ස් ටික දීලා එන්නම්."

දේවක නැඟිට්ටේ මෙතන ඉඳීම සුදුසු නැතැයි සිතුන නිසාය. අක්කාටත් නංගීටත් කතාකරන්නට දෙයක් ඇත.

"මේ දේවකයියේ"

භාවනා කතාකළාය. යන්නට ගිය දේවක නැවතුණේය.

"අර කැෂියර් ප්‍රෝග්‍රම් එක හදන අයට තුනටවත් එන්න කියනවද? මේ මළ මඟුලකට වේලාසන යන්න

වෙනවනේ."

ඇය ගොරෝද හඬකින් කීවාය.

"මමහරි බලන්නම් සුද්දි. කොහොමත් වේලාසන එන්න කියන්නම්."

දේවක එසේ කියා ගියේය. නේත්‍රා බොර පාටට හැරුණු දෙනෙත්වලින් නේත්‍රා දෙස බැලුවාය.

"ඇයි අක්කා මේ."

නේත්‍රා සන්සුන්ව බැලුවාය.

"තාත්තා මොනවාහරි සුද්දි ගැන හිතාගෙන ඉන්නවා ඇති"

"අනේ ඇයි මම ගැන. පොඩි අක්කා ඉන්නේ"

"ඒකීට ෆ්ලයින් ගායනේ. මොන ෆැමිලි එකද මේ වෙලාවේ ඔය බඹර පැටික්කිව බලන්නේ"

නේත්‍රාට කියවිණ. භාවනා ගැස්සී

මෙන් බැලුවාය.

"එයාලා මාව බලන්නද එන්නේ"

"එහෙමනම් එන්නේ මෙහෙම නෙමේනේ සුද්දි. ඒත්."

"කියන්ඩකෝ"

"මොකක්හරි ඇති. එක්කෝ තාත්තගේ හිතේ. එතන කොල්ලෙක් ඉන්නවලුනේ."

"මේ දැකලාවත් නැති කෙනෙක්ව."

"ජීවිතේ ලැබෙන හැමෝම එක කාලයක දැක්කේ නැති අය තමයිනේ සුද්දි. කලබල නොවී අපි බලමුකෝ. තාත්තයි අම්මයි වැරදි නෑනේ. මට වෙච්ච දේවල් නිසා එයාලා හරියට හිතනවා ඇති. සූරි අන්කල්ලා හරි හොඳ ෆැමිලි එකක්. ඔය තාත්තා යන්නේ එහේ නිතරම පිරිත් එහෙම

තියෙනවා කියලා.”

නේත්‍රා කීවාය. භාවනා දිග සුසුමක් හෙළුවාය. ජීවිතේ කිසිම දිනයක ඇතිනොවූ බියක් ඇයට අද ඇතිවිය. වසන්තේ දවස් එන්නට පෙරම වසන්තය නිමාවෙයිද? ඇය සිතුවාය. ‘ඔයා එක්ක සිතුරාදා රෑට දෙයක් කතාකරන්නත් උන්නේ’ ඇය සිතුවාය. භාවනා පපුවම හිස්කළාය.

නේත්‍රා කෙල්ලගේ අතක් ගෙන පිරිමැද්දාය.

“මූණ දෙන්න හැමදේකටම. එකම විදිහට ජීවිතේ දිහා බලන්න එපා. අපි බලමු බබා”

නේත්‍රා තම සොයුරියට ආදරයෙන් කීවාය. භාවනා කතාකළේ නැත.

# 20

දේවකගේ ළය ගැස්සිණ. තමා කොතරම් නොතරම්ද? තමා කොතරම් අංශු මාත්‍රා ජීවිතයක්ද කියා ඔහුට දැන් ටිකකට කලින් සිතුණි. භාවනාගේ ජීවිතයේ වෙන දෙයක් මේ තරම්ම හදවතට වැදෙන්නේ ඇයි? ඒ ජීවිතයත් තම ජීවිතයත් අතර කිසිම කතාකරගත් බැඳීමක් තවමත් නැත.

එහෙත් හදවතට බොරුවක්

කියන්නේ ඇයි? හදවත අහන්නේ කිසිම දෙයක් දන්නේම නැද්ද කියා නොවේද?

රඹුක්වැල්ල පවුල බලවත් පවුලකි. අදින් වසර විසි තුනකට විසි හතරකට පමණ පෙර ඒ ගෙදර පොඩි කෙල්ලට ආදරය කළ තම අප්පච්චීට ඒ දුවව දුන්නේ නැත. අවසානයට දුව ඒ දුප්පත් කොල්ලා සමඟ හිතුවක්කාරකමට ගියාය. ප්‍රතිඵලය වූයේ ඇයට සීගිරි පවුලෙන් කිසිවක් නොලැබීම පමණක් නොවේ. සම්පූර්ණ පවුලම අහිමිවී යාමය.

අවුරුදු විසි තුනතට විතර පසුව මේ යන්නට යන්නේද එයමද? දේවක දන්නේ නැත.

"එදා අප්පච්චිට මොනවා හිතෙන්න ඇත්ද? අම්මා එක හිතින්

අප්පච්චි එක්ක ආව නිසයි අදටත් අප්පච්චි දේවතාවියකට වගේ අම්මට ආදරේ කරන්නේ. වෙන ගෑනියෙක් දිහා තාමත් බලන්නේවත් නැත්තේ."

දේවක සිතුවේය. රඹුක්වැල්ල පවුලේ තත්වය එහෙමය. අදහාගත නොහැකි පුවතක් හෙට අනිද්දා ඇසෙන්නට පුළුවන.

"ඔයා මේ සීගිරි එකේ නැති දවසකට මම යනවා සුද්දි. එහෙම ඉන්නේ නෑ."

දේවක සිතුවේය. සීගිරි එකට මේ තරම් නැහෙන්නට වෙන හේතුවක් නැත. තිබුණද දැන් එය තේරුමක් නැත. සීගිරි එකේ රැඳෙන්නට ඇති එකම අරමුණ හදවතින් ගිලිහී ගිය පසුව මෙතන ඉන්නට ඕනා නැත.

දේවක සිතුවේ එහෙමය. හදවතම කතරක් වූවාක් වැනිය.

භාවනා දේවක සොයාගෙන එද්දී ඔහු උන්නේ සීගිරි එක පිටුපස වූ ස්ටෝර්ස් වැරන්ඩාවේ තිබූ පෙට්ටි ගොඩක් උඩට වී කල්පනා කරමිනි. භාවනා ඈතදීම ඔහු ඉන්නා හැටි දැක්කාය. 'ඇයි මේ ඔයා. මොකද වුනේ එකපාරටම. අද උදේ ඉඳලා මලක් වගේ පිපිලනේ උන්නේ. මටත් පුදුම හිතුණා බස බස ගාලා වැඩකරද්දී. මෙන්න එකපාරම කඩාගෙන වැටිලා.' භාවනා සිතුවාය.

ඔහු කොහේ බලාගෙන මොනවා කල්පනා කරනවාද කියා භාවනා සිතුවාය. ඒ ඇස්වල ඇති බොර පාට ඇය පැහැදිලිව දැක්කාය. 'මොකද වුනේ කියලා කියනවකෝ පිස්සෝ'

ඇයට අසන්නට සිතුණි.

"දේවකයියේ"

තමා ළඟටම එනතුරු ඔහු දැක්කේ නැත. වෙනදා සාරියේ පොටේ සද්දෙට පවා ඔහු බලයි.

දේවක හැරී බැලුවේ අර හිස්වූ දෙනෙතින්මය. 'දෙයියනේ මේ ඇයි. මූණ ගන්න දෙයක් නෑනේ.' භාවනාට මේ ඇස් හොඳට දැන් කියවිය හැක.

"සුද්දි"

ඔහුගේ කටහඬත් අමුතු වී ඇතැයි ඇයට සිතුණි. මේ විනාඩි දෙක තුනට මේ වූයේ මොනවාද?

"ඇයි අයියේ."

"ආ මුකුත්නෑ සුද්දිමම මේ පොඩි දෙයක් හිතුවා."

"මොකක්ද?"

"මේ කන්ට්‍රෑක්ටර් කෙනෙක්ගේ

දෙයක්.”

'ඔයාට බොරු කියන්න දන්නේ නෑ' භාවනා සිතින් කීවාය. මේ වෙලාවේ මේ වැරන්ඩාවේ ඔහුත් සමඟ ඉඳගෙන පැයක් දෙකක් නිස්කලංකයේ කතාකර මේ හිත සැහැල්ලු කරගන්නට භාවනා ප්‍රිය කළාය. ඒත් මේ සීගිරි එකය. කතාකරන්නට දෙයක් නැති සීගිරි එකට කතාකරන්නට ඕපාදූපයක් දියයුතු නැතැයි ඇය පසුව සිතුවාය. 'දැනටමත් මොනවා කියනවද දන්නේ නෑ'

“යන් ඇතුළට.”

දේවක බැලුවේය.

“මං එන්නම් සුද්දි.”

“පිස්සුද මේ පකිස් පෙට්ටියක් උඩට වෙලා කල්පනා කරන්න. අරහේ

වැඩ පිරිලනේ. එන්න."

ඇය බැණ්නාය. දේවක නැඟිට්ටේය. භාවනාට හදිස්සියේ සිනාගියාය. 'මට බයයි.' ඇය සිතින් සිතුවාය. ඒ ගැන හදවතට අස්සේ මේ තරම් සතුටක් ඇතිවෙන්නේ ඇයි?

'මොකද එකපාර වුනේ' කියා අසන්නට ඇයට සිත්වෙයි. එහෙත් එසේ ඇසිය යුත්තේ තමාගෙන්ම නොවේද? මේ උන්නාට හිත ඇත්තේ මේ ලෝකයේ නොවේ. හවස කුමක් හෝ බියජනක දෙයක් වේදැයි භාවනා සිතුවාය.

"සුද්දි"

"අයියේ."

දෙදෙනාමෙ වැරන්ඩාවේ දොර අසලදී නැවතිණ. දේවක බැලුවේය.

"සුද්දි ටිකක් වේලාසන යන්න. මම මේවා බලලනවානේ. අද ටිකක් රෑ වෙනකල් ඉන්නවා"

ඔහු කීවේය. ඒත් ඔහු කියන්නට ගියේ එය නොවේයැයි භාවනාට සිතුණි. 'හිතේ තිබ්බ නිස්කලංකේ කෑවානේ' භාවනා සිතුවාය.

කුමක් හෝ ගින්දරක් ළඟ ළඟ එන බවක් ඉවෙන් මෙන් භාවනාට අද දැනෙයි. 'හිතන දෙයක් එක්කෝ කියනවකෝ' ඇය සිතින් දේවකට කීවාය.

"මොනවද ඔච්චර කල්පනා කරන්නේ."

ඇය මෘදුව ඇසුවාය. එහෙම ඇසූවිට ඔහු ඇත්තම කියන බව ඇය දනී.

"හිතුවේ සුද්දි ගැන."

භාවනාගේ දෙපා පණනැති විය. ඒ තරම් හොඬර ගණනක වචන තුනක් ඔහු කියාවී කියා ඇය සිතුවේ නැත. ඒත් ටිකකට කලින් සිතුවේ එය නොවේද? හිතන දෙයක් කියනවානම් කියා නොවේද? සිතූ දේ ඔහුට දැණුනාවත්ද? දැන් කුමක් අසන්නද? භාවනා සිතුවාය.

"ම..මම ගැන මොනවද?"

ඇයගේ වචනත් පැටලිණ. මේ තමා ගැන මෙසේ සිතූ පළවෙනි කෙනා බව ඇය නොදන්වා නොවේ. ඒ සිතීම පවා ඇයට වැදගත්ය.

දේවක උත්තර දෙන්නට වෙලාගත්තේය. ඒ තත්පර කිහිපය ඇයට කල්පයක් මෙන් විය.

"ආ අයියේ. මං ගැන මොනාද?"

නොඉවසිලිමත්ව ඇය ඇසුවාය.

දෛවයේ තීරණ ඉදිරියේ ගැහෙන හැම යුවතියක් මෙන්ම ඇයද උන්නේ ගැහෙමිනි.

"සුද්දිව තාත්තා දෙන්න වෙන්න ඇති යන්නේ."

ඔහු සිර කූඩුවේ ඉඳගෙනත් කතාකරනවා ඇය අසා ඇත. එහෙත් එදා පවා මේ තරම් දුකක් වචනවල නොවීය. එහෙත් අද ඔහුගේ උගුරට කුමක් වීද?

"ඉතින්."

ඇය ඇසුවාය. ඔහු කිසිවක් කීවේ නැත.

"තාත්තලා එහෙමනේ අයියේ. කෙල්ලෝ ඉන්නකොට කොල්ලෝ ඉන්නකොට වගේ නෙමේ. කෙල්ලට කොල්ලෙක් ඉන්නවානම් ගෙන්නලා බලනවා. එහෙමත් නැත්නම් ඉතින්

එයාලා කියන කොල්ලට කැමති වෙන්න කියනවා."

භාවනා කීවාය. කෙල්ල කපටිය. ඇය වචනවලින් දේවක සිරකරගත්තේය. ඔහු බිම බලාගෙන උන්නේය.

"ඔව්."

"එයාලා දෙතුන් පාරක් මගෙන් අහලා තියෙනවා."

"මොකක්ද"

"මගේ මොකක්හරි මේ අටමගලයක් තියේද කියලා."

වචන ගන්න කොතරම් අමාරුද?

"ඇති කෙහෙල්මලක් නෑනේ. ඉතින් නෑ කියනවා. බොරුවට තියෙනවා කියන්ඩයෑ."

දේවක කෙළ පොදක් ගිල්ලේය.

"මට එයාලට කියන්න සාධාරණ

උත්තරයක් නෑ.”

ඇය කීවාය.

“ඒකනේ නේද?”

‘ගොන් හරකෙක් මේ’ ඇය තොල්පට තදකරගෙන සිතුවාය.

“පස්සේ කතාකරමු. දැන් යන්. මෙතන කතා යන්න කලින් ටේලර් ග හන්න ඕන නෑනේ.”

භාවනා එසේ කියා සිනාසුනාය. දේවක හිස කැසුවේය. ඇය සීගිරි එක තුළට යන අතරවාරයේ බොහෝ දේ සිතුවාය. ‘තාත්තා මට හුස්මක්වත් ගන්න දෙන එකක් නැද්ද? මෙච්චරම වේලාසන හිරවෙන්න කවුද හිතුවේ.’ එහෙත් හැමදේටම භූමිතෙල් ගෑවුණු ගැරඬියා සේ දඟලන එක තේරුමක් නැතැයි ඇය පසුව සිතුවාය.

'බලමුකෝ මොකද වෙන්නේ කියලා. මටත් පැත්තකට වෙලා හිතන්න තියෙනවා. මේ වගක් දන්නවානම් ඊයේ රෑම හිතනවා' ඇය තනිවම සිතුවාය.

*** *** *** *** ***

"කීයටද ගෙදර යන්නේ."

භාවනා සීගිරි එකෙන් පිටවෙන්නට පෙර දේවකගෙන් ඇසුවාය. ඔහු කොහොමත් අද ඉන්නේ තෝන්තුවාවෙන් මෙන්ය.

"නමයට විතර යනවා සුද්දි. මේ රැක්ස් ටික තියන විදිහක් ගැන බලන්න ඕන"

"මී නමයටම යන්න එහෙනම්. යනකොට පරිස්සමින්. වීල් එකක්

අරන් යන්න."

"ම්"

"ඊට වඩා රෑ වෙනකල් ඉන්න එපා"

"ම්"

මෙච්චර දේවල් කියවෙන්නේ ඇයි? යනවා කිය කියා නොයන්නේ ඇයි?

"මං රෑ වෙලා ගන්නම්."

"හා සුද්දි"

"මං එහෙනම් යනවා. මළ වදයක් මේක. අද ටිකක් රෑ වෙනකල් ඉන්න බලන් ආවේ."

ඇය කීවාය.

"බුදු සරණායි."

ඔහු කීවේය. භාවනාට හීල්ලින. ඇය වාහනයට ගොඩවීත් දේවක

දෙස බැලුවාය. 'එකපාරම මොකක්ද වුණා අම්මයි තාත්තයි කතාකළාට පස්සේ. එයා මොනවා හිතනවද කියලා තේරෙන්නේ නෑ' ඒ නොතේරුම් කමද නැත්නම් හිතන්නට ඇති බයද? කොහොමත් අද ටිකක් බය හිතෙන දවසකි. මේ අද රෑ ඇති රෑ කෑම සාමාන්‍ය රෑ කෑමක් නොවේ. සූරියආරච්චිලා සාමාන්‍ය අය නොවේ. ඔවුන්ට ලංකාවට ටයිල්ස් ගෙන්වන විශාල සමාගමක් ඇත. නාවල පාරේ ඇති ඔවුන්ගේ ටයිල් ප්‍රදර්ශනාගාරය භාවනා දැක ඇත. මේ හදිස්සියේ ඔවුන් නිවසට එන්නේ ඇයි?

"මාව හිරවුනොත් මොකද වෙන්නේ"

භාවනා දුක්බරව සිතුවාය. එහෙම

නොවේවායි පැතිය හැක. එහෙත් සිදුවෙන්නේ පතන දේම නොවේ. එහෙම පතන දේම වෙනවානම් මේ ජීවිතයද නොවේ.

"අක්කගේ ජීවිතේ තනිකරම අසාර්ථක වුණා. පොඩි අක්කා අහසේ. මහ පොළොවේ පේන්න ඉන්නේ මං විතරයි. තාත්තගේ හිතේ බරක් තියෙන එක සාධාරණයි. කෙල්ලෝ තුන්දෙනාම ගෙදර. අක්කට විසි හතක්. පොඩි අක්කට විසි හතරක්. මට විසි එකක්. කාගෙ න්හරි නිදහස් වෙන්නෝන කියලා එයා හිතනවානම් එයාගේ පැත්තෙන් ඒක සාධාරණයි."

එහෙත් හිත දුවන්නේ වෙන පොඩි පාරකය. ඇත්ත කතාවත් එයය. ඒ පොඩි පාර නිස්කලංක යැයි ඇයට

සිතෙයි. කාලාන්තරයක් තිස්සේ හීන දැක්කේ ඒ වැනි පොඩි මල් පාරක යන්නට විනා මේ හයිවේ එකක යන්නට නොවේ. ප්‍රාර්ථනා පොදි බැඳගත් ජීවන වන්දනාවක යන්නට හැක්කේ හදවතට හුරු පාරකය. එවැනි පාරක සේයාවක් යන්තමට මෙන් ජීවිතය ඉදිරියේ දිස්වෙයි. හුරුය. පුරුදුය. සැනසීමය. ප්‍රියය. එහෙත් එයම පමණක් දෛවය වෙයිද? ප්‍රශ්නය ඇත්තේ එයය. යුවතියගේ දෛවය පුදුමය. අක්කා එක කාලයක උන්නේ මලක් වාගෙ ය. එහෙත් ඇගේ ජීවිතය කටුන කාන්තාරයක් වෙන්නට ගියේ වසරක් දෙකක් පමණ කෙටි කාලයකි. ලස්සන උන්න ඇය අවසානයේ දිසා අධිකරණයේදී දික්කසාද වූවාය. ආබාධිත ගැහැණියක්ව ජීවිතයම

රෝද පුටුවකට සීන්න කළාය. එය රඹුක්වැල්ල පවුල ලද දැවැන්ත පරාජයකි. ඛේදවාචකයකි. තාත්තා ඉන්නේ ඒ දුක වසන් කරගෙනය. එය එසේමය.

මේ කතාව ලියවෙන්නේ එවන් පසුබිමක් මැදය. භාවනාට බයත් ඒකමය. හිතන පතන දේ පැත්තකය. ලැබෙන නොලැබෙන දේවල් තවත් පැත්තකය.

ඇය ගියේ චොකලට් කේක් එකක්ද අරගෙනමය. ඉඳුනිල් නිවසේ වැඩට ඉන්නා සේවිකාවද එක්කරගෙන සාලය වැක්ස් කරන්නට පටන් ගෙන උන්නාය.

"අමරසේන. ඔය ගාඩ්න් එක ටිකක් බලලා සුද්දකරලා දාන්න. වතුර ටිකක් වැඩිපුර දාන්න. මේ

පැවිල්ලට ගස්කොළන් වේලිලා ගිහින්."

ඉඳුනිල් කීවේ භාවනා ආ වාහනයේ උන් රියදුරුටය. භාවනා ඇස් ලොකුකරගෙන බැලුවාය. ඇය උන්නේ අත් බෑගය කරට දමාගෙන කේක් එකත් ඇතැතිවය. ඉඳුනිල් නෙත් පුරා පොඩි දුව දෙස බැලුවාය. මිලින්ද කියන්නේ හරිය. මේ මල දෙනවානම් දිය යුත්තේ මේ වගේ ලස්සනට පිපී ඇති වෙලාවකය. තමාගේ බාල දුව කොතරම් ලස්සනදැයි ඉඳුනිල් අද අලුත් ඇස්දෙකකින් දැක්කාය.

"ඇයි අම්මා."

අම්මා බලාගෙනම ඉඳිද්දී භාවනා බයෙන් මෙන් ඇසුවාය. ඉඳුනිල් සිනාසුනාය.

"ඔය ස්ලිපර්ස් ගලවලාම එන්න මැණික. මේ වැක්ස් තාම අලුත්."

භාවනා ඇගේ දෙපාවල තිබූ සැන්ඩල්ස් දෙක ගලවා නිරුවත් දෙපයින් නිවසට ආවාය. ඉඳුනිල් සිනාසුනාය. කෙල්ලගේ දෙපා තාම පොඩිය. දෙන්නට දුකත් එක්කය. එහෙත් එහෙම පේන්නේ තමාට පමණක් විය යුතුය.

"මේ කේක් එක. තියෙන හොඳම එක ගේන්න කිව්වේ."

ඇය කේක් එක අම්මා දෙමින් කීවාය.

"විශේෂ අමුත්තෙක් එනකොට එහෙමනේ."

මේ වචන බර වැඩිය. කෙල්ලව බයකරන එක සාධාරණද නැත.

"එහෙම ලොකු දෙයක් නෑ. නිකං

එන්නේ."

අම්මා හදන්නේ තමාව සනසන්නටද?

"හදිස්සියේ අම්මා."

"තාත්තාට හිතෙන්න ඇති. එයාලත් කියලා එන්නෝන කියලා."

වෙන මොනවා අහන්නද?

"පුතෙක් ගැන කියවන්නේ. සූරි අන්කල්ලා හරි කියමුකෝ."

"එහෙමනේ පුතා දැන් කොළඹ උසාවියේ ලෝයර් කෙනෙක්. ඒ නිසා කියන්න ඇති."

"අපි නඩු කියන්නයෑ."

ඇය කට ඇදකර කීවාය. ඉඳුනිල් කරුණාබරව සිනාසුනාය.

"හොඳ ඇඳුමක් ලෑස්තිකරගන්නකෝ."

ඉඳුනිල් එතරම් බරකර නොකියාම කීවාය. උඩට යන්නට ගිය භාවනා යළිත් හැරී බැලුවාය.

"එහෙම මොකටද?මම ත්‍රී ක්වාටර් එකක් ඇඳලා ටී එකක් දාගන්නවා. මේක මළ මඟුලක්නේ"

ඇය කීවාය.

"අනේ මැණික එහෙම එපා. අපි ලස්සන ගවුමක් දාගමු. ත්‍රී ක්වාටර් එපා. හොඳ නෑ."

අද හිතට දැනෙන පීඩනය වැඩිය. කොටුවී ඇත්තේ තමාම බව ඇයට වැටහෙයි.

"තියෙන ජරාම ගවුම දාගන්නවා."

"ඒකටත් ඔයා ලස්සනයි. කමක් නෑ"

ඉඳුනිල් කීවාය. කෙල්ලට ඇති ඇඳුම් සේරම ලස්සන බව ඇය දනී.

ඇරත් කෙල්ලෝ කරන්නේ කියන ප්‍රේම නොවේ. භාවනා උඩට ගොස් ටික වෙලාවක් ඇඳට බරවීගෙන උන්නාය. අද පපුවේ ගැස්ම වැඩිය. නොදන්නා දෛවයක සේයාවක් ජීවිතය මත සරන විට කෙල්ලෙක්ගේ සිතට මේ ගැස්ම ඇතිවෙයි.

"හැමදෙයක්ම මැද්දෙන් මං දිහා බලාගෙන ඉන්නේ ඇයි පිස්සෝ. මේ ඔක්කොම ගින්දර ඒ නිසානේ"

ඇය සිතින් දේවකට කීවාය. ඔහු සර්වාංගය පුරාම සරනා බවක් ඇයට දැනෙයි. ඒ සැරිසැරීම පුදුමාකාරය. කිසිම දවසක කිසිම කෙනෙක් මේ තරම් සන්සුන්ව මේ හිතේ සැරිසරා නැත.

භාවනා පපුවම හිස්කර මෙන් සුසුමක් පිටකළාය. පසුව ඇය

අල්මාරිය විවර කර එහි තිබූ සාමාන්‍ය ගවුමක් ගෙන ඇඳ මතට දැම්මාය. එතන තිබූ ලස්සනම ගවුම දම්පැහැගත් පසුබිමේ කුඩා රෝස පැහැ මල් වැටුණු සිල්ක් ගවුමය. එහෙත් එය අඳින්නේ පේරාදෙණියට යන දවසටය.

# 21

"හැමදේම ලස්සනට වෙනවා පුතා. ගුඩ්. ඔහොම කරගෙන යන්න."

රඹුක්වැල්ල මහතා දේවකත් සමඟ සීගිරි වැඩබිමේ ඇවිද අවසානයේ කීවේය. දේවක හිස වැනුවේය. 'ඔයාව තාම මම පුදුම කරන්න පටන් ගත්තේ නෑ සීයා' දේවක සිතින් කීවේය.

"එහෙනම් මම අද ටිකක් වේලාසන යනවා පුතා. අපේ ගෙදරට

විශේෂ අමුත්තෝ ටිකක් එනවා.”

රඹුක්වැල්ල මහතා වාහනයට ගොඩවූයේ එසේ කියාය.

“හොඳයි සර්. ගුඩ් නයිට්.”

දේවක කීවේය. රඹුක්වැල්ල නිවසට අද එන්නේ සාමාන්‍ය අමුත්තෝ ටිකක් නොවන බව ඔහු තේරුම් ගෙන උන්නේය.

“ඒ එන්නේ සූරිආරච්චි කියලා ෆැමිලි එකක්. ෂයින් ලංකා ටයිල් කම්පනි එකේ අයිතිකාරයෝ. මිලින්ද සර්ගේ යාළුවෙක්. ඔයාව විශේෂයෙන්ම කියලා අද වේලාසන ගෙන්න ගත්තේ ඇයි කියලා හිතන එක අමාරු නෑ සුද්දි. ඒක හරි සරල දෙයක් තේරුම්ගන්න”

දේවක සීගිරි වැඩබිම පුරා ඇවිදිමින් සිතුවේය. ඇය නැති වැඩ

බිම පාළුය. අඳුරුය.

"ඔයාට අද අම්මත් කතාකළා. තාත්තත් කතාකළා. ඔයා බයත් වෙලා ඉන්නේ. ඒ පුතා ලෝයර් කෙනෙක්. සුදුසුකම් වැඩි කෙනෙක්."

දේවක ඇවිදිමින් සිතුවේය. තමා කවුද? දුප්පත් අප්පච්චි කෙනෙක්ගේ පුතෙක් පමණක් නොවේද? ඉදිකිරීමේ සමාගමක රුපියල් හැට හැත්තෑදහසක වැටුපකට සේවය කරන සයිට් මැනේජර් කෙනෙක්ගේ පුතෙකි. සාමාන්‍ය උගත්කමක් ඇති සුපර් මාර්කට් එකක රැකියාව කරන සාමාන්‍යම කොල්ලෙකි. තමාගේ වැනි කතාවක් කිසිවෙකු අමුතු විශේෂ කතාවක් කියා කිසිවෙක් සිතන්නේ නැත.

ඇති එකම සුදුසුකම මීට වසර

විසි තුනකට පමණ පෙර මේ සීගිරි පවුලෙන් පිටමං කළ රඹුක්වැල්ල ෆැමිලි එකේ බාල දුවගේ පුතා වීම පමණය. ඇයත් ජීවතුන් අතර නැත. එසේනම් තමාට වඩා සුදුසුකම් මිහිරංගටත් කෝසළටත් ඇත.

"එහෙම වාසනාවක් මට නෑ. ඒකයි ඇත්ත. හිම්හිට හැමදේම අත්හරින්න හිත හදාගමු පුතා. ගින්දර දැනෙන්න පටන්ගත්තා. ගින්න තව ටිකකින් මෙළවෙයි පපුව උඩම"

දේවක සිතට කීවේය. ඇය නැති සීගිරි එකක ඉන්නට හිත හදාගන්න අමාරුය. ඇත්ත කතාව ඒකය. මේ ජීවිතය කොහොමත් ඇරඹුනේ අහිමිවීම් සමඟය. එය දේවක පුංචි බණ්ඩාර හොඳින්ම දැනගෙන

උන්නේය.

ලැබීම් යනු වාසනාවන්ත දේවල්ය. ඒවා හිමි නැත. එසේ වුවහොත් අප්පච්චීට කියා යළිත් නුවරම යනවා කියා දේවක සිතාගත්තේය. කොළඹ ඇවිත් වූයේ සිත කඩාගැනීම පමණක් නොවේද?

"අද සමහරවිට ඔයාව දැක්කහම එයාලා අදම තීන්දුකරන්නත් පුළුවන්."

පපුව මැද්දේම කකියන සෙයක් දේවකට දැනෙයි. කිසිම දවසක හෙලවුණේ නැති පපුවක් හෙලවුනේ මේ සීගිරි එකට ආ දවසේය. දැන් ඒ පපුවම දැවෙයි.

"සිකුරාදා නුවර යන්න හරි ආසාවෙන් උන්නේ. ඒත් දැන්."

දේවක කිසිවක් නොසිතා ඉන්නට

උත්සාහ කළේය. එහෙත් එහෙම කරද්දී සිතෙන්නේම නොසිතා ඉන්නට හදන දේ බව පොඩි කොල්ලා දන්නේ නැත. ඒ සිතේ හැටිය. සිත නම් වූ විශේෂ දේ දෙවියන් හැදුවේ එසේය.

දේවක සීගිරි එක පුරා ඇවිද්දේ තෝන්තුවාවෙන් මෙන්ය. මේ තෝන්තුව හෙට අනිද්දා වෙද්දී තවත් වැඩිවෙන්නට පුළුවන. එසේ වුවහොත් කරන කියන කිසිවක් කරගන්නට ශක්තියක් නැත.

"කිසිම රහසක් මේ සීගිරි එකේ අයට නොකියම මම යනවා. එහෙම හොඳයි. ගොඩක් හොඳයි. අප්පච්චි කිව්වේ ඇත්ත. කවුරුවත් මේ මොනවත් දැනගන්න ඕන නෑ"

ඔහු තනිවම සිතුවේය.

*** *** *** *** ***

සූරියආරච්චි පවුල රඹුක්වැල්ල නිවසට ආවේ අලුත්ම වර්ගයේ ප්‍රාඩෝ රියකිනි. වාහනය පදවාගෙන ආවේ සූරියආරච්චි පවුලේ එකම පුතා වූ මෙන්ද්‍රක සූරියආරච්චිය. ඔහු නීතිඥයෙක්ට උරුම තියුණු පෙනුමක් සහ උසක් සහිත වෙනස්ම පෙනුමක් තිබූ තරුණයෙක් විය. ඉගෙනීමටම කාලය කැපකළ නිසාදෝ අවුරුදු තිහක පමණ පෙනුමක් ඔහුට තිබුණි.

සූරියආරච්චි පවුලව පිළිගත්තේ ඉඳුනිලුත් මිලින්දත් රඹුක්වැල්ල මහතාත්ය.

"එන්න සූරි. එන්න ශ්‍රීමා. කෝ පුතා එන්න."

මිලින්ද කීවේ උද්යෝගයෙනි.

භාවනා පිටුපස සිට සියල්ලම අසාගෙනය. 'තාත්තා අද හරි සතුටින් ඉන්නේ. ඇයි මේ' භාවනා සිතුවේ පපුවේ ගැස්මක් එද්දීය. ඇය දුබල දෙනෙතින් නේත්‍රා දෙස බැලුවාය. කෙල්ල පව් යැයි නේත්‍රාට සිතුණි.

"සූරි තාත්තව කාළෙකින් හම්බවුනේ නෑනේ නේද?"

"ඒකනේ. ඒත් මෙතනින් යන හැම වෙලාවකම මට ඔයාලව මතක් වෙනවා. කොහොම තාත්තා. සනීපෙන් ඉන්නවා නේද?"

"හොඳින් ඉන්නවා පුතා. දැන් ඉතින් වගකීම් මගේ මුණුපුරාලා මිණිපිරීලා බලනවනේ."

"ඒක ඇත්ත. අපේ කොල්ලව නම් මම උසාවියට දුන්නා. තාම එයා

බිස්නස් පැත්ත පළාතේ බලන්නේ නෑ."

"දවසක ඉතින් පුතා බලයි."

මෙන්දක සිනාසුනේ වෙනස් ලෙසය. 'එයා මහ අමුතු මූණක් තියෙන කෙනෙක්නේ. මෙතන ඇවිත් හිනාවෙන්නෙත් උසාවිය කියලා හිතාගෙනද?' භාවනා සිතුවාය. ඔහුගේ පෙනුම කෙල්ලව ටිකක් බයපත් කළේය.

"කොහොමද ශ්‍රීමා. කාළෙකින් හම්බවුණේ."

"ඒකනේ ඉන්දු. මේ වැඩ නිසා එන්නත් බැරිවුණා."

"දැන් ආවනේ."

සියල්ලෝම සාලයට ආවෝය.

"මේ අපේ පොඩි දුව භාවනා. සූරිලා දැකලා තිබුනා කිව්වේ. මේ

අපේ ලොකු දුවනේ."

සියල්ලෝම භාවනාව වැළඳගෙන සිපගත්තෝය. ඇය මෙන්දකට ළංවී යන්තමට මුහුණ පමණක් පෑවාය. ඇයගේ පපුවේ ගැස්ම වැඩිවිය. ඒ ඇස්වල බැල්ම් බියජනයකයැයි ඇයට සිතුණි.

"ලොකු දූට තාම ට්‍රීට්මන්ට් කරනවනේ නේද මිලින්ද"

"කරනවා සූරි. අපි දැන් මේ ආයුර්වේද ට්‍රීට්මන්ට් එකක් කරගෙන යනවා. කොහොමහරි කෙල්ලව ඇවිද්දවන්නයි අපිත් බලන්නේ."

සූරියආරච්චි මහතාත් ශ්‍රීමාත් නේත්‍රා දෙස බැලුවේ කරුණාබරවය.

"පොඩි දූ හරි ලස්සනයිනේ. ඇක්ට්‍රස් කෙනෙක් වගේනේ. නේද නෝනා."

සූරියආරච්චි මහතා කියද්දී සියල්ලෝම සිනාසුනෝය. මෙන්දක විශේෂයෙන් ඇය දෙස බැලුවේය.

“ඉඳගන්න අන්කල්. එන්න ඇන්ටි. ඉදගන්න අයියේ.”

භාවනා අමාරුවෙන් කීවාය. එසේ නොකියා ඉන්න එක හොඳ නැත.

“අපි දුවව දවසක් දැක්කා නවලෝකෙදී. නේද පුතා.”

සූරියආරච්චි මහතා කීවේය.

“මාව අන්කල්.”

“ම්. දුවයි සීයයි නවලෝකේ ග්‍රවින්ඩ් ෆ්ලෝ එකෙන් උඩට යනවා. අපි පහළට එනවා. කතාකරන්න විදිහක් තිබුනේ නෑ. අපි හිටියේ ඩොක්ටර් කෙනෙක් එක්ක. නේද පුතා.”

මෙන්දක හිස වැනුවේය.

'එහෙනම් මාව දැකලා තියෙනවා' ඇය සිතුවාය.

"සීයගේ බැක් පේන් එකක් ඇවිත් ගියා තමයි."

"අපි දවස් දෙකක්ම ගියේ මැණික. ඩොක්ටර් ඩි මෙල්ව හම්බවෙන්න"

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනා හිස වැනුවාය.

"කෝ අනිත් දුව."

ශ්‍රීමා ඇසුවාය.

"එයාව අල්ලන්න ශ්‍රීමා ඉතින් උඩ යන්න වෙනවා."

මිලින්ද පිරිසව සිනාගන්වමින් කීවේය.

"කිව්වේ මිලින්ද?"

"තාරකා දැන් එමිරේට්ස් එකේ

එයා හොස්ටස් කෙනෙක්නේ ශ්‍රීමා. අපි කිව්වට ඇහුවේ නෑ. කෙල්ල ගියා. එයාගේ ආසාවනේ. මැරිකරනකල් විතරයි කියලා යැව්වා. අපිට පොරොන්දුවෙලා ගියේ"

මිලින්ද කීවේය.

"එහෙනම් අපිට එමිරේට්ස් යද්දී හම්බවෙයි දුවව. කොහේ යන ෆ්ලයිට් එකේද දුව අක්කා ඉන්නේ."

ශ්‍රීමා ඇසුවේ භාවනාගෙනි.

"පොඩි අක්කා ඇන්ටි ඩුබායි කලම්බු ෆ්ලයිට් එකේ. ඩේලි ෆ්ලයිට් එකක්නේ. අද ඩුබායිවල. හෙට එනවා."

භාවනා කීවාය.

"පුතා අද උසාවි ගිහින්ද ආවේ."

මිලින්ද ඇසුවේ මෙන්දකව කතාවට සම්බන්ධකරගන්නටය.

භාවනා දෙනෙත් බරකළාය.

"මේ දවස්වල අන්කල් මම උසාවි යන්නේ නෑ. මම හැම කේස් එකකටම යන්නේ නෑ. අපි ලීගල් ෆර්ම් එකකනේ ඉන්නේ. ස්පෙෂල්ම කේස් විතරයි ගන්නේ. ඒවත් කම්පනීස්වල. ක්‍රිමිනල් ගන්නේ අඩුවෙන්. ඩොමැස්ටික් කේස්වලට ගියාම ටිකක් පහළට යනවා"

මෙන්දක කතාකරන දෙස භාවනා පරිස්සමින් බලාගෙන උන්නාය. 'අලි පොරක් වගේ කතාව' භාවනා සිතුවාය. පසුව ඈය නේත්‍රාගේ අතක් මිරිකුවාය. කෙල්ල කියන්නේ කුමක්ද කියා ඈය දැනගත්තාය. නේත්‍රා හිස වැනුවේ ඒ නිසාය. අක්කලා නංගිලා අතර එහෙම රහස් භාෂාවක් ඇත.

"අපි දැන් එයාට කියලා

තියෙන්නේ මොන කේස් එක ගන්නත් කලින් මැරේජ් කේස් එක ගන්න කියලා. ඒක පරදින්න කතාකරන්න බෑනේ තාත්තා නේද?"

සූරියආරච්චි මහතා කීවේ රඹුක්වැල්ල මහතා දෙස බලාගෙනය.

"ඒක ඇත්ත. හැම දේකින්ම සක්සස් වුනත් ෆැමිලි ලයිෆ් එකෙන් ෆේල්නම් අමාරුයි."

රඹුක්වැල්ල මහතා කීවේය. මෙන්දක හිස එසෙව්වේය. ඔහුගේ දෙනෙත්වල කෙළින්ම ලක්වූයේ භාවනාවය. කෙල්ලගේ දෙපා වෙව්ලන්නට විය. 'මොකද මේ මං දිහා බලන්නේ. මම විත්තිකාරයා නෙමේ.' ඇයට සිතින් කීවාය. අද කොහොමත් පපුවට අසාමාන්‍ය බියජනක හැඟීම් මාලාවක්ම

දැනෙන දවසකි. ඒ බිය මෙන්ද්‍රක සූරියආරච්චිගේ බැල්මෙන් තවත් වැඩිවිය.

"අපි හොයන්නේ අපි දන්න දරුවෙක්ව තාත්තා. අද කාලේ හොඳ ළමයෙක්ව හොයන එක ලේසි නෑනේ. මම ඊයේ මිලින්ද්‍රටත් කිව්වේ ඒකයි."

සූරියආරච්චි මහතා කීවේය. ඒ කතාවෙන් භාවනා එක දෙයක් සිතාගත්තාය. 'තාත්තයි සූරි අන්කලුයි මොකක්හරි දෙයක් කතාකරලා තියෙනවාමේ කියන්නේ ඒකයි' භාවනා සිතුවාය. කෙල්ල ඉන්නේ බයෙන් බව නේත්‍රා තේරුම් ගත්තාය. හිත එහේ මෙහේ ගිය විට එහෙමය. කෙල්ලගේ හිත ඇත්තේ වෙනතකය. නේත්‍රා එය දැනගෙන උන්නාය.

"අපි හිමිහිට කතාකරමුකෝ. නේද ඉඳුනිල්. අපේ ළමයිනේ"

ශ්‍රීමා කීවේ ඉඳුනිල්ගේ අත මත සුරත තබාය. භාවනාට හීල්ලින. 'හීන මාළිගාව ඉවරයි වගේ' ඇය සිතුවාය.

"අපි එයාට ගේකුත් හදන්න ගත්තනේ ඉඳුනිල්. නාවල අරලියා ගාඩ්න්ස්වල. එතන හරි ලස්සන තැන. මැරිකරපු කාලෙක එයාට නෝනා එක්ක වෙනම ඉන්න පුළුවන්. අපි ඒ නිදහස දෙන්නට දෙන්න ඕනනේ. අනික අපිත් ඉන්නේ ඒ ළඟමනේ"

සූරියආරච්චි මහතා කීවේය. මේ කියන වදනයක් වචනයක් පාසා භාවනාගේ හදවතට දැනෙන බර වැඩිවිය.

"දැන් ගොඩක් වැඩ ඉවරයි. මෙච්චර ටයිල් ගෙන්නන කම්පනි එකක් තියෙද්දී පුතන්ඩියා කිව්වනේ මිලී ෆ්ලෝ එකට කුඹුක් ලීය දාන්නෝන කියලා. බලන්නකෝ"

සූරියආරච්චි මහතා කීවේ සිනාසෙමිනි. මෙන්දක සිනාසුනේ මුව කොණකිනි.

"කුඹුක් දැම්මාම හිට් එක අඩුයි අන්කල්. ඒකයි"

මෙන්දක කීවේය.

"ඒක ඇත්ත. දැන් ඉතින් වෙඩින් එක ගන්න විතරයි එහෙනම් තියෙන්නේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"එයා එක්ක ටිකක් හෙට අනිද්දා කතාකරන්න වෙනවා. අපි ඔක්කොටම කලින් අපේ ලේලිව

හොයාගන්න ඕනනේ තාත්තා.”

සූරියආරච්චි මහතා කීවේ යන්තමට භාවනා දෙස බලාගෙනය. කෙල්ලගේ දෙපා වෙව්ලන්නට විය. මොකක්දෝ හේතුවක් නිසා මිලින්දද ඒ මොහොතේ බැලුවේ භාවනා දෙසය.

භාවනාට දේවකව සිහිවිය. ‘පිස්සා තාම සීගිරි එකේද දන්නේ නෑ. කතාකරලා යන්න කියන්න ඕන. මේ මහ රෑ තනියම යන්නේ’ ඈය සිතුවාය. මෙහෙම කී දවසක් ඔහු ගැන සිතන්නද? ඔහු ගැන සිතන්නට ගත් දවසේ සිට හදවතේ සැනසීම නැතිවූවා නොවේද?

භාවනා මෙන්දක දෙස බැලුවාය. ඔහු ජංගම දුරකථනය ඔබමින් සිට දෙනෙත් පමණක් ඉහළට එසවූවේය.

දෙදෙනාගේ දෙනෙත් ගැටිණ. භාවනා යන්තමට සිනාසී දෙනෙත් බර කළාය. 'ඇයි මට එයාව දකිනකොට බයක් හිතට එන්නේ' භාවනාට තේරෙන්නේ නැත.

# 22

සූරියආරච්චි පවුල රඹුක්වැල්ල නිවසින් පිටවූයේ මධ්‍යම රාත්‍රිය ආසන්නයේය. කෑම මේසයේදී සියල්ලෝම සතුටින් සිනාසෙමින් සතුටු සාමීචියේ යෙදුනෝය. සියල්ලන්ටම සංග්‍රහ කරන්නට වූයේ භාවනාටය.

දුරකථන ඇමතුමක් ලැබී මෙන්ද්‍රක කෑම මේසයෙන් නැඟිට යාබද දිග දොරෙන් ගාඩ්න් එකට

මුහුණ ලා තිබූ වැරෙන්ඩාවට ගියේය.

"මේ ඩෙසට් එක අයියට දෙන්න මැණික. රස්නේ යනවනේ"

ඉඳුනිල් චොකලට් පුඩිමෙන් ටිකක් ඩෙසට් කප් එකට දමා භාවනා අතට දුන්නාය. කෙල්ල කට අමුතුකර අම්මා දෙස බලා ඇස්වලින් මොනවද කීවාය. එය ඉඳුනිල් ගණනකට ගත්තේ නැත. සූරියආරච්චි පවුලේ සිරියෙන් අම්මාද මත්වී ඇතැයි භාවනාට නිකමට සිතුණි.

ඇය කුඩා ට්‍රේ එකේ තබාගෙන ඩෙසට් එක අරගෙන ගියාය. මෙන්දක උන්නේ ඇමතුමේය.

"ඕකේ මිස්ටර් ආරියරත්න. හෙට මාව ඇවිත් මීට්වෙන්නකෝ. අපි මොකක්හරි කරමු."

මෙන්දක ඉක්මනින්ම ඇමතුම

නිමාකළේ වැරන්ඩාවේ දැල්වෙමින් තිබූ කහ පැහැගත් තුනී එළියක් සහිත විදුලි පහනේ එළියෙන් දුටු යුවතියගේ ලස්සන නිස්කංලකයේ විඳගන්නට අවශ්‍ය නිසාය. කිසිම සැකයක් නැත. මේ මෙන්දක ඔහුගේ ජීවිතයේ දුටු ලස්සනම රුවය. නීති විද්‍යාලයේදී ඔහුගේ ඇසුරු කළ කිසිදු යුවතියකගේ මුහුණකින් දුටුවේ නැති නැවුම් බවක් ඔහු භාවනාගේ මුහුණින් දැක්කේය. ‘දැක්ක ලස්සනම කෙල්ල කියලා හිතුවේ නිෂානේ. ඒකී කැලේනේ. මේකනේ මල’ මෙන්දක දැඟකාර හැඟීමෙන් සිතුවේය.

“මේ ඩෙසට් එක අයියේ.”

භාවනා මෘදුව කීවාය. ‘ඩෙසට් එක මම වගේනේ මං දිහා බලාගෙන ඉන්නේ. මාව කන්න වගේ හැන්දෙන්’

ඇය යටි සිතෙන් සිනාසෙමින් සිතුවාය.

"මේ මොනවද නංගි."

මෙන්දක ඇසුවේය. 'මොනවා වුණාම මොකද කෑවානම් ඉවරනේ. දෙන දේ'

"මේ චොකලට් පුඩින් එකක් අයියේ. අම්මා ගෙදර හැදුවේ"

ඔහු සිනාසුනේය.

"එහෙනම් කමු. මාත් ආසයි චොකලට්වලට"

'ඉතින් මට මොකද' ඇයට කියන්නට සිතෙයි.

"නංගි සීගිරි එකේ මොනවද කරන්නේ"

මෙන්දක අතුරුපස කප් එක ගනිමින් ඇසුවේය. දැන් ඇයට යා නොහැක.

"මම එතන මේ හැමදේම බලනවා. එකක් කියලා නෑ."

"ඔයාලගේ දේනේ නේද? දවසක එන්නෝන ඒ පැත්තේ"

"මේ දවස්වල අපි රෙනෝවේෂන්වලට වහලා තියෙන්නේ. නෙක්ස්ට් වීක් ආයෙත් ඕපන් කරන්නේ"

"ආ. මොනවත් ස්ටඩීස් එහෙම කරන්නේ නෑ"

"එහෙම නෑ. ඒ ලෙවල්ස් ඉවරවෙච්ච ගමන් සීගිරි එකට ආවා. පස්සේ කම්මැලි හිතුණා"

ඇය කීවාය.

"ඉගෙනගන්න එක කම්මැලි වැඩක් තමයි."

'ඒක වෙන්න ඇති වයසට යනකල් ඉගෙනගත්තේ' ඇය සිතින් කීවාය.

"ඉන්නකෝ මම නංගිට මගේ කාඩ් එකක් දෙන්න"

භාවනා අල්ලාගෙන උන් ට්‍රේ එක මත ඩෙසට් කප් එක තැබූ මෙන්ද්‍රක ඔහුගේ පර්ස් එක ගෙන ඉන් සුදු පැහැගත් නේම් කාඩ්පතක් රැගෙන ඇයට දුන්නේය.

"ඕකේ මගේ මොබයිල් නම්බර් එකත් ඇති. පුළුවන්නම් ඒකට ඔයාගේ නම්බර් එක එවන්නකෝ රෑට. දවසක කතාකරන්න"

මෙන්ද්‍රක කීවේය. භාවනාගේ ළය ගැස්සිණ. 'ඇයි මම එහෙම කතාකරන්නේ. ඇයි ඒ. මොකක්ද එහෙම කතාකරන්න අපි අතර තියෙන සම්බන්ධය. අවශ්‍යම නෑ' ඇය සිතුවාය.

"ම්"

ඇය අමාරුවෙන් කීවාය.

සූරියආරච්චි පවුල යන්නට පිටත් වී කියූ එක කතාවක් නිසා භාවනාගේ නිවන නැතිම විය.

"අපිට ආයෙත් ඉක්මනට එන්න වෙයි මිලී. මං හෙට උදේම ගන්නම්."

සූරියආරච්චි මහතා කීවේය.

"හරි සූරි. මමත් ගන්නම්කෝ හෙට"

ශ්‍රීමා ඉඳුනිල්ව වැළඳගෙන පසුව වැළඳගත්තේ භාවනාවය.

"අපි ඔයාව බලන්න ඉක්මනට එනවා සුදු දුවේ."

ඇයගේ වචන කෙල්ලගේ පපුවට හොණ්ඩර ගණනක බරක් ගෙනආවේය. 'ඇයි මාව බලන්න විශේෂයෙන් එන්නේ. මම දීපිකා පදුකොන්යෑ' ඇය සිතින් කීවාය.

"ගුඩ් නයිට් ඇන්ටි"

භාවනා එපමණක් කීවාය. මෙන්ද්‍රක ඇයට සමුදුන්නේ වෙනස්ම ලෙස ඇය දෙස බලාය. ඒ බැල්මේ මොකක්ද තිබුණි.

"මට නම්බර් එක මැසේජ් කරන්න නංගී."

ඔහු ඇයට සමුදෙද්දී කීවේය. භාවනා හිස වැනුවාය. වෙන කළහැකි දෙයක් නොවීය.

"ෂෝක් ෆැමිලි එක පුතා. හොඳ මිනිස්සු."

සූරියආරච්චි පවුල ගිය පසුව රඹුක්වැල්ල මහතා කීවේය. භාවනා නේත්‍රා දෙස බැලුවාය.

"ඒකනේ මම එන්න කිව්වේ තාත්තේ. අපිට ඒ වගේ පවුලක් ඉන්න ඕන."

මිලින්ද කීවේය. ඒ කතාවේ සෑහෙන අරුත් විය. භාවනා සිතන්නට ගියේ නැත.

ඔහු නිවසට ආවේ භාවනාගේ කරට අතක් දමාගෙනය.

"කොහොමද ඒ අයියා. ආ සුද්දි"

මිලින්ද ඇසුවේය.

"හොඳයි තාත්තා. මං වැඩිය දන්නේ නෑනේ"

ඇය උගුරෙන් මෙන් කීවාය.

"නොදන්න අය දවසක දන්න අය වෙනවා. ඒ ජීවිතේ හැටි"

මිලින්ද කීවේය. භාවනා එහෙමම උඩු මහළට ආවාය. හදවතම මිරිකා හල බවක් ඇයට දැනෙන්නට විය.

# 23

කිසිවෙක් සමඟ කිසිවක් කතාකරන්නට භාවනාට අවශ්‍ය නොවීය. සමහරවිට කිසිවක් කතාකරන්නට ඉඩක්ද නොලැබෙනු ඇත. සූරියආරච්චි පවුල මේ ආ ටිකට නිවසම වෙනස්විය. ඔවුන් ආවේ රඹුක්වැල්ල පවුලේ බාල දුවගේ දෛවය ලියා යන්නද?

භාවනාට කෙඩෙත්තු ගතියක් දැනෙන්නට විය. ඇය කාමරය

පුරා ඔහේ ඇවිදිමින් බොහෝ දේ සිතුවාය. සූරියආරච්චි පවුල මේ නිවසට ඒමේ ලොකු අරමුණක් ඇති බව ඇය දනී. ඒ අරමුණ තමාද? 'මාව දවසක් නවලෝකේදී දැකලත් තියෙනවා කියලා කියන්නේ.'

මෙන්දක සූරියආරච්චි කොහොම කෙනෙක්ද කියා සිතන්නට අමාරුය. ඔහුගේ පෙනුමෙන් බැල්මෙන් ඔහු සිතන දේ කියන්නට අමාරුය. දක්ෂ නීතිඥයන්ට ඒ කපටි නුවණ ඇත. එසේ පෙනුනහොත් අනෙක් පාර්ශවයේ නීතිඥයන්ට ඔහුව කියවිය හැක. ඒ නිසාදෝ නීතිඥයන් හැසිරෙන්නේ තමාව අනෙක් අයට කියවන්නට බැරි ලෙසය.

"මටත් එයාව කියවන්න බෑ. කියවන්න ඕනත් නෑ. ඒත් මගේ

ජීවිතය එයාගේ ජීවිතේ ළඟ තියලා හැමෝම හිතනවා"

එය එසේ නැතැයි කියා සිතන්නට තරම් භාවනා බොළඳ නොවීය. මේ වෙන්නට යන්නේ ඒකය.

"එයාලා හෙට අනිද්දාම මොකක්හරි තාත්තට කියයි. තාත්තට එයාලගෙන් තොර ලෝකයක් නෑ. අද අම්මත් එහෙමයි. සීයටත් එයාලව හිතට අල්ලලා"

භාවනා සිතුවාය.

භාවනා ඇගේ ජංගම දුරකථනය දෙස අලසකමින් බැලුවාය. නැත. කිසිම ඇමතුමක් නැත. කිසිම කෙටි පණිවිඩයක් නැත. ඔහු අද කතාකරන්නේ නැති බව ඇය දනී. භාවනා වෙලාවෙ බැලුවාය. වෙලාව රාත්‍රී දොළහයි තිස් පහය.

"ඔයා නිදි නෑ. මට එහෙම හිතෙනවා. නිදි නෑ."

මේ රෑ ඔහුට අමතා කුමක් කියන්නද? අසරණ කොල්ලාට කතාකර තවත් දුක් දෙන්නේ ඇයි. ?

"ඒත් ඔයාට කෝල් එකක් ගන්නම ඕන. එහෙම හිතෙනවා."

ඇය ඇඟ සෝදාගෙන අතට අසුවූ රෑ ඇඳුමක් ගතට දමාගෙන ආවාය. හැමදේම එපාවූයේ ඇයි? රැය නිහඬය. පාළුය. ඊයේ පෙරේදා හිතේ නොතිබූ පාළුවක් අද දැනෙන්නේ ඇයි. ?

භාවනා දේවකගේ අංකයට ගත්තාය. පසුව ඇය ඇඳ වියලට කොට්ටයක් තබාගෙන එයට බරවූවාය. අද ඔළුවත් බරයි වාගෙ "ය. නිදාගන්නට පෙර පැරසිටමෝල්

පෙත්තක්වත් බොන්නට ඕනා කියා ඇයට සිතුණි.

"සුද්දි."

දේවක කතාකළේ පළවෙනි රින්ග් එක යන්නටත් පෙරයැයි ඇයට සිතුණි. 'ඒ කියන්නේ ඔයා නිදි නෑ. ඇයි මේ රෑ ඇහැරගෙන'

"නිදි නෑ දේවකයියේ."

කටහඬ දුකින් බරවී ඇත්තේ ඇයි?

"එනකොට ටිකක් පරක්කු වුණා සුද්දි"

"දැන් මොනවද කරන්නේ."

ඇය ඇසුවාය.

"මේ නිකං දොරකඩ පඩියට වෙලා ඉන්නවා. අද අප්පච්චිත් නෑනේ සුද්දි."

ඔහු මේ කතාකරන්නේ දුකින්ද?

"ඇයි අප්පච්චි."

"අද මේ සයිට් එකක ලොකු කොන්ක්‍රීට් එකක් දානවා. කොළඹ හෝටලේක. ඉතින් නයිට්."

දේවක කීවේය.

"කෑවද අයියේ."

භාවනා ඇසුවාය.

"අද මේ හේරත් මාමත් ගමේ ගිහින්. නෑයෙක් ලෙඩවෙලා. මම මේ."

"ඉතින් කෑවේ නෑ. ඇයි එහෙම කරන්නේ. ආ. බඩගින්නේ ඉන්න මෙච්චර රෑ වෙනකල් පිස්සුද?"

මෙහෙම කෑගහන්නේ ඇයි? දන්නේ නැත.

"මේ මැගී එකක් රෑ වෙලා හදාගන්නවා. තේ ටිකක් හදාගෙන ආවේ දැන් සුද්දි. එහෙම බඩගින්නත්

ආවෙත් නෑ"

භාවනාගේ ළයම හිස්විය. අද රඹුක්වැල්ල නිවසේ සූරියආරච්චිලාට දැමූ කෑම මේසය කෙල්ලට සිහිවිය. එහි නොතිබූ දෙයක් නැත.

"මැගී එකක් කාලා ඇත්ද? ඇයි එහෙම කළේ. බෝ සෙවණෝන් මොනවාහරි අරන් එන්න තිබුණානේ"

ඇය කීවාය.

"මට මතක්වුනේ නෑ සුද්දි. ඒක ගානක් නෑ. මැගී එකක් හදාගන්නවා රෑ වෙලා"

"ගෙදර මැගී නෑනේ"

ඇත්තටම නැත. ද්වෙක ක්ෂනික නූඩ්ල්ස් කන්නට කැමති නැත.

"ඇති. ගෙනාවා වගේ මතකයි."

ළඟක ඉන්නවානම් මේ රෑ ගොස් කෑම ටිකක් දෙන්නට තරම් හැඟීමක්

භාවනාට දැනෙයි.

"ඉතින් සුද්දි අමුත්තෝ ආවද"

ඔහු මෙය අසන බව ඇය දනී. 'අද කෑමත් කන්නේ නැතුව මේ මහ රෑ වෙනකල් ඉන්නේ ඒ නිසාද?

"ඔය ඇවිත් ගියේ තාත්තගේ යාළුවෝනේ."

ඇය ඕනවට එපාවට මෙන් කීවාය.

"එයාලා සුද්දි"

"එයාලා ගැන ඇති දැන්."

භාවනා ඒ කතාව එතනින්ම නතර කළාය. සූරියආරච්චිලා ගැන කතාකරන්නට ඇයට බයය. 'එයත් එනවා මෙතන තවත් පපුව පුච්චන්න' ඇය සිතින් දේවකටත් බැණ්නාය. ඒත් මේ අහිංසකයා කළ වරද කුමක්ද?

"යන්න. ගිහින් හදාගන්න දෙයක් තියෙනවද කියලා බලන්න. පාන්වත් නැද්ද?"

භාවනා ඇසුවාය. පුදුමය. මේ කැක්කුම හද දවාලයි. ද්වෙක මේ රෑ යේ නිරුවත් පපුව අතගාන්නේ ඒ නිසාද?

"දැන්ම බඩගිනි නෑ සුද්දි."

"දොළහට එකට බඩගිනි එන්නේ නැත්නම් කීයටද එන්නේ."

"මං තියනවා. දැන් යන්න. මොනවාහරි කන්නෝන."

අද ඔහු ගෙදර තනියමය. මේ රෑ යේ පුංචි ගෙදරක දොරකඩ පඩියට වී ඉන්නා ඔහුගේ රුව ඇයට මැවී පෙනුණි. 'එතනට වෙලා මටත් ඔයා එක්ක කතාකරකර ඉන්න තියෙනවානම්. දන්නෙම නැතුව මම

ඔයාට හේත්තුවක් දාගෙන නිදාගනී. අපි එහෙමයි.' ඈයට සිතුණි.

"සුද්දි දැන් නිදාගන්න"

"ඇයි ඈහැරගෙන උන්නේ."

"සුද්දි රෑ වෙලා ගනී කියලා හිතුවා."

"ඇයි මං ගන්නේ"

ඈය ඇසුවාය. කොල්ලාගෙන් උත්තරයක් නැත. උත්තර අරන් කුමටද?

"දැන් යන්න. මං උදේට අහනවා කෑවේ මොනවද කියලා."

"ම්. බුදු සරණයි. නිදාගන්න."

ඈය දිග සුසුමක් හෙළා දුරකථනය තැබුවාය. ඊටත් පසු දෑස් පියාගෙන විනාඩි විස්සක් පමණ උන්නාය. අද නිදිමතක් එන්නේ නැත.

** ** ** ** ** ** ** **

සූරියආරච්චි මහතා මෙන්ද්‍රක දෙස බැලුවේ රඹුක්වැල්ල නිවසේ සිට සිය නිවසට යන අතරවාරයේය. ඔහුට ඔහුගේ පුතාගේ සිත කියවන්නට පුළුවන.

"මොකද කියන්නේ පුතා"

රඹුක්වැල්ල මහතා ඇසුවේය. අසන්නට දෙයක් නැත. කොල්ලා කෙල්ලට කැමති බව ශ්‍රීමා දැනගෙන උන්නාය. ඒ මලට අකමැතිවෙන කොල්ලෙක් නැත. කෙල්ලව දැක්ක වෙලවේ සිට ශ්‍රීමාටත් ආසය.

"මම තාත්තා."

"කෙළින්ම කියන්න. භාවනාට කැමතිද නැද්ද? තව බලන්නෝනද? ඔයාට මනමාලියෝ හොයලා මට

එපාවෙලා තියෙන්නේ. දැන් රශ්මිගෙන් ඩිවෝස් වෙලාත් අවුරුදු දෙකක් වෙනවනේ”

සූරියආරච්චි මහතා කීවේය. මෙන්ද්‍රක සූරියආරච්චි මේ කුළුදුලේ ආදරය කරන කෙනෙක් නොවේ. ඔහුගේ ජීවිතය එක කාලයක අවුල් ජාලාවක් විය. රශ්මි ඔහුගේ ප්‍රථම බිරිඳය. එහෙත් ඒ විවාහය කෙරුණේ නැත. මුදු මාරුකළා පමණය. එයද කෙරුණේ පවුලේ දෙකේ සාමාජිකයන් ඉදිරියේය. දෙන්නා වෙන්වූයේ වෙඩින් එක කටේ තියෙද්දීය. හේතුව තවමත් කිසිවෙකු දන්නේ නැත. රශ්මිත් මේන්ද්‍රකත් දෙදෙනාම ඇවිත් කිව්වේ මැරිකරන්න බෑ කියාය. එයට රශ්මිගේ පැත්තේ හේතු වාගේම මෙන්ද්‍රකගේ පැත්තේද හේතු විය.

"කියන්න. අහන්න ශ්‍රීමා මෙයාගෙන්. අපිත් මේවා සෙට්ල් කරගන්න ඕනනේ."

සූරියආරච්චි මහතා කීවේ තරමක් තදිනි. මෙන්දකගේ ජීවිතයේ සිදුවූ සමහර දේවල් නිසා සූරියආරච්චි මහතා හෙම්බත්ව උන්නේය.

"අහන්න දෙයක් නෑ පුතා කැමතියි භාවනාට. මාත් කැමතියි."

ශ්‍රීමා කීවාය.

"භාවනා හොඳයි තාත්තේ."

මෙන්දක කීවේය. සූරියආරච්චි මහතාගේ මුවේ තුනී සිනාවක් නැඟිණි.

"කෙල්ලෝ තුන්දෙනෙක්ම ඉන්න නිසා අපිට මිලින්දගෙන් ලොකු දෙයක් බලාපොරොත්තුවෙන්න බෑ. ඒත් සීගිරි එකම සෑහෙන වත්කමක්.

එතන ඉඩම විතරක්ම කෝටි සීයක් විතර ඇති”

“තව දේපොළත් ඇති. රඹුක්වැල්ලලා හැමදාම කළේ හම්බකරපු එකනේ”

ශ්‍රීමා කීවාය.

“ඔව් ඒක ඇත්ත. මං එහෙනම් මිලින්දට කියන්නද”

“තාත්තගේ කැමැත්තක්.”

“ආයේ සෙල්ලම් කරන්න බෑ මෙන්දක හොඳද? දැන් පිස්සු නැටුවා ඇති. හැමදේම සෙට්ල් කරගන්න”

මෙන්දක කිසිවක් කීවේ නැත. විවාහය යනු නිදහස් ජීවිතයේ අවසානය යැයි ඔහු කවදාවත් සිතන්නේ නැත.

“එහෙම වුනොත් අපි ඉක්මනට වෙඩින් එක ගමු. මේ රශ්මිගේ

කතාව මෙයාලා දැනගනීද? ඒක කියලම දාන්න වෙයිද මිලින්දට."

සූරියආරච්චි මහතා ඇසුවේය.

"එයා ගැන කියන්න එපා. මැරිකළාට පස්සේ ඒවා වැඩක් නෑනේ. අනික රශ්මි දැන් ලංකාවෙත් නෑනේ."

මෙන්දක කීවේය. ඇය ඔහුට මේ ළඟදීත් කතාකළාය.

"මං උදෙන්ම මිලින්දට කතාකරන්නම්."

අවසානයට ඔහු කීවේය.

# 24

භාවනා ඉහළ මාලයේ සිට පහළට ආවේ බරවූ මුහුණිනි. මුළු රඹුක්වැල්ල නිවසම ගුප්ත නිහඬතාවයක ගිලී තිබුණි. කෙල්ලගේ සිතට මොකක්දෝ අඳුරු මූසල බවක ගිලී තිබුණි. ඇය අද එහෙමට කියා ලස්සනට ඇන්දේද නැත. සාරියක් ඇඳින්නට ගොස් පසුව එය එහෙමම දැමූ ඇය සාමාන්‍ය සායක් හා බ්ලවුසයක් ඇන්. දාය.

කොණ්ඩය එක මිටකට ගෙන පෝනි ටේල් එකක් දැමූ ඇය ඇයගේම රුව දෙස කැඩපතින් බලාගෙන උන්නාය.

"මොකද වෙන්නේ."

හිතම අසන්නේ එයය. එය හෙට අනිද්දාම දැනගන්නට පුළුවන් වෙනු ඇත.

භාවනා පහළට ආවේ හැකි ඉක්මනින් නිවසින් පිටවීමේ අරමුණිනි. අද කන්නට නවතින්නේ නැතැයි ඇය සිතාගත්තාය.

භාවනා පහළට එද්දීම සාලයේ මේසය මත තිබූ මිලින්දගේ ජංගම දුරකථනය නාදවිය. මිලින්ද පෙනෙන්නට උන්නේ නැත.

"තාත්තා ෆෝන් එක රින්ග් වෙනවා"

නැත. මිලින්ද උන්නේ නැත. ඇය

ගොස් දුරකථනය අතට ගත්තාය. පසුව කතාකරන්නේ කවුද කියා බැලුවාය.

"සූරි අන්කල් කතාකරන්නේ. මේ උදේ හතට. ඇයි ඒ"

ඇය සිතුවේ දෙගිඩියාවෙනි. දුරකථනය නාදවෙන හඬ පවා ළයට සිදුරුැ අනින්නාක් වැනි යැයි භාවනාට සිතුණි.

මිලින්ද උන්නේ කෑම කාමරයේය. භාවනා දුරකථනයද ගෙන එතනට ගියාය.

"මේ කෝල් එකක් තාත්තා."

ඇය උගුරෙන් මෙන් කීවාය.

"කාගෙන්ද සුද්දි."

"මේ සූරි අන්කල්ගෙන්."

භාවනා කීවාය.

"ඉතින් ආන්සර් කරන්න තිබුණානේ

පුතේ. කෝ දෙන්න"

මිලින්ද කෙල්ලගේ අතින් දුරකථනය ගත්තාය. පසුව ඇය මිලින්දගේ කට දෙසම බලාගෙන උන්නාය.

"ගුඩ් මෝනිං සූරි. ඉතින් කියන්නමේ දැන් ඉඳුනිල් සූරිලව මතක් කළා විතරයි."

මිලින්ද කීවේය.

"උදේම සූරි. කියන්න"

භාවනාගේ බඩ පපුව දාගෙන ගිය සෙයක් ඇයට දැනුණි. උසාවියේ තීන්දුව ප්‍රකාශ කරන තෙක් විත්තිකරුවෙක් බලාගෙන සිටින්නාක් වැනි හැඟීමක් භාවනාට දැනුණි. කොහොමත් හෙට අනිද්දාම දෛවය තමාගේ ජීවිතයේ තීන්දුව ප්‍රකාශකරනු ඇතැයි භාවනාට

සිතෙයි. එය පිළිගන්නවාද? නැත්නම් එයට අභියාචනා කරනවාද? එසේ කළ හැකිද? භාවනා දන්නේ නැත. ඇයට තේරෙන්නේ නැත.

"ඔව් සූරි. අපි කිව්වනේ කතාකරමු කියලා. ඒක මොකක්ද?"

මේ කතාකරන්නේ කුමක් ගැනද? භාවනා අම්මා දෙස බැලුවාය. ඇයගේ මුහුණේ ඇත්තේ මොකක්ද රහසිගත බවකි. 'එයාටත් ඊයේ හවස ඉඳලා මොකක්ද වෙලා' භාවනා සිතුවාය.

"හරි සූරි. හම්බවෙලාම කතාකරමුකෝ. මට අද උදේන්ම වැඩක් තියෙනවා. මම ඒක ඉවරවෙලා එන්නම් ඒ පැත්තේ."

මිලින්ද කීවේය.

"ඒකනේ සූරි. හරි. හතරට විතර

අපි හම්බවෙමු එහෙනම්. ඔව්”

භාවනා සුසුමක් පිට කළාය.

මේ අද හවස හමුවී විශේෂයෙන් කතාකරන්නේ කුමක් ගැනද? භාවනාට ඇවිදගන්නට බැරි ගතියක් දැනුණි.

“ඕකේ සූරි.”

මිලින්ද දුරකථන ඇමතුම නිමාකර කෙළින්ම බැලුවේ භාවනා දෙසය. ඇයගේ දෙපා හිරි වැටිණ.

“සූරි අන්කල්ලට ඔයා ගැන කතාකරන්න ඕන කියන්නේ.”

මිලින්ද කීවේ වටෙන් පැමිණය. තාත්තා මොනවා කියන්නද කියා භාවනාට තේරෙන්නේ නැත.

“මං ගැන ඇයි තාත්තා.”

වචන ආවේ ගොරෝද හඬකිනි.

“අපි අහලා බලමු. මං ඇවිත්

කියන්නම්කෝ. ශ්‍රීමතී ඉන්දුට කතාකරයි"

මිලින්ද කීවේය. භාවනා ඉඳුනිල් දෙස බැලුවාය. අද හැමදේම සිද්ධවෙන්නේ තමාට විරුද්ධව යැයි භාවනාට සිතෙයි.

"මං හිතුවා ඔයාව දැක්කට පස්සේ එයාලට කතාකන්න ඕනවෙයි කියලා. හිතපු දේම වුණා ඉතින්."

භාවනා එක දෙයක් සිතාගත්තාය. මේ හැමදේම සිද්ධවෙන්නේ කලින් කතාකරගත් විදිහකට අනුවය. 'එයාලා මාව දැක්කත් කිව්වේ නවලෝකෙදී.' භාවනා තුනී සුසුමක් පිටකළාය.

"මී. දැන් යන්න ගිය ගමන යන්නකෝ. මෙච්චර උදෙන් මොකද සුද්දි."

මිලින්ද ඇසුවේය.

"අපි නෙක්ස්ට් වීක් ඕපන් කරනවනේ තාත්තා. වැඩ ගොඩ ගැහිලනේ."

භාවනා අමාරුවෙන් කීවාය.

"ඔයත් වැඩකරනවා විතරයි. අපි බලමුකෝ"

මෙහෙම වැඩකරන එක සැනසීමක් කියා කියන්නට භාවනාට සිතුණි. ඒකේ එහෙමට කියා ගින්දරක් තිබුනේ නැත. ඇවිලීමක් තිබුනේ නැත.

"මං යනවා තාත්තා."

භාවනා කෑම මේසය ළඟ බිම පහත් වී මිලින්දට වැන්. දාය.

"ම්. බුදු සරණයි. සමහරවිට මෙන්ද්‍රක පුතා ඔයාට කතාකරයි."

මිලින්ද යන්තමට කීවේය. භාවනා

කිසිවක් කීවේ නැත. ඔහු කොයි වෙලාවක හෝ කතාකරාවී කියා ඇයටද සිතුණි.

භාවනා කෑම කාමරයෙන් ගියේ කොර ගසමින් මෙන්ය. ඈය යන දෙස මිලින්දත් ඉඳුනිලුත් බලාගෙන උන්නේ දරුෑ කැක්කුම උතුරායන බැල්මකිනි.

"කෙල්ල බයවෙලා වගේ මොකෝ ඉන්දු."

මිලින්ද ඇසුවේය.

"තාම පොඩි කෙල්ලනේ."

ඉඳුනිල් කීවාය. ඒත් කෙල්ලගේ බය පිටුපස කුමක් හෝ දෙයක් ඇතිබව ඉඳුනිල්ට නිකමට මෙන් දැනෙයි. එහෙත් කෙල්ලෙක් හිතාගෙන ඉන්නා සියල්ලම ඇගේ ජීවිතය වෙන්නේ නැත. එය ගැහැණු

දරුවෙකුගේ ජීවන ඉරණමය.

දෛවය දෙන උත්තරයක් බාරගන්නට කෙල්ලෙක්ට සිදුවෙනු ඇත. ඉන්පසු එය ජීවිතය කියා සිතාගෙන ජීවත්වෙන්නට ඇයට සිදුවෙයි.

ඒත් ඒ ඉඳුනිල්ගේ කාලයේ කෙල්ලන්ගේ හැටිය. භාවනාලා ඉන්නේ වෙනම කාලයක බව ඇයට නිකමටවත් සිතෙන්නේ නැත. දෛවය දෙන හැම උත්තරයක්ම කෙල්ලෝ බාරගන්නේ නැත.

"සූරිලා උඩින් අපේ කෙල්ලට කැමතියි. ඊයේ රෑ වෙනකල් කතාකළේ භාවනා ගැනලු. අපි මේක කතාකරලා ඉවරයක් කරමු මිලී කියලා කිව්වේ."

මිලින්ද ඉන්නේ ලොකු සතුටකින් බව ඉඳුනිල් තේරුම් ගත්තාය.

"තාත්තා එක්කත් කතාකරන්න වෙනවා ඉන්දු. අපිත් මේ කෙල්ලට දෙන දෙයක් ලෑස්තිකරන්න වෙනවනේ."

මිලින්ද කියද්දී ඉඳුනිල්ට දුක සිතුණි. ඔහු ඉන්නවා ඇත්තේ කොතරම් ලොකු ගින්දරකින් විය හැකිද?

"තාත්තා එක්ක කතාකළා කියලා."

ඇය ඇසුවාය.

"අනේ මන්දා. සීගිරි එකටත් අයිතිවාසිකම් කියන්න හයදෙනෙක් ඉන්නවනේ."

මිලින්ද කීවේය.

"ඒකනේ."

මිලින්ද මේසයට තට්ටු කරමින් කල්පනා කළේය.

"එහෙම සූරිලා අහයිද?"

මිලින්ද ඉඳුනිල් දෙස දෙස බැලුවේය.

"ඒත් මට මොකක්හරි කියන්න වෙයි ඉන්දු. වෙඩින් එකක් ගන්නත් ලක්ෂ හැටක් විතර යනවා. ඒක හොයාගත්තා කියමුකෝ. ඒත්"

"අපි ඇත්ත තත්වය එයාලට කියමු"

ඉඳුනිල් කීවාය.

"එහෙම කොහොම කියන්නද?"

"ඕක හයට බෙදලා මොනවා කෙල්ලට දෙන්නද? ඇරත් මේ හදිස්සියේ."

මිලින්දද එය දැනගෙන උන්නේය.

"නේත්‍රා පැත්තක තිබ්බත් තාරකාත් ඉන්නවනේ"

ඉඳුනිල් කීවාය.

"මට එහෙම එයාව පැත්තක

තියන්නත් බෑ ඉන්දු."

මිලින්ද දුකෙන් කීවේය.

"නෑ මං කිව්වේ."

"අපි බලමුකෝ මොකක්හරි. සූරිලා එක්ක කතාකරලා බලමුකෝ ඉස්සෙල්ලා"

මිලින්ද නැඟිටිමින් කීවේය. කෙල්ලෝම තුන්දෙනෙක් හැදූ පසුව තාත්තලාට ඇති ගින්දර වැඩිය. මිලින්දගේ හිතේ ඇති ප්‍රශ්න ඉඳුනිල් තේරුම් ගෙන උන්නාය.

# 25

භාවනා සීගිරි එකට යන්නට වාහනයට ගොඩවූයේ කැමැත්තකින් නොවේ. ටික වෙලාවක් ඉඳ ආපහු ආවොත් හොඳයි කියාත් ඇයට සිතුණි. පසුගිය දවස් ටිකේ සීගිරි එකට ගියේ කොතරම් ආසාවකින්ද? හදවත අස්සෙන් මෝදුවෙන මලක සුවඳ හදවත පුරාම විසිරී ගිය බවක් ඇයට දැනුණි. එහෙත් අද ඒ හිතම පාළුවට ගොස් ඇත.

භාවනාගේ මුහුණේ කිසිදු සිනාවක් තිබුනේ නැත. තද වැස්සකට තෙමුණු පසුව තද අව්වකට වියලීගිය මලක මැලවුණු පාට ඇයගේ මුහුණේ විය.

ගින්දරක් ඇත්තේ සීගිරි එකේද? නොවේනම් නිවසේද? භාවනා ඔද්දල්ව ගිය සිතින් සිතුවාය. දැන් ගොස් එක්කෙනෙකුගේ දෑස් දෙස බලන්නට බැරි ගතියක් ඇතැයි ඇයට සිතුණි.

සීගිරි කා පාක් එකට වාහනය දමද්දී ඇයට පුදුම සිතුණි. ඊයේ රාත්‍රීයේ මුළු කා පාක් එකම කොන්ක්‍රීට් ගල් අතුරා ලස්සනට සකසා තිබුණි. මේ දකින්නේ සීගිරි එකද නොවේනම් අලුත්ම සුපර් මාර්කට් එකක්ද කියා ඇය

සිතුවාය. සීගිරි සුපර් ඉදිරිපස පෙනුම සම්පූර්ණයෙන් වෙනස් වූයේ කෙසේද? තැනින් තැන වූ බිත්ති කෑලි සියල්ලම කඩා ඇත. ඒ වෙනුවට ඊයේ රෑ පැහැදිලි වීදුරු බිත්ති ගසා තිබුණි. මේ සියල්ල එක රැයක් තුළ සිදුවිය හැකිද? අලුතෙන් කොන්ක්‍රීට් ගල් ඇතිරූ සීගිරි කා පාක් එක මැදින් ඇය ඇවිදගෙන ආවාය. දෙපසින් සිටවන ෆෝක්ස් ටේල් ගස් පේළිය වෙනුවෙන් වලවල් කපමින් තිබුණි. දැන් ඇත්තේ ඉදිරිපස තාප්පය කැඩීමට පමණි. දේවක කීවේ එය සම්පූර්ණයෙන්ම කඩන බවය. ඉන්පසුව සීගිරි එකට කලින් තිබුනේ නැති පෙනුමක් ලැබෙනු ඇත. මේ සියල්ල ඔහුගේ සැළසුම්ය. ඔහු එහෙම සිතුවේ කෙසේද?

භාවනා සීගිරි සුපර් වෙත ඇතුල් වූයේ එක ඇස්දෙකක් සොයමිනි.

දේවක උන්නේ මීට් කවුන්ටරය හදන තැනය. එයට උඩින් ලස්සන ලී වහළයක් ඉදිවෙමින් තිබුණි. එය ලී නොව ඉදිකිරීම් සඳහා යොදාගන්නා ප්ලාස්ටික් විශේෂයකි. එහෙත් එය ප්ලාස්ටික් බව කෙනෙක් හඳුනාගන්නේ එය ඇල්ලූවිට පමණය. නැත්නම් සිතන්නේ දැවැන්ත ලී වහළයක් කියාය. මීට් කවුන්ටරයට කඳුකර පෙනුමක් ගෙන එන්නට මේ ලී වහළය යොදාගන්නා බව ඔහු දවසක කීවේය. කෙනෙක් සුපර් මාර්කට් එකට ඇතුල් වූ විගස එහි කෙළවර දක්වාම පෙනෙයි. ඉස්සර එසේ නැත. හරහට තැනින් තැන තබා තිබූ රාක්ක නිසා සුපර් මාර්කට් එකේ කෙළවරක්

නොව එහා පැත්ත පවා පෙනෙන්නේ නැත.

සීගිරි එක මේ තරම් විශාල බව භාවනා දන්නේද අදය. මේ උද්දේය. මීට් කවුන්ටරයට වම් පසින් ඇත්තේ එළවළු අලෙවි සැළය. දකුණු පසින් ඇත්තේ බේකරි ෂොප් එකය. එතනට ආ විට කෙනෙක්ට හෙළවෙන්නට සිතෙන්නේ නැත. මැද අලුත් මස් මාළුය. වම් පසින් අලුත් එළවළු පළාය. දකුණු පසින් අලුතෙන් පිච්චෙන පාන්ය. ඔහුගේ සැළසුම හරිය.

බේකරි ෂොප් එක සම්පූර්ණයෙන්ම හදන්නට ගෙන තිබුනේ පිච්චූ ගඩොලිනි. 'අපි හරි අඩු වියදමකින් මේක කරන්නේ සුද්දි. ලොකුවට පෙන්නනවා.

පිටිපස්සෙන් ඉඩ ටිකක් ගන්නවා ඇතුළට. ඉස්සරහට මේ ගඩොල් අල්ලනවා. කපරාරු කරන්නේ නෑනේ. රෆ් ෆිනිෂ් එකක් දෙන්නේ. මෙතන කවුන්ටරයට අපි එක දිගට ටිකක් පරණ පාට ලෑම්ප් ෂේඩ්ස් අල්ලනවා. එතකොට නිකං හෝටලේක බේකරි සෙක්ෂන් එකක් වගේ. කෙනෙක්ට මෙතන නතරවෙලා ටිකක් ඉන්න හිතෙනවා. අපි අවන් එක පිටිපස්සෙන් තියන්නේ. ඒක කස්ටමර්ට පෙන්නන්නේ දර පෝරණුවක් වගේ. නමුත් ගෑස් අවන් එකම තමයි. ඒත් මෙයා පාන් කේක් එහෙම දාන්නේ දර පෝරණුවකට දානවා වගේ පත්තකින්.' ඔහු කලින් දවසක සැළසුම විස්තර කළේය. ඔහු ඒවා කොහොම හිතුවාද? හිතපු දේම

මැව්වේ කෙසේද? මේවා හදන හැටි පවා බලාගෙන උන්න තමාටත් දැන් එතනට වී ඉන්නට සිතෙන්නේ ඇයි. ?

ඒත් මේ හැමදේම දමා ඔහු දවසක යනු ඇතැයි අද භාවනාට සිතුණි. ඒ ඇතිවූ හැඟීමෙන් ඇයගේ ළය දැවීගෙන ගියේය.

"එහෙම හිතෙන්නේ ඇයි? ඔයාට සීගිරි එක දාලායන්න බෑ. කවදාවත් බෑ."

භාවනා සිතින් කීවාය. එහෙත් සිදුවෙන්නේ සිතාගෙන උන්න දේවල් නොවේ. කාටත් කළින් මේ සීගිරි එකෙන් තමාට යන්න වේවිද කියා දන්නේ නැත.

දෙවියන්ට මේ දවස්වල වෙන වැඩක් නැත. පන්නන්නේම තමාගේ

පස්සෙන්ය.

ලා රෝස පැහැගත් කමිසයට මෙරූන් පැහැගත් හීනි ටයි පටියක් පැළඳගෙන දේවක මීටි කවුන්ටරය අසළ උන්නේය. භාවනා එනවා ඔහු දැක්කේ නැත.

"මට සරත් මෙතනින් තව දිග ගඩොල් පේළියක් ඕන. පොඩි පඩියක් වගේ"

දේවක කීවේය.

"මෙහෙම ඇයි සර්. අපි කෙළින් ගහමු"

භාවනාටත් සිතුණේ එතන පඩියක් අනවශ්‍ය බවය. එහෙත් ඔහු එහෙම හදන්න කියා කියන්නේ ඇයි?

"බෑ සරත්. ඕනමයි. ඒක අමතර වියදමක් යන වැඩක් නෙමේනේ. මේ

බඳින බිත්තියම පන්නලා හදාගෙන යන්න. ගඩොල් දෙකක් පන්නන්න”

දේවක කීවේය.

“මෙහෙමද සර්.”

“ඔව්. ඒක දිගටම ඕනඅඩි හතළිහක් විතර දිගට.”

දේවක කීවේය. ඒ මොකටද කියා භාවනා සිතුවාය. හැමදේම ඇත්තේ ඔහුගේ සිතේය. දේවක භාවනාව දැක්කේ හැරෙද්දීය. ‘මේ ඇයි පරවෙලා.’ භාවනාගේ මුහුණ දුටු හැටියේම දේවක සිතුවේය. කෙල්ලගේ මුහුණත් අද මැලවී ඇත. ‘ඊයේ රෑ මොනවද වුනේ සුද්දි’ අහන්නට සිතෙන්නේ එහෙමය.

“ගුඩ් මෝ..නිං සුද්දි”

දේවක මුමුණා මෙන් කීවේය.

“මෝනිං දේවකයියේ”

කෙල්ල කීවේ හුළං බැස ගිය වචනවලිනි. මේ ඇගේ සිනාවද නොවේ. ඇගේ අයිස් ක්‍රීම් සිනහව ගැන දේවක හොඳින් දනී.

"මෙතන ඇයි ගඩොල් පේළියක් පන්නන්නේ දේවකයියේ."

ඇය ඇසුවාය. 'වෙනදාට ලස්සනට උදේ නාලා කඩාගෙන එන්නේ. කොණ්ඩේ අද පෝනි ටේල් දාලා. ඔයාට ලස්සනට අරමනේ' දේවකට කියන්නට සිතෙයි.

"ඒ දිගටම අපි ටින් මාළු දානවා සුද්දි. මස් මාළු ගන්නකොට එයාලට ටින් මාළු ගැනත් මතක් වෙනවා. ඒත් ටින් මාළු තැනට යනකොට එයාලට ඒක අමතක වෙනවා. ඒක වෙලාසනම විකුණගත්තාම අපිට හොඳයි. අනික ටින් මාළුවල

කොමිෂන් එකත් වැඩියි."

ඔහුට ඇත්තේ පුදුම සිදුම් මොළයකි.

"සනීප නෑ වගේ සුද්දි."

දේවක බයෙන් මෙන් ඇසුවේය. භාවනා දෙනෙත් පමණක් එසෙව්වාය.

"ම්. ඔළුව බරයි වගේ."

ඇය මලානක ලෙස කීවාය.

"ඒක තමයි අද නාලත් නෑ."

කෙල්ලට යටි සිතින් සිනාගියේය.

"ඒකනේ. ගඳකුත් ආවනේ."

ඇය ඇසුවාය. බැබලෙන ඇස් යන්තමට දිලිසෙන්නට ගත්තේ ඒ කතාවෙනි. දේවක රැව්වේය. හදවත අස්සෙන් ආ තෘෂ්ණාධික හැඟීමක් විසින් භාවනාගේ සිත අවතැන් විය. හෙණයක් ගසන්නාක් මෙන් ඇයගේ

සිත පුරා මෙන්ද්‍රක සූරියආරච්චිගේ රුව ඇඳිණි. 'ඒ යකාව ඇයි මේ උදේ මතක් වෙන්නේ' ඇය සිතුවාය.

"ඇයි සුද්දි"

'ඔයාට මොකක්ද වෙලා' දේවක සිතුවේය. ඔහු බොහෝ දේවල් සිතාගත්තේය. ඊයේ නිවසට ආ අමුත්තෝ ආවේ සාමාන්‍ය රෑ කෑමකට නොවන බව ඔහුට සිතෙයි. 'එයාලා ඔයාව බලන්න ආවේ'

"එන්නකෝ ඉවරවෙලා."

ඇය එතනින් ආවේ එසේ කියාගෙනය. කොර ගසමින් මෙන් ඇවිදගෙන යන භාවනා දෙස දේවක මොහොතක් බලාගෙන උන්නේය.

දේවක භාවනාගේ කාමරයට ඇතුළු වූයේ හදවත පුරා ඇවිලෙමින් එන දුකක් උඩට එමින්

තියෙද්දීය. භාවනා ඒ මුහුණ දෙස බැලුවාය. 'මටනම් දුක්වෙන්න කාරණා තියෙනවා කියමුකෝ. මොකද මේ දේවක මහත්තයට වුණේ. මූණ ගන්න දෙයක් නෑනේ. රෝස පාට කමිස ඇන්ඳට මූණම කළුයි' ඇය සිතුවාය.

දේවක පැමිණ භාවනාගේ මේසය ඉදිරිපට පුටුවට බරවූයේය.

"දේවකයියේ."

කෙල්ල කතාකළේ උගුරෙන් මෙන්ය. ඇය කියවාගෙන ආ විදිහට දේවක සිතුවේ මහ බරපතල දෙයක් මේ දැන් දැන් කියන්නට යනවා කියාය. එවැනි පාටක් ඒ මුහුණේ විය. මේ මුහුණ තරම් කියවූ මුහුණක් මේ ජීවිතයේ නැත.

"සුද්දි."

ඔහු ගොරෝද්‍ර හඬකින් කතාකළේය. 'වචනයක් කතාකළත් මේකා බයවෙනවනේ.' ඇය සිතුවාය. ඒ බියේ කෙළවර ඇත්තේ කුමක්ද?

"රෑ කෑවේ නෑනේ නේද?"

අසන්නට ගියේ එයමද කියා භාවනා සිතුවාය. ඇය කියන්නට ගියේ එයමද කියා දේවකද සිතුවේය.

"න්නෑ සුද්දි"

දේවක අවංකව කීවේය. භාවනා තොල්පට දසන් අතර තදකරගත්තාය. එහෙම කරගෙනම බැලුවාය.

"මොනවා වුනත් හොඳ ළමයෙක්. බොරු කියන්නේ නෑ"

ඇය ප්‍රසංසා කළාය.

"ඒත් ඇයි කෑවේ නැත්තේ දේවකයියේ"

ඒක අසන්නේ ඇයි?

"තව කෝපි පාරක් බිව්වා සුද්දි. තාත්තත් ආවා පාන්දර හතර විතර පස්සේ එහෙමම ඇඳගත්තා"

"රෑම නිදි නෑ."

ඇය ඇසුවාය. දේවක කතාකළේ නැත.

"මහන්සියට නින්ද ගියේ නෑ"

"මටත් නින්ද ගියේ නෑනේ."

භාවනා කීවාය. දේවක දයාබරව බැලුවේය.

"සුද්දිගේ මූණෙන් පේනවා"

"එහෙම."

"ම්."

"මූණුවල් කියවන්න පුළුවන්ද?"

"මී. මට පුළුවන් සුද්දිගේ කියවන්න."

"මගේ විතරද?"

"අපේ අප්පච්චිගෙත් පුළුවන්."

ඔහු ළදරුවෙක් මෙන් කීවේය. භාවනා බලාගෙනම උන්නාය.

"දැන් උදේ කෑවද?"

ඇය ඇසුවාය.

"සුද්දි ආවමනේ කන්නේ"

'මං ආවම කන්න මම නොනද අනේ' ඇයට අසන්නට සිතුණි. එහෙම අසන්නට ඇත්නම් හොඳය. එහෙත් එසේ අසා ඔහුව අපහසුතාවයට පත්කරන්නට හැකිද?

"මං මේ ඉඳි ආප්ප අරන් ආවා. ඩ්‍රයිවර් අන්කල් කිව්වේ එතන හොඳයි කියලා."

"කොහෙන්ද සුද්දි."

"ඔය මේ පොඩිතැනක්. ඒත් මං ඇහුවා පිරිසිදුද කියලත්. ගෑනු කෙනෙක් හදනවා කිව්වේ පිරිසිදුවට."

ඇය කීවාය.

"කමු මෙතනට හමුදාව එන්න කලින්."

ඇය කීවාය. භාවනා ගෙන ආවේ ඉඳි ආප්ප තිහක මුලකි.

"මේක දාන්න"

ඇය හොදි පැකට් එකක් දී කීවාය.

"සුවඳයි වගේ සුද්දි."

"මී. හාල් මැස්සෝද?"

"ඔව් පොල් මැල්ලුමත් සුවඳයි"

ඔහු හොදි පැකට් එකෙන් ටිකක්

දැමුවේය. පසුව හාල් මැස්සෝ ටිකක් ඇගේ පැත්තට දැමුවාය. එකම මුලක ඔහු සමඟ කන්නට හිතෙන්නේ ඇයි?

"මට පහක් ඇති. ඔක්කොම කන්නෝන."

"දෙන්නම කමුකෝ"

ඔහු කටක් අනා කන්නට ගෙන ඇය දෙස බැලුවේය. භාවනා ඉඳි ආප්ප මුළු අතගාමින් බලාගෙන උන්නේ ඔහු දෙසය.

"සුද්දි"

"කන්නකෝ."

"ඔය කන්නේ නෑනේ."

ඇය ඇයගේ පැත්තේ තිබූ අල කෑල්ලක් ඔහුගේ පැත්තට දැමුවාය.

"එයාලා අලත් දාලා."

"එහෙම දැම්මාම රසයිනේ සුද්දි"

"මී"

ඇය කන්නේ නැත. දේවක අලත් දමා පොල් මැල්ලුමත් දමා කටක් හැදුවේය. භාවනා එදෙස ඇස් කොනකින් බලාගෙන උන්නාය. හදිස්සියේම ඔහු ඉඳි ආප්ප කටක් අනා කෙල්ල දෙස බැලුවාය.

"සුද්දි අද කන්නේ නෑ. ආ මේක කන්න"

පුදුමය. ඔහු ඇනූ කට ඇගේ මුව අසළට ගෙන ආවේය. භාවනා ගැස්සී ගියාය. දෙදෙනාගේ දෙනෙත් එකවර මුණගැසුණි.

"කන්න"

ඔහු කීවේ ඇස්වලිනි. ඇගේ මුහුණ පුරා කුඩා දැරිවියකගේ බඳු හුරතල් පෙනුමක් සටහන් විය. ඒත් සමඟම ඇස් දුක්බර විය.

"ම්"

දේවක ඇයට ඒ ඉඳි ආප්ප මුල කැව්වේය. ඇයගේ බඩ පපුව දාගෙන ගියේය.

"එහෙම කනකොට රසයිනේ"

ඇය අමරුවෙන් කීවාය. මේ කටවත් කන්නට නොහැක. ඒ තරමට බඩ පපුව දැවිල්ලක් පැමිණ ඇත.

"කෝ මං කවන්නම්. සුද්දි නැත්නම් අද කන්නේ නෑ."

ඔහු ඉඳි ආප්ප මුලම ඔහුගේ පැත්තට කරගත්තේය. ඔහු මේ සීගිරි එකට ආවේ ප්‍රමෝෂන් මැනේජර් වීය. එහෙම ආ ඔහුට මෙහෙම තමා ළඟට වී ඉඳි ආප්ප කවන්නට හැකිද? පුදුමය.

"දැන් අයියා කන්නේ නෑනේ"

ඔහු එක දිගට කටවල් තුනක් කැවූ පසුව ඇය කීවාය.

"මං කනවා."

"කන්න තුනක්"

"එකක්"

දේවක ඉඳි ආප්ප කටක් කෑවේය.

"අනිත් දවසේ රෑට නොකා ඉන්න එපා."

ඇය කීවාය.

"මට හවස යනකොට අමතක වුණා සුද්දි. අප්පච්චිත් මතක්කරලා කිව්වා"

ඔහු කීවේය. හොඳ තක්කාලි කෑලි අල කෑලි හා හාල් මැස්සෝ සියල්ලම ඔහු අනා දෙන්නේ තමාටය. 'ජීවිතේ හැමදේකම හොඳම දේ තමන් ළඟ ඉන්න

ගෑණිට දෙන පිරිමි අඩුයි' ඇය සිතුවාය.

"මි කන්න"

ඔහු කැව්වේ නිකට යටින් අතක් තබාගෙනය. භාවනාගේ ළය දෙදරිණ. හදිස්සියේම ඇයට ඇඬුම් ආවාය. භාවනා දෑස් දැතින්ම වසාගත්තාය.

"සුද්දි ඇයි මේ."

දේවක නැඟිට ඇසුවේය.

"කන්නකෝ අයියේ."

ඇය අඬමින්ම කීවාය.

"කන්න බෑ සුද්දිඇයි මේ"

ඔහු වමතින් ඇයගේ හිස අතගා ඇසුවේය. භාවනා කඳුළු පිරි දෙනෙත් ඔහු වෙතට පෑවාය.

"කමුකෝ. මට නිකං ඇඬුනේ."

ඔහු නොකා ඉඳීවීයැයි ඇයට බියක් දැනුණි.

"අයියා කන්න කටවල් තුනක්"

භාවනා කීවාය. දේවක ඇයට කටක් කවාම ඉඳි ආප්ප කටක් කෑවේය. අද කන්නට නොහැක. ඒ තරමට පපුව දැවිල්ලක් ඇත.

"ඇයි"

"ගෑස් වගේ සුද්දි"

"ඒකනේ නොකාම හිටියනේ කන්න දැන්"

දේවක දෙනෙත් එසවූවේය. ඔහු දැක්කේ වෙනදා දකින කෙල්ලගේ ලස්සන ඇස් නොවේ. මොකක්ද දුක්බර කතාවක් ලියූ දෑසකි.

"මොකද මේ අද වුනේ"

ඇය ඔහුගෙන් දෑස් වසන්කරගත්තාය.

"එහෙම මොනවත් නෑ"

"සුද්දිට බොරුකරන්න දන්නේ නෑ"

"මී දන්නේ නෑ තමයි. කියන එක්කෙනාටත් බෑ"

"මං බොරු කියන්නේ නෑ"

"කාටද"

"සුද්දිටයි අප්පච්චිටයි."

"ඇයි ඒ"

එයට දැන් උත්තර දිය යුතුමද කියා දේවක සිතුවේය.

"එහෙම කරන්නේ නෑ"

ඇයට හේතු අවශ්‍ය නැත. සියල්ල ඔහුගේ නාරං බික් දෑස්වල ලියවී ඇත.

"අද හෙට තියෙන වැඩ සේරම ඉවරකරනවා සුද්දි. අනිද්දා ඉඳලා

අපි ඇරේන්ජ් කරන්න ගමු."

"නුවර යන එක"

"මේ ටික බාරදීලා අපිට යන්න පුළුවන්. ඒක හිතන්න එපා. දවස් හතරක් තව තියෙනවානේ"

ඔහු සමඟ නුවර යන ගමන ගැන මේ තරම් සිතන්නේ ඇයි? 'මේ දවස්වල වෙන දේවල්වල හැටියට එහෙම යන්න පුළුවන් වෙයිද දන්නෙත් නෑ' භාවනා සිතුවාය.

"දවල්ට කොහෙන්හරි හොඳ බත් එකක් ගෙන්නන්නම්"

දේවක බැලුවේය. එකට කන බොන මේ ජීවිතයේ අවසානය කුමක්ද? 'දවසක ඔයා ගියාම මට තනියම කාගන්නත් බැරිවෙයි' ඔහු දුක්බරව සිතුවේය.

"ඇයි දේවකයියේ"

"ගෙදර මොනවද වුනේ සුද්දි."

ඇයගේ මුහුණ කඩාගෙන වැටුණි. එය මේ ලෝකයටම කිව හැක. එහෙත් ඔහුට කියන්නේ කෙසේද? භාවනා නෙත් බරකරගෙන සිතුවාය.

"තේරුමක් නෑ පිස්සු අනේ."

ඇය දෙනෙත් සඟවාගනිමින් කීවාය. රඹුක්වැල්ල නිවසේ කුමක් හෝ බරපතල දෙයක් වෙන්නට ඇතැයි දේවක ඉන්තේරුවෙන්ම සිතුවේය. මේ කඩාවැටුණු මුහුණ කියන්නේ ඒ කතාවය.

"එයාලා ආවේ."

"දැන් ඇති අනේ. ඔයත් එනවද ඒ පාර ඔළුව අවුල්කරන්න. ඉඳි ආප්ප ටික කමුකෝ."

කෙල්ල සැරකළාය. දේවක

බලාගෙනම උන්නේය. මදටිය ඇටයක් තරම් ලොකු කඳුළක් භාවනාගේ නෙත්වලින් කඩාගෙන මේසයට වැටුණි. දේවක එහෙමම ඉඳි ආප්ප මුල ගුලිකර භාවනා දෙස බැලුවේය.

"මට කියන්න සුද්දි."

"කාටවත් කියලා තේරුමක් නෑ. කාටවත් කිසිම දෙයක් කරන්න බෑ. මේක මහ කරුමයක්"

ඇය මේ බණින්නේ කාටද? දේවක කරුණාවෙන් බලාගෙන උන්නේය. 'මේ තරම් දුකට මම මේ මූණ දැක්කේ මම රිමාන්ඩ් එකේ හිටපු දවසේ විතරයි. දැන් අද' දේවක සිතුවේය.

"අනේ සුද්දි"

ඔහු බැගෑපත්ව ඇසුවේය.

"කෙල්ලෙක් වෙලා ඉපදෙන එක පවක්. ලොකු පවක්."

භාවනා පොඩි දැරිවියක මෙන් අතින් මුහුණ අතුල්ලාගෙන කීවාය. දේවක බලාගෙනම උන්නේය.

"එහෙම හිතන්න එපා සුද්දි. මේ ලස්සන කෙල්ලනේ. කොල්ලෝ කොච්චර දුක් විඳිනවද කියලා දන්නේ නෑ. ඒක මහා කාලකන්නි දුකක්."

ඔහු හිස් හැඟීමෙන් කීවේය. භාවනා දෙනෙත් ඔසවා බැලුවාය.

"අපි නුවර යනවනේ නේද? මේ වැඩ නිසා ඒ ගමන නොයා ඉන්නේ නෑනේ නේද?"

භාවනා ඇසුවාය. ඇය ඇසුවේ අසන්නට ගියදේ නොවේ.

"නේත්‍රා අක්කා වෙනුවෙන් ඒක

කොහොමහරි කරනවනේ. අපි කොහොමහරි අක්කව ඇවිද්දවනවා නේ."

භාවනා නෙත් බරකගත්තාය.

"මම අද දොළහට විතර යනවා. මොනවාහරි ඊට කලින් කරලා දෙන්න තියෙනවද?"

දේවකගේ දෙනෙත් එසවිණ.

"අද වැඩක්ද සුද්දිට"

"ම් ලොකු වැඩක්."

දේවක කිසිවක් අසාගත නොහැකිව බලාගත් අත බලාගෙන උන්නාය.

"මට ටිකක් කල්පනා කරන්නෝන."

භාවනා හදිස්සියේම මෙන් කීවාය. කෙල්ලෙක් එහෙම කියනවා මේ ඇසුවාමය.

"මොකක් ගැනද සුද්දි"

මේසය මත වූ පෑන ගෙන ඇය ඇගේම දබරැඟිල්ලට ඇණෙගත්තාය. දේවක ඇගේ අතට ගැසුවේය.

"හිල්කරගන්නද හදන්නේ"

භාවනා යටිතොළ හපාගෙන සිනාසුනාය. ඇඬුවානම් ඊට වඩා හොඳය.

"හිතන්නේ මගේ ජීවිතේ ගැන අයියේ."

එය බරපතල කතාවකි. මොනවා කියන්නද කියා දේවකට සිතාගත නොහැකි විය. දේවක යමක් අසන්නට ගියේය. ඒත් සමඟම කාමරයට කිසිවෙක් එන හඬ කොරිඩෝවෙන් ඇසෙන්නට විය. දේවක මේසය මත තිබූ හාෆ් ෂීට් එකක් අතට ගත්තේය. භාවනා

පරිගණකය ක්‍රියාත්මක කළාය.

ආවේ මිහිරංගය. ඔහු කාමරයට ආවේ දේවක දෙස බලාගෙනමය. දේවක උන් තැනම ඉඳගෙන උන්නේය.

"මට ටිකක් කතාකරන්න ඕන බබා ප්‍රයිවට් එකේ."

මිහිරංග කීවේය. දේවකට භාවනා දෙස බැලිණ.

"මං ඒ ටික කරලා තියන්නම් මිස්. යන්න කලින් එන්නම්."

දේවක නැඟිට්ටේ එසේ කියාය. ඔහු කරබාගෙනම ගියේය. මිහිරංග ඉඳගත්තේ නැත. ඔහු කළිසම් සාක්කුවට අතක් දමාගෙන භාවනා දෙස බැලුවාය. භාවනා පරිගණක තිරයෙන් දෙනෙත් ගත්තාය.

"ඉඳගන්න මිහිරංගයියේ."

භාවනා කීවාය. මොහොතකට කලින් තෙත්වූ දෙනෙත් භාවනා අමාරුවෙන් පාදාගත්තාය. මේ ලෝකයේ ඉන්නා හැම පිරිමියෙක්ටම ඇස්වල කඳුළු පෙන්විය නොහැක. එහෙම පිරිමි හමුවන්නේ කළාතුරකිනි.

දැන් මෙතන ඉඳ ගියේ එවන් කෙනෙකි.

"මොකක්ද බබා මේ මාමා කරන්නේ. ආ."

මිහිරංග ඇසුවේය. භාවනා ඇස් ලොකුකර බැලුවේ ඔහු මොනවා කියනවාද කියා තේරුම් ගත නොහැකිවය.

"ඇයි තාත්තා මොනවද කළේ."

ඇය ඇසුවාය.

"මේ අර සූරියආරච්චිලාව

ගෙනත්. ඊයේ මහලොකු ඩිනර් පාටි එකකුත් දුන්නලු නේද?"

භාවනා මළානික ලෙස සිනාසුනාය.

"ඉතින්"

ඇය ඇසුවාය.

"ඉතින් කියන්නේ. මොකටද උන් ආවේ"

එහෙම අසන්නට මිහිරංගට අයිතියක් නැත. කොහොමටවත් නැත.

"ඇයි මොකට ආවම මොකද අයියට"

ඇය ඇසුවාය. කාත් සමඟවත් සූරියආරච්චිලා ගැන කතාකරන්නට භාවනාට ආසාවක් නැත. ඒ නම මතක් කරන්නටවත් ඇය කැමති නැත.

"මොකද කියන්නේ. මඟුල් කතාකරන්නද ආවේ."

"කවුද දන්නේ මොන මඟුලට ආවද කියලා. දැන් මෙතන ඔයා මාව කන්න හදන්නේ මොන මඟුලකටද කියන්න. මේ උදේ පාන්දර."

භාවනා නොරිස්සුමෙන් කීවාය. ඇය කවදාවත් මෙසේ කතාකර නැත.

"මාමට පිස්සුද?"

"ඇයි. එයාගේ යාළුවෙක්ට ඩිනර් එන්න කියන්න එයාට බැරිද? ඒක මාර කතාවක්නේ. කාගෙන්ද අවසර ගන්නෝන එතකොට."

භාවනා ඇසුවාය. මේ මිහිරංගගේ පිටින් යන්නේ වෙන තරහකි. මිහිරංග එය දන්නේ නැත.

"එහෙන්ම ඔයත් ඒ පාටි එකෙන්. ඇයි මාමා සූරියආරච්චිලාව ගෙන්නුවේ."

භාවනා මිලින්දගේ අංකය දුරකථනයෙන් ගත්තාය. පසුව එයට අතක් තබාගෙන මිහිරංග දෙස බැලුවාය.

"අරන් දෙන්නද කෝල් එකක් තාත්තට. අහන්ඩ එයාගෙන්."

"මට ඕන නෑ එයාට කතාකරන්න"

"එහෙනම් මෙතන මාව කන්නේ නැතුව අයියගේ වැඩක් බලාගන්න. මෙතන මම හෙඩෙක් එකේ ඉන්නවා. මාව කන්න යනවා"

භාවනා බැණගෙන ගියාය. මිහිරංග බලාගෙන උන්නේ පුදුමයෙනි.

"සද්ද බද්ද නැතුව මඟුල් කතාකරලා එහෙනම්"

භාවනා මේසය සද්ද නැඟෙන්නට පසෙකට දමා නැඟිට්ටාය. පසුව ඇගේ ජංගම දුරකථනය අතට ගත්තාය.

"ඕන මඟුලක් හිතාගන්න. මෙතන මඟුලක් කතාකරන්නේ නැතුව පාඩුවේ ඉන්න දෙන්නකෝ."

භාවනා වේගයෙන් මේසයට ගසාගෙන කාමරයෙන් ගියාය. මිහිරංග බලාගෙනම උන්නේය. ඔහුට කිසිවක් තේරුම් ගන්නට නොහැකි විය. 'එහෙම සූරියආරච්චිලාට උඹව උස්සන්න දෙන්නේ නෑ භාවනා. එහෙම වුනොත් හැම ප්ලෑනක්ම ඉවරයි. බලමු' මිහිරංග සිතුවේය.

# 26

දේවක උන්නේ හැම දෙයක්ම දරාගනෙ සීගිරි එක නැවත විවෘත කිරීමේ වැඩවලය. ඔහු වේගයෙන් වැඩ නිමාකරමින් උන්නේය. මීට ටික වෙලාවකට කලින් ඔහු රඹුක්වැල්ල මහතාව සීගිරි එක වටේම එක්කාගෙන ගියේය. සියල්ල විස්තර කළේය.

“වෙරි ගුඩ් පුතා. ඔයා හැමදේම ලස්සනට කරලා”

"අපි සර් අර පේපර් ඇඩ් දෙක ලෑස්තිකරන්න ඕන. අපි ආයෙත් ඕපන් කරන දවස දාලා. මම ඒක හෙට හදන්න දෙන්නද?"

"දෙන්න පුතා"

"එතකොට සර් අපි මේ පැත්තේ යන ඔක්කොම ඉරිදා පත්තරවල අපේ ලීෆ්ලට් එකක් යවනවා. මම ගත්තා ඒ ලිස්ට් එක. පත්තර විසි දෙදාහක් යනවා."

"ලීෆ්ලට් විසිපන්දාහක්වත් ඕන වෙයි"

දේවක ඔහුට අවශ්‍ය හැම වැඩකටම රඹුක්වැල්ල මහතාගෙන් අවසරගත්තේය.

"මම සර් එතකොට අපේ කෝකියෝ දෙන්නවයි බේකරි සෙක්ෂන් එකේ පේස්ට්‍රි වෙෆ්ටයි

එන්න කියනවාසර් බලලා ඉන්ටවීව් කරන්න"

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"අපි නේත්‍රා මිස්ටත් එන්න කියමු"

"මං කිව්වා සර්."

රඹුක්වැල්ල මහතා දේවක දෙස ඕනාකමින් බැලුවේය.

"පුතාට ඉන්නේ අප්පච්චි විතරයි කිව්වා නේද?"

දේවකට අමුත්තක් දැනුණි.

"ඔව් සර්.."

"අප්පච්චි මොනවද කරන්නේ"

"එයා සර් මේ කන්ස්ට්‍රක්ෂන් සුපවයිසර් කෙනෙක්."

දේවක කීවේය.

"වෙලාවක එන්න කියන්න. මට ඔයා ගැන එයාට හොඳ කියන්න

ඕන"

'ඔයාව හම්බවෙන්න අප්පච්චිට බෑ සීයේ. ඔයා අතින් මගේ අප්පච්චිටයි අම්මටයි ලොකු වැරැද්දක් වුණා. ඒක අප්පච්චි දැන් අමතක කරලා ඉන්නේ. ඒකනේ මාව මෙතනට එව්වේ. ඒත් අප්පච්චිට බෑ ඔයා ඉස්සරහට එන්න. එහෙම ආවොත් ඒක ඔයාටත් දරාගන්න බැරිවේවී' දේවක සිතින් කීවේය.

"මං කියන්නම් සර්"

"කරගෙන යන්න."

"අපි සර් පොඩි ඕපනින් එකක් ගන්නවා නේද? මං ඒකට පොඩි ඉන්විටේෂන් එකක් හදලා තියන්නද?"

"එහෙම තමයි මාත් හිතාගෙන ඉන්නේ. අපි කාඩ් එකක් දෙන්නෝනද

පුතා"

"එහෙම දුන්නොත් ඒක හොඳයි සර්."

"එහෙනම් පුතා මට කාඩ් තුන්සීයක් විතර හදලා දෙන්න."

"අපේ සප්ලයර්ස්ලා හාරසීයක් විතර ඉන්නවා සර්. එයාලට නේත්‍රා මිස් කාඩ්ස් දෙනවා. කතාකරලා කියනවත් එක්ක"

"ඒක හොඳයි."

"මං සර් මේ බුලත් කොළේ හැඩේට කාඩ් එක හදන්නේ. ඇත්ත ගොයම් ගහක් ඇතුලට දාලා. මං සර්ට අද හවසට ඒකේ සාම්පල් එක දෙන්නම්"

දේවක කීවේය. රඹුක්වැල්ල මහතාට පුදුම සිතුණි.

"ඔයා පුතේ ඇත්තටම දක්ෂයෙක්.

මං එක්කම ඉන්න"

'සමහරවිට ඒක කරන්න බැරිවෙයි සීයේ. ඔයාගේ මිණිපිරී මෙතනින් ගියොත් මමත් යනවා. එයා නැතුව ඉන්න බෑ' භාවනා මේ සියල්ල පිටුපස සිට අසාගෙන උන්නාය. ඇය උන්නේ මලානික වූ මලක් සේය.

"එන්න මැණික. ඇයි පුතේ අසනීපයක්ද"

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"හිසරදේ වගේ සීයේ."

භාවනා කීවාය. දේවක දුක්බරව ඇය දෙස බලාගෙන උන්නේය.

"අනේ පුතේ මිස්ට මොනවාහරි ගෙනත් දෙන්න."

රඹුක්වැල්ල මහතා කීවේය. 'මිණිපිරීව මේ කොහේහරි වාඩිකරවගෙන හොඳ හෙඩ් මසාජ්

එකක් දෙන්නද මං සීයේ' දේවකට අසන්නට සිතුණි.

"මං අරන් එන්නම්"

දේවක එතනින් ගියේ එසේ කියාගෙනය. භාවනාට හීල්ලිනි.

"සීයා"

භාවනා පිටත අලුතින් නිමවන කා පාක් එකේ ඇවිදිමින් සීයා සමඟ කතාකළාය.

"කියන්න මැණික."

"මේ මොනවද සීයා තාත්තා කරන්නේ"

ඇය ඇසුවාය.

"තාත්තගේ ඔළුවේ තියෙන බර අපි දන්නේ නෑ පුතේ. ඔයාලා කෙල්ලොම තුන්දෙනෙක්නේ පව්. මම මේ දුකෙන් ඉන්නේ ඔයා වෙනුවෙන් දෙයක් ලෑස්තකරගන්න බැරුවයි."

රඹුක්වැල්ල මහතා ඇත්තම කීවේය. ඔහු ඊයේ රෑම ඒ ගැන සිතුවේය.

"මාව දෙන්න තව දෑවැද්දත් දීලා"

"අපි එහෙම දෙන්නෝන. බලමුකෝ."

"ඒත් සීයේ මගේ ජීවිතේ"

"සූරිආරච්චිලා හොඳ මිනිස්සු පුතේ. එහෙම දන්න කියන අය එක්ක තමයි ඒවා කතාකරන්නේ. ඔයාගේ තාත්තා හරි. නොදන්න අයගේ වගකීමක් නෑ"

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනාට හීල්ලිණ. 'එහෙනම් මාව හැම පැත්තකින්ම කොටුවෙන්න යන්නේ. කාත් එක්කද මම කතාකරන්නේ' භාවනා සිතුවාය.

"තාම මොනවත් වුනේ නෑනේ. අපි

බලමුකෝ. ඔයාට නරකක් කරන්නේ නෑ අපි. හැමදේම බලනවා"

භාවනා කිසිවක් කීවේ නැත. සමහරවිට කිසිවක් කියාගන්නම බැරිවෙනු ඇත. එසේ ඇයට සිතුණි.

කීවක් මෙන්ම භාවනා වේලාසනින් යන්නට සූදානම් වූවාය. නේත්‍රාට ඇයත් සමඟ කතාකරන්ට ඕනාවිය. එහෙත් එයට මේ සීගිරි එක සුදුසු තැනක් නොවේ.

"යනවා අක්කා."

"රෑට ඔයත් එක්ක කතාකරන්න ඕන බබා."

"හ්ම්."

භාවනා පිළිතුරු දුන්නේ උදාසීන ලෙසිනි.

"බබා"

යන්නට ගිය භාවනා හැරුණාය.

නේත්‍රා ඇය දෙස බලාගෙනම උන්නාය.

"මේ බලන්න බබා"

භාවනා අත්බෑගය අල්ලාගෙනම බැලුවාය.

"ජීවිතේ ඔයාගේ බබා. තීරණයක් ගන්නෝන ඔයා. වේලාසන යන්නේ හිතන්නනම් ඒකත් හිතන්න."

නේත්‍රා කීවාය. ඇගේ ජීවිතයේ වැරදුන තැන් අනන්තවත් ඇත. ඒ වැරදීම තම බාල නංගීට වෙනවා දකින්නට නේත්‍රා අකමැති වූවාය.

"චුට්ටක් වේලාසන එන්නකෝ හවස"

"මං එන්නම්. අද රෑට මාත් එක්ක නිදාගමුකෝ."

"පොඩි අක්කත් නෑ. එයත් එන්නේ හෙට"

"ඒකී මොනවත් දන්නේ නෑ. පිස්සි."

නේත්‍රා කීවාය. පොඩි අක්කාගේ ජීවිතය කොතරම් නිදහස්ද කියා භාවනා සිතුවාය. ඇයට කැමතිලෙස ජීවත්වීමේ නිදහස තාත්තා දී ඇත. 'ඒකටත් එක්ක දැන් මාව හිරකරන්න යන්නේ' භාවනා සිතුවාය.

දේවක උන්නේ බේකරි සෙක්ෂන් එකේය. අද එහි තවත් ටෙස්ට් රන් එකක් දුවන දවසය.

"අනේ යනවද"

භාවනා අත් බෑගයක් දාගෙනම එද්දී දේවක ඇසුවේය.

"ම්. මම ෆ්‍රයිඩ් රයිස් එකක් ගෙන්නුවා. ඒක මේසේ උඩ ඇතිකන්න"

භාවනා කීවාය. දේවක දුක්බරව

බලාගෙන උන්නේය. 'ඔයත් නැතුව මොන ෆ්‍රයිඩ් රයිස්ද සුද්දි' දේවකට කියන්නට සිතුණේ එයය.

"කන්නෝන."

දේවක කිසිවක් කීවේ නැත.

"මං හවස පන්සල් යනවා"

ඇය කීවාය.

"හවස"

"මී බෝධිමළු විහාරෙට. එතන නිස්කලංකයි"

"ඇයි සුද්දි හදිස්සියේ"

භාවනා දිග සුසුමක් හෙළුවාය.

"දන්නේ නෑ. හිතුණා යන්න"

"මාත් එන්නද ඒ පැත්තේ"

භාවනා පන්සල් යන කතාව කීවේ ඔහු එන බව දැනගෙනය.

"පහට විතර."

"මං එන්නම්."

"වළිදින්නෝන මාත් එක්ක. මං ගියාම ඔක්කොම ගාථා කියනවා."

දේවක දුක්බරව සිනාසුනේය.

"මමත් ඔක්කොම ගාථා දන්නවා. දහම් පාසලේ හොඳම ශිෂ්‍යයි මම සුද්දි"

"එහෙනම් එන්න"

භාවනා බැලුවාය. දේවක යන්න එපා කියන්නාක් බඳු බැල්ලමක් හෙළුවේය.

"මං යන්න ඕන. හිතන්න ගොඩක් දේවල් තියෙනවා අයියේ."

"මට තේරෙනවා."

"පරිස්සමින් වැඩටික කරන්න."

ඇය ළඟින් යන ගමන් කියාගෙන ගියාය. භාවනා යන දෙස දේවක බලාගත්වනම බලාගෙන උන්නේය.

පසුව ඔහු පපුවට පිඹගත්තේය. 'ලොකු දුකක් ළඟ ළඟ එනවා වගේ' දේවක තනිවම සිතුවේය.

ඉඳුනිල් කෙල්ල වේලාසන එනවා දැක පුදුම වූවාය. ඇය ලේසියෙන් සීගිරි එකෙන් වේලාසන එන්නේ නැත.

"ඇයි මැණික."

ඉඳුනිල් ඇසුවාය.

"මෙතන මැණිකක් නෑ. මම නිකං තිරුවානා ගලක් අනේ. හිසරදේ. ඉතින් වේලාසන ආවා"

භාවනා කේන්තියෙන් කීවාය. කෙල්ලගේ කේන්තිය ඉඳුනිල් තේරුම් ගත්තාය.

"මං තේ එකක් හදලා දෙන්නද? කාලද ආවේ"

ඉඳුනිල් ඇසුවාය. කෙල්ලගේ

පෙනුම හොඳ නැත.

"දෙන්න අනේ මොනවාහරි. කෑවේ නෑ. කන්නත් බෑ. කන්නත් එපා. මට ඉන්න දෙන්න. තේ එකක් ඇති"

ඉඳුනිල් සුසුමක් පිටකළාය.

එක පැත්තකින් මිලින්ද්‍රය.

අනිත් පැත්තෙන් කෙල්ලය. එක එක්කෙනාගේ කතාව ඇසූ විට හැමෝම හරිය. කිසිවෙක් වැරදි නැත.

"මේ අහන්න මැණික"

"යන්න අනේ. එන එන එකාට මෙන්න කියලා පුදනවද මැණිකක් නම්. වටින දෙයක්නේ. එහෙම කරනවද?"

භාවනා උඩට ගියේ එහෙම කියාගෙනය. ඉඳුනිල් සුසුමක් පිටකළාය. ඇය මේ වෙන

දේවල්වලට කොහොමත්ම කැමති නැති බව ඉඳුනිල් කොහොමත් දැනගෙන උන්නාය. දෙයක් කරනවානම් කරන්නට වෙන්නේ කෙල්ලගේ බරපතල අකමැත්ත පිටය.

ඉඳුනිල් මිලින්දට කතාකලේ රහසින් මෙන්ය.

"ඇයි ඉන්දු"

"සූරිලව හම්බවුණාද"

"තාම නෑ. තාම මේ මම පෝටිකෝ එකේ. කියන්න."

"මෙහේ කෙල්ල මූණ දෙක කරගෙන ඉන්නේ. අද මේ වේලාසන ඇවිල්ලත් එක්ක. මටත් බැණගෙන ගියේ."

මිලින්ද සුසුමක් හෙළුවේය.

"ඉන්දු කියන්නේ කෙල්ල"

"එයා කැමති නෑ. මං දන්නේ නැද්ද මෙයා ගැන"

"ඒත් ඉන්දු"

"හැමදේම හරි. කොහොමත් සුරීලට එකපාරම වචනයක් දෙන්න එපා. මෙතන මළගෙයක් වෙයි."

ඉඳුනිල් එය දැනගෙන උන්නාය.

"මම හිතුවේ ඉන්දු"

"හිතන දේවල් එහෙමම වෙන්නේ නෑ. දුවලානේ හැදුවේ. ලේසි නෑ"

ඉඳුනිල් කීවාය.

"බලමුකෝ. මම කොහොමත් අද සූරිව හම්බවෙනවා."

"ම්"

ඉඳුනිල් දිග සුසුමක් හෙළුවාය. භාවනා ආ හැටියේම ඇඟ ටිකක් සෝදාගෙන ඇඳට වැටුණාය. කෙල්ලගේ මුහුණම සුදුමැළිවී ඇතැයි

ඉඳුනිල්ට සිතුණි. මේ දේ වෙන බව ඇයට ඉවෙන් මෙන් දැනුනේ ඊයේ මිලින්ද සූරිලා එන බව කියද්දීමය.

"අක්කට වෙච්ච දේ නිසා ඔයා ගැන තීරණ ගන්නත් හරි බයයි. අනේ මන්දා. අන්තිමට කෙල්ලෝ තුන්දෙනාම දුක් විඳිනවා බලලයි අපිට මැරෙන්න වෙන්නේ"

ඉඳුනිල් උඩට යමින් සිතුවාය.

"මම කිරි තේ එකක්ම හැදුවා. සැන්ට්විචස් එකක් හදලා දෙන්නද. නැත්නම් නූඩ්ල්ස් එකක්"

ඉඳුනිල් ඇසුවාය.

"එපා අම්මා. මේ ඇති."

කිසිවක් නොකියාම ඇය භාවනාගේ හිස පිරිමැද්දාය.

"මට ටිකක් හිතන්න දෙන්න. මගේ ජීවිතේ එහෙම ලේසියෙන් මම

දෙන්නේ නෑ අම්මා. කවදාවත් නෑ”

භාවනා මේ ටික පමණක් කීවාය. ඉඳුනිල් කිසිවක් කීවේ නැත.

“මං හවස්වෙලා පන්සල් යනවා.”

“පන්සල් ඇයි පුතේ”

“බයට”

භාවනා එපමණක් කීවාය. ඉඳුනිල්ට මේ ප්‍රශ්නයේ බරපතලකම තේරුණේ ඒ කතාවෙන් පසුවය.

“එච්චර පුතේ.”

ඉඳුනිල් ඇසුවේ කරුණාවෙනි. මේ වෙලාවේ කෙල්ලත් සමඟ තර්ක කරගෙන යන්නට නොහැක. ඇය කීවාක් මෙන් මේ ඇගේ ජීවිතයයි. එය කාටත් වඩා වටින්නේ ඇයටය.

“තාත්තට කොච්චර කාලයක් ආදරේ කළාද?”

භාවනා තේ එක අල්ලාගෙන

ඇසුවාය. ඉඳුනිල් සිනාසුණාය.

"මතක් කරනකොටත් එයාගේ තියෙන කොමළේ."

භාවනා කීවාය.

"අවුරුදු දෙකක් විතර. පොඩි නැන්දා අපිට උදව් කළේ."

"නැතිවෙච්ච."

"ම්. හරි ආදරෙයි මට. ගෙදර මොනවා හැදුවත් තාත්තා අතේ එවනවා. එයා පෑන් කේක් නිතරම හදනවා. හැමදාම තාත්තා එනකොට පෑන් කේක් අරන් එනවා. නංගි හැදුවා කියලා දෙන්නේ."

ඉඳුනිල් කීවාය.

"අඟෙයා එක අවුරුදු දෙකෙක්"

"ම් පස්සේ ඉතින් මැරිකළා."

භාවනා දිග සුසුමක් හෙළුවාය.

"තමත් කැමති අයත් එක්ක තමන්

කැමති විදිහට ජීවත්වෙන්න ලැබෙන එකත් වාසනාවක්. හැමෝටම ඒ වාසනාව නෑ. නන්නාඳුනන මිනිස්සු එක්ක නන්නාඳුනන සුවඳවල් එක්ක ජීවත්වෙන්න වෙන එක පවක්ලොකු පවක්. මම ආස නෑ අඳුරන්නේ නැති පිරිමියෙක් එක්ක එකට වාහනයක යන්නත්.  තවත් ඉතින්”

භාවනා ඉන් ඔබ්බට කිසිවක් කීවේ නැත.

“මෙහෙම මට වෙයි කියලා හීනෙකින්වත් හිතුවේ නෑ. කවදාවත් හිතුවේ නෑ. තාත්තට කියන්න කොහොමත් මටත් වීල් චෙයාර් එකක් ලෑස්තිකරලම තියන්න කියලා.”

ඉඳුනිල්ගේ දෑස් තෙත්විය. ඈය කිසිවක්ම කීවේ නැත. බිත්තිය දෙස බලාගත්වනම බලාගෙන උන්නාය.

ගැහැණු දරුවෙකුගේ දෛවය සම්බන්ධයෙන් වේලාසන අනාවැකි කිව නොහැක.

"අනේ අම්මා"

භාවනා ඉඳුනිල්ගේ බඳ බදාගෙ නම ඇයගේ උකුලට වැටුණාය. ඉඳුනිල් සෑහෙන වෙලාවක් ඇගේ හිස පිරිමැද්දාය. කිසිවක් ඇසුවේ නැත. මේ වෙලාවේ අසා තේරුමක් නැත.

"තාත්තට ටිකක් මාත් එක්ක කතාකරන්න තිබුණා. එයා එහෙම තාත්තා කෙනෙක්නේ. මොකද එකපාර මේ වුනේ. දුවලව එහෙමම දෙනවද? එක දුවෙක්ව එහෙම දීලා දැන් විඳින දුක එයාට පේන්නේ නැද්ද?"

භාවනා කියන කතාව හරිය.

එහෙත් ඒ ඇගේ පැත්තෙනි. මිලින්දගේ පැත්තෙන් ඔහු හරි වෙන්නත් පුළුවන. ඉඳුනිල් මේ සියළු පැති දැක්කාය.

"අපි තාත්තා එක්ක කතාකරලා බලමුකෝ මැණික."

ඉඳුනිල් කීවාය.

"තීරණ ගන්න ඕන අම්මා. මම නෑ කියන්නේ නෑ. ඒත් මිනිස්සුන්ට අන්ධවෙලා නෙමේ. මිනිස්සු දැකලා කුලප්පු වෙලා නෙමේ. හිම්හිට. මමත් දැන් කොල්ලෙක්ව දැකලා කුලප්පු වෙලා තීරණ ගත්තොත්. එහෙම ගත්තද මම. එක පොඩි තීරණයක් ගන්න කිපාරක හිතනවද?"

භාවනා ඇසුවාය.

"දුක් විඳින්න බෑ. කොහොමටවත් බෑ. ටයිල් මාළිගා ඇතුළේ

කොහොමටවත් බෑ. මට ආසයි හුස්ම ගන්න. හුස්ම හිරවෙලා මැරෙන්න බෑ."

භාවනා එය මුළින්ම කීවාය. කොයි මොහොතක හෝ මෙන්දක සූරියආරච්චි කතාකරන බව ඇය දනී. එහෙම සිතද්දීත් පපුව හිරවෙනවානම්.!

"තාත්තා එහෙම ඔයා එක්ක කතාකරන්න හිතාගෙන ඇති."

"එක එක්කෙනාට තීරණ දුන්නට පස්සේ මොනවා කතාකරන්නද? මමත් මොකක්හරි තීරණයක් ගත්තොත් අම්මා"

එහෙම ගනීයැයි ඉඳුනිල්ට බියක් දැනුණි. කෙල්ලෝ එහෙම නොග නී යැයි කියා සිතන්නටත් අමාරුය. කෙල්ලෝ තුන්දෙනා තුන් විදිහකි.

"සමහර මිනිස්සුන්ව දැක්කහම බයක් එනවා"

ඇය කීවාය. මේ කියන්නේ සූරියආරච්චිගේ පුතා ගැනද? ඉඳුනිල් සිතුවාය.

"සූරි අන්කල්ගේ පුතාව දැක්කහම මට බය හිතුණා. ඇයි දන්නේ නෑ. ඒ බයම මට විජිත් අයියව දැක්ක දවසේ ආවා."

භාවනා කීවාය. විජිත් යනු නේත්‍රාගේ සැමියාය. කෙල්ලගේ කතාවෙන් ඉඳුනිල් ගැස්සී ගියාය.

"මට එතකොට දාසයයි. ඒත් මට එදා ඒ බය ආවා. කාටවත් කියාගන්න බැරිවුණා. මම එයා එක්ක වචන දහයක් කතාකරලා ඇති. අදටත් මම එයාට බයයි."

භාවනා කීවාය.

"අපි බලමුකෝ පුතේ"

ඉඳුනිල් කීවේ දැඩි කෙඩෙත්තුවකිනි. මිලින්දත් හදිස්සියේම කෙල්ලව දෙන්නට ගත් තීරණය මෝඩ තීරණයක් කියා ඉඳුනිල්ට දැන් සිතෙයි. එහෙත් ඔහු සමඟ කතාකරද්දී සිතෙන්නේ ඒ තීරණය හරියි කියාය.

# 27

භාවනා බෝධිමළු විහාරයට ගියේ කැබ් රියක් ගෙන්වාගෙනය. රියදුරු අන්කල්වද ඇයට විශ්වාස නැත. 'මං ගැන තාත්තා අහන්න පුළුවන්. දේවකයියව දෙතුන් තැනක හම්බවෙනවා ඩ්‍රයිවර් අන්කල් දැක්කා. කියයි මෙයා තාත්තා ඇහුවාම' භාවනාට සිතුණි.

හවස පන්සල් යන කතාවක් දේවකට කිව්වේ ඇයිදැයි භාවනාම

සිතුවාය. බෝධිමළු විහාරය පිහිටා ඇත්තේ වැව පාර්ශ්වේය. ඒ පැත්ත හරි නිස්කලංකය. අවශ්‍යනම් වැව ළඟ සිමෙන්ති බංකුවකට වී කතාවක් දාන්නට පුළුවන.

ඒත් මේ ගින්දරට දැන් භාවනා බයය. 'අන්තිමට සීගිරි එකට ඔයාව නැතිවෙනවා. ඔයා සීගිරි එකේ හැමදාම ඉන්න ඕන දේවකයියේ.' තමා නැති සීගිරි එකක ඔහු ඉදියිද? භාවනා සිතුවාය. ඒ තරම්ම බැඳීමක් තමාත් දේවකත් අතර ඇත්ද?

භාවනා වාහනයට ගොඩවී දේවකට ඇමතුමක් ගත්තාය.

"මම බෝධිමළු විහාරය ළඟ සුද්දි."

භාවනාට පුදුමය.

"ආවද?"

"ඔව් මේ මම මලුත් ගත්තා."

"මං එනවා."

භාවනා දිග සුසුමක් පිටකළාය. දුරකථනය යළිත් නාදවිය. ඇමතුම ආවේ නොදන්නා අංකයකිනි. 'දන්නේ නැති නම්බර්ස් ගන්නත් බයයි'

"හෙලෝ."

භාවනා ඇමතුම ගත්තේ සීගිරි හී සප්ලයර්ස්ලා කිහිප දෙනෙක්ට මේ අංකය දී ඇති නිසාය.

"භාවනා මම. මෙන්දක සූරියආරච්චි"

කෙල්ලගේ සිත කඩාගෙන වැටුණි. 'අන්තිමට බයවෙච්ච කෝල් එක ආවා' ඇය සිතුවාය.

"ආ. කි..ය..න්..න"

"භාවනා මඟුද ඔය."

"ඔව්."

“ගමනක් යනවද?”

“ඔව්. මේ ළඟට යනවා”

‘එයාට කියන්නේ මොකටද පන්සල් යනවා කියලා’ ඈය සිතුවාය.

“දවල් කෝල් එකක් ගන්න හිටියේ. මේ දැන් කෝට්ස්වල ඉඳලා ආවේ.”

‘ඉතින් මට මොකටද. මම එයාගේ කෝල් එක එනකල් බලාගෙන උන්නයෑ’ භාවනා නොරිස්සුමෙන් සිතුවාය.

“අද මිලින්ද අන්කල් ඒ පැත්තේ එනවා කියලා තාත්තා කිව්වා.”

“ඇයි ඒ.”

භාවනා ඇසුවාය.

“මි. භාවනා දන්නවනේ.”

“නෑ මං දන්නේ නෑ. ඇයි ඒ.”

"අපි දෙන්නා ගැන කතාකරන්න."

කෙල්ලගේ යටි පතුල් දිගේ ගින්දරක් උඩට ආවේය.

"අපි දෙන්නා කිව්වේ."

"ඔයයි මායි ගැන. තාත්තයි අම්මයි භාවනාව දැකලා මගෙනුත් ඇහුවා."

මේ ඇමතුම ගත්තේ අපරාදේ යැයි භාවනාට සිතුණි.

"මං එහෙම දෙයක් ගැන දන්නේ නෑ. මගෙන් කවුරුවත් අහලත් නෑ."

භාවනා කීවාය.

"අද කියයි. වෙලාවක ඉතින් අපි දෙන්නත් මීට් වෙලා කතාකරන්න ඕන භාවනා."

ඇය කිසිවක් කීවේ නැත. ඔහු කතාකරන්නේ හිතක් හැදෙන ලෙස නොවේ. උසාවියේදී කතාකරන්නාක්

මෙන්ය.

"මොනවද?"

භාවනා තේරුමක් නැති ලෙස ඇසුවාය.

"එහෙම ඕනනේ. ෆ්‍රී වෙලාවක් කියන්න. මම එන්නම් භාවනාව ගන්න."

මේ කතාව මීට වඩා දිග දුර ගෙනයන්නට භාවනාගේ කැමැත්තක් නොවීය.

"මම එහෙම මොනවත් තාම හිතලා නෑ මෙන්දක අයියේ. කොහොමටවත් හිතලා නෑ. අයියව දැක්කෙත් ඊයෙනේ."

මෙන්දක සිනාසුනේය. ඒ සිනහව සරදම් සිනාවක් වැනිය. එවැනි සිනාවකට භාවනා කොහෙත්ම කැමති නැත.

"දැන් දැකලනේ. දෙන් වී මීට් අප්. අයි රියලි නීඩ් ටු ටොක් යූ."

භාවනා පපුවෙන් ආ හුස්ම තදකරගත්තේ දෙතොල්පට මුව තුළට දමාගෙනය. එය ගින්දරකට සමාන සුසුමක් නොවේද?

"බට් අයි"

කියාගෙන ආ දේ භාවනාව ගිලගත්තාය. කතාකිරීම තේරුමක් නැති දෙයක් විය හැක.

"හෙට මට ටිකක් ෆ්‍රී. මං මෝනිං භාවනාට ගන්නම්. මේ දැන් ක්ලයන්ට් කෙනෙක් ඇවිත්"

ඔහු කිසිම දේකට කැමැත්තක් අසන්නේ නැත. 'පුදුම කෙනෙක්නේ. එයා හිතන් ඉන්නේ මාත් මේ එයාගේ ගනුදෙනු කාරයෙක් කියලද? මාර බයිබෝස් එකක්නේ' භාවනා

සිතුවාය.

භාවනා දෑස් අඩවන් කරගෙන පාර දෙස හිස් හැඟීමෙන් යුතුව බලාගෙන උන්නාය. තමා සිතනවාටත් වඩා මේ කතාව දුර දිග ගොස් ඇත. 'තාත්තා එහෙනම් අද වචනයක් දෙනවා. මගෙන් නිකමටවත් අහන්නේ නැතුව. එහෙම කොහොමද කරන්නේ'

පන්සල් යන්නට තිබූ ආසාවත් නැති විය. පන්සල් යනවානම් හිතේ සැනසීමෙන් එය කළ යුතුය. මල් ආසනයට මලක් විසිකර එන එක පන්සල් යාමක් නොවේ. 'ඒ මදිවට ඔයත් අද පන්සල් ඇවිත්. කොහොමද මම හිතේ සැනසීමකින් ඔයා එක්ක කතාකරන්නේ. පොඩ්ඩක් මූණ බරවෙච්ච ගමන් පිස්සා

අහනවනේ ඇයි සුද්දි ඇයි සුද්දි කිය කිය. මම මොනවා කියන්නද’

භාවනා පන්සල් ගියේ දේවක එතන බලාගෙන උන් නිසාය. නැත්නම් මෙහෙමම හරවාගෙන යන්නට තරම් හිතක් ඇයට ආවේය.

*** *** *** *** ***

බෝධිමළු විහාරයේ මහ සෙනඟක් උන්නේ නැත. දේවක උන්නේ පන්සල ඇතුළේය. කෙල්ල එන්නේ රියදුරු සමඟ බව ඔහු සිතුවේය. ඔහුට පේන්නට ඉන්න හොඳ නැත. හොඳ නැත්තේ ඇයටය.

ඔහු බුදු ගෙට පිවිසෙන තැන පඩිපෙළේ ගල් පඩියක් උඩ ඉඳගෙන බලාගත්වනම බලාගෙන උන්නේය.

භාවනා ආවේ ඉදිරිපස පිවිසුමෙන් නොවේ. පිටුපසිනි. බොහෝ විට ඇය එන්නේ ඒ පැත්තෙනි.

ගල් පඩිය උඩ වාඩිවී බලාගෙන ඉන්නා දේවකව දැක ඇය සුදු වැළි මළුවේ නැවතුණාය. කළු ටයිට් සායට සුදු කමිසයක් ඇඳගෙන උන් කෙල්ලගේ මුහුණ අද ඕනවටත් වඩා චාම්ය. ඇය කිසිම දෙයක් මුහුණට ගෑවේ නැත. කොණ්ඩයට පෝනි ටේල් එකක් දමාගෙන උන් කෙල්ලගේ මුහුණින් ආවේ චාම් සරල පෙනුමකි.

භාවනා නැවතී දේවක දෙස බලාගෙනම උන්නාය. මේ කුඩා පිරිමි පිළිමය සමඟ තමාගේ ඇති සම්බන්ධය කුමක්දැයි භාවනා සිතුවාය. ඔහුව මුල්ම වරට සීගිරි රාක්ක අතර දකිද්දී හදවතට ආ

ගැස්ම භාවනා සිහිකළාය. එය කොහොමටවත් අමතක කළ හැකි දෙයක් නොවේ.

භාවනා දිග සුසුමක් පිටකළාය. ඒ සුසුම බර වැඩිය.

ඔහු මේ පඩියට වී නිසංසලේ බලාගෙන ඉන්නේ තමා එනතුරු නොවේද? එසේ බලාගෙන ඉන්නට ඇති හැඟීම කුමක් විය හැකිද? මේ වෙලාවේ දේවක පුංචි බණ්ඩාර සිතන්නේ කුමක්ද? කෙනෙක්ගේ සිතක් කියවිය හැකි බලයක් තිබුණානම්. මේ ළඟදී නැරඹූ කොරියන් කොරියන් ටෙලි නාට්‍යයක කොල්ලාට එසේ කරන්නට පුළුවන. ඇස් දෙස බලාගෙන සිත කියවිය හැක.

මේ හමුවීම ජීවිතයේ ඇතිකළ

ගැස්ම කුමක්ද? භාවනා අඩි දෙක තුනක් ඇවිදගෙන ආවේ කොර ගසමින් මෙන්ය. දේවක ළඟින් පඩියේ ඉඳගෙන පැය දෙක තුනක් කතාකරන්නට ඇත්නම් කියා භාවනාට සිතුණි. එසේ කළානම් සමහරවිට මේ හිතේ ඇති සාංකාව දුරවී යන්නට පුළුවන. ඒත් නිවසට ගිය පසුව?

භාවනා සෙමෙන් ඇවිදගෙන විත් දේවක ඉඳගෙන උන් පඩියට උඩ පඩියේ නතරවූවාය. ඔහු දුටුවේ කෙල්ලව නොවේ. මිරිවැඩි සඟලින් මුදාහල ඇගේ දෙපාය. ලා ගුරු පැහැයේ නිය අලේපනයක් ගැල්වූ නිය සහිත ඇගේ දෙපාන්තයේ සිට ඔහු මන්දගාමී කැමරාවක වේගයෙන් දෙනෙත් ඉහළට එසවූවේය. යුවතියගේ දෙපාවල සෑහෙන අඩක්

දේවක දැකගත්තේ ඔහු පහළ පඩියේ උන් නිසාය. මේ පන්සලය. රාගී සිතුවිලි හදට ඒම හොඳ නැත. දේවක සිතට තරවටු කරගත්තේය.

"සුද්දි කොහෙන්ද ආවේ"

ඔහු ඇසුවේය.

"උඩින්."

ඇය අසරණ දුගී සිනාවක් පා කීවාය. ඒ සිනහව ඔහුට බොහෝ දේ කීවේය. කියන්නට බලාගෙන උන්නේය.

"මං ගොඩක් වෙලා ඇවිත්."

"ඉතින් වඩින්න තිබුණානේ."

දේවක නැඟිට්ටේය. අද කෙල්ල චාම්ය. සරලය. ලස්සනය. එහෙත් ඔහු ආස කළ ලස්සන මේ නොවේ. ඇයට කුමක්ද වී ඇත. ඒ වූ දේ ඇගේ මුහුණ පුරාම අඳුරු පාට

තීන්ත පදාස මෙන් සටහන්ව තිබේ.

"සුද්දි එක්කම වඳිනවා කියලා හිතුවා."

"මි. වඳිමු."

දෙදෙනාම බුදු ගෙට ගියේ එකටය. මේ යන ගමනක තේරුම කුමක්ද? සඳකඩ පහන ළඟදි ඇය බැලුවාය. දේවකද බැලුවේය. දෙනෙත් එක්වූයේ සුසුමන් සමඟය.

"සුද්දි අසනීපෙන් වගේ."

ඔහු කීවේය.

"සනීපයක් නෑ තමයි"

ඇය අවංකව කීවාය. මේ කොල්ලා සමඟ බොරුකරන්නට නොහැක. සමහරු එහෙමය. ඇත්ත එයාකාරයෙන්ම දනී.

"වඳිමුකෝ."

දේවක සුදු නෙළුම් මල්

පොකුරක්ම ගෙන තිබුණි.

"මං පඩියට වෙලා මේවා දිගෑරියා"

"ලස්සනට පුබුදුවලා."

"මට පුරුදුයි. නුවරදී නෙළුම් මල් ලක්ෂයක් විතර පුබුදුවලා තියෙනවා."

"එච්චර."

"අපි මාළිගාවේ එක එක වැඩ කළානේ සුද්දි. මං පෙරහැර කමිටුවෙත් හිටියා."

ඔහු කීවේය.

"මාළිගාවට නෙළුම් මල් පූජකළේ කාත් එක්ක ගිහින්ද?"

ඇය ඇසුවාය.

"එක්කෙනෙක් හිටියා. හැමදාම හිටියා."

දේවක කීවේය. භාවනා බැලුවාය. ඇගේ දෙනෙත්වල විස්මයක් තිබුණි.

"කිව්වේ කවුරුවත් හිටියේ නෑ කියලා."

"එයා ඇත්ත කෙනෙක් නෙමේ."

"භූතියෙක්ද?"

භාවනා ඇසුවාය. සිනාවක් නැත.

"න්නෑ. හිතේ කෙනෙක් හිටියා. එයා හැමදාම හිතේ හිටියායන යන තැන."

ඔහු කීවේය. අද කියවෙන්නේ මොනවාද?

"අද?"

ඇය ඇසුවාය. දේවක කතාකළේ නැත.

"කියනවකෝ. අදත් එයා ඉන්නවද?"

ඇය ඇසුවාය.

"හිතේ නෑ."

ඔහු අවංක හඬකින් කීවේය. 'ඇයි හිතේ නැත්තේ එයා අද' භාවනා සිතුවාය. පසුව ඇය කල්පනාබරව මල් ආසනය වෙතට පියමැන්නාය. 'හිතේ හිටපු කෙනා ඇත්තට ළඟ ඉන්නවා කියලද පිස්සා කියන්නේ මේ' භාවනා සිතුවාය.

මල් පූජා කර විහාර ගෙයි බිම ඇය ඉඳගත්තාය. ටයිට් සාය නිසා එහෙම ඉඳගන්න ආමාරුය. දේවක බැලුවේය. භාවනා රැව්වාය.

"මී. මේක දාගන්න. පන්සල් එනකොට හිතලා අඳින්න එපැයි."

ඔහු සාක්කුවේ දමාගෙන උන් ලේන්සුවෙන් ඇගේ නිරාවරණය වූ දෙපා වැසුවේය. භාවනා දෙනෙත්

විසල් කරගෙන බැලුවාය. දේවක පුංචි බණ්ඩාර. ඔහු කොතරම් පුදුම කෙනෙක්ද? භාවනාට බුදුන් වඳින ගාථාව පවා අමතක විය.

බෝධිමළු විහාරයෙන් පිටවී දෙදෙනාම පසුපස දොරටුවෙන් වැව අද්දරට ආවෝය. දෙදෙනාම ඇවිදගෙන ආවේ නිහඬවමය. දැන්ම ගෙදර යන්නට ආසාවක් නැත. භාවනා කැබ් රියදුරුට ඉන්න කියා වැව දිගේම ඇවිදගෙන ආවාය. දේවක ඇය අසළින්ම ඇවිදගෙන ආවේය.

"අයියේ"

භාවනා කතාකළේ වැව් දියේ පාවෙන ජපන් ජබර දෙස බලාගෙන නය. මීට මාසයකට කලින් එද්දී වැව් දිය අපූරුවට පෙනුණි. දැන් වැව් දිය

නොපෙනන තරමට ජපන් ජබර වැවී ඇත.

"කියන්න සුද්දි."

දේවක මෘදුව කතාකළේය.

"මගේ ජීවිතේ ටිකක් හිරවෙලා අයියේ."

භාවනාගේ කටහඬ ඇඬුම්බරය.

"එයාලා සූරියආරච්චිලා. ලංකාවට ටයිල් ගෙන්නන අය. තව බාත් රූම් ෆිටින්ස් එහෙමත් ගෙන්නනවා. එයාලගේ පුතා මෙන්ද්‍රක. මේ දැන් එද්දීත් මට කතාකළා. ලෝයර් කෙනෙක්. අපේ තාත්තා සීයා මත්වෙලා ඉන්නේ. එයාලා තමයි රෑ ආවේ. දැන් අද තාත්තා එයාලව හම්බවෙනවා. කතාකරනවා. මාත් එක්ක මෙලෝ දෙයක් කතාකරලා නෑ. මාව

හිරවෙලා ඉන්නේ. මං අම්මට කිව්වා. ඒත් අම්මට කරන්න පුළුවන් දෙයක් නෑ. මං සීයා එක්ක කතාකරන්න හැදුවාඒත් එයාටත් කරන්න දෙයක් නෑ. එයා දුක්වෙන්නේ මට දෑවැද්දට දෙන්න දෙයක් නැති එක ගැන විතරයි. මට මගේ ජීවිතේ ගැන බයක් එනවා. ඒක පුදුම බයක්. මගේ අක්කට වෙච්ච දේ මම ඇස්දෙකෙන් දැක්කා. අද මම අම්මට කිව්වා. අක්කට වගේම මටත් වීල් චෙයාර් එකක් ගෙනල්ලා තියන්න කියලා තාත්තට කියන්න කියලා."

එක හුස්මක්වත් නොගෙන භාවනා කියාගෙන ගියාය. දේවක යටිතොල හපාගෙන බලාගෙන උන්නාය. හදිස්සියේ මෙන් භාවනාගේ දෙනෙතින් කඳුළක් ගිලිහිණ.

"අනේ සුද්දි"

දේවක අසරණව කීවේය. කෙල්ලගේ දුක වෙනුවෙන් කුමක් හෝ කිව යුතුය. එහෙත් කිවයුතු දෙයක් ගැන සිතාගන්න අමාරුය.

"සුද්දිට තාත්තා එක්ක කතාකරන්න වෙයි නේ."

දේවක අසරණව කීවේය. 'ඔයත් පව්. මේවා කියනකොට ඔයා මොනවා කියලා කියන්නද?' භාවනා සිතුවාය.

"උත්සාහ කරනවා. ඒත් අමාරුවෙයි. එයාගේ පැත්තත් ලේසි නෑ. එක කෙල්ලෙක් කසාදේ කඩාගෙන ඇවිත් රෝද පුටුවක් උඩ. තවත් කෙල්ලෙක් අහසේ. මහ පොළොවේ ඉන්නේ මම විතරයි. මගෙත් ජීවිතේ."

කියාගෙන ආ දේ භාවනා ගිලගත්තාය.

"සුද්දි මොකක්හරි."

දේවක යමක් කියාගෙන ආවේය. භාවනා කඳුළු පිරි දෙනෙතින් බැලුවාය. ඒ බැල්ම දේවක පුංචි බණ්ඩාරව දෙදරා යැවූ බැල්මක් විය.

"සුද්දි."

ඔහු ගොතගැසුවේය.

"මම. අයියේ. කෙනෙක් ගැන."

නැත. එවැන්නක් දැන් කියා තේරුමක් නැත. කිසිම තේරුමක්නැත.

"අපි යන්. අම්මා බලාගෙන ඇති"

භාවනා හදිස්සියේම හැරුණාය.

"සුද්දි"

"යන්කෝ. මම මඟින් දාගෙන

යන්නම්.”

භාවනා වේගයෙන් ගොස් කැබ් රියට ගොඩවූවාය. දේවක හිරිවැටීගොස් උන්නේය.

හිතේ තියෙනා දෙයක් දැන්මම කියා දැම්මානම් ඉවරය. එහෙත් සැබෑ නොවන සිහින අසා තේරුමක් ඇත්ද? සමහරවිට ඇය කිසිවක්ම නොකියා මේ යන්නේද ඒ නිසා නොවේද? දේවක භාවනාට කැබ් රියට ගොඩවෙන්නට දොර විවර කර දුන්නාය. දේවක කැබ් රියේ දොර අල්ලාගෙන මොහොතක් භාවනා දෙස බලාගෙන උන්නාය.

“මේ ටිකනේ සුද්දි. මම යන්නම්. පරිස්සමින් යන්න.”

ඔහු කම්පනයෙන් මෙන් සිටින්නේ ඇයි? භාවනා ඉඳගෙන උන්

ආසනයේ එක් පසෙකට වූවාය. ඇය නොකියා කීවේ ගොඩවෙන ලෙසය. ඊළඟ තත්පරයේ දේවක ඇයගේ නෙතඟ බැල්මට කීකරු විය. භාවනාට දුක්බර සතුටක් ඇතිවිය. ඇස්වලින් කියන දේත් තේරුම් ගන්නා අය අඩුය. ඔහු එහෙමය.

"මේ පැත්තෙන් යන්"

භාවනා කැබ්රියේ රියදුරුට කීවේ දුර පාරය. දේවක බැලුවේය. භාවනා තොල්පට තද කරගෙන බැලුවේ මහා ගින්දරක් පපුවෙන් කඩාගෙන එන නිසාය. පිටවෙන සුසුම් එයාකාරයෙන්ම පිටකළ නොහැක.

"අපිට හිතපු විදිහට වැඩටික ඉවරකරගන්න පුළුවන් වෙයිද අයියේ"

භාවනා ඇසුවාය.

"ගොඩක් සුද්දි. හිතපු විදිහටම කරගන්න පුළුවන්. අපි නුවර ගිහින් එනකොට වැඩ ගොඩක් ඉවරයි."

භාවනා කල්පනා කළාය. නුවර ගමන යන්නට උන්නේ කොතරම් ආසාවෙන්ද?

"මං හෙට දිගටම වැඩ."

"එහෙම කරලා අපිට අනිද්දා යන්න බෑනේ. අමාරුයිනේ"

දේවක අසරණව සිනාසුනේය.

"ඒක මොකක්ද සුද්දි. එහෙම අමාරු නෑ."

"නුවර ගියාම හොඳට නිදාගමු නේ"

නැත. නුවරදී ගතකරන රාත්‍රියේ නිදාගත නොහැක. දැන් නින්දත් සැනසීමත් කොහොමත් අහිමිය. ඔහු ආසනයේ ඉඳගෙන ඉන්නේ

අසරණ අහිංසක පිරිමි ළමයෙක් සේය. භාවනාගේ හදවත කොණක සිට ඇවිලීගෙන එයි. එය සාමාන්‍ය ගින්දරක් නොවේ. අසාමාන්‍ය ඇවිලීමකි. 'තාත්තා හැමදේම තීරණය කරලා ආවොත්. එයා මං ළඟට ඇවිත් ඉල්ලීමක් කළොත් පවුල වෙනුවෙන් මට කැපකිරීමක් කරන්න වෙයිද? කතාව එතනින් ඉවරයිද?' සමහරවිට එසේම වෙනු ඇත. ජීවිතය යනු අප පතන දේම නොවේ. ලැබෙන දේද ජීවිතයට අයත්ය.

"අද නයිට් කරන්න එපා අයියේ. ගෙදර යන්න."

"ටිකක් රෑ වෙනකල් ඉන්නවා සුද්දි. මේ වැඩ ටික බලන්නෝන. මං බාරගත්ත වගකීමනේ. ඕපන්

කරනවා කිව්ව දවසට ඒක කරන්න ඕන.”

භාවනා දිග සුසුමක් පිටකළාය. අලුත්වෙන සීගිරි එකේ ලස්සනට ඉන්න සිතූ සිතුම් සියල්ල වතුරේය.

“ගොඩක් රෑ නොවී ගෙදර යන්න.”

ඇය කීවේ එසේ කරන්නම කියා බලකරන හඬකින් නොවේ. සමහරවිට කියන්නට දෙයක් නැතිව විය හැක. දේවකද එය දැනගෙන උන්නේය. මේ අද පන්සල් ආවේ වෙනදා දකින භාවනා නොවේ.

දේවක ඔහුගේ සාක්කුවේ ගසාගෙන උන් පෑන අතට ගත්තේය. එය සිහින් කුඩා පෑනකි. ඔහු එහි පිටුපස බටින් එක ඔබා පෑන් තුඩ පිටතට ගත්තේය. ඊටත් පසුව

ඔහුගේ අත්ලේ ඉරක් ඇද බැලුවේය. භාවනා සියල්ල බලාගෙනය.

හදිස්සියේම දේවක උකුල මත තබාගෙන උන් භාවනාගේ අත ගත්තේය. භාවනා කිසිවක් කීවේ නැත. මලානිකව ගිය කෙල්ලගේ පණ නැති සුදු අත දේවක ගෙන ඔහුගේ දකුණු පාදය මත ටිකකට තබාගත්තේය. ඒ කුඩා අත සිහින්ය. දිගැටිය. දේවක අතේ අත්ල පැත්ත හරවා ඒ මත යමක් ලියන්න ගියේය. භාවනා දුක්බරව සිනාසුනාය. 'මොනවාහරි ලියන්න දේවකයියේ. ඒක සැනසීමක්' ඇය සිතින් කීවාය.

ඔහු කිසිවක්ම නොලියා භාවනාගේ අත්ල මත හැපී ෆේස් එකක් ඇන්දේය. භාවනා ඒ සිනාබර කුරුටු බෝල මුහුණ දෙස බලාගෙ

නම උන්නාය. ඔහු මේ කියන්නේ සතුටින් ඉන්න කියාය. සතුටින් සිටිය හැක. ඒ සතුටින් තියන අය ඇත්නම්ය.

දේවක භාවනාගේ අත ඇගේ උකුලින්ම ලස්සනට තැබුවේය. භාවනා ඔහු ඇන්ඳ හැපී ෆේස් එක ලෙස ටික වෙලාවක් බලාගෙන උන්නාය.

පසුව හදිස්සියේම දේවකගේ අතින් පෑන උදුරාගත්තාය. ඊටත් පසුව ඔහුගේ අත ඇගේ උකුලට ගත්තාය. දේවකගේ පපුව සිරවිය. ඇය ඔහුගේ අත අල්ලාගෙන මොහොතක් ඒ දෙස බලාගෙන උන්නාය. පසුව ඔහුට නොහැඟෙන ලෙස සුසුමක් පිටකළාය.

පසුව ඔහුගේ අත්ල මත යමක්

ලීවාය. එය ලියා, ඇය ඒ දෙසම ටික වෙලාවක් නෙත් බරකරගෙන බලාගෙන උන්නාය. භාවනාගේ දෙනෙතින් ගිලිහී ගිය කඳුළක් හදිස්සියේම ඔහුගේ අත්ලට වැටිණ. ඇගේ කඳුළේ සීතලෙන් දේවක ගැස්සිණ.

"සුද්දි."

ඔහු යමක් කියන්නට ගියේය. භාවනා අතින් කීවේ කිසිවක් කියන්න එපා කියාය. එය ඔහුගේ අත යළිත් ඔහුට දී දේවකගේ පැත්තට බරවී පෑන ඔහුගේ කමිස සාක්කුවේ ගැසුවාය. දේවක ඔහුගේ දකුණතේ අත්ල දෙස බැලුවේය.

"නෝ වන් කැන් මේක් මී හැපී. ලයික් යූ ඩූ."

ඇය ලියා තිබුනේ එසේය.

එපමණය. රවුම් ඉංග්‍රීසි අකුරෙන් ඇය එවැන්නක් ලියා තිබුණි. 'කිසිවෙකුට මාව සතුටින් තැබිය නොහැක. ඔබ කරනවා වගේ' එහි සරල තේරුම එයය. දේවක නෙත් ඔසවා ඇගේ තෙත්වූ දෙනෙත් දෙස බැලුවාය. භාවනා අසරණව සිනාසුනාය. ඒ සිනහව ආවේ සැඩ සුළඟක් බඳු සුසුමක්ද සමඟය. සමහරවිට යළිත් එවැන්නක් කියන්නට වෙලාවක් නොලැබෙනු ඇත. භාවනාට සිතුවේ එසේය.

# 28

දේවක සිය වතාවක් පමණ ඔහුගේ අත්ල දෙස බැලුවේය. දකුණතේ අත්ල මත භාවනා ලියූ වැකිය හෙට වෙද්දී මැකී යාවී යයි කොල්ලා උන්නේ බියෙනි. “නෝ වන් කැන් මේක් මී හැපී. ලයික් යූ ඩූ.” ඒ වචන දැන් අත්ලෙන් මැකී ගියද කමක් නැත. හදවතේ බිත්ති මත එය ලියවී හමාරය. පුදුමය. මේ රවුම් ඉංග්‍රීසි අකුරු ටික ලිව්වේ ඇයය.

කියන්නට බැරිවූ දිග කතාවක කෙටි සාරංශයක් ඒ අකුරුවල ලියවී ඇත. 'ඔයාව හැමදාම සතුටින් තියන්න වරමක් මට දෙනවානම්. මම මගේ සතුට කියලා දෙයක් හිතන්නේ නෑ සුද්දි.' දේවක එන මඟ දිගටම සිතුවේය.

සමහරවිට කෙල්ල මේ ටික මෙහෙම ලීවේ යළිත් කිසිවක් කියන්නවත් නොලැබෙන නිසා වෙන්නට ඇත. 'ඔයාව හරි ඉක්මනට සූරියආරච්චිලා අරගෙන යයි.' එහෙම නොවෙන්න විදිහක් නැත. රඹුක්වැල්ල පවුලේ බාල කෙල්ලගේ ජීවිතයට ඉක්මන් විසඳුමක් දෙන්නට හැමෝටම හදිස්සියක් ඇත.

කෙල්ලව සූරියආරච්චිලාට නොදෙන්නට හේතුවක් නැත.

ඇයට සූරියආරච්චිලා සමඟ යන්න බෑ කියන්නට හේතුවක් සොයාගන්නටවත් නොහැකිවෙනු ඇත. මේ තරම් ඉක්මනින් භාවනා සීගිරි එකට සමුදේයැයි දේවක සිතුවේ නැත. එහෙම සිතුවානම් මේ කිසිවක් කරන්නේ නැත. ඇය නැති සීගිරි එකක ඉඳීම තේරුමක් නැත.

රඹුක්වැල්ල මහතා කතාකළේ දේවක බස්රියෙන් බසිද්දීමය.

"සර්."

දේවක ඇමතුම ගත්තේය.

"දේවක මඟද පුතා."

"ඔව් සර්. මම මේ ගෙදර යන ගමන්. කමක් නෑ සර් කියන්න"

දේවක කීවේය.

"අපට පුතා පොඩි වෙනසක් කරන්න වෙනවා."

දේවක පාරෙන් මඳක් පැත්තකට ආවේය. ඔහුගේ පපුවට මොකක්ද දැනුණි.

"මොකක්ද සර්."

"අපි කතාකරගත්ත බජට් එකම යන්න අමාරු තත්වයක් තියෙන්නේ. කලෙක්ෂන් එනකොට අපි ඉතුරු ටික කරමු පුතා. ඔයාගේ ප්ලෑනින්වල එකේ ප්‍රශ්නයක් නෙමේ පුතා. සමහරවිට අපිට මේ වෙන දේකට සල්ලි ඕනවෙන්න පුළුවන්."

දේවකගේ සිතට කෙළින්ම ආවේ භාවනාගේ විවාහයය. 'සමහරවිට ඒක වෙන්න ඇති. සීයා දෙන්න දෙයක් නැතුව හිතනවා කිව්වේ ඒකනේ ඔයා' දේවක පන්සලේදී භාවනා කියූ කතාව සිහිකළේය.

"මට තේරෙනවා සර්. මම බජට්

එක එහෙනම් ට්‍රිම් කරන්නම්. අපිට බැරිවෙන එකක් නෑ සර්. මේ තියෙන වැඩ ටික මෙතනින් ඉවරකරන්නම්. ඊට වඩා සතයක්වත් එපා සර්. අපිට සර් කිව්වා වගේ කලෙක්ෂන් එක එද්දී ඉතුරු දේවල් කරගන්න පුළුවන් සර්. ඩෝන්ට් වොරී සර්. අයල් මැනේජ් දිස්"

දේවක කීවේය.

"තැන්කියු පුතා. මේක තේරුම් ගන්න."

"හරි සර්. එහෙම වුණා කියලා අපිට අමාරුවෙන එකක් නෑ සර්. අපි හිතපු විදිහට ඕපන් කරමු සර්. අපිට කලෙක්ෂන් හදාගන්න පුළුවන්."

දේවක කීවේය.

"එහෙම පුළුවන්නම් ගොඩක් හොඳයි පුතා. මම ගොඩක් පැති

බලන්න ඕන."

"මට තේරෙනවා සර්. මම හෙට උදේම සර්ව හම්බවෙන්නම්"

"ම්. දැන් යන්න."

"හරි සර්ගුඩ් නයිට් සර්."

දේවක මහ පාර මැදම දිග සුසුමක් හෙළුවේය. 'එහෙනම් කතාව එහෙම යයි සුද්දි' දේවක හිස් හැඟීමෙන් යුතුව ගෙදර ගියේය. දේවක යද්දී ජීවන් පැමිණ උන්නේය. කොල්ලාගේ මුහුණේ ඇති කඩාවැටුණු පෙනුම ජීවන් දැක්කේය. 'කොල්ලට ආයෙත් ප්‍රශ්නයක්ද' ජීවන් සිතුවේය.

"පුංචි මහත්තයෝ. ඇයි."

දේවක සිනාසුනේය. ඔහු පියවි සිහියට ආවේ එවිටය.

"අප්පච්චි අද වේලාසන ඇවිත්."

දේවක කීවේය. ජීවන් පරිස්සමින් බැලුවේය.

"වේලාසන කොහෙද පුංචි මහත්තයෝ. දැන් නමයත් පහුවෙලා"

දේවක අසරණව සිනාසුනේය. කොල්ලා ඉන්නේ මේ ලෝකයේ නොවේ.

"මට වෙලාව බැලුනේ නෑ අප්පච්චි."

ජීවන් සුසුමක් පිටකළේය.

"ආයේ මොකක්හරි ප්‍රශ්නයක්ද පුංචි මහත්තයෝ."

දේවක බැලුවේය.

"එහෙම නෑ අප්පච්චි හේරත් මාමා ඇවිත්ද?"

"ම්. ඉඳි ආප්ප හදනවා. ගිහින් වොෂ් එකක් දාගන්න. යන්න."

දේවක කොරගසමින් මෙන්

ගියේය. 'කොල්ලා ඉන්නේ මොකක්හරි අවුලකින්.' හිමිහිට අසනවා කියා ජීවන් සිතාගත්තේය. කාරමයට ගොස් දේවක ඇඳුම් උනා දමා තුවාය කරට දමාගත්තේය. ඔහුට බැලුණේ වම් අත්ල දෙසය. භාවනා ලියූ වැකිය එහි විය. 'මට ඔයාව සතුටින් තියන්න බැරිවෙයි සුද්දි. ඒත් ඔයා සතුටින් ඉන්න බලන්න.' ඔහු සිතින් කීවේය.

දේවක ළිඳට ගියේය. ජීවන් කාමරයට ආවේ නිකමටය. ඒ මොහොතේම කොල්ලාගේ ජංගම දුරකථනයට කෙටි පණිවිඩයක් ආවේය. ජීවන් නිකමට එය බැලුවේය. කෙටි පණිවිඩය ඇවිත් තිබුණේ භාවනාගෙනි.

"දේවකයියේමම රෑ වෙලා

ගන්නවා. නිදාගන්න එපා.”

ඈය ලියා තිබුනේ එපමණය. ජීවන් බොහෝ දේ සිතාගත්තේය. ‘ඔයාව පුතේ මගේ කොල්ලට දෙන්නේ නෑනේ. දවසක ඉතින් මට කොල්ලා සනසන්න වෙයි. මොනවා කරන්නද? රඹුක්වැල්ලලා හිතන විදිහ මම හොදට දන්නවා පුතේ’ ජීවන්ට දැන් කතාකර කෙල්ලට කියන්නට සිතුණි. ඒත් මේ කෙල්ල කොතරම් අහිංසක හොඳ කෙල්ලෙක්දැයි ජීවන් දැනගෙන උන්නේය. ‘මූණ පුළුටු කරන් ආවේ මොකක්හරි වෙනවා ඇති.’ ජීවන් සිතුවේය.

# 29

මිලින්ද ගෙදර ආවේ භාවනාගේත් මෙන්දකගේත් විවාහය වහෙන් ඔරෝවෙන් තීන්දුකරය. සූරියආරච්චිලාගේ බලසම්පන්න බව ඉදිරියේ මිලින්දට අන්කිසිවක් කතාකරන්නට නොහැකි විය. එහෙම කතාකරන්නට අවශ්‍යද නැතැයි ඔහු පසුව සිතුවේය. මඟින් මඟට ඉඳුනිල් කතාකර කීවේ එකපාර වචනයක් දෙන්න එපා කියාය. ඇත්තටම

මිලින්ද සූරියආරච්චිලාට වචනයක් දුන්නේ නැත. එහෙත් නුදුන්නේද නැත.

මිලින්ද උන්නේ කොහොමත් මේ විවාහය කෙරෙන තැනය. ඔහු නිවසට ආවේ ඒ ප්‍රීතියෙනි.

"මොකද වුනේ?"

නිවසට ආ විගසම ඉඳුනිල් ඇසුවාය.

"ඒකේ ආයේ කතාකරන්න දෙයක් නෑ ඉන්දු. කෙල්ලට සූරිලා එක පයින්ම කැමතියි. කිසිම යෝජනාවකට කැමතිවුනේ නැති මෙන්දකත් කෙල්ලට හරිම කැමතියිලු. හවස මෙන්දක පුතා භාවනාට කතාකළා කියලත් කිව්වේ"

"මේ අපේ කෙල්ලට."

"ඔව්."

ඉඳුනිල් සුසුමක් පිටකළාය.

"ඒත් අපි එහෙම එකපාර."

මිලින්දගේ මුහුණේ තිබූ සතුට එකවර නැතිකරන්නට ඉඳුනිල්ට බයය.

"එකපාර නැතුව දෙතුන් පාරක් කසාද තීන්දු කරනවද ඉන්දු. මොකක්ද ප්‍රශ්නේ."

"කෙල්ල එක්ක ටිකක් කතාකළොත් නරකද?"

ඉඳුනිල් අමාරුවෙන් කීවාය. මිලින්ද සැහැල්ලුවෙන් සිනාසුනේය.

"මම හිමිහිට එයා එක්ක කතාකරන්නම්. මම කියන දේකට සුද්දි පිටින් යන්නේ නෑ."

මිලින්දට එවැනි විශ්වාසයක් විය.

"ඒත් හවස කියෙව්වා. එයාටත් වීල් චෙයාර් එකක් ගෙනත් තියන්න

කියලා"

ඉඳුනිල් කියූ කතාවෙන් මිලින්ද ගැස්සිණා. ඔහු කිසිවක් නොකියාම ඉඳුනිල් දෙස බලාගෙන උන්නේය.

"කරන දෙයක් එයත් එක්කත් කතාකරලා කරමු. දරුවොනේ."

ඉඳුනිල් කරුණාවෙන් කීවාය. මොකක්ද හේතුවක් නිසා මෙන්දක සූරියආරච්චි යනු තමාගේ පොඩි බෑනා නොවේ යැයි ඉඳුනිල්ටද දැන් සිතෙයි. එහෙම සිතුනේ අදය.

"තවත් ප්‍රශ්නයක්"

"ඒ පාර මොකක්ද?"

"සුරංගි ආවා. ටිකක් සද්දෙට කතාකළේ. මෙතන අපි රහසින් මඟුල් කතාකරපු ගාණට. අරවා මේව කියාගෙන ආවේ. මම මොනවත් කිව්වේ නෑ. ඔයා එක්ක කතාකරයි."

ඉඳුනිල් කීවාය.

"කෙල්ලව මිහිරංගට දෙයි කියලා හිතාගෙන වෙන්න ඇති."

මිලින්ද කීවේය.

"මොනවා හිතේ තියාගෙන ඉන්නවද කියලා කියන්න දන්නේ නෑ. කොහොමත් ප්‍රශ්නයක් ඇතිකරග න්නේ නැතුව හැමදේම කරන්න වෙයි. ඔක්කොටම වඩා දරුවගේ ජීවිතේ. තවත් දරුවෙක් දුක් විඳිනවා බලාගෙන ඉන්න බෑ."

ඉඳුනිල්ට ඒ ටික කියද්දී ඇඬුණි. රෝද පුටුව කරකවාගෙන නේත්‍රා කාමරයට ආවේ ඒ මොහොතේය.

"එන්න මැණික."

ඉඳුනිල් කඳුළු පිසදාගෙන කීවාය. නේත්‍රා ඇගේ අතින්ම රෝද පුටුව කරකවාගෙන ආවාය. දැන් එහි රෝද

හිරය. මිලින්ද එය දැක්කේය.

"මේක ටිකක් හිරයි තාත්තා. ඔයිල් ටිකක් දාගන්න ඕන."

නේත්‍රා අසරණව සිනාසී කිවාය.

"මම බලන්නම්."

මිලින්ද කීවේ ඊටත් වඩා අසරණවය.

"තාත්තා"

නේත්‍රා කතාකළේ මෘදුවය.

"කෙල්ල එක්ක කතාකරලම ගන්න තීරණයක් ගන්න. අපි මලක් වගේ හදපු කෙල්ලනේ. ඒකීට මොනවාහරි වුනොත් අපිට ලේසි නෑ. බත් කටක් කන්න බැරිවෙයි. ආයේ මේ ගෙදර කිරිබත් කටක් හදලා ඉවරයි"

නේත්‍රා මේ ටික කියන්නට සිතාගෙන උන්නාය. අද කීවේ සමහරවිට යළිත් කියන්නට වෙලාවක් එතැයි

නොසිතුණා නිසාය. මිලින්ද අසරණාව බැලුවේය.

"තාත්තා එහෙම බලන්න එපා. අපිට ඉන්නේ එහෙම දෙන්න බැරි කෙල්ලෙක් නෙමේ. මේකිව වටිනවා. අපි බලන්නෝන කෙල්ල සතුටින් ඉඳියිද කියලා. එහෙම නැත්නම් කාට දීලත් වැඩක් නෑනේ. නේද? මේ අපි ටිකක් සැරෙන් කතාකළත් මාසයක් අඬන කෙල්ලනේ."

නේත්‍රා කීවේ භාවනාගේ කුඩා විය සිහිපත් කරමිනි. එය හැමෝම දැනගෙන උන්නෝය.

"මේ පවුල හරි හොඳ පවුලක්නේ ලොකු පුතේ."

මිලින්ද කීවේය. නේත්‍රා දිග සුසුමක් හෙළුවාය.

"සූරි අන්කලුයි ඇන්ටියි හොඳයි

තමයි. මටත් ඒක හිතෙනවා. ඒත් කෙල්ල ජීවත්වෙන්නෝන මෙන්ද්‍රක එක්කනේ තාත්තා. අපි දන්නේ නෑනේ. මම කියන්නේ නෑ මෙන්ද්‍රක නරක කෙනෙක් කියලා. ඒත් අපි දන්නේ නෑ."

"අපි හොයමු ටිකක්"

මිලින්ද කීවේය. නේත්‍රා සුසුමක් පිටකළාය.

"මේක කරන්නම ඕන නම් කරලා දාන්න තාත්තා. ගොඩක් කතාකරලා තේරුමක් නෑනේ. කෙල්ල සතුටින් හිටියොත් ඒ ඇති. වෙන මොනවත්ම ඕන නෑ. අපි කෙල්ලට දුකක් දුන්නේ නෑ. මම තාත්තා අම්මා නංගි සීයා. අපි හැමෝම මේකිට දුකක් දුන්නේ නෑ. ඒ තරමට අපි ආදරේ නිසා. එහෙම කෙනෙක් හිතනවානම් ඒ

ඇති. මටත් තේරෙන්නේ නෑ"

නේත්‍රා අසරණව කීවාය. විවාහය කඩාකප්පල් කරගෙන දික්කසාදයත් රැගෙන නිවසට ආ තමාට නංගිලාගේ විවාහයන්ට එහෙමම එරෙහිවෙන්නට අයිතියක් නැත. එය සුදුසුද නැතැයි නේත්‍රාට සිතෙයි.

"නංගා එක්ක කතාකරලා ඉන්න තාත්තා. ඒ ඇති."

නේත්‍රා රෝද පුටුව කරකවාගෙන කාමරයෙන් ගියේ එසේ කියාය. මිලින්ද ඇය යන දෙස දුක්බරව බලාගෙන උන්නාය. තමාගේ තවත් දරුවෙක්ටත් මේ වැනි ඉරණමක් හිමිවුවහොත් එය කොහොමටවත් දරාගත නොහැකි බව මිලින්ද දැනගෙන උන්නේය.

"මං රෑට සුද්දි එක්ක

කතාකරන්නම්. කෙල්ලට නිදාගන්න එපා කියන්න ඉන්දු."

මිලින්ද කීවේය.

"මී. බය නිසා එහෙම කියන්නේ"

මිලින්ද කිසිවක් කීවේ නැත.

# 30

දේවක පඩියේ වාඩිවී රෑ අහස දෙස බලාගෙනම උන්නේය. ජීවන් පැමිණ ඒ ළඟින් වාඩිවුනේය.

"අප්පච්චි"

දේවක කතාකළේ මලානකවය.

"මොනවද පුංචි මහත්තයෝ කල්පනා කළේ"

ඔහු ඇසුවේය. දේවක සිනාසුනේ අහසටය.

"එහේ වෙඩින් එකක් ගන්න

යන්නේ අප්පච්චි.”

දේවක කීවේය.

“වෙඩින් එකක්. කාගෙද?”

ජීවන් ඉවෙන් මෙන් යමක් සිතුවේය.

“භාවනාගේ.”

දේවක හැම දෙයක්ම අප්පච්චිට කීවේය. කොල්ලාගේ හිතේ භාවනා ගැන ඇති භක්තියත් ආදරයත් ඉවෙන් මෙන් ජීවන් දැනගෙන උන්නේය. කිසිම දවසක දේවක කෙල්ලෙක්ට ආදරය නොකළ බව ජීවන්ට සහතිකය.

“ඒ දරුවා මොකද පුතේ කියන්නේ.”

දේවකට පෙන්වන්න සිතුනේ භාවනා අත්ලේ ලියූ වැකියය. ඔහු අද ඇඟ සෝදුවේත් එය අහකට

කරගෙනය. හෙට දවස වෙනතුරුවත් ඇය ලියූ දේ අතේ තියෙනවානම් බල බල සිටිය හැක.

"එයා මොනවා හිතුවත් එයාට යන්න වෙනවා අප්පච්චි. මාමාගේ පැත්තෙන් මාමා සාධාරණයි. එක කෙල්ලෙක් කසාදේ කඩාගෙන රෝද පුටුවක් උඩ. තවත් කෙල්ලෙක් අහසේ. එයාගේ ජීවිතේ ගැන එයාවත් දන්නේ නෑ. තාරකා නංගි හොඳ කෙල්ල. ඒත් පිළිවෙලක් නෑ. භාවනාගෙන්වත් නිදහස් වෙන්න මාමා හිතනවා ඇති. කෙල්ලොම තුන්දෙනෙක්ගේ අප්පච්චි. එනකොට මට සීයා කතාකළා."

"ම්"

"සීගිරි එකට දාපු බජට් එක අඩුකරන්න පුළුවන්ද කියලා ඇහුවේ.

සමහරවිට මේ වෙඩින් එකක් කටේ නිසා වෙන්න ඇති."

කොල්ලාගේ මේ තේරුම් ගැනීම ගැන ජීවන්ට සැනසීමක් දැනුණි. 'ජීවිතේ දරාගන්නත් ඔයා හිමිහිට පුරුදුවෙයි. මම වගේ.' ජීවන් සිතුවේය.

"කෙල්ල ගියොත් පුංචි මහත්තයෝ."

ජීවන් ඇසුවේය. දේවක අසරණව අප්පච්චි දෙස බැලුවේය.

"බෑ අප්පච්චි. එහෙම වුනොත් සීගිරි එකේ ඉන්න අමාරු වෙයි"

ජීවන් දුක් විය. ඒ කොල්ලාගේ අහිංසක හිත ගැනය.

"අපි බලමුකෝ"

"ම්. එන විදිහක් අප්පච්චි"

දේවක කීවේය. ජීවන් නැගිට

ගියේ කොල්ලාගේ හිස අතගාය. දේවක බැලුවේ දුරකථනය දෙස. නැත. රෑ කතාකරන්නම් කීවාට කෙල්ලගේ කිසිම හැල හොල්මනක් නැත. 'සමහරවිට අද ඔයාට කියනවා ඇති. කොහොම ඉතින් කතාකරන්නද' දේවක සිතුවේය.

මිලින්ද භාවනාගේ කාමරයට ආවේ මහ රෑය. තාත්තා එන බව භාවනා දැනගෙන උන්නාය. භාවනා උන්නේ කිසිවක් සිතාගත නොහැකිවය. තමාගේ ජීවිතයට මේ තරම් ඉක්මනින් අභාග්‍යසම්පන්න කාලයක් උදාවෙතැයි ඇය සිතුවේ නැත. එහෙත් සිදුවන්නේ සිතාගෙන උන් දේම නොවේ. නොසිතූ දේමය.

"සුද්දි නිදාගන්නද ගියේ."

මිලින්ද පැමිණ ඉඳගත්තේ

ඇඳ උඩය. 'හිතේ තිබ්බ සැනසීම සම්පූර්ණයෙන්ම නැතිකරලා ඔයා නිදාගන්නද යන්නේ කියලා අහන්නේ ඇයි තාත්තේ' භාවනා ඇසුවේ සිතිනි.

"ඔයත් එක්ක ටිකක් කතාකරන්න කියලා ආවේ පුතේ."

භාවනා අසරණව බලාගෙන උන්නාය. හිනාවක් නැති කෙල්ලගේ මුහුණේ වූවේ බියපත් පෙනුමකි. මිලින්ද එය නොදැන උන්නා නොවේ.

"කියන්න තාත්තා."

තාත්තා කියන්නට යන්නේ අන් කිසිවක් ගැන නොවේ. මෙන්ද්‍රක සුරියආරච්චි ගැනය. ඔහු එය කියන්නේ දෙයක් සිතේ තබාගෙනය.

"මම අද සූරි අන්කල්ලාගේ ගෙදර ගියා."

මිලින්ද කීවේය. ඔහු අද කතාකරන්නේ කවරදාටත් වඩා සැනසීමකින් යැයි භාවනාට සිතුණි. 'මාව දීලා ඔයාට එච්චර සැනසීමක් එන්නේ ඇයි කියලා හිතාගන්න බෑ.' භාවනා සිතුවාය. කෙල්ලෝ තුන්දෙනෙක් ඉන්නා පවුලක තාත්තා කෙනෙක්ට මේ බර එන බව ඇය දැනගෙන උන්නාය. ඒත් මේ තරම් ඉක්මනට එයට තමාට මුහුණ දෙන්නට වේයැයි ඇය සිතුවේ නැත.

"එයාලා සුද්දිට පුදුම තරම් කැමැත්තකින් ඉන්නේ. කියන්නේ වෙන දෙයක් නෙමේ. පොඩි දූව අපට දෙන්න අපි මලක් වගේ බලාගන්නම් කියලා"

මිලින්ද අමාරුම දේ කීවේය. 'මලක් වගේ' භාවනා ඒ වදන් යළිත්

සිතින් කියෙව්වාය. මලක් වාගේ කෙල්ලෙක්ව බලාගන්නේ කෙහොමද කියාවත් මෙන්දක සූරියආරච්චි දන්නවාද කියා ඈය සිතුවාය.

"තාත්තා වචනයක් දුන්නා."

භාවනා ඇසුවාය. එසේ දුන්නානම් තවත් මෙතන කතාකර තේරුමක් නැත.

"ඔයත් එක්කත් කතාකරන්න ඕනනේ පුතේ. මම එහෙම අසාධාරණ තාත්තා කෙනෙක් නෙමේනේ."

භාවනාට ඔහු ගැන දුකක් දැනුණි. ඈය මුළු හදවතින්ම තාත්තාගේ හදවත තේරුම් ගෙන උන්නාය. එහෙත් ජීවිතයේ දෛවය වෙනස්ය.

"මට තාත්තා හිතන්නවත් වෙලාවක් නෑනේ. එහෙම අලුත් ජීවිතයක් පටන් ගන්නේ

කොහොමද?"

මිලින්ද සැහැල්ලුවෙන් සිනාසුනේය.

"ජීවිතේ ගොඩක් දේවල් වෙන්නේ අහම්බයකින් තමයි පුතේ. අපි ඒවා බාරගන්න විදිහ තමයි. උපදින පවුලේ අය ඇරෙන්න අනිත් සේරම අහම්බයකින් තමයි හම්බවෙන්නේ. හිමිහිට එයාලව තමන්ගේ අය කරගන්නවා."

භාවනා කිසිවක් කතානොකර උන්නාය.

"තාත්තා මට මොකක්ද කියන්නේ"

"මම ඔයාට බලකරන්නේ නෑ සුද්දි. ඒත් ඉල්ලීමක් කරනවා. මේ ගැන හිතන්න. අපිට බෑ ගොඩක් හිරවෙන්න. ඔයා ගැන මේ තරම් ඉක්මනට බලන්න නෙමේ හිටියේ.

පොඩි අක්කා උඩ. අක්කා වීල් චෙයාර් එකක් උඩ. ඉතින් මම."

මිලින්ද අසරණාව කියාගෙන ආවේය.

"මට තාත්තා කියන දේ තේරෙනවා"

"තේරුම් ගන්න බැරිකෙනෙක් නෙමේනේ ඔයා. මම ඒක දන්නවා. අනිත් දෙන්නටත් වඩා ඔයාට එහෙම පුළුවන්."

මිලින්ද කීවේ බොරුවට නොවේ.

"අපිට පුතේ එකපාර ලොකු දෙයක් ඔයාලා වෙනුවෙන් දෙන්න අමාරුයිනේ. සීගිරි එක තවම බෙදලා නෑ. මේ ගෙදරත් තාම නෑ. සීයා කියන්නේ දවසක මෙ ගේ ඔයාට දෙමු කියලා. තව අරන් දාපු ඉඩමක් තියෙනවා. දැන් ඒක තමා අපි දෙන්න

යන්නේ. වෙඩින් එකට මම සල්ලි ටිකක් ඉතුරුකරලා තියෙන්නේ. සීයත් කීයක්හරි දෙයි මට"

භාවනාගේ දෙනෙත් කඳුළින් පිරීගයේය. දැන් ඉරණම පැහැදිළිය. හොඳින්ම පැහැදිළිය. කතාකර තේරුමක් නැත.

"එයාලා දෑවැදි ඉල්ලුවා"

"තාම එහෙම මොනවත් කියලා නෑ. ඒත් දුවෙක් දෙන විදිහක් තියෙනවා. දැනට කියන්නේ දුවව අපට දෙන්න කියලා. එහෙම කියලා අපි ඔයාට මොනවත්ම නොදී ඉන්නේ නෑ. සමහරවිට හැමදේම ඔයාට දෙයි. අක්කත් කියන්නේ ඒකයි. පොඩි අක්කගෙන් ඇහුවත් එයත් කියයි. අපිට ඕන ඔයා සතුටින් ඉන්නවා දකින්න"

සමහරවිට නැතිම වෙන දේ එය විය හැක. එහෙත් දැන් එය කතාකර තේරුමක් නැත.

"මම මැරිකරලා තාත්තා එහේ යන්නෝන"

"මෙන්දක පුතාට ගෙයක් හදනවලුනේ පුතේ. එහේ යයි. මම ඒවා කතාකරන්න ගියේ නෑ. මේක යෝජනාවක්නේ. සාමාන්‍යයෙන් එහෙම කොල්ලගේ පැත්තෙන් යෝජනා එන්නේ කළාතුරකින්. අනිත් එක සූරි අන්කල්ලා වගේ අයගෙන්."

භාවනා දෙනෙත් බරකරගෙන උන්නාය. පසුව ඇය කඳුළු පිරුණු දෙනෙතින් මිලින්ද දෙස බැලුවාය.

"තාත්තා."

"කියන්න සුද්දි. මෙතන අපි දෙන්නා විතරයි ඉන්නේ. හිතෙන දේ

කියන්න. මම ලෑස්තියි ඔයා කියන
දෙයක් පිළිගන්න. කියන්න."

මිලින්ද කීවේය.

"මම තාත්තා මැරිකරන්නම්. ඒත්
දෙයක් ඔයාට කියන්න තියෙනවා"

"කියන්න පුතේ."

මිලින්ද ඇසුවේය.

"මම කෙනෙක් ගැන පහුගිය
කාලේ හිතුවා. ගොඩක් හිතුවා. එයා
කවුද කියලා දැන් තාත්තට කියලා
තේරුමක් නෑ. සූරි අන්කල්ලට
ළංකරන්නවත් බැරි සාමාන්‍ය
කෙනෙක්. සමහරවිට මොනවත්ම
නෑ. ඒත් කෙනෙක්ගේ වත්කම
එයාගේ බෑන්ක් එනවුන්ට් එකද
කියලත් මම හිතුවා. දැන් ඒක
හිතන්නේ නෑ. මම එහෙම කෙනෙක්
නෙමේ. කෙනෙක්ව හිතේ තියාගෙන

තවත් කෙනෙක් එක්ක මම යන්නේ නෑ. කවදාවත් නෑ. ඒත් කෙනෙක් ගැන හිතුවා. සමහරවිට එයාට ආදරෙත් කළා වෙන්න පුළුවන්. මාව සතුටින් තියන්න පුළුවන් එයාට විතරයි කියලත් හිතුවා. ඒ වගේ හරි අහිංසක ගතිගුණ තියෙන කෙනෙක් එක්ක ගෙවන ජීවිතේ කොච්චර ලස්සනද කියලත් හිතුවා. ඒත් කාත් එක්කවත් මම අෆෙයා එකක් පටන් අරන් නෑ. ඒ නිසා මට මෙන්ද්‍රක අයියා එක්ක යන්න පුළුවන්. ඔයා බයවෙන්න එපා. එයාලට කියන්න දුවත් කැමතියි වෙඩින් එකට ලෑස්තිවෙන්න කියලා. තාත්තා හිත නිදහස් කරගන්න. මම ලෑස්තියි තාත්තා. මම හැමදේකටම වඩා බලන්නේ ඔයාගේ අම්මගේ සීයගේ අක්කගේ පොඩිඅක්කගේ සතුට

විතරයි. ඒක විතරමයි. හිතපු දේවල් හිතාගෙන උන්න දේවල් දැකපු හීන ඒවා දැන් වැඩක් නෑ. ඒත් මම මේක කිව්වේ මේ ගමන මම යන්නේ පොඩියට හරි කැපකිරීමක් කරලා කියලා ඔයාට කියන්න ඕන නිසා. ඒක මට දරාගන්න පුළුවන් වේවී නේද?"

භාවනාගේ දෙනෙතින් අසාමාන්‍ය ලෙස කඳුළු ගලාගෙන ආවේය. මිලින්ද ඒ දෙස බලාගෙන උන්නේ දරාගත නොහැකි දුකකිනි. කෙල්ල කියූ සියල්ල ඔහු අසාගෙන උන්නේ පරිස්සමිනි.

"ඒ පුතා පුතේ."

මිලින්ද ඇසුවේය.

"න්. නෑ තාත්තා. ඒක මගේ හිතේ විතරක් තිබුණාම ඇති. හැමදේම එහෙම තිබ්බදෙන්. එයාවත්

සමහරවිට දන්නේ නැතුව ඇතිනේ. ඒක මගේ ෆස්ට් ලව් එක වෙන්න ඇති. ඔය මළ ඉලව්ව කාගේවත් හරියන්නේ නෑලුනේ. ෆොගෙට්ඉට් තාත්තා"

මිලින්ද බලාගෙනම උන්නේය.

"ඔහොම දැන් බලාගෙන ඉන්න එපා තාත්තා. තාත්තා ගන්න තීරණය ගන්න. මම ලෑස්තියි. අම්මටත් කියන්න. අක්කටත් කියන්න. සීයටත් කියන්න. මට මේ කතාව හැමෝටම වෙන වෙනම කියන්න බෑ. ඒක දුකක්"

භාවනා කීවාය. පසුව ඇය කොට්ටය ගෙන ඉන් මුළු මුහුණම පිසදාගත්තාය. පොඩි දැරිවියක මෙන් කඳුළුත් හොටුත් පිසදාගත්තාය. ඇගේ නැහැය රතුවී

තිබුණි. දෑස් ලොවි ගෙඩි මෙන් වී තිබුණි.

"මම සුද්දියේ"

"එහෙම තාත්තා පොඩි දුව ඉස්සරහ අසරණ වෙන්න එපා. ඔයා එහෙම වෙන්නෝන තාත්තා කෙනෙක් නෙමේ. මේ කෙල්ලෝ තුන්දෙනෙක්ව හදන්න ඔයා වින්ඳ දුක අපි දැක්කා. හොඳටම දැක්කා. ඔයා අර පොඩි කාර් එකෙන් වැස්ස දවස්වලට අපිව ඉස්කෝලේ එක්කගෙන ගියා. ඔයා තෙමි තෙමී අපි තුන්දෙනාව තුන්පාරකට ඉස්කෝලෙට දැම්මේ. අපි ඔයා තෙමි තෙමි යන දිහා බලාගෙන උන්නා. හවසට ගන්නත් එනවා. එනකොට බොම්බේ ස්විට් එකෙන් බූන්දි ගෙනත් කාර් එකේ තියාගෙන උන්නා. ඒවා අපි දැක්කා.

ඉතින් එහෙම තාත්තා මේ දුව ළඟ ඉල්ලීම් කරන්න එපා. ඒක පව්. මම ලෑස්තියි. ඔයා ඔය හදන්නේ මාව තවත් අඬවන්න. එහෙම කරන්න එපා. මේ ලෝකේ හදාගන්න බැරි හිතක් නෑ. මට පුළුවන්. මම හදවතින්ම බලන්නම් මෙන්දක අයියා එක්ක සතුටින් ඉන්න. ම්."

භාවනා සිත දැඩිකරගෙන කීවාය. පසුව පපුවම හිස්කර මෙන් සුසුමක් හෙළුවාය. මිලින්ද කෙල්ලව බදාගත්තේය. භාවනා තාත්තාගේ ගතින් එන සුවඳ විඳගෙනම දෑස් තදකරගත්තාය. 'ඔයා පව්. ඔයාගේ ආදරයට මම සාධාරණයක් කරන්න ඕන. මගේ ජීවිතෙන්ම හරි. ඒක අද මම පන්සලේදී හිතාගත්තා.' භාවනා සිතින් කීවාය.

මිලින්ද ගිය පසුව භාවනා එහෙමම දුවගොස් කාමරයේ දොර වසා දැමුවාය. එසේ වසා දමා ඇය ඇඳ බදාගෙන පැයක් පමණ ඇඬුවාය. පපුව භාරාගෙන ආ ඉහිලුම් නොදෙන දුකක් විසින් කෙල්ලව වෙව්ලා ගියේය. ඇය දෑස් ගිනියම් වෙනතරුම ඇඬුවාය.

# 31

මහ රෑ වෙද්දී භාවනාව වෙච්ලා උණු ගැණීන. ඉඳුනිල් ආවේ හිතේ සැකේටය.

"සුද්දි. මැණික."

ඉඳුනිල් පැමිණ කතාකළේ කෙල්ලත් සමඟ කතාකළ පසුව මිලින්දද කිසිවක් නොකී නිසාය. තාත්තාත් දුවත් අතර මොන විදිහේ කතාවක් ගියාදැයි ඇය දන්නේ නැත. භාවනා සමඟ කතාකර ආ

මොහොතේ සිට මිලින්ද මිදුලට වී ඇවිදිමින් කල්පනා කළේය. ඉඳුනිල් කිසිවක් ඇසුවේ නැත. දෙවක් තිවෙනවානම් මිලින්ද තමාට කියන බව ඇය දැනගෙන උන්නාය.

අවසානයේදී මිලින්ද පැමිණ ඇඳට බරවූවේය.

"කෙල්ල මොකද කියන්නේ"

ඉඳුනිල් ඇසුවේය. මිලින්ද බැලුවේ වෙනස්ම බැල්මකිනි.

"සුද්දිගේ මොකක්හරි අභ්‍යයා එකක් ගැන ඉන්දු දන්නවද?"

ඔහු ඇසුවේය.

"එහෙම"

"මං ඇහුවේ දන්නවද කියලා ඉන්දු"

"එහෙම දෙයක් ගැන කියලා නෑ. ඇයි එහෙම දෙයක් තියෙනවා කියලා

කිව්වද?"

මිලින්ද කිසිවක් කීවේ නැත.

"කෙල්ල කිව්ව දේ කියන්නකෝ."

ඉඳුනිල් හැඟීම්බරව ඇසුවාය.

"තාත්තා කැමති දෙයක් කරන්න කිව්වා. වෙඩින් එකට ලෑස්තිවෙන්නම් කියලා කිව්වේ"

ඉඳුනිල්ගේ ළය බරවිය. ගැස්සිණ. 'ඇයි එහෙමම කිව්වේ.' ඉඳුනිල් සිතුවාය.

"මොකක්හරි දෙයක් ඉන්දු"

ඉඳුනිල් ඇයට දැනෙන දේවල් ගැන කියන්නට ගියේ නැත. 'සිගිරි එකට අලුතින් ආව දරුවා ගැන හරි හැඟීමෙන් කතාකළේ. ඒත් එහෙම දෙයක්'

"දැන් මොකද කරන්නේ."

මිලින්ද කිසිවක් කීවේ නැත.

ඉඳුනිල් කෙල්ලගේ කාමරයට ආවේ ඉන්පසුවය.

"සුද්දි මැණික."

ඇය භාවනාගේ උරතලයට අතක් තබා කකා කළාය. කෙල්ලගේ වතින් ආ අධික රස්නය ඉඳුනිල්ගේ පපුවම කඩා දැම්මේය.

"අනේ මැණික. මේ උණනේ ගිනියමට."

ඇය භාවනාව ඔඩොක්කුවට ගෙන කීවාය.

"මට අම්මා"

"ඇයි මේ උණ අරන්. මේ සහලෝල උණනේ. ඔය වෙව්ලනවනේ මැණික."

"මොනවාහරි දෙන්න අම්මා බොන්න. මට සීතලයි. පොරවන්නකෝ."

භාවනා ඉඳුනිල්ගේ ඔඩොක්කුවේ ඇකිලෙමින් කීවාය. ඉඳුනිල්ගේ දෑස් තෙත්විය.

"ඇයි මේ උණ අරන්. ආ පුතේ. තාත්තා කියපු දේටද"

"මට අමාරුයි අනේ. පස්සේ කතාකරන්න. ම..ට මොනවාහරි බොන්න දෙන්න. පිපා..ස..යි"

ඉඳුනිල් දුවගෙන පහළට ආවාය.

"කෙල්ලට ගිනි මැලේරියා උණානේ. යනකොට ඇඟේ උන්ඩිවෙලා වෙව්ල වෙව්ල ඉන්නවා."

මිලින්දද දුවගෙන ආවේය. කෙල්ලව බදාගෙන උන් මොහොතේවත් එහෙම රස්නයක් තිබුනේ නැත. මිලින්ද ඇයගේ නළළට අතක් තබා බැලුවේය.

"ඇඳුමක් දාන්න. මං

ඩොක්ටර් පරණවිතාන ළඟට එක්කගෙන යන්නම්. රෑ ඇති"

"මේ දැන් එකොළහත් පහුවෙලා. දැන් ඩිස්පෙන්සරියත් වහලනේ"

ඉඳුනිල් කීවාය.

"මම අයිස් ටිකක් තියලා බලන්නම්. පැනඩොල් දීලා බලමුකෝ. කෝ පුතේ"

ඉඳුනිල් ඇය රැගෙන ආ ඕඩිකලෝන් බෝතලයෙන් ටිකක් ගෙන භාවනාගේ හිසට දමා පිරිමැද්දාය.

"ලොක්කි ළඟ ඇති උණට ගන්න පෙත්තක්මම ඉල්ලගෙන එන්නම්. නැත්නම් අපි අක්කගේ ඇඳට යන් මැණික. මී"

"මං උස්සගෙන යන්නම්."

මිලින්ද කෙල්ලව හරහට

ගත්තේය. භාවනා අමාරු මැදත් සිනාසුනාය.

"අම්මා"

ඇය කතාකළේ අඬමින් මෙන්ය.

"පුතේ"

"අපේ තාත්තා පව්."

ඇය කීවාය. ඉඳුනිල්ගේ පමණක් නොව මිලින්දගේද දෑස් තෙත්වය. සද්දය ඇසී නේත්‍රාද ඇහැරී ඇඳ මත ඉඳගෙන උන්නාය. තාත්තා කෙල්ලව උස්සාගෙන එද්දී ඇයට පුදුම සිතුණි. නේත්‍රා පපුවට අතක් තබාගත්තාය.

"අනේ මගේ කෙල්ලට අම්මේ"

නේත්‍රා බියපත්ව ඇසුවාය.

"කෙල්ලට උණ අරන් පුතේ. මේ තාත්තා ඔයාගේ කාමරේට වඩාගෙන ආවා."

නේත්‍රාගේ දෑස් තෙත්විය. ඇය තොල්පට තදකරගෙන කඳුළු පුරවාගෙන බලාගෙන උන්නාය. මිලින්ද පරිස්සමින් භාවනාව නේත්‍රාගේ ඇඳ මත තැබුවේය.

"මං ළඟ ඇති පෙත්තක්. උණට ගන්න. මම ඒක දෙන්නම්. අම්මා ඕඩිකලෝන් බෝතලේ අරන් දෙන්න"

"දැන් මාත් දැම්මා"

"ම්. රස්නෙට තේ එකක් හදන්නකෝ. මේක එක්ක රස්නේ දෙයක් බොන්නෝන. මං ළඟට වෙලා ඉන්නකෝ."

නේත්‍රා ආදරයෙන් භාවනාගේ හිස අතගා කීවාය. පසුව ඇය තාත්තා දෙසත් අම්මා දෙසත් බැලුවාය. කෙල්ලට උණ ගන්නට හේතුවක් තිබිය යුතුය. තාත්තා අද කෙල්ලත්

සමඟ කතා කළ බව ඇය දනී. ඒ කතාවෙන් පසුව මෙහෙම දෙයක් වුවාද?

"තේ ගේන්නකෝ අම්මා."

නේත්‍රා සුසුමක් පිටකර කීවාය. මිලින්ද කාමරයෙන් යන දෙස නේත්‍රා බලාගෙනම උන්නාය.

"සුද්දියේ. ඇයි බබා"

භාවනා කතාකළේ නැත. ඒ වෙනුවට ඇය අක්කාගේ උණුසුමේ දෑස් පියාගෙන උන්නාය. නේත්‍රා ඇගේ උකුලටම නංගීව ගත්තාය. ඊටත් පසුව ඇගේ හිස ඕඩිකලෝන් පෙඟවූ ඇඟිලිතුඩින් පිරිමැද්දාය.

"අක්කා"

"ම්."

"සනීපයි. දිගටම කරන්න."

කෙල්ල යමක් කියන්නට ගිය බව

නේත්‍රා දනී. එහෙත් ඇය එය කීවේ නැත.

"තාත්තට මොනවද කිව්වේ."

භාවනා එයට පිළිතුරු දුන්නේ නැත.

"එයා පව්. ගොඩක් පව්."

භාවනා කීවේ එපමණය. කෙල්ල බලාපොරොත්තු නොවූ උත්තරයක් තාත්තාට දී ඇති බව පමණක් නේත්‍රා තේරුම් ගත්තාය. 'අපිට මොනවා කිව්වත් තාත්තා එක්ක එහෙම කියවගෙන යන්නේ නෑ. හා කියන්න ඇතිපව්.' නේත්‍රා ඉවෙන් මෙන් සිතුවාය.

බෙහෙත් පෙත්ත බිවු පසුව භාවනා තද නින්දකට වැටුණාය. නේත්‍රා ඇයට පොරවා හිමිහිට ඇඳෙන් රෑටා බැස රෝද පුටුවට

බරවුවාය.

ඉඳුනිල් උන්නේ කුස්සියේ නේත්‍රාට තේ එකක් හදමිනි.

"අම්මා. මොකද වෙලා තියෙන්නේ."

ඉඳුනිල්ගේ දෑස්වල තෙතමනයක් විය. අද මහා දුකක් හිතට දැනෙන්නේ ඇයිදැයි ඇයටම තේරෙන්නේ නැත.

"වෙඩින් එකට ලෑස්තියි කියලා. තාත්තා කැමති දෙයක් කරන්න කියලා."

නේත්‍රා පුදුම වූයේ නැත. 'උඹ එහෙම කරනවා කියලා මම දැනගෙන උන්නා. උඹ බලන්නේ උඹේ සතුට නෙමේ. මේ පවුල ගැන. තාත්තා ගැන' අතීතයේ එක දවසක තමාද කළේ එයමෙ නොවේද?

"මොකක් නමුත් කෙල්ල කියලා. තාත්තා ඇහුවා අෆෙයා එකක් ගැන."

"කෙල්ලගේ"

"ම්. ඔයා දන්න දෙයක් පුතේ."

නේත්‍රා දෙනෙත් බරකළාය.

"ඒක අෆෙයා එකක්ද නැත්නම් බැඳීමක්ද කියලා කියන්න මම දන්නේ නෑ අම්මා. ඒත්"

"අර අලුතෙන් ආපු පුතා එක්ක"

"ම්. හරි ආදරෙයි කොල්ලට. ඒත් ඒක එහෙම අෆෙයා එකක්ද කියන්න දන්නේ නෑ අම්මා."

ඉඳුනිල් සුසුමක් පිටකළාය.

"එතකොට සූරි අන්කල්ලට දැන් කියනවා."

"තාත්තා කියයි"

නේත්‍රා කිසිවක් කියන්නට ගියේ නැත. තමාගේ ජීවිතය අසාර්ථක වූ පළිය‍ටම එයම සොයුරියන්ගේ ජීවිතවලටත් වෙයි කියලා සිතිය හැකිද? එතනදී යමක් කියන්නට නේත්‍රා පසුබට වූවාය.

"අම්මා දවාලක කෙල්ලව අල්ලගෙන ටිකක් කතාකරන්නකෝ."

ඉඳුනිල් බැලුවාය.

"මං හිතන්නේ නෑ නංගි කතාකරයි කියලා. එහෙම කතාකරන්න ඕනකමක් නෑ කෙල්ලට."

නේත්‍රාට දේවකගේ මුහුණ සිහිවිය. 'ඔයා වගේ අහිංසක මල්ලි කෙනෙක් මගේ මස්සිනා වෙයි කියාල නිකමට මම හිතුවා. දැන් එහෙම වෙන්නේ නෑ. මං හොඳාකාරම

දන්නවා. බබා කොල්ලට ආදරේ කළා. කොල්ලත් මේකීට පැලෙන්න ගියා.' නේත්‍රා භාවනාගේ හිස පිරිමදිමින් බොහෝ වෙලාවක් උන්නාය.

# 32

උදේ බලද්දීත් භාවනාට උණය. ඒත් ඇය අමාරුවෙන් ඇඳෙන් බැස ඇයගේ කාමරයට යන්නට ගියාය. නේත්‍රා ඇහැරී කෙල්ලගේ අතකින් අල්ලාගත්තාය.

"බබා"

භාවනා ඇය දෙස ඇස් දී බැලුවේ නැත.

"ම්."

"ඇයි බබා මගේ ඇස් දිහා

බලන්නේ නැත්තේ."

භාවනා අසරණව බැලුවාය.

"තාත්තට මොනවද කිව්වේ"

"දැන් මොනවත් අහන්න එපා අක්කා. වෙන දෙයක් වෙයි. මට හිත හදාගන්න දෙන්න. කිසිම දෙයක් මට කියන්න එපා. එහෙම කතාකරන්න අමාරුයි අක්කා. ප්ලීස්"

භාවනා කීවේ එපමණකි.

"ඔෆිස් එකේදීවත් මට කියන්න"

භාවනා සිනාසුනාය. එය දුක්බර වියරු සිනහවකි.

"අද ඉඳලා මම සීගිරි සුපර් එකේ නෑ අක්කා. අද සීයට කියලා අස්වෙනවා. ආයේ කවදාවත් සීගිරි එකට මේ භාවනා පය තියන්නේ නෑ. කවදාවත් නෑ. නෙවර්. අද මම රිසයින් වෙනවා. ඒ තීරණය එහෙමම

තමයි”

භාවනා දැඩි හදවතින් කීවාය. කෙල්ල කිව්වොත් කරන බව නේත්‍රා දනී. නේත්‍රා අයාගත් දෙනෙතින් බලාගෙන උන්නාය. ඇයට උණගත්තෙත් ඒ නිසා බව නේත්‍රා දනී.

“ඇයි බ..බබා ඒ”

නේත්‍රා ඇසුවේ ගොත ගසමින් මෙන්ය.

“ජීවිතේ කියන්නේ අක්කා අත්හැරීම් ගොඩකට. ඒක කරන්න හිත හදාගන්න වෙනවා. දැන් මගේ ලොකු අක්කා මේ වීල් චෙයාර් එකක ඉන්නේ කොච්චර දේවල් අත්ඇරලද? එහෙම අතාරින්න පුරුදුවෙන්න ඕන. අමාරු වෙයි. ඒත් පස්සේ හිත හැදෙයි. නේ?”

නේත්‍රා කේන්තියෙන් බැලුවාය. ඇයගේ දෑස් හදවතෙන් ආ ආවේග යෙන්ම රතුව තිබුණි.

"මොනවද බබා කියන්නේ. උඹට මගේ වගේ කාලකන්නි ජීවිතයක් නෑ. උඹට එහෙම වෙන්න බෑ. මම අත්ඇරපු දේවල් උඹත් අතාරින්න නම් මේක මොන කාලකන්නි පවුලක්ද?"

නේත්‍රා බැණ්නාය. භාවනා කිසිවක් කීවේ නැත. ඇය බලාගෙන උන්නා පමණය.

"මම යනවා අක්කා. මගේ ඔළුව බරයි"

භාවනා එසේ කියා වේගයෙන් උඩු මහළට ගියාය. පියගැට පෙළේ පියවර මත අඩි තබන තබන පාරට ඇගේ ඇස්වලින් කඳුළු වැටිණ.

"හැමදේම ඉවරයි. මේක තමා අවසානය. අපි හිත හදාගමු භාවනා"

ඇය ඇයගේම දෙනෙත් දෙස බලාගෙන කීවාය. ඊටත් පසුව ගෙදරට අඳින සායකුත් බ්ලවුස් එකකුත් අල්මාරියෙන් තෝරා ඇඳ උඩට විසිකළාය. අල්මාරියේ පසෙක එල්ලා ඇති ලස්සන අත් බෑග් සාරි සහ ලස්සන පටි පාවහන් දෙස ඇය බැලුවේවත් නැත.

නාන කාමරයට යද්දීම වාගේ දුරකථනය නාදවිය. භාවනා පැමිණ එය බැලුවාය. එහි මුහුණත මත වැටී තිබුනේ දේවකගේ අංකයය. ඇය එය එහෙමම සයිලන්ස් කළාය.

"ආයේ කතාකරන්න එපා. කවදාවත් එපා. සුද්දි නෑ. සුද්දි මැරුණා දේවකයියේ"

ඇය සිතින් කීවාය. දේවක දිගටම ගත්තේය. එහෙත් භාවනා කතාකළේ නැත. කතාකරන්නට අමාරුය. 'තේරුම් ගන්න. කොල්ලෙක්ට එහෙම තේරුම් ගන්න වෙනවා' ඇය සිතින් පමණක් කීවාය.

භාවනා පැමිණ ඇඳ මත ඉඳගත්තාය. දැන් අලුත් ජීවිත කතාවක් ලියන්නට සූදානම් විය යුතුය. මෙන්දක කොහොම කෙනෙක්ද කියාවත් ඇය සිතන්නට ගියේ නැත. තමා මේ පවුල වෙනුවෙන් මේ ජීවිතයම කැපකරන්නට සිතාගෙන අවසානය. දැන් ආයේ හැරීමක් නැත.

දේවක දිගටම ගත්තේය.

හදිස්සියේම භාවනා ඔහුගේ ඇමතුම සම්බන්ධකරගත්තාය.

"කි..ය..න්..න දේවකයියේ"

ඇය මේ වෙලාවේ මේ ඇමතුම සම්බන්ධකරගත්තේ අක්කා ගැන සිතාය. හෙට ඔහුත් සමඟ පේරාදෙණියේ වෙද මහතා හමුවන්නට යා යුතුය. ඒ ගමන යා යුත්තේ ඔහු සමඟමය.

"නෑ සුද්දි මම මේ. නිකං මේ"

"මට ටිකක් සනීප නෑ අයියේ"

"අනේ ඇයි. මං ඒත් බැලුවා."

"මම මේ දවස් ටිකේ එන්නේ නෑ අයියේ. වැඩටික හොඳින් කරන්න. හෙට කොහොමහරි එනවා. අක්කව එක්කගෙන යන්න. ම්. එක දෙයක් විතරක් කියන්න තියෙනවා"

"කියන්න සුද්දි."

දේවක ශක්තිමත් ලෙස කීවේය.

"මාව අසරණ කරන්න එපා

අයියේමම අමාරු තත්වයක ඉන්නේ. හොඳේ. ජීවත්වෙනකොට එහෙම අවස්ථා එනවානේ. හොඳේ අයියේ"

දේවක ඒ වචන දහ දොළහෙන් බොහෝ දේවල් සිතාගත්තේය.

"තේරුණා සුද්දි. ගොඩක් හොඳට තේරුණා. බයවෙන්න එපා. මම මේ ලෝකේ මුලින්ම තේරුම් ගත්තේ මගේ අප්පච්චිව. ඊට පස්සේ සුද්දිව. ම්. සනීපවෙන්නකෝ. හොඳේ. බුදු සරණයි"

දේවක එපමණක් කියා දුරකථනය තැබුවේය. ඔහුව හරි ඉක්මනට සීගිරි එකට අහිමිවෙන බව භාවනාට විශ්වාසය. 'ඔයා ඉන්නේ නෑ. යනවා. මට ඒකට  කරන්න දේකුත් නෑ' ඇයට එය විශ්වාසය.

භාවනා ඇඳමත ඉඳගෙන

කල්පනා කළාය. දේවක්ව සීගිරි එකට අහිමිවෙනවා කියන්නේ සීගිරි එකට සිදුවෙන බරපතලම අහිමිවීමය. තමාත් දැන් එහි නැත. ආයේ සීගිරි එකට පය තියන්නේ නැතැයි භාවනා සිතාගත්තාය. ඒ තීරණය එහෙමමය. එය වෙනස් වෙන්න් නැත. කවදාවත් නැත.

"ඔයාව මට අහිමිවෙන එකේ සීගිරි එකට අහිමිවෙන මොකක්ද දේවකයියේ"

භාවනා අවසානයට සිතුවාය.

මේ සියළු අහිමිවීම් මැද තමාට දෙයක් හිමිවේයැයි භාවනා සිහිනෙන්වත් සිතුවේ නැත. 'මෙන්දක එක්ක එහෙම සුරංගනා ෆැමිලි ලයිෆ් එකක් ගතකරන්න ලැබෙයි කියලා මම විශ්වාස කරන්නේ නෑ.

මම මගේ පළවෙනි ආදරය විතරක් නෙමේ. මගේ ජීවිතයක් බිලිදෙනවා මගේ පවුල වෙනුවෙන් ආයේ මට හිමිවෙන්න දෙයක් නැති එකේ අමුතුවෙන් අහිමිවෙන්න දේකුත් නෑ' භාවනා සිතුවාය.

"මම නැති ලෝකෙක ඔයාලා සතුටින් ඉන්න. සුද්දි මළා"

ඇය හදවතින්ම සිතුවාය. පැතුවාය.

# 33

තාරුකා කොළඹ ඩුබායි එමිරේට්ස් ගුවන් යානය කොළඹ කටුනායක ගුවන් තොටුපළේ ගොඩබස්වන තුරු බලාගෙන උන්නේ දැඩි නොඉවසිල්ලකිනි. ඊයේ රාත්‍රියේ නේත්‍රා ඇයට ඩුබායිවලටම කතාකර සියල්ල කීවාය.

"මේකී ඉතින් එහෙම කියලා. අපි වගේ නෙමේනේ පව්. ගොඩක් පව්."

තාරකා කීවාය. කෙල්ලගේ ජීවිතයට වෙන දේ තාරකාට සිතාගන්නට පුළුවන. ඔය හැම මෙන්දක කෙනෙක් ගැනම තාරකා හොඳින් දැනගෙන උන්නාය. ඇය නේත්‍රා නොවේ. භාවනාද නොවේ. මේ සමාජයේ හොඳට ඇවිද්ද යුවතියකි.

මෙන්දක සූරියආරච්චි ගැන තාරකා දැනගත්තේ ඇගේ සමීපම මිතුරියක වූ අයේෂාගෙනි.

"රශ්මි ගොඩක් හොඳ කෙල්ලෙක් තාරු. මෙන්දක කෙල්ලගේ ජීවිතේම නැතිකළා. පව්. අන්තිමට කෙල්ල රටත් දාලා ගියා. මෙයා මහ අමුතු හැඟීම් තියෙන මිනිහෙක්. එහෙම එක කෙල්ලෙක්ගෙන් සැනසෙන්න බෑ.

කොල්ලෝ කොහොමත් ෆාස්ට්. මෙයා ෆාස්ට් ෆෝවඩ්. සල්ලි ආකර්ෂණේ. හිතපන්කෝ අර ගායට සල්ලිත් එකතුවුණාම. උගේ හැටි බලාගන්න දවසක් වරෙන් බිලූ එලිෆන්ට් එකට. මෙන්දක කියන්නේ කවුද කියලා මම උඹට වීඩියෝස්වලින්ම පෙන්නන්නම්"

අයේෂා කීවාය. මෙන්දක කලින් විවාහ වූ කෙනෙක් බව තාත්තා දන්නවාද කියා තරුකා සිතුවාය. මෙන්දගේ ඇත්ත ජීවිතය ගැන තාත්තා මොනවාද දන්නේ කියා ඇය සිතුවාය.

ඒ නිසාම තාරුකා කොළඹ එයාපෝට් එකෙන් බැස්ස විගසම මිලින්දට ඇමතුමක් ගත්තාය.

"තාත්තා මං."

තාරුකා කතාකළේ තරමක කළකිරීමකිනි.

"ඔයා ආවද? මං ඔයාට ගන්නත් හිටියේ."

"පවුලේ වැදගත්ම තීරණ ගන්නවා මං නැතුව. ඒක සාධාරණ නෑනේ තාත්තා. නොට් ෆෙයා. මම මගේ පවුලට ආදරේ නෑ කියලා ඔයා කොහොමද හිතුවේ තාත්තා"

මිලින්ද සිනාසුනේය. ඇය කියන කතා ඔහු ඒ තරම් ගණන් ගන්නේ නැත.

"සුද්දි කිව්වද"

"සුද්දි නෙමේ තාත්තා. මායි අද කියන්නේ. මං කතාකරනකල් තාත්තා ඔය සූරි අන්කල්ලට වචන දෙන්න එපා. ටිකක් ඉන්න. මං පැයකින් එනවාමේ දැන් ලෑන්ඩ්

කළේ”

“ඇයි එහෙම කියන්නේ”

“එහෙම කියන්නේ මගේ නංගිගේ ජීවිතේ නිසා. ටිකක් ඉන්න. හැමෝටම ගෙදර ඉන්න කියන්නමම එනවා. ඔයා හිතන්න එපා මේ අඩි තිස් තුන්දාහක් උඩ හිටියා කියලා මම මගේ පවුලේ හතර දෙනා ගැන හිතන්නේ නෑ කියලා. සමහරවිට හිතන්නේම එච්චරක් වෙන්න ඇති”

තාරුකා දැඩිව කීවේය. ඉඳුනිල් බලාගෙන උන්නාය.

“ඇයි.”

“මද්දු කතාකළේ. දැන්ලු බැස්සේ එයාපෝට් එකෙන්. පැයකින් එනවලු”

“ම්”

“එයාට සුද්දිගේ මේ වැඩේ ගැන

කතාකරන්න ඕනලු. කතාකරනකල් වචනයක් දෙන්න එපා කියන්නේ."

ඉඳුනිල්ට මොකක්ද සැනසීමක් දැනුණි. 'අපි වගේ නෙමේ මද්දු. කෙළින්ම කියනවා' ඉඳුනිල් සිතුවාය.

තාරුකා එහෙමම නේත්‍රාට ගත්තාය.

"අක්කා වැඩට යන්න එපා. මම දැන් එනවා. සීයටත් ටිකක් ඉන්න කියන්න."

කෙල්ල මේ මොනවද කරන්නේ කියා නේත්‍රාට සිතාගන්නට බැරිවිය. එහෙත් ඇය මේ පවුලේ සියල්ලන්ටම වඩා නංගිට ආදරය කරන බව නේත්‍රා දැනගෙන උන්නාය.

තාරකා භාවනාට ගත්තේ

අන්තිමටය.

"මොනවද බබා මේ කරන්නේ. උඹ ගොන් හරකි. වැස්සී. හිතාගෙන ඉන්නේ උඹ මහ ලොකු පරිත්‍යාගයක් කළා කියලද? ආ. උඹ දුක් විඳින කොට උඹට විතරද ඒ දුක. උඹ හිතාගෙන ඉන්නේ උඹට අපි ආදරේ නෑ කියලද? ආ මෝඩියේ. හිටපන් මම ඇවිත් උඹව අල්ලගන්නම්. පැයකින් මම එනවා. හෙළුවෙන්නේ නෑ ගෙදරින්. උඹට එහෙම තනියම උඹ ගැනවත් තීරණ ගන්න බෑ. අපි උඹට නැද්ද? "

"අනේ පොඩි අක්කා."

"උඹ නෙමේ සුද්දි. අද මායි කතාකරන්නේ. ටිකක් ගෙදරට වෙලා හිටපන්. මං තාම මේ ෆලයිට් එකේ"

ඇය බැනගෙනම ගියාය. භාවනා දිග සුසුමක් හෙළුවාය. පොඩි අක්කා පැමිණ කුමක් කීවද මේ දෛවය වෙනස් වෙන්නේ නැත. කොහෙත්ම නැත.

# 34

දේවක සීගිරි එක නැවත විවෘත කිරීම සඳහා සියළුම වැඩ බොහෝමයක් අවසන් කර උන්නේය. දැන් ඇත්තේ දවස් දෙකක් ගෙන බඩු ටික ඇරේන්ජ් කිරිම පමණි. ඒත් දේවක උන්නේ අසාමාන්‍ය ලෙස කම්පනයට පත්වය.

"මට නිකමට හිතෙනවා ඔයා සීගිරි එකට ආයේ එන එකක් නෑ කියලා. ඇයි සුද්දියේ එහෙම වුනේ."

දේවක සීගිරි එක පුරාම අනාථයෙකු සේ ඇවිදගෙන ගියේය. සීගිරි එක අසාමාන්‍ය ලෙස වෙනස්වී තිබුණි. ඒත් මේ ලස්සන බලන්නට ඇය එන්නේ නැත්නම්.! ඔහුගේ හදවතම ඇවිලිණ. 'මම මේ හැමදේම කළේ ඔයා වෙනුවෙන් කියලා හිතෙනවා' ඔහු දිග සුසුමක් පිටකළේය.

එක දෙයක් දේවකට පැහැදිළිය. 'ඔයා යන්න හදන්නේ. ඔයාව අරන් යන්න හදන්නේ.' දේවක පපුවම හිස්කර මෙන් සුසුමක් පිටකළේය.

"අක්කව වෙද මහත්තයා ළඟට එක්කගෙන යන්නත් ඔයා එන්නේ නැද්ද? ඇයි එහෙම කරන්නේ. මෙච්චර දරුණු විදිහට ඈත්වෙන්නේ."

දේවක අසරණව සිගිරි එක පුරාම ඇවිද්දේය.

"සමහරවිට මටත් දරුණු තීරණයක් ගන්න වෙයි."

ඔහු සිතුවේය. දේවකට ඇමතුමක් ආවේය.

"නේත්‍රා මිස්."

දේවක ඇමතුම සම්බන්ධ කරගත්තේය.

"අක්කේ."

"මල්ලියේ. මේක ටිකක් අහන්නකෝ. ගෙදර තත්වේ ටිකක් දරුණුයි. කෙල්ලත් ෂොක් වෙලා ඉන්නේ. මටත් ඉන්න වෙනවා. මේක අමාරු තත්වයක්නේ මහත්තයෝ. තේරෙනවා නේද"

නේත්‍රා කියාගෙන ගියේය.

"තේරෙනවා අක්කේ. ගොඩක්

හොඳට තේරෙනවා."

දේවක බිඳුණු හඬකින් කීවේය.

"අපි මල්ලියේ වෙද මහත්තයා ළඟට ඊළඟ සතියේ යන්ද? මේක මහත්තයෝ නිස්කලංකයේ කරගන්න ඕන දෙයක්නේ නේද"

"හරි අක්කේ. මම ඒක ලබන සතියට දාගන්නම්. එතන මල්ලි කෙනෙක්ගේ නම්බර් එකක් මම අරන් ආවේ."

"කෙල්ලගේ ජීවිතේනේ මල්ලියේ"

නේත්‍රා අඬමින් මෙන් කීවාය.

"මට සුද්දි වෙනුවෙන් කරන්න දෙයක් තියෙනවද කියන්න අක්කේ. අපේ සුද්දි වෙනුවෙන්"

දේවකට ඇඬුණි. නේත්‍රාගේ හදවතම කම්පාවෙන් තෙත්විය. 'ඇයි මෙහෙම වුනේ. මේ මොන

අපරාධයක්ද? මගේ ජීවිතේට වෙච්ච දේම මගේ නංගිගේ ජීවිතේටත් වෙන්නද යන්නේ.' නේත්‍රා කම්පනයෙන් මෙන් සිතුවාය.

"අපි බලමු මල්ලියේ. මී. ටිකක් ඉන්නකෝ"

නේත්‍රා එසේ කියා ඇමතුම තැබුවාය. ඇය එහෙමම තාරකාට ගත්තාය.

"ලොකු නංගි කොහෙද ඔයා"

"මම මේ එක්ස්ප්‍රස්වේ එකෙන් එළියට ආවා විතරයි. ටිකක් ඉන්න අක්කේ"

"ඉක්මනට එන්නකෝ."

"මම මෙන්දක ගැන හැම විස්තරයක්ම අරන් එන්නේ."

තාරකා කීවාය. නේත්‍රාට පුදුමය. මෙන්දක ගැන විස්තර මොනවාද?

ලොකු නංගි වෙනස් බව නේත්‍රා දැනගෙන උන්නාය. එහෙත් ඇය මේ කාරණයේදී මේ තරම් ඇවිස්සේයැයි නේත්‍රාවත් සිතුවේ නැත.

** ** ** ** ** ** ** **

දේවක සීගිරි එක පුරා ඇවිද්දේ අතරමං වුවෙක් සේය. අසරණ ආනාථයෙක් සේය. සීගිරි එක විවෘත කරන්නට ඔන්න මෙන්නය. හැමදේම සූදානම් කර අවසානය. ඇත්තේ භාවනා නැති අඩුව විතරය. 'මේ හැමදේම කළේ ඔයාට පෙන්නන්න කියලා හිතෙනවා. ඒත් ඔයා නැතුව මේ දේවල් කොහොමද කරගෙන යන්නේ. අඩුම ගාණේ පේන්නවත් හිටියානම් සුද්දියේ'

භාවනා සීගිරි එකට සදහටම සමුදී ඇත්දැයි දේවකට බියය. ඇය එවැනි තද තීරණයක් ගන්නවානම් ඒ ගන්නේ දුක දරාගෙන ඉන්නටම බැරි නිසා බව දේවක තේරුම් ගත්තේය.

"ඔයාට දරාගන්න බැරි දෙයක් වෙලා. නැත්නම් මෙහෙම හැසිරෙන්නේ නෑ. අක්කත් කිව්වේ ඒකනේ ෂොක්වෙලා ඉන්නේ කියලා."

හැමදේම එක මොහොතකින් අවුල් වේයැයි දේවකවත් සිතුවේ නැත. 'ඔයාට කතාකරන්නත් බෑ. එහෙම කතාකරගන්න පුළුවන්කමක් තිබුණානම් කොහොමහරි හිත හදන්න තිබුණා. එහෙම බැරි නිසාද මෙහෙම කරන්නේ.'

දැන් කරන්නට ඇති එකම දේ මේ කරගෙන ආ දේවල් ටික පිළිවෙලක්

කර හැකි ඉක්මනින් සීගිරි එකෙන් පිටවීමය. සදහටම මේ සීගිරි සුපර් එකට සමුදීමය. සමහරවිට එය සතියකින් දෙකකින් කළ හැකිවෙනු ඇත. ඇය නැතිව එක දවසක්වත් මෙහි රැඳීම දුකකි.

එසේ වුවහොත් යළිත් මේ කොළඹට පය තබන්නේවත් නැතැයි ඔහු සිතාගත්තේය.

"නුවරට වෙලා මොකක්හරි කරන්න පුළුවන්. ඒක නිදහස් වෙයි. එහේ ගෙවපු නිස්කලංක ජීවිතේ මීට වඩා සැනසීමයි. දැන් ගින්දර ගොඩක්. අප්පච්චිත් කැමති වෙයි."

අප්පච්චී කොළඹ ආවේ තමා නිසාය.

"හැමදේම වුනේ මේ සීගිරි එකට පය තිබ්බට පස්සේ. ඒත් දැන් මට

මෙතනින් යාගන්න බැරුවයි ඉන්නේ."

දේවක සන්සුන්ව හැමදේම සිතුවේය. හදවතට දැනෙන මේ අසීමිත තෘෂ්ණාව අවසාන වෙන්නේ මහා දුක් ගින්දර ගොඩකිනි. හැකි ඉක්මනින් හැමදේම පිළිවෙලක් කර සීගිරි එක විවෘත කරනවා කියා දේවක සිතාගත්තේය.

"එහෙම කරලා මම යනවා අම්මේ. මෙතන ඉන්න බෑ. සමහරවිට ඔයත් අප්පච්චි එක්ක මේ සීගිරි එකයි ගෙදරයි දාලා ගියේ ඒ නිසා වෙන්න ඇති. මේක පරම්පරාවෙන් එන අභිම්වීමක්."

දේවකට එය විශ්වාසය. අද රෑම අප්පච්චි සමඟ කතාකරනවා කියා දේවක සිතාගත්තේය.

දාගත් දිනයටම සීගිරි එක විවෘත

කරනවා කියා දේවක සිතාගත්තේය. හැමදේම දැන් සූදානම්ය. කොහොමත් හැමදේම ඉක්මනින් කළ යුතුය. දමායන තැන්වල වැඩි වෙලාවක් රැඳෙන්න අමාරුය.

"ඔයා එක්ක කොහොමහරි අද රෑට කතාකරනවා. ඔයා කියන දේ අනුව හැමදේම තීරණය කරනවා සුද්දි."

දේවක කෙටි පණිවිඩයක් ටයිප් කළේය. සමහරවිට තමා කතාකළොත් ඇය දුරකථනයට අමතන්නේ නැති වෙන්නට පුළුවන. 'ඔයා කවදාවත් එහෙම කරන කෙනෙක් නෙමෙයි. හිතේ ලොකු කඩාවැටීමක් ඇති. ඒකයි එහෙම කරන්නේ.'

දේවක කෙටි පණිවිඩය

ටයිප්කරන්නට පටන්ගත්තේය.

"සුද්දි. සමාවෙන්න මෙහෙම එස්එම්එස් එකක් එවනවට. මේ දවස්වල සුද්දිට කතාකරන්න අමාරුයි කියලා මට තේරෙනවා. ඒකයි මෙහෙම එස්එම්එස් එකක් එවන්නේ. මට සුද්දි එක්ක පුළුවන්නම් විනාඩි දහයක් කතාකරන්න ඕන. විනාඩි දහයක් ඇති. සීගිරි මම කොහොමහරි ඕපන් කරනවා. ඒත් සුද්දි නැතුව ඒක කරන්නේ කොහොමද කියලා තවමත් හිතාගන්න බෑ. ඒත් මම සර්ට වෙච්ච පොරොන්දුව රකින්න ඕන. අක්කව හෙට වෙද මහත්තයා ළඟට එක්කගෙන යන්න ඕන. අක්කා කිව්ව ඒක පස්සට දාගන්න කියලා. ඒක සුද්දි අපරාධයක්. එයාගේ ජීවිතයම සම්බන්ධ දෙයක්නේ මේක.

ඒකත් කතාකරගන්න ඕන. සමහරවිට මමත් සුද්දියේ ලොකු තීරණයක් ගනී. දිගටම මෙහෙම රැඳෙන්න ආසාවක් නෑ. මෙහෙමත් ඉන්නේ මේ සීගිරි එක ඕපන් කරනකල් විතරයි. ඒක මම බාරගත්ත වගකීම නිසා. මේ හැමදෙයක් ගැනම වචන දෙක තුනක් සුද්දි එක්ක කතාකරන්න ඕන. පුළුවන්නම් විතරක් රෑට ටිකක් කතාකරමු. ඒක අහිංසකව කරන ඉල්ලීමක්. මම සුද්දිට ගන්නේ නෑ. සුද්දිට පුළුවන් වෙලාවක කතාකරන්න. මම ඇහැරගෙන බලාගෙන ඉන්නවා. බුදු සරණයි. දේවක."

ඔහු ටයිප් කළේ එපමණකි. පසුව දේවක සිතන්නේවත් නැතුව එය භාවනාට යැව්වේය.

තත්පර කිහිපයක් තුළ භාවනාගේ දුරකථනයට දේවකගේ කෙටි පණිවිඩය ලැබිණ. කෙල්ලගේ ඇස්වල කඳුළු පිරුණි.

"ඔයා හරි ඉක්මනට සීගිරි එක දාලායයි. මට එහෙම හිතෙනවා. මෝඩ කොල්ලා. ඔයා එහෙම කරන කොල්ලෙක්. මම දැන් මොනවද කරන්නේ. ඔයා වගේ කෙනෙක්ව මට අහිමිවෙන දුක මම හරි අමාරුවෙන් දරාගත්තේ. ඒත් දැන් කොහොමද ඔයාව සීගිරි එකට අහිමිකරන්නේ."

දේවකට අද රෑ කතාකරන්නටම වෙන බව භාවනා තේරුම් ගත්තාය.

"මේ මොන දේ වුනත් අක්කව වෙද මහත්තයා ළඟට එක්කගෙන යන්නෝන. එයත් කියන්නේ ඒක. අපි ඉතින් නුවර ගිහින් කොහොමද

ඉන්නේ. මං කොහොමද පපුවේ මේ ගින්දර තියාගෙන ඔයා එක්ක මහ රෑ ඇහැරගෙන කෝපි බිබී කියවන්නේ. සදාකාලයට අහිමිවෙන කෙනෙක් එක්ක එහෙම ඉන්නකොට පපුවට මහ තෘෂ්ණාවක් එනවනේ. ඊට පස්සේ කොච්චර දුකක්ද?"

භාවනා සිතුවාය. පසුව ඇය වචන තුන හතරක කෙටි පණිවිඩයක් ටයිප් කළාය.

"මම රෑට ගන්නම් දේවකයියේ."

කෙල්ල යැව්වේ එපමණය. ඊට වඩා දෙයක් කියන්නට අමාරුය.

තාරකා කතාකළාය.

"සුද්දි මේ මම ළඟ. ගෙදර හිටපන් හොඳේ."

"ම්. ඒත් පොඩි අක්කේ."

භාවනා ගොත ගැසුවාය.

"ගොන් හරකි. එක වචනයක් කියන්න එපා."

ඇය කීවේ එපමණය.

තාරකා තත්පර කිහිපයක් තුළ සීගිරි අංකයට ඇමතුමක් ගත්තාය. ඇය ළඟ දේවකගේ අංකය තිබුනේ නැත. කෙල්ලට කතාකරන්නට ඕනා වූයේ දේවකටය.

"දේවක ප්ලීස්."

දුරකථනය ගත්තේ සීගිරි හී යුවතියකි.

"දේවක සර් වැඩකනේ. මෙතන දැන් නෑ."

"මම කතාකරන්නේ තාරකා රඹුක්වැල්ල."

තාරකා කීවාය. යුවතිය ගැස්සිණා.

"අනේ සොරි මිස්. මට මේ."

"හරි. ගිහින් දේවක සර්ට

කතාකරන්න. නැත්නම් මේ නම්බර් එක ලියාගන්න."

"හරි මිස්."

තාරකා ඇගේ අංකය දුන්නාය.

"මේ දැන්මම දේවක සර්ට කියන්න මට කෝල් එකක් ගන්න කියලා. හරි ජස්ට් නැ."

"හරි මිස්."

යුවතිය දේවකව සොයාගෙන දිව්වාය. දේවක උන්නේ අලුතෙන් සකස් කළ සිගිරි හි රැක්ස් මත අලුත් බඩු තබන අයුරු පරීක්ෂා කරමිනි. මේ සීගිරි අලුතින් හදන මෙහෙයුමේ අවසන් අධියරයය.

"මේ භාවනා මිස්ගේ අක්කා ඉන්නේ සර්. තාරකා මිස්."

"ඔව් අනූ කියන්න"

"නෑ ඒ මිස් දැන් කතාකළා. මේ

දැන්මම සර්ට කෝල් එකක් දෙන්න කිව්වා."

දේවකට පුදුම සිතුණි.

"මේ නම්බර් එක සර්."

දේවක තාරකාට ඇමතුමක් ගත්තේය.

"මිස් මම දේවක."

ඔහු කීවේය.

"අහකට දාපන් බං මිස් කෑල්ල. රෙද්දේ මිස්. මම තරූ. උඹත් මෙතන බබා වෙන්න එනවනේ"

තාරකා සැරෙන් කීවාය.

"සොරි තරූ."

"හරි දේවකයියේ. ගෙදර වෙන දේවල් දන්නවා නේ"

තාරකා කෙළින්ම ඇසුවාය.

"දන්නවා තරූ. සුද්දිව දකින්නත්

නෑ."

"ඉතින් උඹට දුකයි."

තාරකා ඇසුවාය. දේවකට පුදුම සිතුණි.

"මි ගොඩක්."

දේවක සිතන්නේ නැතුවම කීවේය.

"දෙයක් අහන්නද දේවකයියේ. කෙළින්ම උත්තරයක් ඕන. මේ දැන්. හුරතල් වෙන්න වෙලාවක් නෑ"

"දෙන්නම් තරූ."

දේවක කීවේ කිසිවෙක් නැති තැනකට යමිනි. මේ අහන්නේ කෙල්ල සම්බන්ධ දෙයක් බව දේවක දනී.

"කෙල්ලට ගොඩක් ආදරේද?"

තාරකා ඇසුවේ උගුරෙන් මෙන්ය. දේවකට පුදුම නැත. එහෙම ඇසූ එක ගැන දේවකට සතුටක්ද

ඇතිවිය. කාට හෝ මේ දුක කිව යුතුය.

"ගොඩක් තරූ. මගේ ජීවිතේනම." ["ගොඩක් තරූ. මගේ ජීවිතේන්ම."]

දේවක කීවේය. එහා කොනේ උන් තාරකාගේ දෙනෙත් තෙත්විය.

"ඉතින් ගොන් හරකෝ කෙල්ලව දැන් අරන් යන්නනේ යන්නේ. ඉතින් දුක නැද්ද? මේ මී හරකෙක්නේ."

තාරකා ඇසුවේ ඇඹුම්බරවය.

"කොච්චර දුකද කියලා දන්නේ නෑ තාරූ. මට බත් කටක් කාගන්න බෑ. එක බත් කටක්. මේ උණාත් වගේ. කරකියාගන්න දෙයක් නෑ. මම දේ දැනුත් එස්එම්එස් එකක් දැම්මා. චුට්ටක් කතාකරන්න ඕන කියලා. මැරෙයි කියලා හිතුන නිසා."

දේවක දරුණු දුකක් හිතේ තදකරගෙන කීවේය.

"මම දේ දැන් ගෙදර යන ගමන්."

"ෆ්ලයිට් එකෙන් දැන්ද බැස්සෙ තරූ."

"ම්. ටික වෙලාවකට කලින්. දන්නවද කෙල්ලව අරන් යන්න හදන්නේ කවුද කියලා."

"ම්."

"මෙන්දක කියන්නේ බෝධිසත්වයෙක් නෙමේ. මගේ කෙල්ලගේ ජීවිතේ ඉවරයි. මම කෙල්ල වෙනුවෙන් සටන් කරනවා. පුළුවන් වුනොත් මම කෙල්ලව බේරගන්නවා. ඒක කියන්න කතාකළේ."

දේවකට කතාකරගන්න පවා බැරිවිය.

"මම සුද්දිට කියාගන්න බෑ තරූ."

"කෙල්ලත් ආදරේ නෑ

කියලද හිතන්නේ. එහෙම කියලා කොල්ලෙක්ට දුකක් දීලා යන්න ඒකී කැමති නැතුව ඇති. මම පස්සේ ගන්නම්. මේ දැන් ගෙවල් ළඟ. මොනම දෙයක් නිසාවත් සීගිරි එක දාලායන්න එපා. මි"

"බෑ තරූ. සුද්දි නැති සීගිරි කන්දක මට බිතු සිතුවමක් වෙලා ඉන්න බෑ. සොරි. හරි ඉක්මනට මම යනවා."

තාරකාගේ දෑස් තෙත්විය.

"මං අයියට ගන්නම්. මි"

"මි. බුදු සරණයි."

දේවක මහා සුසුමක් සමඟ පිටකරමින් කීවේය. තාරකා නිවසට ආවේ ඇය ආ කැබ් රියටවත් මුදල් ගෙවන්නේ නැතුවය.

"මෙන්න මේක අර ටැක්සියට

දීපන් බං.”

ඇය මුදල් ගෙන නිවසේ උයන්නට ඉන්නා ලලිතාට කේන්තියෙන් දුන්නාය. ඊටත් පසුව අත රැඳි අත් බෑගය සැටියට විසිකළාය. කෙල්ල තවමත් ඉන්නේ එමිරේට්ස් ගුවන් සේවිකාවන් අඳිනා නිළ ඇඳුමිනි. එයවත් මාරුකරන්නට ඇය රැඳුනේ නැත.

# 35

"අම්මා තාත්තා අක්කා."

තාරකා බෙරිහන් දුන්නාය.

ඉඳුනිල් ආවේ දුවගෙනය.

"මොකද දරුවෝ මේ. ටිකක් ඉවසීමෙන් ඉන්නකෝ."

"මේ ගෙදර දවසක් දෙකක් නැතිවුනොත් ගෙදර ඉන්න උන්වත් විකුණනවනේ. කොහොම ඉවසීමෙන් ඉන්නද?"

තාරකා කෑ ගැසුවාය. මිලින්ද

ආවේ මුහුණ සඟවාගෙනය.

"ගිහින් ඇඳුම් මාරුකරගෙන එන්න."

ඔහු කීවේය.

"න්නෑ ඕන නෑ තාත්තා. මට කතාකරන්න ඕන."

"ඉතින් මද්දුට මම බෑ කිව්වද?"

මිලින්ද දුක්බරව ඇසුවේය. හැමෝම උන්නේ තවමත් හිටගෙනය. නේත්‍රා ආවේ අමාරුවෙන් රෝද පුටුව තල්ලුකරගෙනය. තාරකා ගොස් එය තල්ලුකරගෙනම ආවාය.

"මේ මගේ ලොකු අක්කා තාත්තා. මම ඇත්තට දැකපු සුරංගනාවී. මගේ බාබි ගර්ල්. ම..ගේ සුදු ප්‍රියංකා චොප්..රා"

තාරකා අඬමින් කීවාය. උඩ සිට භාවනා දුවගෙන විත් පඩිපෙළ

මඟ නැවතුණාය. ඒ තාරකාගේ කතාවටය.

"එහෙම මම ඇත්තටම දැකපු සුරංගනාවී තමයි මේ අද මෙහෙම රෝද පුටුවෙන් යන්නේ. කොච්චර දුකද කියලා ඔයා දන්නවද? මී කොච්චර දුකද? මම මේ මගේ කකුලක් දෙන්න පුළුවන්නම් මම මගේ අක්කට දෙනවා. ඔව්. දෙනවා. මේ බලන්න ඔයාගේ ලොකු දුව දිහා. මේකද එයාගේ ආදර කතාවේ අවසානයට දුන්න තෑග්ග. අපි වෙඩින් අරන් ලස්සනට දුන්න කෙල්ල. මතකද එදා. අපි මලුත් දැම්මා කෙල්ල යනකොට. මොකද වුණේ. තාත්තට මතකද?"

තාරකා අඬමින් ඇසුවාය. නේත්‍රාට පවා ඇඬුණි. මිලින්ද

වේදනාවෙන් බිම බලාගත්තේය. රඹුක්වැල්ල මහතා පැමිණි තාරකාව පුටුවෙන් ඉන්ඳවූවේය.

"අපි මැණික ඉඳගෙන කතාකරමු. මි. එහෙම කතාකරන්න බැරිදෙයක් අපේ පවුලේ නෑනේ පුතේ."

ඔහු කරුණාවෙන් කීවේය.

"මේක සීයා එක කෙල්ලෙක්ගේ ජීවිතේ සම්බන්ධ ප්‍රශ්නයක් නෙමේ. මේ පවුලේ එක කෙල්ලෙක්ට දෙයක් වුනොත් ඒ කියන්නේ අපි හැමෝගෙම ජීවිතේ සතුට ඉවරයි. එහෙමයි මම හිතන්නේ. අදටත් මම කොල්ලෙක්ව විශ්වාස කරන්නේ නෑ. කවදාවත් නෑ. ඇයි ඒ. මගේ අක්කට වෙච්ච දේ නිසා. උදේ හවා බුදු පහන තිබ්බ. පෝය දවසට ගිහින් සිල් ගත්ත. කවදාවත් නරක වචනයක්වත් කිසිම

කෙනෙක්කට කිව්වේ නැති. රහසින්වත් පවක් නොකරපු මගේ ලොකු අක්කට මෙහෙම දෙයක් එක බල්ලෙක් කළානම්. මට මොනවා නොකරයිද?"

තාරකා අඬමින් ඇසුවාය. ඉඳුනිල් තොල්පට තදකරගෙන බිම බලාගත්තාය.

"මම ඔයාටයි මගේ සීයටයි පණ වගේ ආදරෙයි. පණ වගේ. මම මේ ලෝකේ දැකපු රත්තරන්ම පිරිමි දෙන්නා ඔය දෙන්නා. කවදාහරි මාත් බඳියිනේ. ඒත් මගේ මහත්තයටවත් මම ඔයාලට තරම් ආදරේ කරන්නේ නෑ. එහෙම වෙන්නත් බෑ එයාලට. ඒ නිසා සුදු තාත්තේ. මට ඉල්ලීමක් කරන්න තියෙනවා. එක ඉල්ලීමක්."

තාරකා කීවාය.

"කියන්න මද්දු."

මිලින්ද මෘදුව කීවේය.

"තාත්තට මේ වෙලාවේ තියෙන වගකීම් වැඩියි. මම ඒවා හොඳට දන්නවා. සුද්දිව අපි බන්ඳලා දෙමු. මටත් හරි ආසයි මේකී මනමාලියෙක් වෙලා ඉන්නවා බලන්න. හරිම ආසයි. මමයි කෙල්ලට හැමදේම අරන් දෙන්නේ. මම ඒකීව ඩුබායි එක්කගෙන ගිහින් වෙඩින් සාරිය අරන් දෙන්නේ. මමයි ඒක කරන්නේ. අපි කෙල්ලව බන්ඳලා දෙමු. කමක් නෑ."

භාවනා කඳුළු හිරකගෙන බලාගෙන උන්නාය. 'ඔයා මොනවද මේ කියන්න යන්නේ අක්කේ'

"ඒත් තාත්තා සුද්දිව මෙන්දක සූරියආරච්චිට දෙන්න බෑ. කවදාවත් බෑ. දුන්නොත්. මම එදා ඉඳලා

මේ ගෙදරට එන්නේ නෑ. මෙන්දක කියන්නේ කවුද කියලා දන්නවද? තාත්තා හොයලා බැලුවද. ටයිල් සල්ලි ගොඩ. එච්චරයිනේ බැලුවේ. නෑ තාත්තා. මෙන්දක කියන්නේ හොඳ කොල්ලෙක් නෙමේ. මේ අහිංසක මගේ කෙල්ලව මම ඒ වනචර  පර බල්ලට දෙන්නේ නෑ. මම කවදාවත් ඒක වෙන්න දෙන්නේ නෑ. දැන් කතාකරලා අහන්න සූරි අන්කල්ගෙන් කවුද රශ්මි කියන්නේ කියලා. කෙල්ලට මොකද වුනේ කියලා අහන්න. අහන්න."

තාරකා කීවාය. භාවනාට පුදුම සිතුණි. මිලින්දද බැලුවේ පුදුමයෙනි.

"කවුද රශ්මි මද්දු."

"මෙන්දක සූරියආරච්චිගේ වයිෆ්. දික්කසාද වයිෆ්. ඒවා ටයිල්

ගොඩවල්වලින් වැහුවා. ඒ කෙල්ල නොවිඳිනා දුක් වින්ඳා. මම මේ එන ගමන් රශ්මිට කතාකළා. කෙල්ල දැන් ලංකාවේ නෑ. ඒත් මම නම්බර් එක හොයාගත්තා. මම කතාකළා. කෙල්ල දැන් මෙයාගෙන් ඩිවෝස් වෙලා ඉන්නේ. ඒක මහ නරක කතාවක්. එයා ඉල්ලුවේ එක දෙයයි. අනේ අහිංසක කෙල්ලෙක්නම් මෙයාට දෙන්න එපා කියලා. මූ මරයි කිව්වා. එහෙම නිස්කලංකයේ පවුල් ජීවිතයක් ගෙවන්න දන්නේ නැති අස්ප රේස් කාරයෙක්ට අහිංසක කෙල්ලෙක්ට පවුල් කන්න බෑ කිව්වා. ගොඩක් දේවල් කිව්වා. ඒ කෙල්ල කිව්ව දේවල් නෙමේ මම ඇහුවේ. මම වටින් පිටින් හැමදේම හෙව්වා. අන්තිමටයි මම රශ්මිට කතාකළේ. කිව්වේ නෑනේ රශ්මි ගැන. මෙයා

කළින් මැරිකරපු කෙනෙක් කියලා. රට වටේම ගෑණු. තාත්තා අද යන් මාත් එක්ක බිලූ එළිෆන්ට් ක්ලබ් එකට. අපිට මෙන්දකගේ වැඩ බලාගන්න පුළුවන්. මේ අපි වඩලා වඩලා හදපු මල උෟට දෙන්න. ටයිල් සල්ලි ගොඩකට යට කරන්න. එහෙම කොහොමද තාත්තා හිතුවේ. එකපාරම. බර්ත් කන්ට්‍රෝල්ස් සාක්කුනේ දාගෙන රෑට නයිට් ක්ලබ් යන බල්ලෙක්ට මේ පිච්ච මල් දෙන්න. මේම අරන්"

මිලින්ද කිසිවක් කීවේ නැත. ඔහු මේ කිසිවක් දැනගෙන උන්නේ නැත.

"මේ මෙන්දක ගැන නේද ඔයා ඔය කියන්නේ."

"ඔව් තාත්තා. මේ මෙන්දක සූරියආරච්චි තමයි. මේ ඊයේ

පෙරේදා ඇවිත් මඟුල් කතාකළේ. එයා තමයි. එහෙම කොලේ වහලා කසාද කතාකරන සිරිතක් නෑනේ. මේ අපි සීගිරි එකේ බඩුවක් විකුණන කොටත් එක්ස්පයරි ඩේට් බලලා දෙන්නේ. මෙච්චර වටින කෙල්ලව දෙනකොට මොනවත් බලන්නේ නෑ. එයා එක කෙල්ලෙක්ගේ ජීවිතේ විතරක් නෙමේ විනාශ කළේ. හෙට අනිද්දා වෙනකොට අපට ගොඩක් දේවල් ආරංචිවෙයි. එතකොට වෙන්න තියෙන දේ වෙලානම් තාත්තට බාල දුවත් වීල් චෙයාර් එකක ඉන්නවා බලාගෙන ඉන්න වෙයි. මොකක්ද මේ පවුල කරපු පව. මට නිකන් කියන්න. ඇයි අපිට අපේ කෙල්ලව කෙල්ලට ආදරේ කරන කොල්ලෙක්ට දෙන්න බැරිඇයි බැරි”

තාරකා ඇසුවාය. ඇය

අවසානයට බැලුවේ රඹුක්වැල්ල මහතා දෙසය.

"සීයා."

"කියන්න පුතේ."

"අදින් අවුරුදු විසි ගාණකට කලින්."

ඇය මේ මොනවා කියන්නට යනවාදැයි භාවනා සිතුවාය.

"ම්."

"මේ ගෙදරට මේ වගේම දෙයක් වුණා. ඔයා පොඩි නැන්දිව කෙනෙක්ට බන්දලා දෙන්න ගියා. නේද? ඒත් පොඩි නැන්දි මොකද කළේ. එයා ආදරේ කරපු කෙනත් එක්ක ගියා. අන්තිමට අපට එයාව නැතිවුණා. ඒ බාප්පවත් නැතිවුණා. පොඩි නැන්දිට පුතෙක් හිටියලු. එයාවත් නැතිවුණා. අපි අපේම අයව

නැතිකරගන්නවා. කවුද දන්නේ අපිට හෙට අනිද්දා කවුරුද නැතිවෙයිද කියලා. ටිකක් පරිස්සමින් ජීවිත ගැන තීරණ ගන්න ඕන නේද? මේ ටයිල් මිටිය දැකපු ගමන් කෙල්ලෝ දෙනවද අරන් පලයන් කියලා. මට කියන්න සීයා. සල්ලි කන්දක් දැකපු ගමන් එහෙම කරන්න එපා. අපිට අමාරුයි. මම දන්නවා. සීගිරි එක වැටිලා. ඒකත් දන්නවා. තාත්තගේ ඔළුව පිස්සු වගේ. ඒත් එහෙම වුණා කියලා මෙහෙම කරන්න එපා. තාත්ති හිතනවද තාත්තගේ පොඩ්ඩුව මේ සල්ලි කන්දක් පතාගෙන ඉන්නේ කියලා. අනේනෑ. සාමාන්‍ය කොල්ලෙක් එක්ක පොඩි කඩේකට ගිහින් මේකී ආප්ප කන්නයි ආස. මුකුළුවක් දාගෙන. මං දන්නේ නැද්ද මේකී ගැන. එහෙම එකේ

තාත්තා මේවා ඔළුවේ තියාගෙන දුක් විඳිනවා. දෙන්නම ඕනනම් කෙල්ලව දෙන්න. ඒත් මෙන්දකට දෙන්න බෑ. නෙවර්. ඒක කරන්න එපා. ප්ලීස්. එක කෙල්ලෙක්ගේ ජීවිතේ විනාශ කරපු මිනිහට තවත් කෙල්ලෙක්ගේ ජීවිතයක් දෙන්න බෑ. පිරිමි හරිම අසික්කිතයි. ඒක මම හොඳට දන්නවා. මේකීව මේ කුණාටුවට දාන්න එපා. ටික දවසක් ඉන්න දෙන්න. අපි හොඳ කෙනෙක්ව බලමු. අනේ හිනාවෙලා හිටපු කෙල්ලනේ. මේ මොනවද කරන්නේ. මොකක්ද අපේ පවුලට මේ වෙන්න යන්නේ. හැමදාම සිකුරාදාට අක්කා ආවා. එන දවසට මෙ ගේ මළගෙයක්. මේ මූණ පුරා සොහොන් ලකුණු තිබ්බා. ඒවා පුපුරලා ගියා. අන්තිමට මේ ඒ දේ මේ කෙල්ලට වෙන්න දෙන්න

එපා. එහෙම වෙන්න දෙන්නෙත් නෑ තාත්තා. ඔයාලා දෙන්නා අපිව හැදුවා තමයි. ඒත් අපිටත් මේකී ගැන ආදරයක් තියෙනවා. ප්ලීස්."

තාරකා හුස්මක්වත් නොගෙන කීවාය.

"එක දෙයක් විතරක් අන්තිමට කියන්නම් තාත්තා. මෙයාගේ කළින් වයිෆ් කියපු දෙයක්. එක දෙයක්."

"ම්."

"සූරියආරච්චිලාගේ ගෙදර බිමට අල්ලලා තියෙන්නේ ඉටලියන් ටයිල් එකක්ලු. තාත්තා දැකලා ඇති. හරි ලස්සනයිලු. මැද මීර එකක්ලු."

මිලින්ද හිස වැනුවේය. එසේම මේ තාරකා කියන කතාව බොරුවක් නොවන බවද ඔහු ඉන් තේරුම් ගත්තේය. සූරියආරච්චිලාගේ ගෙදර

ගිය දවසේ මේ ටයිල් එක දෙස මිලින්ද බලාගෙනම උන්නේය. ඒ එය ඒ තරම්ම ලස්සන නිසාය.

"ඒ ටයිල් එකක් එකක් ගානේ එයාගේ කඳුළු වැටිලා තියෙනවා කිව්වා. හැම ටයිල් එකක් ගානෙම. හෙට ඔයාගේ නංගිගේ කඳුළු වෙන්න පුළුවන් කිව්වා ඒකේ වැටෙන්නේ. එදාට හිතෙයි කිව්වා ටයිල් නෙමේ බිම ගොම මැටි දාපු ගේක හරි ඉන්න අහිංසක කොල්ලෙක්ට නංගිව දුන්නානම් අද මේ ගින්දර නෑ නේද කියලා. එහෙමම කිව්වා. එහෙම කුහක කෙල්ලෙක් නෙමේ. හරිම හොඳ කෙල්ලෙක්. දැන් කම්පනි එකක ලොකු පඩියක් ගන්න කෙල්ලෙක්. ආයෙත් මැරිකරලා ලස්සන දුවලා දෙන්නෙක් ඉන්න කෙල්ලෙක්. එහෙමයි කතාව. තාත්තා

කැමති දෙයක් කරන්න. මම දන්න දේ කිව්වා"

තාරකා හතිය පිටින්ම සාලයෙන් ගියාය. ඇය කිසිවෙක් දෙස බැලුවේ නැත. බලන්නට ඇයට ඕනා වූයේද නැත.

"වරෙන්."

පඩිපෙළ දිගේ යද්දී තාරකා කෙල්ලගේ අත කොනිත්තාගෙන කියාගෙන ගියාය. භාවනා එක දශමයක්වත් නොසෙල්වී බලාගෙන උන්නාය.

මිලින්ද කතාකළේ නැත. ඔහුට අද මහා වේදනාවක් හිතට ආ දවසකි. ඊයේද මේ දුක මෙහෙමමම ඇති විය. ඒ භාවනා සමඟ තනිවී කතාකළ පසුවය. අද ඊයේ පෑරුන තුවාලය අලුත් විය. ඒ මද්දුම දූ

නිසාය.

"පුතා."

රඹුක්වැල්ල මහතා කරුණාවෙන් කතාකළේය.

"අපිට ටිකක් හොයාබලන්න තිබුණේ පුතා."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මම සූරිලව විශ්වාස කළා තාත්තේ."

"නෑ පුතා. මිනිහා හරි හොඳ මනුස්සයා. ඒත් ඒ නිසාම."

"ඇත්ත. මමත් දන්න කීපදෙනෙක් ඉන්නවා. හොයලා බලනවා. ඒ නැතත් තාත්තේ."

මිලින්ද බැලුවේ පඩිපෙල් බිම ඉඳගෙන උන් භාවනා දෙසය.

"මම අද එයාලට කියනවා. අපිට ටිකක් අමාරුයි කියලා."

මිලින්ද කීවේය. භාවනා පඩියක් බැස ආවාය.

"තාත්තා."

ඇය හිමිහිට කතාකළාය.

"මම මැරිකරන්න ඕනනේ තාත්තා ඒත්. අපි හොඳ කෙනෙක්ව බලමු. මම යන්නම්."

භාවනා පැහැදිලිව කීවාය. මිලින්ද ඇයව පපුවට ළංකරගත්තේය.

"ඔයා එහෙම කියන්න එපා."

මිලින්ද අඬමින් මෙන් කීවේය.

ඉඳුනිල් දෑස් පහතට කළාය. තාත්තලා දුවලාට ආදරය වැඩිය. මේ හැමදේකටම මුල ඒකය.

"මම තරහකින් නෙමේ තාත්තා කියන්නේ. මම යන්නම්. මට හැමදේම තේරෙනවා."

ඇය යළිත් කීවාය.

"නෑ පුතේ. එහෙම කියලා දුක වැඩිකරන්න එපාඅද මට හරි දුක දවසක්."

තාරකා ඇඳුම් මාරුකරගෙන ආවාය.

"තාත්තට දුක ඇයි. මද්දු කතාකරපු නිසා. ඇයි තාත්තට සතුටු නෑ මේකීගේ ජීවිතේ බේරුනා කියලා."

තාරකා කෙළින්ම ඇසුවාය.

"මට හිතන්න තිබුණා තමයි මද්දු."

තාරකාගේ ඇස්වල අලුතින් කඳුළු මතුවිය.

"ඔයා තරම් හිතන තාත්තා කෙනෙක් මේ තුන් ලෝකෙම නෑ තාත්තා. අපිට ඒ ගැන කියන්න එපා. මේ ආපු මිනිස්සුයි හොඳ නැත්තේ."

ඇය පැහැදිළිව කීවාය.

"අනික තාත්තා අපිට ඉස්සරහට හොඳ කාලයක් උදාවෙයි. එහෙමම අපි වැටෙන්නේ නෑ. සීගිරි එකත් එහෙම වැටෙන්නේ නෑ. එනකොට දැක්කේ මම. සීගිරි එක අලුතින් හැදෙන විදිහ පුදුම ලස්සනයි."

තාරකා මේ ටික කීවේ දේවකවත් සිතේ තබාගෙනය.

"ඒක ඇත්ත පුතේ. මටත් ඒ අපේ සීගිරි එකද කියලා හිතාගන්න බෑ දැන්. කොල්ලා ඒක ලස්සනට කරනවා."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මේ රටේ ඒ වගේ දක්ෂ කොල්ලෝ දෙතුන් දෙනෙක් තවමත් ඉතුරුවෙලා ඉන්නවා සීයා. තාමත් මේ රට ලස්සන ඒකයි."

භාවනාට පුදුමත් සිතුණි. 'අක්කා ඇයි දේවකයියා ගැන මෙච්චර පැහැදීමෙන් කතාකරන්නේ. මේ වෙලාවේ.' ඇය සිතුවාය.

"මම මේ වෙලාවේ තාත්තටයි අම්මටයි සීයටයි පොරොන්දු වෙනවා. කවදාවත් මම මගේ පවුල අමතක කරලා හිතුවක්කාර තීරණයක් ගන්නේ නෑ කියලා. ඒ වගේම අක්කයි සුද්දියි ගැන මීටත් වඩා හොයලා බලනවා කියලත් පොරොන්දු වෙනවා. කොච්චර උඩ ගියත් මගේ හිතත් තියෙන්නේ මේ ගෙදර. උඩ යන්න ගත්තට පස්සේ තමයි ඒක දැනගත්තේ."

තාරකා අඬමින් මෙන් කීවාය. ඉඳුනිල් පැමිණ කෙල්ලගේ හිස අතගෑවාය.

“මී දැන් අඬන්න එපා. අද හැමෝම අඬ අඬ හරි එකට එකතුවෙලානේ ඉන්නේ. නේද තාත්තේ.”

ඉඳුනිල් කීවාය. රඹුක්වැල්ල මහතා සිනාසුණේය.

“ඒක තමයි. මම කෑම ටිකක් ගෙන්නන්නම්.”

භාවනා කොර ගසමින් මෙන් ආවාය. සියල්ලෝම බලාගෙන උන්නේ ඇය දෙසය. කෙල්ල ඇවිත් මිලින්දව බදාගත්තාය.

“මාත් පොරොන්දු වෙන්නම්. කවදාවත් ඔයාලා කියන දේකට පිටින් යන්නේ නෑ කියලා”

ඇය අඬමින් මෙන් කීවාය. මිලින්ද කෙල්ලව තවත් තදින් බදාගෙන ඇගේ හිස අතගෑවේය.

"පොඩි අක්කා කිව්වා වගේ ඔයා සතුටින් ඉන්නයි ඕන. අද මමත් ඔයාට පොරොන්දුවක් වෙනවා. මේ හැමෝම ඉස්සරහ. ඔයාට සතුටින් ඉන්න පුළුවන් කෙනෙක්ව දවසක ඔයා එක්කගෙන එන්න. අම්මයි මමයි සීයයි අක්කලා දෙන්නයි බලලා ඒ පුතාව පිළිගන්නවා."

මිලින්ද එහෙමම කීවේය. කෙල්ල හැමදේම අමතකකර තමා කියන කෙනා එක්ක යන්නට කැමති වූ මනුස්සකම මිලින්ද අමතක කළේ නැත.

"මේ ලෝකේ ඉන්න හොඳම තාත්තා මට ඉන්නේ"

භාවනා අඬමින්ම කීවාය.

"මට ඔයාලා ගැන බලන්න ඕන. සීයා ගැන. අක්කලා ගැන

බලන්නෝන. මගේ හුස්ම ටික වැටෙන්නේ එතකොට තාත්තා.”

නේත්‍රාගේ දෑස්වල කඳුළු අලුත්විය.

“අපි ඒක දන්නවා සුද්දි.”

“මම කොහොමහරි අක්කවත් සනීපකරගන්නවා.”

භාවනා කීවාය. මිලින්ද කෙල්ලගේ හිස අතගාමින් බැලුවේ නේත්‍රා දෙසය.

“වෙද මහත්තයා ළඟට එක්කගෙන යනවා කිව්වනේ. නේද මැණික.”

“ම්. මේ වැඩ නිසා ඒක පස්සට දාගත්තා.”

“එහෙම එපා. ඒක කරන්න.”

“කරනවා තාත්තා. අනික ඔයා අපිව දෙන්න කියලා ගොඩක්

මහන්සිවෙන්න එපා. අපිව එහෙම දෙන්න හිතන්නත් එපා. ඇයි මෙච්චර ආදරෙන් අපිව හදලා පිටට දෙන්නේ. අපි දවසක හොඳ අයියලා තුන්දෙනෙක්ව ගෙදරටම ගේමුකෝ. එතකොට ෂෝක්නේ. තාත්තා හිතන්නකෝ එහෙම වුනොත් මේ ගෙදර කොච්චර ලස්සන වෙයිද කියලා. අපි ටික ඇතිනේ එතකොට"

ඉඳුනිල් ලස්සනට සිනාසුනාය. 'මේකී කපටි කෙල්ල' ඈය සිනාසුනේ නේත්‍රා දෙස බලාගෙනය.

"ඒකත් නරකම නෑ නේද පුතා."

රඹුක්වැල්ල මහතා කීවේය.

"එහෙම අපිත් එක්ක වැටිලා ඉන්න කොල්ලෝ එයිද තාත්තේ."

ඔහු ඇසුවේය.

"එහෙම කියනවානම් අපිත් ඒ

ගැන හිතන්නම්. නැත්තෙමත් නෑ නේද සුද්දියේ."

තාරකා ඇඟට පතට නොදැනී කීවාය.

"ම්."

කෙල්ල වැඩිය කියෙව්වේ නැත.

"තාත්තා බලන්නකෝ දවසක. මේ ගෙදරට අපි ලොකු අයියා කෙනෙක්ව එක්කගෙන එනවා. ෂෝක් අයියා කෙනෙක්ව. අපි ලොකු අක්කගේ ස්වීට් හාට්. එයා එනවා තාත්තා."

නේත්‍රා ඉහුලුම් නොදෙන දුකකින් මෙන් බලාගෙන උන්නාය.

"මට හොඳ මල්ලිලා දෙන්නෙක් ආවොත් ඇති."

ඇය ඇඬුම්බරව කීවාය.

"එහෙම කියන්න එපා. අපි ඔයාගේ දෛවයම වෙනස් කරනවා

ලොකු අක්කේ. සීයා එක දෙයක් කරලා දෙන්න."

"කියන්න පුතේ."

"සීගිරි එකේ ඉහළම තැන අක්කව තියන්න. ඒ ඇති."

නේත්‍රාට පුදුම සිතුණි. රඹුක්වැල්ල මහතා සිනාසුනේය.

"ඒක හෙටම කරන්නම් පුතේ"

"අනේ සීයා මට."

"ඒකට නියම සුදුස්සා ඔයා තමයි ලොකු පුතේ. මම මුලින්ම අතට ගත්තේ ඔයාව. එදා මගේ හිතට ආපු සතුට කොච්චරද කියලා ඔයාලා දන්නේ නෑ"

නේත්‍රා ඇඬුවාය. අද සීගිරි පවුලම අඬපු දවසකි.

# 36

තාරකා කෙල්ලව බදාගෙනම නේත්‍රාගේ කාමරයට ඇදගෙන ගියාය. භාවනා තාරකාව බදාගෙන විනාඩි දහයක් පමණ ඇඬුවාය. නේත්‍රාත් තාරකාත් කෙල්ලව අමුතුවෙන් සනසන්නට ගියේ නැත. ඇය අඬන්නේ දුකකට නොවන බව දෙදෙනාම දැනගෙන උන්නෝය.

"ඔයාට ගොඩක් පින් මගේ පොඩි අක්කේ. ගොඩක් පින්."

භාවනා අඬමින්ම කීවාය. තාරකා කෙල්ලගේ කඳුළින් තෙමුණු මුහුණ දෝතට ගෙන පසුව එය ලස්සනට පිසදැම්මාය.

"අපි එහෙම උඹට අඬන්න දෙන්නේ නෑ. කවදාවත් නෑ. ඒත් මෙච්චර ලේසියෙන් ජීවිතේ අල්ලගත්ත දේවල් අතාරින්න පුරුදුවෙන්නත් එපා. කෑගහලා හැපියන්."

තාරකා කීවාය.

"මම කොහොමද තාත්තා එක්කඒ අසරණ මූණ දිහා බලාගෙන."

ඇය කීවාය.

"තාත්තටත් අද දුක හිතුනේ ඒකයි. උඹ එයා වෙනුවෙන් හැමදේම පරිත්‍යාග කළා කියලා දන්න නිසා. ඒකනේ අරම කිව්වේ"

"පොඩි අක්කා"

"ම්."

"ඇත්තටම මෙන්දක එහෙම."

"ම්. සම්පූර්ණ ඇත්ත. මම හැමදේම හෙව්වා. උඹ වෙනුවෙන්. මේ ඉන්නේ ඒ කෙල්ල. වට්ස් ඇප් එකට කෙල්ලගේ නම්බර් එක දාගත්තට පස්සේ මේ පින්තූරේ දැක්කේ."

වට්ස් ඇප් හී රශ්මිගේ නමත් සමඟ ආ ඇගේ පින්තූරය තාරකා පෙන්නුවාය.

"ලස්සන අක්කා කෙනෙක්නේ"

"ඒකනේ. මූට මෝල් කලන්තේ. උඹව දැකලා උඹට ආස වුණා. හෙට තවත් කෙල්ලෙක්ට ආසවෙනවා. දැන් ඒක වැඩක් නෑ"

තාරකා කීවාය.

"ජීවිතේ වෙනුවෙන් ෆයිට් කරන්න ඉගෙන ගනින්"

"මට මගේම අය එක්ක එහෙම කරන්න දන්නේ නෑ."

"හරි. උඹ වෙනුවෙන් මම ඒක කළානේ. නැත්නම් මෙතන සුදු කොඩිනේ සුදූ."

භාවනා බිම බලාගෙන හිස වැනුවාය.

"ඔව් හිතම මළ ගෙයක්."

ඇය අවංකව කීවාය.

"මී. අරන් කොල්ලට කියපන් ප්‍රශ්නේ දැන් සෙට්ල් කියලා. නැත්නම් උඟත් පව්නේ."

තාරකා ඇගේ දුරකථනය ගෙන භාවනාට දුන්නාය.

"කවුද කොල්ලා පොඩි අක්කේ"

තාරකා සිනාසුනාය. නේත්‍රා තොල්

පට තදකරගත්තාය.

"උඹ මෙච්චර කරපු අපටනේ මේ කොලේ වහන්නේ. මේ සුදූ. බොරු බෑ. හරි. ඇත්ත කතාකරපන්. මේ අපි අක්කලා දෙන්නා. මේ මූණ බලාගෙන කියපන්. කොල්ලට ලව්නේ. සීරියස් ලව්නේ. මාරම ලව්නේ ආ."

තාරකා ඇසුවාය.

"දේවකයියා ගැනද අහන්නේ"

භාවනා ඇසුවාය.

"ඔ. චි ඔව් දේවකයියා ගැන තමයි. උඹ මොනවත් නොදන්න තොත්ත බබා. වරෙන් හරහට අරන් කුක්කු ටිකක් දෙන්න"

තාරකා දත් මිටි කාගෙන මෙන් කීවාය.

"කියපන් ඇත්ත. කාමරේ දොර වහලා තියෙන්නේ. ඇත්ත කියපන්."

ඇය ඇසුවාය.

"මිගොඩක් ආදරෙයි එයාට. ඒත් මම ඒ පිස්සට ඒක කිව්වේ නෑ. පව්"

භාවනාගේ උගුර සිරවී ඇයට ඇඬුණි. නේත්‍රා ඇගේ හිස පපුවට තබාගත්තාය.

"ආදරේ කියන්න ඕන නෑ පැටියෝ."

නේත්‍රා සන්සුන්ව කීවාය.

"මී. උඩට ගිහින් කොල්ලට ගනින්. ඒකා තැම්බෙනවා ඇති පව්නේ."

භාවනා නේත්‍රාගේ ඇදෙන් බැස්සාය. පසුව එහෙමම පහත් වී නේත්‍රාගේ දෙපා සිපගත්තාය.

"අනේ සුදූ."

නේත්‍රා කීවාය. ඊළඟ තත්පරයේදී ඇය බිම පහත් වී තාරකාටද වැන්ඳාය. තාරකාට ඉහිලුම් දුන්නේ

නැත. ඇය කෙල්ලව බදාගත්තාය.

"උඹ පව් පැටියෝ."

තාරකා කෙල්ලව බදාගෙන ටික වෙලාවක් ඇඬුවාය. නේත්‍රා සැනසුම් සුසුමක් හෙළුවාය.

# 37

නුවර යනතුරු දේවකත් සමඟ වචනයක්වත් කතාකරන්නේ නැතැයි ඇය සිතාගත්තාය. එහෙත් ඇය කෙටි පණිවිඩයක් දේවකට දැම්මාය.

"හවස හතරට පේරාදෙණියේ යනවා. තියෙන වැඩක් බලලා උදේ ඉවරකරන්න. මම හතරට අක්කත් එක්ක සීගිරි එකට එනවා. සුද්දි"

කෙල්ල යැව්වේ එපමණාය. හදවතට මේ දැනෙන සැනසීම

වෙනස්ම ලෙස විඳගන්නට ඇය ආසය. ටිකෙන් ටික එය සමරන්නට ආසය. ජීවිතයට හදිස්සියේ දුකක් පැමිණ එය නැතිවීමත් එක පැත්තකින් සතුටකි.

"ඔයා කොච්චර පිච්චෙනවා ඇත්ද කියලා මට හිතාගන්න පුළුවන්. තවත් ටික වෙලාවක් එහෙම පිච්චෙන්න දේවකයියේ. ගොඩක් පිච්චෙන්න. මම එක චූටි දෙයක් කියලා ඔයාගේ ඒ ගිනි ගොඩම නිවන්නම්. අද රෑට."

භාවනා සිතුවාය.

කෙල්ලගේ එස්එම්එස් පණිවිඩය ලැබෙද්දී දේවක උන්නේ සීගිරි එකේමය. ඔහුද උන්නේ ඉක්මනින් වැඩ ටික අවසන් කරමිනි. අලුතින් නිමවෙන සීගිරි එකේ

ලස්සනවත් දේවක බැලුවේ නැත. ඒ ලස්සන් බලන්නේ ඇය සීගිරි එකට ආවොත්ය. ඇය එන්නේ නැත්නම් ලබන සතියේ සීගිරි එක යළිත් විවෘතකළ පසුව එයට සදහටම සමුදෙනවා කියා දේවක සිතාගත්තේය.

"අද හවසට පේරාදෙණියේ යනවා. ඒත්."

දේවකට ඇයගේ කෙටි පණිවිඩය හරියට තේරුම් ගන්නට බැරිවිය. ඒත් ඔහු කෙල්ලට ගත්තේ නැත. 'ඔයා මේ එස්එම්එස් එකක් එවලා කියන්නේ මට කතාකරන්න එපා කියලා' දේවක තේරුම් ගත්තේය. ඇය නේත්‍රාට ගත්තාය.

"අක්කා මම දේවක"

"කියන්න මල්ලියේ"

"මේ සුද්දි එස්එම්එස් එකක් එවලා. හවසට පේරාදෙණියේ යනවා කියලා."

"ඔව් මල්ලියේ. අපි යමු. අපි හතරට එනවා."

දේවක කෝල් කරාවීයැයි භාවනා නේත්‍රාටද කීවාය. 'මොනවත් මේවා කියන්න එපා අක්කා.' කෙල්ල හදන්නේ ඇගේ කටින්ම එය කියන්නටය. ඇගේ අහිංසක ආසාවල්වලට නේත්‍රා බාධා කළේ නැත.

"හවස ඉන්නකෝ මල්ලියේ. මී. වරද්දන්න එපා."

"හොඳයි අක්කේ. මං ඉන්නම්"

"බුදු සරණයි."

දේවක සීගිරි එක පුරාම අනාථයෙක් සේ ඇවිද්දේය.

'මොනවද වෙන්නේ කියලාවත් මට කියන්නේ නෑනේ සුද්දියේ.' ඔහු සිතින් කීවේය. කෙසේ හෝ හවසට නුවර යනවා කියා දේවක සිතාගත්තේය. ඔහු හැමදේම අමතක කර වැඩ ටික ඉක්මන් කළේය.

හදිස්සියේම යමක් මතක් වී ඔහු යළිත් කෙටි පණිවිඩයක් භාවනාට දැම්මේය.

"සුද්දි රෑට අපි නවතිනවානම් හොටෙල් රූම් එක බුක්කරන්න ඕන නේද?"

ඔහු යැව්වේ එපමණය. නැත්නම් මේ කෙල්ලෝ දෙන්නෙක් සමඟ රාත්‍රියේ හෝටල් කාමර සොයමින් යන්නට සිදුවෙයි. එය අමාරුය.

"එදා අපි හිටපු රූම් එකම බුක්කරන්න. ඒකම. රූම් නම්බර් ටූ

ෆයිව් සීරෝ.”

ඇය තත්පරයක් තුළ එව්වාය. දේවකට පුදුම සිතුණි. ‘ඔයාට ඒ හිටපු රූම් නම්බර් එකත් මතකයි. මේ පිස්සු කෙල්ලෙක්නේ. ඇයි මෙහෙම. චුට්ටක් කතාකරන්න බැරිද සුද්දි.’ කිසිවක් නොසිතා දේවක හෝටලයට කතාකර එම කාමරයම ගත හැකිදැයි ඇසුවේය. වාසනාවට එය තිබුණි. දේවක එයම බුක් කළේය.

“හරි සුද්දි ඒක කළා. සේම් රූම්.”

ඔහු යැව්වේය.

“තැන්කියු”

කෙල්ල එව්වාය.

“වෙල්කම් සුද්දි”

දේවක යැව්වේය. භාවනා ඇඳට වී එය කියෙව්වේ තොල්පට

තදකරගෙනය.

"මගේ බූරු පැටියා. හරක් රැළ"

ඇය සිනාබරව මිමිණුවාය.

හදවතේ මේ ඇති සතුට තියාගන්නේ කොහේද? භාවනා ඇඳේ පෙරළෙමින් සිතුවාය. මේ දෛවය පොඩි අක්කා පැමිණ වෙනස් නොකළානම් අද හදවතම කාන්තාරයකි. ඒ කාන්තාරය මැදම තමාගේ ජීවිතය පිච්චී අළුවී යනු ඇත. 'මම ඔයා වෙනුවෙන් තාත්තේ ඒ දුකක් විඳින්න බලාගෙන උන්නේ. ඔයා වෙනුවෙන්. මේ සීගිරි පවුල වෙනුවෙන්. මම මගේ පළවෙනි අහිංසක ආදරේ සීගිරි එකේ දොරකඩ නන්නාඳුන කෙනෙක් වගේ දාලා ආවේ.' භාවනා සිතින් කීවාය.

දේවක පුංචි බණ්ඩාර. ඔහු මේ සීගිරි එකට ආ පළවෙනි

දවස භාවනා සිහිකළාය. ඒ අදින් තෙමසකට පෙරය. මේ දින අනූවක කාලය තුළ කොතරම් නම් දේවල් සිදුවුණාද? 'ඒක අවුරුදු තුනක් වගේ මට හිතෙන්නේ ඇයිඊටත් වඩා කාලයක්. ආත්ම තුන්සීයක් විතර ඔයත් එක්ක හිටියා වගේ පුරුද්දක් මට ඇතිවෙන්නේ ඇයි' භාවනා ඇඳට වී සිතුවාය.

දේවක පුංචි බණ්ඩාර සීගිරි හී ප්‍රවර්ධන කළමනාකරු සම්මුඛ පරීක්ෂණයට පැමිණ කියූ දේවල් භාවනා සිහිකළාය. "මට මිස් සීගිරි එකට ඇතුල්වෙච්ච හැටියේම දැනිච්ච දේ තමයි චුට්ටක් පාළුයි කියලා. මොකක්ද සිරියක් අසිරියක් නැති ගතියක් පෙනුනා. මම හිතන විදිහට මිස් සුපර් මාර්කට් එකක් ඇතුලේ පොඩි කානිවල් එකක

ගතියක් තියෙන්න ඕන. එහෙන් මෙහෙන් අතරින් පතරින් බැබලෙන ගතියක්. මම කියන්නේ මේ ලයිට්ස් දාන්න ඕන කතාවක් නෙමේ. අපි කියන්නේ සෝබාව දේ මෙපුර සිරි විසිතුරු බලන් මිතුරු මඟ පියකරු වූ. කියලා. මේක එකම සල්පිළක් වෙන්නෝන මිස්. එක එක කතන්දර සුපර් මාර්කට් එක ඇතුලේ තියෙන්න ඕන. සීගිරි එකේ ස්ටාෆ් එක ඔහේ තැන තැන හිටියේ මිස්. එහෙම කියලා එයාලා සේල් එක ප්‍රමෝට් කරන්නේ නෑ. මම එදා දැකපු විදිහට දොළොස් දෙනෙක් හිටියා එහෙම කැරකි කැරකි. ඒ අය අතරින් හතර දෙනෙක් හිටියේ මොබයිල් කෝල්ස් වලවී ශ්‍රමය සර් අපරාදේ කියලා මට හිතෙන්නේ. එක්කෙනෙක්ව අපට දාන්න පුළුවන්

ස්පෙෂල් වෙජිටබල් ඔයිල් එකක් ප්‍රමෝට් කරන්න. ඔයිල් කම්පනි එකට කතාකළොත් එයාලා අපිට සම්පූර්ණ සහය දෙයි. අපි ටේබල් එකක් දානවා සර්. එතන ලස්සනට පොඩි ගෑස් එකක් තියලා අපි ඔයිල් පෑන් එකක් රත්කරලා මොනවාහරි පොඩි දෙයක් ෆ්‍රයි කරකර දෙනවා. ඒ ටේබල් එකේ පැත්තකින් අපි වෙජිටබල් ඔයිල් එකත් තියනවා. අපි හිතමු සර් අපි ෆ්‍රයි කරලා දෙන්නේ කට්ලට් එකක් කියලා. ඒ කොස්ට් එක අපරාදේ යන්නේ නෑ. එදාට අපිට වෙජිටබල් ඔයිල් දෙසීයක් තුන්සීයක් සේල් කරන්න පුළුවන්. තව මම දැක්කා අපි ගෙනාපු චිකන් සෑහෙන ප්‍රමාණයක් තියෙනවා. අපිට පුළුවන් ස්පෙෂල් චිකන් කරියක් හදන්න හවසට.

හදලා පොඩි සාම්පල් එකකුත් කස්ටමස්ලට දෙන්න. මෙන්න මේ චිකන් වලින් හදපු කරිය කියලා. ඒ සුවඳින් සුපර් මාර්කට් එක පිරෙනවා සර් එතකොට. අපිට ස්පෙෂල් චිකන් කරියක් රුපියල් එකසිය පනහකට වගේ දෙන්න පුළුවන්. ලස්සන කප් එකක. හිතන්නකෝ එන දෙසීය දෙනෙක් මේ සුවඳ චිකන් කරිය ගත්තා කියලා සර්. එතනම කලෙක්ෂන් එකට රුපියල් තිස්දාහක් ඇඩ් වෙලා. එක චිකන් කරියකින්. හිතන්නකෝ එතනම අපි පොල් රොටි හදනවා කියලා. අද රෑට පොල් රොටියි චිකන් කරියි කියලා බෝඩ් එකකුත් දානවා. මමනම් ගන්නවා සර්.. සීගිරි එකේ සබන් නම් ඇත්තෙම නෑ සර්. නමුත් අපිට යුනි ලීවර්ස්ලත් එක්ක කතාකරලා

ඒකත් ප්‍රමෝට් කරන සේල්ස් ටේබල් එකක් දාන්න පුළුවන්. මම සීගිරි එකේ වෙජිටබල් කෝනර් එක අදත් දැක්කා සර්. කිසිම පිළිවෙලක් නෑ. බෙල් පෙපර් ළඟ අමුමිරිස්. අමුමිරිස් වලට පස්සේ තක්කාලි. ඊට පස්සේ මුරුංගා. එහෙම ලස්සන නෑ සර්. උඩරට එළවළු ලස්සනට උඩින් තියන්න පුළුවන්. අලුත් සලාද කොළ එක්ක බෙල් පෙපර් තත්කාලි එහෙම තියලා. අපිට පුළුවන් එතනම කොස් කපන්න."

ඔහු එදා එක දිගට පැය එකහමාරක් තිස්සේ සීගිරි එක ගොඩනගන වැඩසටහන කීවේය. එදා ඔහු මේ හිතේ ඇතිකළ කම්පනය භාවනාට මතකය. අද ඔහු මේ දුක් විඳින්නේ එදා මේ වචනවලින් කියූ මැවූ සීගිරි එක හදන්නටය. ඒතරම්

වටිනා ඔහුව සීගිරි එකට අහිමිවී යාමේ අවධානමක් ඇති බව භාවනා දැනගෙන උන්නාය.

අද රැයින් පසු ඒ අවධානම නැත. කොහෙත්ම නැත.

අවසන් වරට ඔහුව දැක්කේ පන්සලේදීය. එදා ඒ ඇස්වල තිබුනේ අහිංසක පිරිමි ළමයෙකුගේ ඇස්වල ඇති අසරණකමය. ගෙදර ඇවිත් ඒ දෑස් මතක් කරමින් ඇඬූ අයුරු භාවනා සිහිකළාය. එදා පන්සල අසළ වැව රවුමේදී ඔහුගේ අත ගෙන කාබන් පෑනෙන් ලියූ දේ භාවනාට සිහිවිය. "නෝ වන් කැන් මේක් මී හැපී. ලයික් යූ ඩූ" තමා එසේ ලිව්වේ ඇයි? එහෙම ලියා අද මෙහෙම කතානොකර ඉන්න එක සාධාරණද කියා භාවනා සිතුවාය.

"මම මේ දෛවය වෙනස්කරගෙන එන්නෝන පිස්සෝ. තේරෙන්නේ නැද්ද? කොල්ලෙක් වුණාම ටිකක් ඉවසන්න පුරුදුවෙන්න වෙනවා"

ඔහු මේ දවස් දෙක තුනට සීගිරි එක සම්පූර්ණයෙන් වෙනස්කර ඇති බව භාවනා දැනගෙන උන්නාය. අවසන් ඇරේන්ජ් කිරීම් තිබුනේ ඊයේත් පෙරේදාත්ය. දැන් සීගිරි එක කොහොමදැයි බලන්නට ඇයට ආසාවක් ඇතිවිය. 'පොඩි අක්කත් කිව්වා ළඟින් යනකොට ඒ පරණ සීගිරි එකද කියලා හිතාගන්න බෑ කියලා. ඔයා පොඩි කොල්ලෙක්. කලින් හිතුවේ මේ පොඩි කොල්ලා මේ දේවල් කොහොම කරයිද කියලාවීත් එක දවසක මම ඔයා වෙනුවෙන් මේ සේරම ඉස්සරහ අභියෝගයක් බාරගත්තා. ඔයා දුක්

වින්ඩේ රස්සාව නිසා නෙමේ. මං නිසාමං ඔයා වෙනුවෙන් බාරගත්ත ඒ අභියෝගය නිසා. එහෙම ඔයාට අද මම කතාකරන්නේවත් නෑ. මේ ඇයි.' භාවනා කාමරය පුරාම ඇවිදිමින් සිතුවාය.

ඇය දැන් දෙතුන් වතාවක්ම ජංගම දුරකථනය ගෙන යළිත් තැබුවාය.

ලබන සිකුරාදා සීගිරි එක යළිත් ගනුදෙනු සඳහා විවෘත කරන්නට නියමිතය. එයට ඇත්තේ තව සතියක් පමණය. මේ සතියේදී ඔහු සීගිරි එක තවත් වෙනස්කරන් ඇත. හෙට සිට ඒ දේවල් කරන්නට ඔහුට දිය හැකි හැම සහයක්ම දෙනවා කියා භාවනා සිතාගත්තාය.

"සුද්දි බුක්ෂොප් එකේ පළවෙනි

බුක් ස්ටෝක් එක ආවා. මේ දැන්. සුද්දි නෑනේ බාරගන්න. බලන්නකෝ."

ඔහු මේ දැන් කෙටි පණිවිඩයක් එව්වේය. භාවනාගේ හදවතේ පතුරු පවා ගැලවී ගියේය. ඇය ආසාවෙන් බලාගෙන උන්නේ සුපර් මාර්කට් එකේ මේ බුක් කවුන්ටරය ඇගෙ'ම අතින් පිළියෙල කරන්නටය. ඔහු ඒ කවුන්ටරය ලස්සනට හදා ඇත. පිටුපස ලෝක බෝලයක රුවක් සහිත විශාල පින්තූරයක් ඔහු ගැසුවේය. ලා කහ පැහැගත් මෘදු ආලෝකයකින් හැඩකළ පොත් කාමරයට තවම භාවනා ගියේවත් නැත. මේ මහා දුක් කන්ද කඩාපාත්වෙන්න ගත්තේ එය ඔහු අවසන් කරන දවසේය.

"එක එක දේවල් කියලා මාව කතාකරවන්න යන්නේ කපටියා."

භාවනා සිනාබරව සිතුවාය.

"ඒ ටික තියන්න. කාටවත් අල්ලන්න එහෙම දෙන්න එපා"

ඇය යැව්වාය. එසේ යවා ඇය මුව තදකරගෙන සිනාසුනාය. 'ඔයාගේ පපුව කොච්චර පිච්චෙනවද කියලා මට හිතාගන්න පුළුවන්. ඉතින් මොකෝ. ආදරේ කියන්නේ ඒකට තමයි. ඔය බඩකඩිත්තුව කරලා කවුද සැනසීමක් ලැබුවේ. පිච්චි පිච්චී ඉන්න ඕන. එක දවසක ඉඳලා මට මගේ සැනසීමයි නින්දයි දෙකම නැතිවුණා' ඇය සිතුවාය.

"ඔයාම ඒක කියනවානම් රෑට. හරි ආසයි. මාව ළඟින් තියාගෙන. හරි අමාරුවෙන්ගොත

ගගහ. ඇස්දෙකත් රතුකරගෙන. කියන්නකෝ. මට එහෙම දෙබස් එන්නේ නෑනේ මෝඩයෝ."

හදවතට මේ දුන් සතුට කොතරම්ද කියා ඇය සිතුවාය. ඒ සතුට දුන්නේ දෙවියන් නොවේ.

"මන්ඩේ ගිහින් ලස්සන සාරි ටිකක් ගන්නවා. සීගිරි එක අලුත් වෙනකොට අපිත් අලුත් වෙන්නෝනනේ."

සීගිරි එකේ අවසන් ප්‍රචාරක වැඩපිළිවෙල කරන්නට පටන් ගන්නේ සඳුදා සිටය. එය කරන්නේද දේවක විසින්මය. මේ වෙද්දීත් සියළුම ඉරිදා පුවත්පත්වල දැන්වීම් සඳහා ඉඩවෙන්කර ඇත. සීගිරි එක අවට නගර දොළහක් ආවරණය වෙන සේ අත් පත්‍රිකා ලක්ෂ තුනක් බෙදීමට

සියළු කටයුතු දේවක සූදානම් කර ඇත. සීගිරි එක විවෘතවන සිකුරාදා සිට එයට ඇතුල්වෙන පාරිබෝගිකයන්ට පුදුමාකාර දේවල් දැකගන්නට ලැබෙනු ඇත. එය ශ්‍රී ලංකාවේ සුපර් මාර්කට් ඉතිහාසයම වෙනස් කරන දෙයක් වෙනු ඇත.

එදා උදේට ගනුදෙනු කරුවන් පොඩි කෙසෙල් කොළ රවුමක් දැමූ කඩදාසි ප්ලේට් එකක දමාගෙන කිරිබත් කනු ඇත. ඒ වෙනුවෙන් ඇඹුල් තියල් කිලෝ විස්සක් හැදෙනු ඇත. දේවක ඒ සඳහා අවශ්‍ය වෙන විශාල මැටි ඇතිළි ගෙන්වාගත්තේ රඹුක්කනිනි. හැම විනාඩියකම සීගිරි හී බේකරි අංශයෙන් පාන් පිච්චී එළියට එනු ඇත. ඒ අලුත් පාන් සුවඳින් මුළු සීගිරි එකම පිරෙනු

ඇත.

ගිය සතියේ ඔහු පැය ගණනක් සීගිරි හී පරිගණකය අසළට වී උන්නේය. භාවනාටද පුදුම සිතුණි.

"කෙල්ලෙක් එක්ක ස්කයිප් කරනවද?ආ දේවකයියේ"

ඇය ඇසුවාය.

"ඔව් සුද්දි. මේ කෙල්ල මේ මාත් එක්ක ස්කයිප් කරකර ඉඳලා කක්ක බරයි කියලා ටොයිලට් එකට දිව්වා"

දේවක ඇඟට පතට නොදැනී කීවේය. භාවනා ඔහුට අත මිට මොළවා ගැසුවාය.

"මාව මෙතන විහිළුවට අරන්. මං සීගිරි එකේ මිස්"

ඇය කීවාය. දේවක බැලුවේය.

"මම මිස් කියලම කියන්නද?"

"ආයෙත් ගුටිකන්න. මොනවද

දාගෙන නෙට් එකේ කරන්නේ එහෙනම්."

"අපි සුද්දි හරිම රස සුවඳ බටර් කේක් එකක් හදන්න ඕන. හදපු කේක් එක හොඳයි. නමුත් මට රස මදි. මම මේ හොඳම රෙසපි එකක් හොයනවා. දෙන එකේ රසම එක දෙන්න ඕනනේ"

එදාද තමාට පුදුම සිතුණු අයුරු භාවනා සිහිකළාය. ඔහු මේ හැමදේම සිතන්නේ කෙසේද?

"ඉතින් හම්බවුණාද?"

"ම්. මේ තියෙන්නේ. ලෝකේ රසම බටර් කේක් එක හදන්නේ ලන්ඩන්වල ඉන්න ලේඩි කෙනෙක්. එයාගේ නම මාර්තා ස්ටුවට්. ඒක හරිම සිම්පල් රෙසපි එකක්. අපි ඒක දෙන්නේ."

"ලන්ඩන්වල ඒවා අපිට දෙන්න

බෑනේ.”

“තාම අපේ රේල්පීලිවල දුවන්නේ එංගලන්තේ කෝච්චි පෙට්ටි තමයි සුද්දි. තාම අපි නඩු කියන්නේ එංගලන්තේ අය හදපු උසාවියේ. ඉතින් බටර් කේක් එකක් හදන්න බැරිද සුද්දි.”

ඔහු එහෙමය. ඔහු එදා හවසම බේකරි අංශයට වී බටර් කේක් එක හැදුවේය. මුල්ම කේක් කෑල්ල ගෙනාවේ තමාටය.

“මංද ටේස්ට් කරන්නේ.”

“රස හඳුනන අයටනේ ඒක දෙන්න ඕන.”

“මං හොද බටර් කේක් රසිකාවියක් තමයි.”

“පේනවා සුද්දි”

“කොහොමද පේන්නේ.”

"නෑ මේ."

"කියන්න."

"ඔය බටර් පාටට ඉන්නේ කෙල්ල."

"ෂටප්."

ඇයට මේ දැනුත් සිනාය. 'එහෙම ඔයාවනේ මට නැතිවෙන්න ගියේ. කොහොමද එහෙම වෙන්න ගියේ. ආ දේවකයියේ' එය ඇසිය යුත්තේ ඔහුගෙන් නොවේ. තමාගෙන්මය.

"හවසට මට සුද්දිව පැයකට දෙකකට ඕන"

පසුගිය දවසක ඔහු පැමිණ කීවාය. 'ඇයි කොහේහරි පෙරළගෙන ඉඹින්නද මාව' ඇයට අසන්නට සිතුණි. සිතූදේ සිහිවී භාවනාට දැනුත් සිනා පහළ විය. ඒ වෙලේද ඇයට සිනා ආවේය.

"ඇයි සුද්දි හිනාවෙන්නේ."

"මුකුත් නෑ. කියන්නකෝ මොකටද මාව පැයකට ඕන. මි"

කෙල්ලෙක්ව පැයකට ඕනා යැයි කියද්දී ඒ කෙල්ල හිතන දේවල් මේ මෝඩයා දන්නේ නැත.

"පොටෝ එකක් ගන්න. අපේ අලුත් පේපර් ඇඩ් එකට."

"මේ මාව"

"ඔව් මේ ළමයි අතන මෙතන දානවා. ඒත් සුද්දි තමයි සීගිරි බැජ් එක සාරියේ ගහගෙන ලේඩි කස්ටම කෙනෙක්ට සර්ව් කරන්නේ"

"අනේ මම එහෙම"

"අපි කරමු"

"දේවකයියා නෑ ඇඩ් එකේ."

"නෑ."

"ඒත් පොටෝ එකක් ගමු."

එදා පොටෝ ගනිද්දී ඔහුත් සමඟ එකට ගත් පින්තූරය තවම ඇයට ලැබුණේ නැත. ඒ පින්තූරයේ ඔහුත් තමාත් එකට ඉන්නවා බලන්නට ඇයට නැති ආසාවක් ආවේය. ඒත් දැන් ඔහුගෙන් ඒගැන ඇසිය නොහැක.

සීගිරි එක අති සාර්ථකව යළිත් ඇරඹෙන බව භාවනාට විශ්වාසය. ඒ සාර්ථකත්වයේ ගරුත්වය කිසිම කෙනෙක්ට ගත නොහැක. එය එක් පුංචි කොල්ලෙක්ගේ ආත්ම විශ්වාසයත් හැකියාවත් මනුස්සකමක් එකට එක්වී ඇතිවූ දෙයකි.

"සීගිරි එක සාර්ථකවෙනවා කියන්නේ ඔයා ගැන හැමෝම කතාවෙන එකටයි. එහෙම දවසක

මට කොච්චර සතුටක් දැනෙයිද"

ඇය සිතුවාය. දේවක ගැන ගෙදරට කියන්නේ එදා යැයි ඇය සිතාගත්තාය. කොහොමත් වටින් ගොඩින් ඔහු ගැන කියා ඇත.

"ඒත් මට ඔයා දවසක් කතාවක් කියනවා කිව්වා. සීගිරි එකටම එන්න හේතුවත් ඒකයි කියලා ඔයා කිව්වා. ඒ දේ මොකක් වෙන්න පුළුවන්දමේ ප්‍රශ්න නිසා ඒක ඔයාට මට කියාගන්න බැරිවුණා."

භාවනා සිතුවාය.

# 38

සීගිරි එකේ අවසන් මෙහෙයුම් කටයුතු කරමින් දේවක සිතුවේද එය ගැනය.

"මං ගැන මගේ අම්මා ගැන. ඒ කියන්නේ ඔයාගේ පොඩි නැන්දි. මගේ අප්පච්චි ගැන. ඔයාටයි අක්කටයි හිමිහිට කියන්න හිතාගෙන උන්නේ. සමහරවිට මට ඒ කිසිම දෙයක් කියාගන්න බැරිවෙයි. මම සීගිරි එකෙන් යනවානම් ඒ රහසත්

හංඟගෙනම තමයි සුද්දියේ යන්නේ.”

දේවක සිතුවේය. දැන් සීගිරි ඒක බලන්න ලස්සනය. ඒත් මේ ලස්සන බලන්නට ඔහුගේ ඇස්වලට පවා ලෝබය. ‘එන්නකෝ ටිකක් සුද්දියේ. ඇවිත් බලන්නකෝ සීගිරි එක දැන් කොච්චර ලස්සනද කියලා.’ එහෙම කියා දැන්මම කෙටි පණිවිඩක් දමන්නට ඔහුට සිතෙයි. ‘කමක් නෑ. දැන් හවස එනවනේ නුවර යන්න’ දේවක සිතුවේය.

ඔහු සීගිරි එක පුරා ඇවිද්දේය. දැන් මිහිරංගවත් කෝසලළවත් මලීෂාවත් සීගිරි එකට එන්නේවත් නැත. ඔවුන්ට මේ ලස්සනට හැදෙන සීගිරි එක දෙස බලාගෙන ඉන්නට අමාරුය. ඔවුන් නැති නිසාම සීගිරි එක නිදහස්ය. දේවක සිතාගෙන

උන්නේ සඳුදා භාවනාගේ පියා වූ මිලින්දටත් සීගිරි එකට හැකිනම් එන්නට කියන්නටය.

දැන්මම කියලා දැම්මොත් හොඳයැයි ඔහුට සිතුණි. දේවක මිලින්දගේ අංකයට ඇමතුමක් ගත්තේ සීගිරි එකෙන් පිටතට පැමිණය. දැන් සීගිරි කා පාක් එකේ සිට බැලූ විට මුළු සීගිරි එකම වෙනස්ය. එහෙත් අවට කිසිවෙක් එය දැක්කේ නැත. දේවක මේ සියල්ලම කළේ සම්පූර්ණ සීගිරි එකටම තහඩුවලින් වසාය.

"සර් මම දේවක! සීගිරි එකේ"

දේවක කීවේය. මිලින්ද උන්නේ ගෙදරය.

"කියන්න දේවක."

මිලින්ද කීවේ සන්සුන්වය.

කොල්ලා කතාකරද්දී ඔහුට මොකක්ද දැනෙයි. එසේම ඔහුව මුදවාග න්නට කෙල්ල උසාවියට ගිය දවසේ මිලින්දට දෙයක් දැනුණි. ඊයේ කෙල්ල අඬමින් යමක් කියද්දීත් මිලින්දට දේවකව නිකමට මෙන් සිහිවිය. කොහොමත් කොල්ලා ගැන නිතර සීගිරි මහගෙදර කතා කරයි. එහි අමුත්තක් ඇත.

"අපි සර් සීගිරි එකේ වැඩවලින් සියටට අසූවත් විතර ඉවරයි. මට ටිකක් මේක සර්ට පෙන්නගන්න ඕන. අඩුපාඩු තියෙනවානම් අහගන්න."

මිලින්ද කොල්ලාගේ කතාව අගය කළේය. ඔහු මම කියා කියන්නේ නැත. කියන්නේ අපි කියාය. ඇරත් මේ ටික පේනවා අඩුපාඩු අසාගන්නට යන්නේ කොල්ලාගේ ඇති නිහතමානී

කමටය.

"මම යන්තමට දැක්කා දේවක. අපේ කෙල්ලෝ දෙන්නත් කිව්වා. මමත් උන්නේ බලන්න ආසාවෙන්. මම එන්නම්"

"පුළුවන්නම් සර් මන්ඩේ උදේ"

"හරි පුතේ. මම එන්නම්. ඔයා දුන්න ප්ලෑන් එක මතක්වෙනකොට සීගිරි එක දකින්නත් ආසයි. ඔයා කියනවා වගේ සීගිරි එක හදන්න අපෙත් හරි ආසාවක් තිබුණා. දැන් නෙමේ. අදින් අවුරුදු විසි හතරකට විතර කලින්. මගේ නංගි ජීවත්වෙලා ඉන්න කාලේ"

මිලින්ද මේ කියන්නේ කොල්ලාගේ අම්මා ගැනය. දේවකගේ සිතට දුකක් දැනුණි.

"මේ ඒ ප්ලෑන කියලා හිතන්නකෝ

සර්."

'වෙනස තියෙන්නේ අම්මා වෙනුවෙන් පුතා ඇවිත් ඒක ක්‍රියාත්මක කරපු එකයි' දේවක සිතින් කීවේය.

"මම එන්නම්. මොනවාහරි තිබ්බොත් මට කතාකරන්න."

"හොඳමයි සර්. මං තියන්නම් බුදු සරණයි"

මිලින්දගේ සිතට අර අමුත්ත යළිත් දැණුනි. ඉඳුනිල් මිලින්දගේ මුහුණේ ඇතිවූ හැඟීම් දැක්කාය.

"ඇයි."

ඇය ඇසුවාය.

"සීගිරි එකේ දේවක කතාකළේ. මට මේ කොල්ලා කතාකරනකොට මොකක්ද දැනෙනවා වගේ ඉන්දු."

ඉඳුනිල් සිනාසුනාය.

"දවසක් මෙහේ ආවනේ. අපේ පොඩි බඩ්ඩට සැන්විචස් අරන්. අනේ දැක්කත් හරි මගේ හිතත් පිරිලා ගියා."

ඉඳුනිල් කීවාය.

"සඳුදා ගිහින් බලනවා කොල්ලගේ වැඩ. ඉන්දුත් යන්."

"මං හිමිහිට එන්නම්."

ඔහු තවත් මොනවද කියන්න මෙන් උන්නේය. එහෙත් කිව්වේ නැත. මිලින්ද පඩිපෙලේ අත්වැට අල්ලාගෙන මොහොතක් උන්නේය. පසුව උඩට ඇවිදගෙන ගියේ කෙල්ලත් සමඟ ටිකක් කතාකරන්නට හිතාගෙනය.

උඩ පේරාදෙණියේ වෙද මහත්තයාගේ නිවසින් ඇමතුමක් ආවේ උදේ එකොළහට පමණය.

අද හවස් වරුවේ දේවකත් භාවනාත් උන්නේ නේත්‍රාවත් රැගෙන පේරාදෙණියට යන්නටය. කාටත් වඩා භාවනා මේ ගමන යන්නට ආශාවෙන් උන්නාය. ඒ ජීවිතයේ වැදගත්ම තීරණයක් පේරාදෙණියේ හීරස්සගල හෝටලයේ උඩ කාමරයේදී ගන්නටය.

එහෙත් ඇමතුමක් ලැබිණ.

"දේවක මල්ලී මම මේ වෙද මහත්තයාගේ ගෙදරින්. ජීවක අයියා."

"දන්නවා අයියේ කියන්න."

දේවක කීවේය.

"පොඩි හදිස්සියෙක් වෙලා මල්ලී. වෙද මහත්තයාගේ අම්මා නැතිවෙලා. අද මේ පේරාදෙණිය හොස්පිට්ල් එකේදී නැතිවුනේ."

ද්වේකට පුදුමය. වෙද මහත්තයාටත් හැත්තෑවකට ළංවී තිබුණි. 'එතකොට වෙද මහත්තයාගේ අම්මත් අද වෙනතුරු ජීවත්වුණාද?' ඔහු සිතුවේය.

"වෙද මහත්තයාගේ අම්මද නෝනද අයියේ."

"අනේ නෝනා සනීපෙන් ඉන්නවා මල්ලි. නැතිවුනේ අම්මා. අවුරුදු අනූ අටක්. කිසිම ලෙඩක් නැතුව උන්නේ. ඉතින් මල්ලි මේ සතිය පන්නලා එන්න. මළගේ තියෙන්නේ මෙහෙනේ. ඉතින් මේ සතියේ වෙදකම් කරන්නේ නෑ. මේ මළගෙදර වැඩ ඉවරකරලා ගෙවල් හෝදලා පිරිත් එහෙම කියලා තමයි ආයෙත් වෙදකම් පටන් ගන්නේ. මේවා මේ පිරුවට කරන වෙදකම්නේ මල්ලි."

දේවකට දුක සිතුණි. 'ඔයාව හවස බලන්නවත් බැරිවෙනවා. ඇයි සුද්දි මෙහෙම.' දේවක සිතුවේය.

"මං අයියේ එහෙනම් ලබන සතියේ ගන්නම්"

දේවක දුක්බරව කීවේය.

දේවක එහෙමම ගත්තෙ නේත්‍රාටය. භාවනාට කතාකළ නොහැක. ඇය තමා ගන්නා ඇමතුම්වලට පිළිතුරු දෙන්නේ නැත. එවිට මෙහෙමවත් හිත හදාගෙන වැඩක් කළ නොහැක.

"බලන්නකෝ අක්කා. හැමදේම ලෑස්තිකරගෙන ඉන්නකොට."

නේත්‍රා සිනාසුනාය.

"ඉතින් දරුවෝ මොකද වෙන්නේමේ වැඩ ටික ඉවරකරලා යමු කියලා මාත් කිව්වේ. අනික

ඉතින් වෙද මහත්තයාගේ අම්මනේ නැතිවුනේ. වෙද මහත්තයා නෙමේනේ. අපි ලබන සතියේ යමු. කෙල්ලට කිව්වද?"

නේත්‍රා ඇසුවාය

"න්නෑ අක්කේ. මම කතාකළාම ගන්නේ නෑනේ. අක්කා ටිකක් කියනවද?"

නේත්‍රා සිනාසුනාය. සමහර කුණාටු පටන් ගන්නට කළින් හරි නිහඬය.

"මේකිට පිස්සුනේ මල්ලි. මම කියන්නම්. ඔයා මේ මොනවත් හිතන්න එපා. තාත්තත් හෙට උදේ එනවා කිව්වා බලන්න සීගිරි එක"

'සුද්දි එන්නේ නැද්ද' කියා අසන්නට ඔහුට සිතුණි. ඇත්තටම මේ ටික පෙන්නාගන්නට ඕනා

ඇයටය. දැන් සීගිරි එක බලන්නට ලස්සනය. ඒ නිසාම දේවක බොහෝ අලුත් අංශ පොලිතීන්වලින් වැසුවේය. ඒ සේවකයන්ගේ හෝ ඇස් වහක් වදිවී යැයි සිතීය. බේකරි අංශයක් විවෘත මුළුතැන්ගෙයත් පොත් කවුන්ටරයත් ඇත්තේ වසා දමාය. පිටතින් බලන කෙනෙක්ට පේන්නේ පොලීතීන් ටික පමණාය.

කොටින්ම කියනවානම් ඔහු තවම අලුත් ලයිට් සෙට් එකවත් දමා බැලුවේ නැත. එය මේ කිසිවෙක් නැති පාන්දරකට බලන්නට දේවක සිතාගෙන උන්නේය. එළියේ කා පාක් එකද ඔහු දිග ඉදිකිරීම් කවරින්වලින් වසා තිබුණි. ඒත් ඒ පොලිතීන් යට ලස්සන සීගිරි එක හැදී තිබුණි.

“එක අතකට මේ හැමදේම කරලා

යන එකත් හොඳයි. ඔයාට හිම්හිට කියලාම එහෙමම මම නවතිනවා. අලුත් වැඩපිළිවෙලට කියලා දීලම මට යන්න පුළුවන්. එහෙම හොඳයි තමයි”

දේවක සිතුවේය.

කොහොමත් ජීවිතය ගැන මහා බලාපොරොත්තුවක් නැත. දේවක යළිත් ගෙලට අතක් තබා බැලුවේය. දැන් ඇඟ ගිනි කබල වාගේය. ‘උණ එකසිය ගාණට එනවා වගේ.’ ඔහුට සිතුණි. ඩෙංගු හැදුනද මේ වැඩේ දමා යා නොහැක.

# 39

ඒත් භාවනා උන්නේ හදවත අස්සේ මොකක්ද රහසිගත සතුටක් තබාගෙන රස විඳිමිනි. ඇය නුවර ඇඳගෙන යන්නට ඇඳුම් දෙක තුනක්ම තෝරා ඇඳ උඩට දැමුවාය. පසුව ඒ දෙස බලාමින් ඉන් එකක් තෝරාගන්නට නොහැකිව බලාගෙන උන්නාය. 'කවදාවත් මෙච්චර ආසාවෙන් ගමනක් යන්න ඇඳුමක් තෝරලා නෑ. මට මේ ගමන හරි

විශේෂ ගමනක්.' ඇය සිතුවාය.

උදේ සිට ඇය මුහුණට ෆේස් පැක් එකක් දාගෙන උන්නාය. පසුව එය ගලවා තවත් එකක් දමාගත්තාය. 'මේක ලෙඩක් වස්තුවේ.' ඒ ලෙඩේ දැන් තමාට වැළු. දීර් අවසානය. දැන් තත්වය හිතුවාටත් වඩා බරපතලය. අද රාත්‍රිය කොහොම එකක් වේදැයි භාවනා දිගටම සිතුවාය. ඔහුත් සමඟ අද රෑ කතාකරන්නේ මොනවාද කියා දැන්මම සිතාගත නොහැක.

"දැන් හවස වාහනේට නැග්ගාම මූණ දෙක තුන කරගෙන ඉඳියි මෝඩයා. හරි ආසයි බලන්නපව්."

මේ දැන් සීගිරි එකට දුවගොස් ඒ මුහුණ ටිකක් සැඟවී බලාගෙන

එන්නට භාවනාට සිතෙයි. එය පපුවේ කොච්චි මිරිස් ගෑවාක් වැනි දැවිල්ලකි. 'ඔයා සීගිරි එක හදලා ඉවරයි. දැන් පිස්සා ඉන්නේ මට ඒක පෙන්නගන්න බැරුවයි.' චුට්ටක් ගොස් ඒ ලස්සන බලාගෙන එන්නටත් හිතෙයි. එහෙත් හැමදේම ඇය සිතේ සිරකරගෙන උන්නා.

"හැමදේම ඔයා කළේ මං වෙනුවෙන් කියලා අද මට හිතෙනවා. ඉතින් ඒක මට කියලා කරන්න තිබ්බනේ පිස්සෝ. හැමදාම ළඟට ආවාම ඇස් ලොකුකරගෙන ඉන්නවා මොනවද කියන්න වගේකියන්නේ නෑ."

ඇය සිනාබරව සිතුවාය. හදවතේ මේ ඇති සතුට තියාග න්නේ කොහේද? භාවනා ඇළේ

පෙරෙළෙමින් සිතුවාය. අද හවස මේ දෛවයේ ඉරණම් ගමන යනවාද? දන්නේ නැත. ඒත් අදින් පසුව ජීවිතය වෙනස්ය. නුවර යන භාවනා යළිත් එන්නේ නැත. එන්නේ වෙනත් කෙනෙකි. අලුත් ඉරණම් කතාවක් ලියාගත් කෙනෙකි. මේ දෛවය පොඩි අක්කා පැමිණ වෙනක් නොකළානම් අද හදවතම කාන්තාරයකි. ඒ කාන්තාරය මැදම තමාගේ ජීවිතය පිච්චී අළුවී යනු ඇත. 'මම ඔයා වෙනුවෙන් තාත්තේ ඒ දුකක් විඳින්න බලාගෙන උන්නේඔයා වෙනුවෙන්මේ සීගිරි පවුල වෙනුවෙන්. මම මගේ පළවෙනි අහිංසක ආදරේ සීගිරි එකෝ දොරකඩ නන්නා. දුන කෙනෙක් වගේ දාලා ආවේ.' භාවනා සිතින් කීවාය.

දේවක පුංචි බණ්ඩාර. ඔහු මේ සීගිරි එකට ආ පළවෙනි දවස භාවනා සිහිකළාය. ඒ අදින් තෙමසකට පෙරය. මේ දින අනූවක කාලය තුළ කොතරම් නම් දේවල් සිදුවුණාද? 'ඒක අවුරුදු තුනක් වගේ මට හිතෙන්නේ ඇයි. ඊටත් වඩා කාලයක්. ආත්ම තුනක් තිහක්. තුන්සීයක් විතර ඔයත් එක්ක හිටියා වගේ පුරුද්දක් මට ඇතිවෙන්නේ ඇයි' භාවනා ඇඳට වී සිතුවාය.

නේත්‍රා කතාකළේ ඒ වෙලාවේය.

"අක්කා."

"කොල්ලා කතාකළාද?"

අක්කා කොල්ලා කියන්නේ කාටදැයි භාවනා දනී.

"දේවකයියා."

ඇය ඇසුවාය.

"දැන් මෙතන වෙන කොල්ලෙක් ඉන්නවද බබා"

නේත්‍රා ඇසුවාය. භාවනා හිකිස් ගා සිනාසුනාය.

"කොහෙත්ම නෑ. මේකත් කොල්ලෙක් නෙමේ. පොඩි හරක් පැටියෙක්."

ඇය කීවාය. නේත්‍රා තම බාල නැගණියගේ කතාවට සිනාසුනාය. 'කොල්ලව දැන් තියාගෙන මඩවනවා'

"ඇයි අක්කේ කතාකළාද ඇහුවේ."

"පේරාදෙණි ගමන කැන්සල් වෙලා බබා."

භාවනාගේ ළයමම කඩාගෙන වැටුණි.

"අනේ ඇයි."

කෙල්ල හවස ගමන යන්නට බලාගෙන උන් බව නේත්‍රා දනී. 'අද හිතත් සැහැල්ලුයිනේ. ආසාවෙන් ඉන්න ඇති' ඇය සිතුවාය.

"වෙද මහත්තයාගේ අම්මා නැතිවෙලා. මළ ගෙදරින් පස්සෙලු වෙදකම් පටන් ගන්නේ."

භාවනා හීල්ලුවාය.

"චුට්ටක් කොල්ලට කතාකරන්න බබා පව්."

"ඉතින් මම."

"පව් අසරණයා. නිකං පුච්චනවා කොල්ලව. ඔවා සහගහන පව් බබා. තව පැයකින් මොනවා වෙයිද කියලා කවුද දන්නේ."

අක්කාගේ කතාවෙන් භාවනාට නැති බියක් දැනිණ. 'ඔයා මේ උදාවෙන පැයේදී සිගිරි එක දාලා

නොපෙනෙන්නම ගියොත්' ඔහු එහෙම කරන්න බැරි කෙනෙක් නොවේ. සමහරවිට මේ හැමදේම දමා රටකට හෝ අද රෑ යන්නට පුළුවන.

"මං කතාකරන්නම් අ..ක්..කේ"

ඇය උගුරෙන් මෙන් කීවාය. භාවනා ඇඳ මත දමා තිබූ ඇඳුම් ටික යළිත් අල්මාරියට දැමුවාය. 'ඇයි අද ගමන වැළැක්වුනේ' ඇයට බියක් දැනුණි.

භාවනා දුරකථනය අතට ගත්තාය. ඔහු කෙටි පණිවිඩයක් එවා ඇත. එයද ඇය දැක්කේ දැන්ය.

"මට පුළුවන් වෙලාවක කෝල් එකක් දෙන්න මිස්. සොරි කරදර කළාට"

කෙල්ලගේ පපුව හැරීගෙන ගියේය. කොහේදෝ සිට පැමිණි කඳුළක් ඇගේ දෑස් තෙත්කළේය. 'එයාටත් තියෙන්නේ හිතක් කියලා අමතක වුණා.' ඇය තමාටම දොස් නඟාගත්තාය. ඇඟිලි කොණකින් ඇස් මත වූ කඳුළක් ගත් ඇය චිරිස් කියා එය විසික්කළාය.

"කතානොකරම ඉඳලා දැන් කතාකරනකොට. අනේ මන්දා."

ඇය දිග සුසුමක් ගත්තාය. පසුව දේවකගේ අංකය ගත්තාය. පිළිතුරු දෙන්නට ටික වෙලාවක් ගතවිය.

"දේවකයියේ."

ඇය උගුරෙන් මෙන් කතාකළාය.

"මිස් මම දේවක සර් නෙමෙයි. රුවන්ත."

රුවන්ත යනු දේවක ඔහුගේ

වැඩට ළඟින්ම තබාගෙන ඉන්නා සීගිරි හී අහිංසක කොල්ලෙකි. දේවක ඔහුගේ වැඩට තෝරාගත්තේ සීගිරි එකේ ඉන්නා අහිංසකම කොල්ලාය.

"කෝ දේවක සර් රුවන්ත."

භාවනා ඇසුවාය. ඇයට මොකක්ද දැනුණි.

"දේවක සර් මේ ඩිස්පෙන්සරියට ආවා මිස් මාත් එක්ක. සර් ඇතුළේ."

කෙල්ලගේ පපුව ගැස්සිණ.

"ඩිස්පෙන්සරියට. ඇයි රුවන්ත"

"සර්ට හොඳටම උණ මිස්. ඊයේ ඉඳලා පෙනඩෝල් බිබී හිටියේ. උදේ ඉඳලා වෙව්ල වෙව්ල උන්නේ. මේ දැන් මම කියලා ආවේ. මෙතන සෙනඟ. සර්ගේ බ්ලඩ් චෙක්කරන්නත් කිව්වා. ඩෙංගුනේ

හැමතැනම. සීගිරි එක පිටිපස්සට ගිහින් වමනෙත් දැම්මා. එතන බිම වාඩිවෙලා පැය දෙකක් විතර උන්නා.මේ බැරිම තැන ආවේ මිස්"

භාවනාගේ අත ගැහෙන්නට විය. වෙව්ලන්නට විය.

"මට කියන්න රුවන්ත කොතන ඩිස්පෙන්සරියද ඔය."

"මේ ඩොක්ටර් රොහාන්ගේ ඩිස්පෙන්සරිය මිස්. පැයක් විතර යයි. බ්ලඩ් චෙක්කරගෙන එන්නෝනනේ."

"මම දැන් එනවා. මම කතාකළා කියලා රුවන්ත කියන්න එපා හොඳේ දරුවෝ. මම මේ දැන් එනවා"

"හොඳයි මිස්."

භාවනාගේ ඇස්වල වැළිග

ාවක් මෙන් විය. ඇය එහෙමම අතට අසුවූ ඩෙනිම් කෑල්ල ගෙන එය ඇඳගෙන ටී ෂර්ට් එකක් දමාගත්තාය. කොණ්ඩය එක මිටකට වෙන්නට බැඳගෙන පෝනි ටේල් එකක් දමාගත්තාය. කිසිම මේක්අප් එකක්වත් නොමැතිව ඇය අත් බෑගයද ගෙන පහළට ආවාය

"මං සීගිරි එකට ටිකක් ගිහින් එන්නම් අම්මා."

"හදිස්සියේ සුද්දි. මේ මූණෝ හැටි."

"මේ ගියා ආවා. යනවා අම්මා."

භාවනා දුවගෙන මෙන් ගොස් වාහනයට ගොඩවූවාය. ඇය උන්නේ තමාටම දොස් කියමිනි. 'පව් උණාත් තියාගෙන අද යන්න උන්නේ. කිව්වෙවත් නෑ' කියන්න

තමා කතාකළාද කියා පසුව ඇය සිතුවාය.

"අන්කල් මෙතන ඩොක්ටර් රොහාන්ගේ මෙඩිකල් සෙන්ටර් එක ළඟින් මාව දාලා අන්කල් සීගිරි එකට යන්න. මම කතාකළාම එන්න."

භාවනා කීවාය.

# 40

විනාඩි හයක් හතක් ඇතුළත භාවනා මෙඩිකල් සෙන්ටර් එකට ආවාය. රුවන්ත එළියට වී උන්නේය. ඇය වාහනයෙන් බැස්සා නොවේ. පැන්නාය. කෙදිනකවත් මෙහෙම වී නැත.

"මිස්."

රුවන්ත දුවගෙන ආවේය.

"දේවක අයියා කෝ."

"ඇතුළේ මිස්. දැන් ඉන්ජෙක්ෂන්

එකක් දුන්නා මං හිතන්නේ. උණ වැඩි නිසා.”

“රුවන්ත වාහනේ සීගිරි එකට යන්න. මං මෙතන කියලා කාටවත් කියන්න එපා. තේරුණානේ”

ඇය කීවාය.

“හොඳයි මිස්. මේ සර්ගේ ෆෝන් එක. බඩු ස්ටොක්ස් වගයක් එනවා මිස්. මට බලන්න කිව්වා මම බලන්නම්. එළියේ පාක් එකේ ලයිට්ස් අල්ලන්නත් එනවා.”

“රුවන්ත බලන්න. සර්ට ටිකක් අමාරුයිනේ”

“දැන් මට බලන්න දේකුත් නෑ මිස්.”

රුවන්ත ගියේය. භාවනා එහෙමම මෙඩිකල් සෙන්ටර් එකේ හදිස්සි ප්‍රතිකාර කාමරය ළඟට ආවාය.

"ඇතුළේ පේෂන්ට් කෙනෙක් ඉන්නවා නේද මිස්. බෝයි කෙනෙක්."

"ඔව් මිස්. සර්ට ටිකක් අමාරුයි. උණ ගොඩක් වැඩියි. ඩොක්ටර් දැන් ඉන්ජෙක්ෂන් එකක් දුන්නා. ඇලවෙලා ඉන්නේ. උණ එකසිය හතරක්. ෆිට් එකට වගේ ඇවිත්"

"මං ටිකක් මිස්"

ඇය හෙදියට බැගෑපත් වූවාය.

"එන්න මිස්."

භාවනා අත් බෑගය උඩට දමාගෙන හදිස්සි ප්‍රතිකාර කාමරයට ආවාය. කුඩා ගිලන් ඇඳේ වැතිරී දෑස් පියාගෙන උන් දේවකව දකිද්දී කෙල්ලගේ පපුව ඇවිලීගෙන පැලීගෙන ගියේය. 'අනේ දෙයියනේ. ඇයි මෙහෙම වුණේ. මං කතාකළේ නැති නිසාද පිස්සෝ' භාවනා

සිතුවාය.

ඔහු අද රැවුළවත් කපා නැත. කොණ්ඩයම අවුල්වී ඇත. සුදු අත් කොට කමිසයක් ඇඳගෙන උන් දේවකගෙන් භාවනා දැක්කේ අන්ත පරාජිත කොල්ලෙක්ගේ නියම පෙනුමය. "මම මේ දෛවය වෙනස්කරගෙන එන්නෝන කියලා දන්නේ නැද්ද දේවකයියේ. තේරෙන්නේ නැද්ද? කොල්ලෙක් වුණාම ටිකක් ඉවසන්න පුරුදුවෙන්න වෙන්නෝනනේ. මේ ටිකට මේ උණත් හදාගෙන." ඇය මේ ඔහුට බණිනවා නොවේ. තමාගේ දුකට නිදහසට කරුණු හදාගන්නවාය.

භාවනා එනවා දේවක දැක්කේ නැත. ඔහු උන්නේ අධික උණ තත්වය නිසා ශරීරයේ ඇතිවූ

කලන්තයට දෑස් පියාගෙනය. අධික උණට ලබාදෙන හදිස්සි එන්නත ටිකකට කළින් දේවකට ලබාදෙනු ලැබිණ.

භාවනා ඔහුගේ ගිලන් ඇඳ අද්දරටම ගියාය. ඒ මුහුණ දෙස බලාගෙනම සිටිද්දී ඇයගේ දෑස් තෙත්විය. ඇයට මතක්වූයේ ඔහු සිර මැදිරියේ උන් දවසය. 'එදත් මෙහෙමයි මූණ' ඇය සිහිකළාය.

හදිස්සියේම ඇයගේ වෙව්ලන සුරත ඔහුගේ නළලතට ගියේය. ගිනි කබලට උණය. දේවක දෑස් විවරකළේ හදිස්සියේ නළලට දැනුන පහසිනි. ඔහු මේ වෙලාවේ භාවනා මෙතනදී සිටී යැයි සිතුවේ නැත. එහෙත් කොල්ලා සිතමින් උන්නේ ඇය ගැනය.

"සුද්දි. මේ."

ඔහු යමක් කියන්නට ගියේය. තොලකට වියලී ඇත.

"මොනවත් කියන්න එපා. ඔහොමම ඉන්න"

ඇය ඔහුගේ අවුල්ව ගිය හිසකේ අතරින් දිගු ඇඟිලිතුඩු ගෙන ගියාය. මේ තරම් ආදරයකින් මේ තරම් හැඟීමකින් කිසිම කෙනෙකුගේ හිසක් පිරිමැද නැත. ඇත්තටම නැත. එහෙත් ඇය එසේ කළාය. භාවනාගේ දෑස් තෙත්විය. කඳුළු ඔහු බලාගෙන සිටිද්දීම වැටිණි.

"අනේ සුද්දි මේ."

"මොනවද මේ කරගත්තේ. නැතිවෙච්ච දවස් දෙකට ආ."

ඇය අඬමින් මෙන් ඇසුවාය. භාවනා තොල්පට මුව තුළට ගත්තේ

ඇඬේයැයි බියටය. මේ ප්‍රතිකාර කාමරයය. නිදන කාමරය නොවේ.

"ඊයේ ඉඳලා චුට්ටක්."

"කිව්වෙවත් නෑ."

කියන්න තමා කතාකළාද කියා ඇය සිතුවාය.

"මේචචර උණත් තියාගෙන වැඩකළා නේ. මහ රෑ ඇහැරගෙන."

ඇය බැණ්නාය. තවමත් ඇය ඉන්නේ ඔහුගේ හිස අතගාමිනි. මේ මොනවා වෙනවාද කියා ඇයම දන්නේ නැත.

"ඔහොම ඇස් පියාගෙන ඉන්න. මම යන්නේ නෑ"

ඇය පුටුවක් ඇඳ ළඟට ඇදගෙන කීවාය. ඔහුගේ කමිස අතක් ඉහළට ඔසවා ඇත. පුළුන් කැබැල්ලක් අලවා ඇත්තේ

ඉන්ජෙක්ෂන් එකගැසූ තැන විය යුතුය.

වෛද්‍යවරයා ආවේය. ඔහු භාවනා සමඟ සිනාසුනේය.

"ඩොක්ටර් කොහොමද පේෂන්ට."

දේවක අසරණව බැලුවේය.

"එනකොට උණ එකසිය හතරයි. වෙව්ලනවානේ. මේ දවස්වල තියෙන නරක උණ හැටියට මෙහෙම බලාගෙන ඉන්න හොඳ නෑ. තව පැයක්වත් මට තියාගන්න වෙනවා. මම බ්ලඩ් සාම්පල් එකක් අරන් දැන් යැව්වා ලැබ් එකට. ප්‍රියානි එහෙන් කතාකළාද?"

"තව විනාඩි විස්සක් විතර යයි කිව්වා ඩොක්ටර්."

"ඩෙංගු කියන්න බෑ. ඒත් අපි බලමු. මට යවන්න බෑ. ඩෙංගු

නෙමේනම් අපි බෙහෙත් ටිකක් අරන් යමු. දවස් දෙක තුනක් රෙස්ට් කරන්න ඕන."

"හොඳයි ඩොක්ටර්."

ඇය කීවාය. වෛද්‍යවරයා ගිය පසුව ඇය ඔහු දෙස බැලුවාය.

"උදේට මොනවද කෑවේ."

දේවක අසරණව බැලුවේය.

"කෑවේ නෑනේද?"

"උදේ ඉඳලා වමනෙට වගේනේ සුද්දි."

"වමනෙට වගේ නෙමේනේ. වොමිට් කළානේ. එක අතකට අද නුවර යන්න නැතිවුන එකත් හොඳයි."

ඇය කීවාය.

"මම බෙහෙත් ටිකක් අරන් යන්නම් සුද්දි. සුද්දි යන්න."

ඇය බැලුවාය.

"මං ඉන්න එපාද?"

මේ කොල්ලාත් සමඟ ගහගන්නේ ඇයිදැයි ඇයම දන්නේ නැත.

"නෑ මේ මම"

"අද මාත් එක්ක ගෙදර යන්නේ. කට හොල්ලන්න එපා. එනවා මෙතන"

දේවක බලාගෙනම උන්නේය. 'ඔය ඉතින් බලාගෙන ඉන්නවා.' ඇය සිතින් කීවාය.

"චුට්ටක් සීගිරි එකට ගිහින් බලන්නකෝ සුද්දි."

"මං මේ දුවන් ආවේ දැන් සීගිරි එකක් බලන්නද ආ."

ඇය ඇසුවාය.

"ඔළුවක් කකියනවද?"

"සුද්දි අතගෑවාම ගියා"

ඔහු කීවේය. එවරනම් ඇය සිනාසුනාය.

"තව තැන් දෙක තුනක් අතගෑවානම් උණත් බහියිනේ එහෙනම්."

ඇය කීවේ ප්‍රතිකාර කාමරයේ එල්ලා තිබූ ඩෙංගු නිවාරණ පෝස්ටරය දෙස බලා සිනාසෙමිනි. දේවක ඒ මුහුණ දෙසම බලාගෙන උන්නේය.

"අප්පච්චිට කිව්වද?"

"න්නෑ සුද්දි."

"කාත් කවුරුවත් නැති හිඟන්නා වගේ ආවා මේ කොල්ලෙක්වත් අඩගහගෙන නේද? එච්චරට අසරණයා. දැන් කවුරුවත් බලන්නේ නෑ. හොයන්නේ නෑ. එහෙමයි

හිතන්නේ නේ."

වෙන කොහොම හිතන්නද කියා දේවක සිතුවේය. අද ඇය මේ මොනවාද කියන්නේ කියා ඔහුට තේරෙන්නේ නැත.

"මං කියන්නද අප්පච්චිට කතාකරලා"

"එපා සුද්දි. අද අප්පච්චි කන්ස්ට්‍රක්ෂන් මිටින් එකක. කළුතර බ්ලූ වෝටර් එකේ. එයාට එන්න විදිහක් නෑ. මෙහෙම කිව්වාම එයාට එතන කරගන්න දේත් කරගන්න බෑ"

ඇය දිග සුසුමක් හෙළුවාය.

"ඇස් පියාගන්ඩ."

ඇය කීවාය. ඔහු ඇය කියූ දේ කළේ බණිවී කියා සිතුන නිසාය. භාවනා මුව තදකරගත්තාය. ඔහු දෑස් පියාගත් පසුව ඇය ඔහුගේ හිස

මෘදුව අතගෑවාය. ඔහු බලාගෙන සිටිද්දී ඒක කරන්න බැරි ඇයිදැයි ඇයට තේරෙන්නේ නැත.

මේ නළලතට දැනෙන පහස හාස්කමක්යැයි දේවකට සිතෙයි. ඔහු සිතුවේ එක්දෙයකි. මේ අත මෙහෙමම මේ නළල මත තිබේනම් කියාය. එහෙත් දැන් මේ දෛවය වෙනස් වී ඇත. සිහිනෙකින්වත් එහෙම සිතිය නොහැක.

ඔහු මොනවද බරට හිතන බව ඇය ඔහුගේ මුහුණේ වෙනස්වන ඉරියව්වලින් තේරුම් ගත්තාය. එසේ සිටියදී ඔහු දෙස ටිකක් නිස්කලංකයේ බලාගෙන ඉන්නට පුළුවන. මේ අඟල් හත අටක් එහායින් සිටින පිරිමි රූපය තමාගේ දෛවයේ සදාතනික පිලිරුව

නොවේදැයි භාවනා සිතුවාය. එය එසේම වේවා කියා ඇය පැතුවාය. ඇය පැතූ රහසිගත නමුදු බරපතල පැතුමක් ඇගේ හෘද කපාට දිගේ ධමනිය දිගේ අත දිගේ පැමිණ ඇඟිලි තුඩුවලින් ඔහුගේ නළලට ආවාක් මෙන්ය.

දේවක හදිස්සියේ ඇස් ඇර බැලුවේය. භාවනාගේ දෙනෙත් තිබුනේ ඒ මුහුණ මතය. ඇයට හදිස්සියේ ඇස් ගන්නට බැරිවිය. එවැනි ඕනාකමක්ද නොවින.

ඇස් හතර එකට තදින් හමුවී තිබුණි. භාවනා කිසිවක් කීවේ නැත. ඔහුට කියවුනේද නැත.

එහෙත් දෙදෙනාගේම කළු ඇස් ඉංගිරියාවන් තුළ උන්නේ ඔහුය.

ඇගේ දෑස් තෙත්විය. තෙත්වීගෙ

නම ගියේය. දේවක අමු අමුවේම ඒ කඳුළු දැක්කේය. ඔහුගේ ඇස් කොහොමත් තිබුනේ තෙත්වය.

"ඇයි සුද්දි අඬන්නේ."

ඔහු කරුණාවෙන් ඇසුවේය. ඇය කිසිවක් නැතැයි කියන්නට මෙන් හිස වැනුවේය.

"අඳ මාත් එක්ක ගෙදර යන්නෝන. හරිමාත් එනවා."

දේවක කිසිවක් කීවේ නැත. අතුරුගිරියේ දුප්පත් ගඩොල් කෑල්ලට ඇය එනවා කියා හිතද්දීත් පුදුමය.

"සුද්දිව ගෙදරින් හොයයි."

ඇය කිසිවක් කීවේනැත.

"මම වෙහිකල් එක යැව්වා. කැබ් එකක් අරන් යන්. බලමුකෝ ඩොක්ටර් මොනවද කියන්නේ

කියලා."

දැන්නම් අසනීපයක් නැතුවාත් වාගේය.

"උණ අඩුයි වගේ සුද්දි."

භාවනා ඔහුගේ ගෙළට අතක් තබා බැලුවාය. මේ ඔහුගේ ශරීරයත් සමඟ ඇති බැ. දීම කුමක්දැයි ඇයට තේරෙන්නේ නැත. 'අතගානවා උණ බලනවා අනේ මන්දා' ඇය තනිවම සිතුවාය.

"අඩුයි වගේ තමා. ඉන්ජෙක්ෂන් එකට වෙන්න ඇති."

නැත. කොල්ලාගේ උණ බැස්සේ ඉන්ජෙක්ෂන් එකට නොවේ. භාවනා ආ නිසාය.

"මම වීල් එකක් අරන් සුද්දි."

ඔහු කියාගෙන ආවේය.

"ඇති."

එහෙනම් ඇත්තටම ඇතිය. දෛවවරයා දේවකගේ රුධිර පරීක්ෂණ වාර්තාව අතේ තබාගෙන ආවේය.

"ඩොක්ටර්."

"ඩෙංගු නෙමේ. වෛරස් ෆ්ලූ එකත් නෙමේ"

ඔහු කීවේය. 'උණ ඇත්තටම ගත්තේ ඇයි කියලා දැන් කියන්න ඩොක්ටර්ට.' භාවනාට කියන්නට සිතුණි.

"පහුගිය ටිකේ ටිකක් මහන්සිවුණා ඩොක්ටර්. නිද්‍රාගත්තේම නෑ."

"ඒක වෙන්න ඇති. මං බෙහෙත් ටිකක් දෙන්නම්. මේක බීලා බෙඩ් රෙස්ට් කරන්න."

දේවක හිස වැනුවේය. 'කරයි එයාම බෙඩ් රෙස්ට්. හෙට ඉඳලා

දුවන් එයි සීගිරි එකට.' භාවනා එය දන්නේය. ඔහුව එක උණකට නැවැත්විය හැකි පුතන්ඩියෙක් නොවේ. ඈය ඒ බව දැනගෙන උන්නාය.

දේවකට නියම කළ බෙහෙත් සියල්ලම අසාගත්තේ භාවනාය. ෆාමසියෙන් දෙන බෙහෙත් තුන්ඩුවද ගත්තේ ඈයය. සියල්ලම ගෙන මුදල්ද ගෙවා ඈය කැබ් රියකට කතාකලාය.

කැබ් රිය ඇණවුම කළ ඉක්මනින් ආවේය.

"යන්. ඇවිදගෙන යන්න පුළුවන්ද? මී"

දේවක දුක්බරව සිනාසුනේය. ඩිස්පෙන්සරියෙන් යද්දී භාවනා ඔහුගේ බාහුවක් අල්ලාගත්තාය.

'එහෙම ඇවිදගන්න බැරිකමක් නෑ. මේ මම නිකං අල්ලගත්තේ.' ඇය තමාටම කියාගත්තාය.

"ඉඳගන්නකෝ."

භාවනා ඔහුව පිටුපස අසුනේම වාඩිකරවාගත්තාය. පසුව ඇයද එයට ගොඩවූවාය.

"අද සීගිරි එකට ආවේ මෙහෙමද?"

දේවක අසරණව හිස වැනුවේය. වෙනදාට ඔහු මෙහෙම එන්නේ නැත.

"කොහෙටද මිස්."

"අපි අතුරුගිරියට යන්."

භාවනා කීවාය. දේවක කිසිවක් කියන්නට ගියේ නැත. එසේ කියා මේ වෙලාවේ කෙල්ලගෙන් බැණුම් අසන්නට නොහැක. මඟ නවත්වාගෙන ෆාමසියක් ළඟින් ඇය

බැස්සාය.

"මං ෆාමසියෙන් ගන්න තියෙන බෙහෙත් ටික අරගෙන එන්නම්. ඔහොම ඉන්නකෝ ඇලවෙලා."

ද්ේවක හිස වැනුවේ අසරණවය. ඇය ගිය පසුව ඔහු කමිසයට යටින් අත දමා පපුව අතගාගත්තේය. 'දැන් උණක් නම් නෑ. ඒත් හාට් ඇටෑක් එකක් එන්න වගේ. අනේ මන්දා බයිපාස් එකක් කරන්න වෙයිද කියලාමේ මොනවා වෙනවද දන්නේ නෑ.' ඔහු සිතුවේය. වෙන දෙයක් වෙච්චදෙන් කියා ද්ේවක සිතාගෙන උන්නේය.

භාවනා ඉක්මනින් බෙහෙත් ටික ගෙන ආවාය.

"මෙතන ෆුඩ් සිටි එක ළඟින් ටිකක් නවත්තන්න"

ඇය මේ හදිස්සියේ ෆුඩ් සිටියට යන්නේ ඇයි?

"අමාරුද දේවකයියේ"

"අර දෙවෙනි පාර විද්ද ඉන්ජෙක්ෂන් එක නිසා වෙන්න ඇති ඔළුව ටිකක් කැරකෙනවා වගේ සුද්දි."

"ඒක ටිකක් සැර පේන් කිලර් එකක්නේ. ඒක නිසා වෙන්න ඇති."

භාවනා ෆුඩ් සිටි එක ළඟින් බැස මෝල්ටඩ් මිල්ක් එකක් නූඩ්ල්ස් ටිකක් කිරි පැකට් දෙක තුනක් සහ කොළ ඇපල් ගෙඩි ටිකක් ගත්තාය. එනගමන් ඇය මිල්ක් චොකලට් එකක්ද ගත්තාය. මේ ඇය ගන්නේ ඇයට උණ හැදුණු විට කන ඒවාය. 'එයත් මේවා කන්න ඕන. චොකලට් කෑවම ඇඟට පණක් එනවා' ඒත්

සමඟම ඇය ඔරේන්ජ් බාර්ලි බෝතලයක්ද ගත්තාය.

කෙල්ල එද්දී ඔහු ආසනයේ පැත්තකට හැරී ඇස් පියාගෙන උන්නේය. 'අනේ දෙයියනේ අමාරු ඇති'

"මේකෙන් උගුරු දෙක තුනක් බොන්නකෝ. එදා මටත් ගෙනාවේ. බිව්වාම සනීපයක් ආවා"

ඇය ඔරේන්ජ් බාර්ලි බෝතලය විවරකර දේවකට දුන්නාය. ඔහු ඉන් බාගයක්ම බීගෙන බීගෙන ගියේය. 'පුදුම පිපාසයකින් ඉන්න ඇත්තේ' ඇය සිතුවාය.

"අයියේ."

දේවක දෙනෙත් ඇරියේ අමාරුවෙනි.

"මෙහෙමම මම යන්නම් සුද්දි"

"මෙහෙම යවන්න මම. ඇයි එහෙම කියන්නේ. කෝ එන්න."

පුදුමය. කෙල්ල ඔහුව ගත්තේ ඇගේ දෙපා මතටය. දේවක එහෙමම ඇයගේ දෙපා මතට වැටුණෝය. ඩෙනිම් ජීන්ස් එක නිසා බේරී තිබූ කෙල්ලගේ දෙපා මතට ඔහු හිස තැබුවේය.

"ම් ඔහොමම යන්. ඇස් පියාගෙන යන්න."

දැන් ඇස් පියාගන්නේ කෙසේද? මේ අමාරුව නැත්නම් බෝනස් වාසනා කියන්නේ මේවාටය. එහෙත් හරි ඉක්මනට කොල්ලාගේ දෑස් පියවිණ. 'දැන් දේවකයියේ මේ හදවත දීලා ඉවරයි. සන්තකේම දුන්නා. ආයේ ගැනීමක් නෑ. දුන්නා කියන්නේ දොතින්ම දුන්නා. අදින්

පස්සේ මම කිසිම කෙනෙක්ව මේ උකුලට ගන්නේ නෑ. ඔයාවයි ඔයාගේ දුවවයි පුතාවයි විතරයි. ඩැට්ස් ඉනෆ්. ඒ ඇති' ඇය දේවකගේ හිසට අතක් තබාගෙන ඒ ප්‍රාර්ථනය කළාය. පසුව පහත්වී ඔහුගේ මුහුණට එබුනාය.

"දොයි..ද?"

ඇය මුමුණා මෙන් කීවාය. දේවකට ඇත්තටම සනීප නින්දක් නොවේනම් අලස සුවදායක නින්දක් ගියේය. එක දිගට පුරා රාත්‍රීන් විසි ගණනක් නිදි නොබලා දුක් වින්ඳ කොල්ලා හරියටම නිදාගත්තේ දැන්ය.

"මේ අතුරුගිරියට යන්න කොච්චර වෙලා යයිද?"

"පැය බාගෙන් අපි අතුරුගියේ

මිස්"

"එහෙනම් මේ හෝමාගමට ටිකක් ගිහින්ම යන්ද?"

කෙල්ල කීවේ දුර පාරය. ඔහුව මෙහෙම තබාගෙන පැයක් දෙකක් ඉන්නට ඇයට ආසය. භාවනා ජංගම දුරකථනය සයිලන්ස් කළාය. ඒ ගමන්ම වාගේ තාරකා කතාකළාය.

"මං යන්න බබා. උඹ කොහෙද ගියේ."

"මේ දේවකයියට අසනීපවෙලා එයාව එක්කගෙන යන්න ආවා. මං එනකොට මෙඩිකල් සෙන්ටර් එකේ සුදූ."

භාවනා හිමිහිට කීවාය.

"මං යනවා. කොල්ලව හෙඳට බලාගනින්. මං අද එන ගමන් කොල්ලට කතාකළා."

"ඔයා."

"ම්. එක ප්‍රශ්නයයි ඇහුවේ. එකයි. ජස්ට් වන්."

"වට්."

"උඹට ආදරේද නැද්ද කියලා"

"එතකොට."

"මොනවද කොල්ලා කිව්වේ."

"මොකක්ද සුදූ. කියන්නකෝ"

"සුද්දි මගේ පණ කිව්වා. එච්චරයි. කොල්ලව බලාගනින්. අපිට හම්බවෙච්ච වල් සත්තු එක්ක බලද්දී කොල්ලා සමනළයෙක් වගේ. එහෙම කොල්ලෝ නෑ බං මේ ලෝකේ. මං යනවා. එයාපෝට් ගිහින් ගන්නම්"

"හොඳයි. ලව් යූ මගේ සුදු අක්කී"

"මී ටූ පැටියෝ"

භාවනා දේවක දෙස බැලුවාය.

"මගේ පොඩි අක්කට කියපු දේ මගේ ඇස්දෙක දිහා බලාගෙන කියන්නකෝ දෙයියනේ. ආසයිනේ. මී අනේ මගේ පණ කිච්චලු. දැන් කෝ පණ. මී පණගේ කකුල් දෙක උඩ දොයිද? ආ."

භාවනා අසීමිත සැනසීමක් වින්ඳාය. දැන් හිතම සැණකෙළියක් බඳුය. මේ සතුට සමරන්නට ඉන්නේද ඔහු පමණය.

# 41

අතුරුගිරිය පාරට දැමූ පසුව භාවනා ඔහුව නැඟිට්ටවා ගත්තේ කන පිරිමැදය. කණ පිරිමදින විට වෙන්නේ මොනවාද කියා දන්නවානම් කෙල්ල එහෙම කරන්නේ නැත.

"අපි අතුරුගිරියේ."

දේවක ඇහැරී බැලුවේය. ඔහු ඇයගේ දෙපාවලින් හිස ගත්තේ ලැජ්ජාවෙන් වාගේය.

"මම සුද්දි මේ."

'පණාගේ කකුල් දෙකට ඔළුව තියන් ඇවිත් මොකටද මූණ රතුකරගන්නේ. ආ' ඇයට අහන්නට සිතෙන්නේ ඒකය.

"ගෙවල් අහගන්න ඕන නිසා කතාකළේ. සීගිරි එකේ වැඩ හොඳට යනවා. මම රුවන්තට කතාකළා. ඒවා හිතන්න එපා. ගේ කියන්න."

දේවක නැඟිට රියදුරාට නිවසට යන පාර කීවේය. එය සොයාග උනීම පහසුය. අවසානයේදී දේවකත් ජීවනුත් ඉන්නා ගඩොලින් බාගෙට නිමකළ නිවස ඉදිරිපිට නැවැත්විණ.

"අනේ මෙහෙද ඉන්නේ"

"ඔව් සුද්දි"

"නිස්කලංක ෂෝක් තැනක්නේ. වෙල් යායක්ද මේ."

"ඔව් සුද්දි. අප්පච්චි අමාරුවෙන්

හොයාගත්තේ.”

“බහිමු”

අද හේරත්වත් නැත. ‘ඔයා මුළින්ම අපේ ගෙදරට එන දවස. තේ එකක්වත් හදලා දෙන්න පණක් නෑ’ දේවක සිහිමද ගතියෙන් සිතුවේය.

“එහෙනම් යන්න. මං ආයේ ඕන වුණාම කෝල් කරන්නම්. මේ තැනට එන්න පුළුවන්නේ. නේද?”

ඇය කැබ් රියදුරාට මුදල් ගෙවා කීවාය. ‘අනේ ඔයා අද යන්නේ නැද්ද සුද්දි.’ ඔහු අමාරුවෙන් සිතුවේය.

“පුළුවන් මිස්. ටිකක් වේලාසන කියන්නකෝ.”

භාවනා නිවස දෙස බැලුවාය. ඔහුත් අප්පච්චිත් ඉන්නේ පුදුමාකාර නිස්කලංක තැනකය. ‘ඔයයි

අප්පච්චියි හරි අමාරුවෙන් ජීවිතේ ගැටගහගෙන යනවා ඇත්තේ.'

"එන්න සුද්දි."

රතු ගඩොලින් පමණක් වටවූ නිවස පරිසරයට තිබුණේ විවෘතවය. නිවසේ පිටුපස තිබුණේ අතුරුග රිය වෙල්යායට මුහුණලාය. භාවනා නිවසට ආවේ වට පිට බලමිනි. මේක ගෙයක් නොවේ. ගේ කෑල්ලකි. අතුරුගිරියේ මේ වෙල්යාය ළඟ ගේ කෑල්ලේ දේවකත් අප්පච්චීත් ජීවත්වන කුඩා ජීවිතය භාවනා මවාගත්තාය. නිවස කුඩා කාමර කෑලි දෙකක් හා සාල කෑල්ලක් පමණක් ඇති නිවසකි. එහි ඇත්තේ කුඩා කුස්සියකි. තවමත් නිවසේ වැඩ නිමකර නැත. ඇත්තේ ගඩොල් බිත්තිය. බොහෝමයක්

දොර ජනේල් උළුවස්සන්ද සවිකර නැත. ඒත් මේ නිවස භාවනාගේ සිත් ගත්තේය. නිවස පින් පාටය. ඇරත් නිස්කලංකය. නිවස කුඩා වූවාට තරමක වත්තක් ඇත. පිටුපස වෙල්යායට ඉඩට කෙළින්ම මුහුණ ලා තිබුණි. අතුරුගිරියේ පන්සල පාර ඇත්තේ ඒ අද්දරිනි.

"ෂෝක් තැනක්නේ."

වෙන දවසක ඇය ආවානම් මීට වඩා ලස්සනට ඇයට පිළිගන්නට තිබුණි.

"හුළඟ එහෙමම ගේ ඇතුළට එන නිසා අද සීතලක් එයි දේවකයියේ."

දේවක සිනාසුනේය.

"ඒ හුළඟ සනීපයි සුද්දි. මං තේ ටිකක් හදන්නම්."

"පිස්සුද? මඟ දිගට වෙව්ලනවා.

කලන්තේ. තේ එපා. මං කිරි පැකට් ගෙනාවා. අපි මොනවාහරි කාලා කිරි පැකට් බොමු.”

ඇය මඟින් සැන්විචස් ගත්තාය. බෙහෙත් දියයුත්තේ මොනවා හෝ කන්නට දීය.

“මෙහෙම ඉඳගන්නකෝ. එහේ මෙහේ දුවන්නේ නැතුව. මං දැන්මම යන්නේ නෑ.”

ඇය මේ නිවසට ආවා කියා සිතද්දීත් දේවකට පුදුමය.

“ඇයි ඔහොම බලන්නේ.”

“න්නෑ. සුද්දි ආවනේ. මට මේ අමාරුයිනේ. ”

ඇය නෙත්බරකර සිනාසුනාය. ‘ඉතින් ෂෝක්නේ. අපි දෙන්නා විතරයි අද’ ඇය සිතින් කීවාය.

“මේකද කාමරේ.”

"මී. ජනේල තාම නෑනේ සුද්දි. අපි මේ."

"හරි ඉතින්. මෙතනින් ඉඳගන්නකෝ."

දේවක ඉඳගත්තේය. ඇය බෙහෙත් ටිකත් ඔඩොක්කුවට ගත්තාය.

"මිහ්. ඔක්කොම බෙහෙත් බොන්න තියෙන්නේ කෑමෙන් පස්සේ. අපි සැන්ච්චස් එකක් කාලා ඉමු. මී. මේ ඇඳුම් හිරකරගෙන ඉන්න බෑනේ. සරමක් දාගමු."

දේවකගේ දෑස් බලාගෙන සිටිද්දී පියවීයයි.

"අයියේ"

"මට සුද්දි."

"බලන්න ඉතින්. කොච්චර අමාරුවකින්ද ඉන්නේ. මෙහෙම

ටිකක් ඇලවෙන්නකෝ. මං කොට්ටයක් අරන් එන්නම්"

සාලයේ වූයේ පරණ කුෂන් සැටියකි. එහෙත් එය සනීපය. දේවක බොහෝ දිනවලදී නිදාගන්නේ මේ සැටියේය. තරමක් බොකුටු වී ගොස් ඇත්තේ කොල්ලා එහි නිදාගෙනමය.

"බඩත්ගිනි ඇති. බඩගින්නේම ඉන්න ඇත්තේ. තේ එකක්වත් බීලා නැතුව ඇයි හිටියේ"

භාවනා අසන්නේ සිතිනි. ඔහු ඉන්නට ඇත්තේ ඒ තරම් දුක්බර මානසිකත්වයකද? 'මම නැතිමවෙලා යයි කියලද හිතුවේ' ඇයට ඔහුව ඇහැරවා අසන්නට සිත්වෙයි. එහෙත් සියල්ලටම පෙර ඔහුව සනීපකරගත යුතුය. භාවනා විනාඩියක් දෙකක් ඔහු ළඟට වී හිස අතගෑවාය.

දේවකගේ දෑස් යළිත් පියවිණ.

ඇය දිග සුසුමක් පිටකර කාමරයට ගියේ කොට්ටයක් අරගෙන එන්නටය. ගඩොල් කාමරය පිළිවෙලය. එහි කෙළවරක දේවකගේ පොත් මේසය විය. පැතතින් කුඩා අල්මාරියක් විය. කුඩා සිංගල් ඇඳ තිබුණේ විවෘත ජනේලය අද්දරමය. එහි ජනේල පලු නැතිවුවද යකඩ ග්‍රිල් ගසා තිබුණි. ඒ අල්ලා තිබූ උළුවහුවලටය. කටු සිමෙන්ති බිම දෙස භාවනාට බැලිණ. 'දවසක ඔයාව තැනකට ගන්නවා.' ඇය සිතාගත්තාය.

කොට්ටයක් ගෙන එන්නට ගොස් ඇය ටිකක් නැවතී බලාගෙන උන්නාය. භාවනා ගොස් නතරවූයේ ඔහුගේ කුඩා අල්මාරිය ළඟය.

එය නිකමට ඇර බලන්නට ඇයට ආසාවක් ඇතිවිය. එය ගැහැණු හදවතක ඇතිවෙන ආසාවකි.

භාවනා එය විවෘත කළාය.

අල්මාරි දොරේ වූ තමාගේ පින්තූරය දකිද්දී භාවනාගේ අතක් ළයට ගියේය. මේ ඡායාරූපය කවදා කොහොම ඔහු සොරාගත්තාද කියා දන්නේ නැත. එහෙත් පොස්ට් කාඩ් ප්‍රමාණයේ මේ ඡායාරූපය තිබුනේ තමාගේ කාර්යාලයේ මේසය උඩය. 'අනේ දෙයියනේ. සූරියආරච්චිලා මාව අරන් ගියානම්. මේ අල්මාරි පලුව අල්ලගෙන කොල්ලා අඬනවනේ. අනේ දෙයියනේ' භාවනාගේ ඇස්වලින් කඳුළු සට සට ගා වැටෙන්නට විය. 'ඔයා හරි ගුණයහපත් කොල්ලෙක්. මාව මේ

දුප්පත් අල්මාරි පලුවේ ගහගන්න කලින් ඔයා මාව ඔයගේ පපුවේ පලුවක ගහගත්තා කියලා මම දන්නවා පව්.' ඈය සිතින් සිතුවාය.

ඇගේ ඡායාරූපයට උඩින් තිබුණේ දේවකගේ අප්පච්චිගේත් අම්මාගේත් එකට ඉන්නා ඡායාරූපයකි. ඒ දෙස බලද්දී කෙල්ලගේ සිතට අමුත්තක් දැනුණි. මේ ඡායාරූපයේ ඉන්නා දේවකගේ අම්මාගේ මුහුණ දැක පුරුදු බවක් ඇයට දැනුණි.

ඇය ටික වෙලාවක් ඒ දෙසම බලාගෙන උන්නාය. පසුව ඇය හරි පරිස්සමින් ඒ පින්තූරයට ළංවී බැලුවාය.

"අනේ දෙයියනේ මේ නැතිවෙච්ච අපේ පොඩි නැන්දි"

භාවනාගේ පපුව වේගයෙන්

ගැහෙන්නට විය. ඇය වෙව්ලමින් මෙන් ඒ පින්තූරය දෙස බලාගෙනම උන්නාය. නැත. වරදින්නට විදිහක් නැත. මේ ඇයමය. මියගිය නර්මදා නැන්දාමය. ඇයමය. නිවසේ පවුලේ පින්තූර අතරත් සීගිරි එකේ පැරණි ඡායාරූප අතරත් ඇගේ පින්තූර ඇත. භාවනා ඇයව දැක ඇත්තේ ඒ පින්තූරවලිනි. හැමදාම දකින නිසා මේ ඡායාරූම සිතට කා වැදී ඇත. සීගිරි එකේද ඇගේ පින්තූරයක් ගසා ඇත.

"අනේ නැන්දිගේ පින්තූරයක් මෙ..ත..න ඇ..යි?"

භාවනාගේ සිතට විදුලියක් ගැසුවක් මෙන් දෙයක් සිහිවිය. ඒ දේවක සම්මුඛ පරීක්ෂණයට ආ මුල්ම දවසය.

"එදා ඔයා දෙයියනේ නැන්දිගේ පින්තූරේ දිහා බලාගෙනම උන්නා. මට පුදුමත් හිතුණා. ඒත් මෙහෙම."

භාවනා සියල්ල සිතින් විසඳාගත්තාය. 'එහෙනම් ඔයා මගේ පොඩි නැන්දිගේ පුතා. එකම පුතා. හැංගිලා ගිය පුතා. අනේ දෙයියනේ. එතකොට මේ ජීවන් මාමා' මෙහෙම වුයේ කෙසේදැයි ඈයසිතුවාය.

ඇය වේගයෙන් ඇගේ දුරකථනය ගත්තාය. ඊටත් පසුව එහි ඇති කැමරාව ක්‍රියාත්මක කර දේවකගේ අම්මාගේත් තාත්තාගේත් පින්තූරයේ කොපි කිහිපයක් ගත්තාය. මේ ටික කරද්දීත් කෙල්ලගේ අත වෙව්ලන්නට විය.

දැන් පපුව ඇත්තේ සාමාන්‍ය ලෙස නොවේ. කොහේට හෝ ගොස්

තනිවී සිතිය යුතුය. එහෙත් මේ අසනීප කොල්ලාව දමා යා නොහැක.

භාවනා නේත්‍රාට ඇමතුමක් ගත්තාය.

"සුද්දි."

"දේවකයියට හොඳටම උණ. මම මේ බෙහෙත් ටිකක් අරන් දීලා අක්කා."

"මට රුවන්ත කිව්වා පැටියෝ. කොල්ලාව ඇරලවලා එන්නකෝ."

"ඔයත් එක්ක ලොකු දෙයක් කතාකරන්න තියෙනවා. ටිකක් වේලාසන ගෙදර එන්න."

"ම්."

මේ දේ කතාකරන්න ඉන්නා හොඳම කෙනා අක්කාය. භාවනා කොට්ටය පපුවට තබාගෙන ආවේ ඇස් දෙක ලොව් ගෙඩි දෙකක් මෙන්

රතුව තිබෙද්දීය. 'අනේ මගේ පොඩි මස්සිනා. ඔයාව අවුරුදු විසි ගාණක් මට නැතිවුණානේ. ඒ වෙනුවට මේ අමනුස්ස මස්සිනාලා දෙන්නෙක් ළඟ උන්නනේ. පුදුමයි. කොහෙද ගිහින් හිටියේ.' ඇය තොල්පට තදකරගෙන සිතුවාය.

"අනේ ඔයාගේ අප්පච්චිව ඉක්මනට බලාගන්න ඕනේ."

අක්කා කතාකළේ ඔහු ගැන ප්‍රසාදයෙනි. 'ජීවන් මාමා හරි හොඳයි. පුදුම හොඳයි. අපට එයාව නැතිවුණා. එයාගෙයි නැන්දිගෙ යි පුතාවත් නැතිවුණා. කොහේ ඉන්නවද මොනවා කරනවද කියලා දන්නේ නෑ පව්' අද උදෙත් ඇය කීවාය.

"මේ ඉන්නේ ඒ කොල්ලා. ඔයා

දවසක් කිව්වා සීගිරි එකට ආපු හරිම හේතුව මට කියනවා කියලා. මට මේ කතාව කියන්න ඉන්න ඇති. පව්."

මේ තරම් දක්ෂ කොල්ලෙක් බිහිවූයේ අර ලේ නිසාය.

"කවුරු‍ැ කොහොම කිව්වත් දැන් මේ සීගිරි එකට ඔයාටත් ලේ උරුමයක් තියෙනවා. මට ඒකම ඇති. ඒකම ඇති."

භාවනා පපුවම අතගාගෙන මෙන් කීවාය.

"දේවකයියේ."

ඇය ඉඳගත්තේ ඔහුගේ ළඟමය. කෙනෙක් උක්කුටි වී සැටියක නිදාග නිද්දී දුක හිතෙයි. ඇයටද එසේමය. භාවනා ඔහුව ඇහැරවන්නට ගියේ නැත. ඔහුගේ ළඟටම වී ඒ හිස

අගතාමින් උන්නාය. 'කවදාද මගේ පින්තූරයක් ගෙනත් අල්මාරියේ ගහගත්තේ. මී. එච්චරම ආදරේද?' ඇය මුව තදකරගෙන ඇසුවාය. සිතින් ඇසුවාය. මේ සියල්ල මෙසේ සිදුවූයේ කෙසේද?

නර්මදා නැන්දා ගැන කොතරම් අසා තිබුණාද? ඇයටත් ජීවන් මාමාටත් විවාහවෙන්නට දුන්නේ නැති සීයා පවා ඔහු ගැන කතාකළේ කොතරම් ආදරයකින්ද?

මීට මාස දෙකකට පෙර සීගිරි එකට ආවේ ඒ දෙන්නාගේ පුතාද?

"අක්කත් කිව්වා. සීයත් කිව්වා. කොල්ලව හරියට පුරුදුයි කියලා. ඒ ලේ බැඳීම නිසාද?"

භාවනා මේ සියල්ල සිතුවේ ඔහුගේ හිස පිරිමදිමිනි.

"ඔයාව දැන් හරියට පරිස්සම් කරගන්න වෙනවා දේවකයියේ ගොඩක් පරිස්සම් කරගන්න වෙනවා. ඔයා දැන් මගේ ජීවිතේ වගේ. බලාපොරොත්තුවෙන් උන්නා මේ වගේ අහිංසක ආදරයක්. මගේ පොටෝ එක පවා අල්මාරියේ ගහගෙන ඉන්න කොල්ලෙක්ව. සූරියආරච්චිලා එක්ක ගියානම් මගේ පොටෝ එක ගහන්න වෙන්නේ මරණ දැන්වීමේ."

භාවනා එය හොඳින්ම දැනගෙන උන්නාය. මේ ආදරය අහිමිව ගියානම් එය මේ ආත්ම භවයේ ලබන දරුණුම අහිමිවීමය. 'ඔයාට ගොඩක් පින් පොඩ්ඩි අක්කේ. ගොඩක් පින්' ඇය පින් දුන්නේ තාරකාටය. ඒ දරුණු දෛවයෙන් තමාව මුදවාගත්තේ ඇයය.

"ජීවිතේ ලස්සනම වෙලාවේ මගේ පිස්සා නිදිනේ."

භාවනා මෘදු සිනාවක් සහිතව ඔහු දෙස බලාගෙන සිතුවාය. ඔහු උණ යන්තමට අඩුවී ඇත. ඇය පරිස්සමට නිවස පුරාම ඇවිදගෙන ගියාය. අප්පච්චිගේත් ඔහුගේත් අහිංසක ජීවිතේ සාක්ෂි හැමතැනකමය.

"ඔයා මෙතන වෙලා වෙලා වෙන්න ඇති උයන්නේ පව්"

පොඩි කුස්සියට එමින් ඇය සිතුවාය. භාවනා කුඩා කේතලය ගෙන හරි පරිස්සමින් එය ගෑස් ලිපේ තැබුවාය. තේ හදන බඩු ටික ඒ ළඟම තබා තිබුණි.

"ටිකක් කහටට තේ ටිකක් හැදුවොත් ඔයා බොයි. කිරි පැකට්

බොන්න අප්පිරියත් ඇති. සීතලට සීතලේ සුදු කිරි බොන්න බෑනේ”

කිරි තේ හදනවානම් කහට ටිකක් වැඩියෙන් දැමිය යුතුය. කෙල්ලට මිම්මක් ප්‍රමාණයක් දන්නේ නැත. එහෙත් ඇය තේ හැඳි දෙකක් පමණ දැමුවාය. කහට බලා තවත් ටිකක් දමනවා කියා ඇය සිතාගත්තාය.

“ඔයාගේ දක්ෂකම ආවේ එහෙනම් ඔයාගේ අම්මගෙන්. ඔයාගේ කරුණාවන්ත මනුස්සකම ආවේ ඔයාගේ අප්පච්චිගෙන්. ඔයා මේ තරම් දක්ෂ වුනේ ඒකයි. සීගිරි එක හැදුවේ සීයයි තාත්තයි ඔයාගේ අම්මයි. සීගිරි නම පවා දැම්මේ නර්මදා නැන්දා. හැමදේ සපිරි නාමය සුපිරි කියන ටැග් එක ලියලා තියෙන්නෙත් නැන්දිමයි. ඒක

එහෙමම පුතාට ආවා."

දැන් භාවනාගේ සිතට සැනසීමක් දැනෙයි. තාත්තා වැඩියෙන්ම ආදරේ ඔහුගේ බාල නැගණියටය. ඒ ගැන ඔහු කියා ඇත්තේ වරක් දෙවරක් නොවේ. අම්මාද නර්මදා නැන්දා ගැන කතාකරන්නේ පුදුමාකාර ප්‍රසාදයකිනි. "මෙයාලා වගේ කපටි අම්මන්ඩිලා නෙමේ නර්මදා නංගි. හරිම හොඳයි. අක්කලවයි ඔයාලවයි ලැබෙන්න ඉන්නකොට මගේ ළඟමයි. ඔයාව ලැබෙනකොට එයාට යන්න වෙලා. සීයා එයාව ගෙදරට ගත්තේ නෑ. ඒත් හොරෙන් ඇවිත් ඔයාව බලලා ගියා. ඔයාට භාවනා කියලා නම දැම්මෙත් නර්මදා නැන්දම තමයි." ඉඳුනිල් මේ ළඟදීද භාවනාට කීවාය. 'මං ඔයාගේ පුතාව බලාග න්නම් නැන්දි. මට පිහිට වෙන්න.'

භාවනා සිතින් කීවාය.

දැන් සීගිරි එක මැද ඔහු වෙනුවෙන් සටන් කරන්නට තවත් අයිතියක් ඇත. භාවනා සිත දැඩිකරගත්තාය.

“අද රෑට අක්කට කියනවා. එයා කට පුරා දේවකයියට මල්ලි කියලා කිව්වේ එහෙනම් මේ බැඳීම නිසයි.”

හැමදේම සිදුවුණේ පුදුමාකාර ලෙසිනි. භාවනා රස කිරි තේ දෙකක් හැදුවාය. ‘මට මේ තරම් රහට කිරි තේ හදන්න පුළුවන් කියලා මමවත් දන්නේ නෑනේ. තාත්තට හදලා දෙන්නෝන හෙට. ආසවෙයි’ භාවනා කිරි තේ දෙක පොඩි මග් දෙකකට දැමුවාය.

ඇය තේ දෙකත් අතේ තියාගෙන සාලයට ආවාය. දුටු දෙයින් ඇගේ

පපුව ගල්ගැසිණ. දේවක සැටියෙන් පහළට හිස දමාගෙන වමනය කරමින් උන්නේය. භාවනා තේ දෙක තබා දුවගෙන ආවාය. ඔහු ඉන්නේ කොතරම් අමාරුවකින්දැයි කඳුළු පිටවෙන රත්පැහැ දෙනෙත් දෙස බලද්දී ඇය තේරුම් ගත්තාය.

"අනේ. ඇයි මේ."

භාවනා දුවගෙන මෙන් විත් දේවකගේ පිට පිරිමැද්දාය. වමනය කරත් කිසිම දෙයක් යන්නේ නැත. වමනය කියා යන්නේ කහ පාට දියරයක් පමණය. 'දෙයියනේ බඩේ මොනවත් නෑ. එතකොට වේල් කීයක් කාලා නැද්ද' ඇය ඔහුගේ පිට අතගාමින් සිතුවාය. ඔහු විඳ ඇත්තේ එසේ මෙසේ දුකක් නොවේ.

"කමක් නෑ දිගටම දාන්න. මේ

පිත යන්නෝන. හිස කැරකෙන්නේ ඒකයි. දාන්න අයියේ"

ඇය දිගටම ඔහුගේ පිට පිරිමැද්දාය. එය කොතරම් ආදරයකින් ඇය කළාද යත් දේවක ඇඳගෙන උන් කමිසය යටින් අත දමා ඇය ඔහුගේ නිරුවත් පිටම පිරිමැද්දාය. ඔහුගේ ගතින් එන්නේ අසාමාන්‍ය රස්නයකි. මේ සාමාන්‍ය උණක් නොවේ. ගිනියම් උණකි.

"සුද්දි මට."

"මං දන්නවා. අයියට අමාරුයි. බලලා අපි හොස්පිට්ල් යන්"

ඔහු එපා යැයි කියන්නට මෙන් හිස වැනුවේය. තවත් බලාගෙන ඉන්නට පුළුවන්දැයි භාවනා සිතුවාය.

"බලන්න මොනවත්ම කාලා නෑනේ. ඒකනේ මේ කහ පාටට පිත

විතරක් යන්නේ.”

මේ තරම් උණක් ආවේ හිස් බඩ වේල් ගානක් උන් නිසාද? ගැස්ට්‍රයිටීස් අමාරුවටත් එසේ වෙන බව ඇය දැනගෙන උන්නාය.

දේවක පහළට කරගෙන උන් හිස යළිත් කොට්ටයට ගත්තේය. භාවනා ඔහුගේ කමිසයේ බොත්තම් විවර කළාය. දේවක දෑස් විවර කර බලන්නට ගියේය. මේ මොහොත ජීවිතයේ උදාවූ කොතරම් රසබර මොහොතක් වීද? එහෙත් එය විඳගන්නට තරම් සනීපයක් මේ වෙලාවේ ඔහුට නැත.

“දාඩියත් දාලනේ. මං තේ එකක් හැදුවා. අපි මොනවා හරි කාලා ටික ටික මේක බොමු.”

මේ හිස් බඩ කිසිම බෙහෙතක්

දිය නොහැක. භාවනා ගෙන ආ සැන්ඩ්විචස් එක ටික ටික ඔහුට කැව්වාය. එකවර කවන්නට නොහැක්කේ යළිත් වමනයට ඒ යැයි සිතුණ නිසාය.

"මේ තේ එක චුට්ට චුට්ට බොමු පස්සේ අපි ඔරේන්ජ් ක්‍රෂ් එකක් බොමුකෝ. ම්."

දේවක සූස් ගාමින් තේ එක බොද්දී ඇය පපුවට අතක් තබාගත්තාය. 'මිරිස් මාළුවක් වගේ දෙයක් තිබුණානම් පාන් කන්න තිබුණා. නැත්නම් රොටි දෙකක් වගේ.' භාවනා සිතුවාය.

"මේ බෙහෙත් ටිකත් අපි මෙහෙමම බොමු. උණ බහින්නත් ඕනනේ."

දේවකට දෑස් විවර කරගෙන

ඉන්නට අමාරුය. ඇය ඉක්මනින් බෙහෙත් ටික පෙව්වේ ඔහු යළිත් දෑස් වසාගනී යැයි සිතූ නිසාය.

"ම්. දැන් හරි. මෙහෙම ඇස් පියාගන්න. මං ඉන්නවනේ"

# 42

භාවනා ඔහුගේ හිස පැත්තෙන් ඉඳගෙන ඒ හිස ඔඩොක්කුවට ගත්තාය. දේවක හැරුණේය. එසේ හැරුණ විට ඔහුගේ මුහුණ විත් නතරවෙන්නේ ඇගේ ළැමට පහළින් උදරයේය. භාවනා වඩාත් ආරක්ෂිත ලෙස දේවකගේ මුහුණ ඇගේ උණුසුමට ළංකරගත්තාය. 'දැන් ඉතින් ආයේ වෙන කවුරුවත් මෙහෙම තියාගන්න බැහැ රජෝ

හොඳේ. ඔයාම විතරයි’ ඇය සිතින් කීවාය.

දේවකගේ දෑස් ඉක්මනින්ම පියවිණා. භාවනා දෙතොල් පට මෑත්කර සිනාසුනාය. ‘පව්. සිහියක් නෑ. නැත්නම් මෙතන මූණාත් රතු කරගෙන ද්‍රාහක් දේවල් වෙලා.’ ඇය සිනාසෙමින් සිතුවාය. ‘ඔයා සීගිරි එකට එද්දීත් මට මොකක්ද දැනුණා. වැඩකරද්දීත් දැනුණා. ඔයා කවුද කියලත් මම හිතුවා. දැන් ඔයාගේ අතීතයම මම දන්නවා. චුට්ටක් සනීපවෙන්නකෝ. අපිට කතාකරන්න ද්‍රාහක් දේවල් තියෙනවා’ භාවනා ඔහුගේ හිසකේ අතරින් සිහින් ඇඟිලි යවමින් සිතින් කීවාය.

ඇය එහෙමම පැය දෙකක් ගෙවෙන්නට දුන්නාය. කෙල්ලට බය

හරි ඉක්මනින් රෑ වේයැයි කියාය.

අද පුදුමාකාර දවසකි. දෛවය අද වැනි දවසක කෙහොම මැව්වාද කියා භාවනා සිතුවාය. ඇය හිමිහිට ඇගේ ජංගම දුරකථනය ගත්තාය. ද්ේවකව මෙහෙම තනිවම දමා මේ නිවසින් යා නොහැක. තව පැය දෙක තුනක් මෙහෙම ඉන්නට පුළුවන. කවුරුවත් තමාව සොයන්නේ නැත. එහෙත් ඉක්මනින් හවස් වෙනු ඇත.

භාවනා ගත්තේ ද්ේවකගේ අප්පච්චිටය. ඇගේ මාමාටය. ඔහු නෑකමට මාමය. පොඩි මාමාය. 'ඔයා හරිම ෂෝයි මාමි කෙනෙක්. මගේ ළමා කාලේ මට ඔයාව නැතිවුණා. මගේ නැන්දිවත් මට නැතිවුණා. දෛවය එහෙමයි' ඇය සිතුවාය. ජීවන් මාමාට මේ කිසිවක් දැන්මම

කියන්නේ නැතැයි ඇය සිතාගත්තාය. 'දවසක ඔයයි අප්පච්චියි ඉන්න වෙලාවක මම එනවා. උද්දේක. දැන් ගේත් දන්නවනේ.' ඇය සිතුවාය.

ජීවන් කතාකළේ ටික වෙලාවකට පසුවය. දුරකථනයෙන් එන කටහඬ පැහැදිලි නැත. ජීවන් උන්නේ කළුතර බ්ලූ වෝටර් හෝටලයේ පැවැත්වෙන ඉදිකිරීම් උත්සවයකය.

"හෙලෝ. අප්පච්චි මට ඔයාව පැහැදිලි නෑ. චුට්ටක් කෝල් එකක් ගන්නවද?"

භාවනා කීවාය. ජීවන් ශාලාවෙන් පිටතට පැමිණ ඇමතුමක් ගත්තාය.

"අප්පච්චි මම භාවනා"

"දන්නවා පොඩි පුතේ. කියන්න."

භාවනාගේ ළය ඇකිළින. 'ඔයා මට පොඩි පුතා කියන්නේ. අක්කට

ලොකු පුතා වෙන්න ඇති කියන්නේ. අනේ දෙයියනේ’ ඇය සිතුවාය.

“අප්පච්චි කන්ෆරන්ස් එකක නේද? කළුතර. දේවකයියා මට කිව්වා.”

“ඔව් පුතේ. මේ එකේ හිටියේ. කමක් නෑ කියන්න පුතේ”

“මම මේ අප්පච්චි දැන් මේ දේවකයියව එක්කගෙන අතුරුගිරියේ ගෙදරට ආවා. අයිටට හොඳටම උණ. මේ දැනුත් නිදි”

භාවනා විස්තරම කීවාය.

“අනේ ඔයා කොල්ලව එක්කගෙන ආපු එක කොච්චර දෙයක්ද පොඩි පුතේ. උදේ යනකොටත් මූණ අමුතුයි තමයි.”

‘ඒ වෙන දුකකට අප්පච්චි’ ඇයට කියන්නට සිතුණි.

“මම ළඟ ඉන්නම් අප්පච්චි. ඒත් මට තනියම දාලා යන්න බෑනේ”

“මං ඉක්මනට එන්නම් පොඩි පුතේ.”

“දුවන් එන්න එපා. හිමිහිට එන්න. හතරට විතර අප්පච්චි.”

“ඔයාව අම්මයි තාත්තයි සීයයි හොයනවනේ පුතේ නේද?”

ඔහු කතාකරන්නේ අම්මාවත් තාත්තාවත් සීයාවත් හොඳින් දන්නා අය මෙන්ය. ‘දැන්මම ඔයාගෙන් අහන්න හිතෙනවා’ ඇයට සිතුණි.

“මට ඉන්න පුළුවන් අප්පච්චි. හිමිහිට එන්නකෝ. මම බෙහෙත් ගත්තා. කාලා නෑනේ. මේ දැන් සැන්විචස් ගෙනත් තේ හදලා පෙව්වා”

කළුතර සිටිනා ජීවන්ගේ පපුවම

ඇකිලිණා. 'මේවා මෙහෙම වෙන්නේ කොහොමද මිලින්ද? ඔයාගේ පොඩි කෙල්ල අද මගේ කොල්ලව බලාගන්නවා. මම හිතලා මේවා කලේ නෑ' ජීවන් සිතින් කීවේ ඔහුගේ මස්සිනා වූ මිලින්දටය. කෙල්ලගේ තාත්තාටය.

"ඔයා පව් පුතේ."

"හිමිහිට එන්න අප්පච්චි. රෑට කන්න දෙයක් අරන් එන්න."

"එයාට උණ හැදුණාම මම දෙන්නේ උණු ආප්ප වගේ දෙයක් පුතේ. නැත්නම් ලුණු මිරිසුයි පොල් රොටියි."

"එහෙම හොඳයි තමයි. මේ දැනුත් නිදිනේ ඇස් ඇරගෙන ඉන්නවත් බෑ පව්."

ජීවන් බොහෝ දේ තේරුම් ගත්තේය.

"මං ආවේ වාහනයක පුතේ. ඉක්මනට එන්නම්."

"හොඳයි අප්පච්චි බුදු සරණයි"

"පුතා කෑවද"

"මං මේ තේ එකක් බොනවා අප්පච්චි. මෙහෙම වැටිලා ඉන්නකොට කන්න බෑ"

භාවනා කීවේ දේවකගේ හිස පිරිමදිමිනි.

ජීවන් ඔහුගේ උසස් කළමණාකරුට පවසා ඒ මොහොතේම වාහනයෙන්ම කොළඹ එන්නට පිටත් වූවේය.

"බණ්ඩාරගම පාරෙන් යමු සරත්. කොල්ලට ටිකක් අමාරුයි"

ජීවන් කීවේය.

# 43

දේවක උන්නේ තද නින්දකය. එය තද උණක් නිසා ඇතිවෙන තෝන්තුවාවත් උණට ලබාදෙන ප්‍රතිජීවක බෙහෙත්වල සැරත් නිසා ඇතිවෙන නින්දකි. මේ සියල්ලටම වඩා භාවනාගේ ඇඟිලිතුඩුවලින් හිසට දැනෙන සනීපය ඔහුව ගැඹුරු නින්දක් කරා ගෙන ගියේය.

එක දිගට පුරා රාත්‍රීන් විසි ගණනක් නිදි නොලැබ මහන්සි වී

උන් දේවකගේ ශරීරය මේ වැනි දීර්ඝ නින්දක් අපේක්ෂාවෙන් උන්නේය. භාවනා ඔහුව උකුලේ තබාගෙන උන් පැය දෙක තුනට බොහෝ දේවල් සිතුවාය. සමහරවිට ඇය ජීවිතයේ බරපතලම තීරණ ටික ගත්තේ අද විය යුතුය. මේ පැය දෙක තුනේදී විය හැක. ඒ තරම් සිතුවේ ඔහුව උකුලේ තබාගෙනය.

ඔහු ඇහැරෙන පාටක් නැත. මෙහෙම නිදාගෙන ඉන්නා එකම හොඳය. ටිකකට කලින් භාවනා පහත් වී ඔහුගේ හිසට මුහුණ තැබුවාය. ඊටත් පසුව කෙල්ලගේ ගැහෙන තොල්පට ඔහුගේ වම් නළලතේ පැත්තකට තදවිය. සමහරවිට ඒ ජීවිතයේ දුන් ප්‍රථම හාදුව වෙන්නට ඇත. 'ඒකත් දෙන්න වුණේ ඔයා නිදාගත්ත වෙලාවක.'

ඇය සිනාබරව සිතුවාය. අද ඔහුව එක්කාගෙන මේ අතුරුගිරියේ ගෙදරට ආ එක කොතරම් හොඳදැයි භාවනා සිතුවාය.

"එහෙම නොවෙන්න ඔයා මගේ පොඩි මස්සිනා කියලා මම දන්නේ නෑනේ"

භාවනා සිතුවාය. දැන් කොහේට හෝ ගොස් කල්පනා කරන්නට දාහක් දේවල් ඇත. 'තීරණයක් ගන්න පොඩි බයකින් උන්නේ. ඒත් දැන් බයක් නෑ' ඇය සිතුවාය. සීගිරි පවුලට එක පැත්තකින් මේ දක්ෂ කොල්ලාට එරෙහිවිය නොහැක. අනිත් අතට මේ ලේ නෑකමට එරෙහිවිය නොහැක.

දේවක ඉන්නේ ඇගේ උකුලේ හිස තබාගෙන කුස පැත්තට මුහුණ දමාගෙනය. 'මං අම්මද ඔහොම

බදාගෙන නිදාගන්න පුතේ. ම්.
හිතුවේ නැද්ද දැන් මේ කෙල්ල
ගෙදර ගිහින් කොහොමද තනියම
ඉන්නේ කියලා' ඇය සිතින් අසයි.
ඒත් මේ උදාවූ මොහොත අපූරුය.
ඇය එක දිගට පුරා පැය තුනකට
වඩා කාලයක් ඔහුව උකුලේ
තියාගෙන ඇය උන්නාය. ඒ පැය
තුනක කාලය පුරාම ඇය ඇගේ
සංසාරගත ආදරයේ මුහුණුවර
දෙස බලාගෙනම උන්නාය. තම
ජීවිත කතාවේ හමුවෙන දයාබරම
චරිතය මේ බව භාවනා තීරණය කර
හමාරය.

"දැන් උණ ටිකක් අඩුයි. ඒත් තාම
ඇඟ රස්නෙයි. රෑ වෙද්දී බහියි"

භාවනා සිතුවාය. අද වැනි
රෑක මේ පුංචි ගෙදර රැයක් පහන්

කරන්නට ඇත්නම් කියා ඇයට සිතෙයි. කොහොමත් හෙට උදේ එනවා කියා ඇය සිතා ගත්තාය. කොතරම් උණක් තිබුණද හෙට උදේ දේවක සීගිරි එකට යන්නට ඇඳගන්නා බව ඇය දනී. මේ වෙද්දී ඔහුගේ සයිලන්ස් කර තිබූ දුරකථනයට සීගිරි එක හදන විවිධ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඇමතුම් අටකට නමයකට වඩා ආවේය. භාවනා ඒ හැමෝටම කෙටි පණිවිඩයක් යැව්වාය.

"වැඩ ටික කරගෙන යන්න. හෙට උදේ මම එනවා. උදෙන්ම ඇවිත් ඉන්න. දේවක."

භාවනා යැව්වේ එහෙමය. අතුරුගිරිය වෙල් යාය දෙසින් හමාගෙන එන සුළඟ අනාරාධිතවම

නිවසේ සාල කෑල්ලට එයි. ඒ නිසා තවත් සනීපය. බැසයන හිරුගේ රැස් දහරාව මන්දාලෝකයෙන් අවට පරිසරයට වැටී ඇත. තව ටිකකින් සැන්දෑ අඳුර කඩාගෙන වැටෙන බව ඇය දනී. 'ජීවන් මාමා දැන් එනවා ඇති' භාවනා සිතුවාය.

භාවනා හිමිහිට ඔහුගේ හිස තවත් ටිකක් ඇගේ ගතට ළංකරගත්තාය. දැන් ඔහුගේ කම්බුල්වලින් එන රස්නය පවා ඇය ඇඳගෙන උන් ටී ෂර්ට් එකේ සිංගල් ජර්සි රෙද්ද කපාගෙන කුසට දැනෙයි. දැන් මේ ජීවිතයම තමාගේය. තමාගේමය. දෛවයේ ඒ නියමය ගැන යළිත් කතාකරන්නට අවශ්‍යද නැත. 'ඒත් අපි දෙන්නා තාම මොනවත් කතාකරගෙන නෑනේ. මේ පිස්සා බෑ කිව්වොත්' එය එසේ

නොවන බව භාවනා රඹුක්වැල්ල දැනගෙන උන්නාය. 'කවුද වැඩියෙන්ම ආදරේ. මම ඔයාටද ඔයා මටද? එතනදී ඔයාට බෑ මාව පරද්දන්න. මම කොච්චර ආදරේද කියලා දවසක පෙන්නන්නම්' ඇය ඔහුගේ නිසල මුහුණ දෙස බලාග නෙ සිතුවාය. හදවතේ වූ හැඟීම්වල බර පුපුරණ දෙතොල්මත ඇඳි ඇත. භාවනා පහත් වී ඔහුගේ හිස මෑදුව සිපගත්තාය.

වාහනය පාරේ නවතා ඉන් බැස ආ ජීවන් එය හොඳින්ම දැක්කේය. සමහර විට මේ ජීවිතයේ දුටු ආදරණීයම දර්ශනය එය විය හැක. තම කොල්ලාට තමා මෙන්ම ආදරය කරන කෙල්ලෙක් දෛවය ගෙනවිත් දී ඇත. ජීවන්ට සිහිවූයේ ශ්‍රී ජයවර්ධන පුර රෝහලේ දාරකාග

ාරයේදී මින් වසර විසි එකකට පෙර අතට ගත් පුංචි දුවවය. ඒ භාවනාය. මේ අද පැමින තම කොල්ලාව උකුලේ තබාගෙන හිස සිපගන්නේ ඒ කෙල්ලය. ඔහු ඔහුගේ මියගිය බිරිඳව සිහිකළාය. 'කෙල්ලට භාවනා කියලා නම දැම්මේ ඔයානේ සුදු නෝනා. දැන් මෙන්න ඇවිත් කොල්ලගේ ජීවිතේට'

"පොඩි පුතේ"

භාවනා ලැජ්ජාවෙන් මෙන් හිස එසෙව්වාය. 'අනේ ඔයා දකින්නත් ඇති මාමේ' ඇය ලැජ්ජාවෙන් සිතුවාය. ඇය ජීවන් දෙස බලාගෙ නම උන්නාය. 'ඔයා කිව්වා හරි අක්කේ. හරිම නිව්ච්ච පාට ලස්සන මාමා කෙනෙක්. තරුණ කාලේ මීටත් වඩා අහිංසක පාටට ලස්සනට ඉන්න

ඇති. අනේ ඔයා මගේ මාමනේ' ඇය ඇවිලෙන හදින් සිතුවාය.

කෙල්ල අරම බලාගනෙ ඉඳිද්දී ජීවන්ටත් පුදුමය.

"අළුප්පච්චිමේ බලන්නකෝ."

ජීවන්ට බියක් දැනුනේ නැත. කොල්ලා නිදාගෙන ඉන්නේ සනීපයට විය යුතුය. ඔහු පැමිණ සැටියේ කොණකට බරවූවේය.

"ඔයා සනීපෙට නිදාගෙන ඉන්නේ. උණ දැන් අඩුයි නේද පුතේ."

"මෙහෙම නෙමේ උන්නේ අප්පච්චි. හිතන්නකෝ මෙහෙම නිදාගන්න කෙනෙක්ද?"

ඇය කීවාය. ජීවන් දෙස කෙල්ල ඕනවටත් වඩා බැලුවාය. අද ඔහුව දැකගන්නට ලැබුනේ පුදුමෙ දවසකය. ඔහු ගැන හැම රහසක්ම දැනගත්

දවසේය. පුදුමය.

"තාමත් ඇඟ යට උණ."

"ඉන්ජෙක්ෂන් දෙකක් ගැහුවා. සමහරවිට ඒකේ සැරත් ඇති."

ජීවන් කොල්ලාගේ අත පය අතගාමින් භාවනා දෙස බැලුවාය.

"අනේ ඉතින් පුතා කොල්ලව එක්කගෙන ආවාද?"

"මී වෙන කවුරු එන්නද?"

ඇයගේ වචන ජීවන් අකුරෙන් අකුර වෙන්කර බැලුවේය. ආයේ අහන්නට දෙයක් නැත. ඔහු ආදරය ගැන හොඳින්ම දන්නා කෙනෙකි.

"එයා මෙහෙම කාටවත් ළංවෙලා ඉඳලා නෑ."

"මං දන්නවා අප්පච්චි."

"මෙහෙම ගෑණු උකුලක කොල්ලට නිදාගන්න වාසනාවක්

තිබුණේ නෑ. කොල්ලගේ අම්මත් පුංචි කාලෙම අපිව දාලා ගියානේ පුතේ.”

භාවනා තොල්පට තදරගෙන බැලුවාය. ‘ඒ මගේ නැන්දි කියලා කියන්නේ නැත්තේ ඇයි අප්පච්චි’ භාවනා සිතුවාය.

“දැන් පැය හතරක් තිස්සේ මෙහෙම නිදි.”

භාවනා අහිංසකව සිනාසී කීවාය. ‘දැන් බිමින් තියන්නත් ලෝබයි’ ඒත් කෙල්ල ඉන්නේ ඉවසාගත නොහැකි මුත්‍රා බරකිනි. සියල්ල ඉවසාගෙන ඇය නිසොල්මන්ම පැය හතරක්ම උන්නාය.

“මේ කොට්ටේ මෙහෙම තියන්න අප්පච්චි.”

ජීවන් එසේ කළේය. භාවනා ඇගේ උකුලේ තිබූ දේවකගේ හිස

පරිස්සමින් කොට්ටයට මාරුකළාය. 'ආයෙත් දවසක මේ වගේම උණාත් හදාගන්න. පැය හතරක් උකුලේ නිදාගන්න දෙන්නම්' ඇය සිතින් කීවාය.

"මං ටොයිලට් එකට දුවලා එන්නම් අප්පච්චි."

"අනේ පුතා හිරකරගෙන උන්නද? හොඳ නෑනේ පුතේ"

ජීවන් දුවෙක්ව කියන්නාක් මෙන් කීවාය. පසුව ඔහු ඇයව ටොයිලට් එකට ළඟට ඇරලෙව්වේය. භාවනා විනාඩි හතර පහක්ම එයට වී උන්නාය. 'එච්චර බරක් කොහොම හිරකරගෙන උන්නද මන්දා' භාවනා සිතුවාය.

කෙල්ල ආවේ නිදහස් මුහුණිනි.

"මේ පුතේ බෙහෙත්"

"දවල් වඩිය දුන්නා අප්පච්චි. මේ පෙත්ත උණ වැඩිම වුනොත් දෙන්න. අඩුවුනේ නැත්නම් අපි හොඳ ඩොක්ටර් කෙනෙක්ට පෙන්නමු අප්පච්චි."

"මේ බෙහෙත් අහයි පුතේ. පුතා ආවේ"

"මං කැබ් එකක් අරන් ආවේ අප්පච්චි."

"මං ආපු වෙහිකල් එක තියෙනවා. පුතා ඒකේ යන්න. ගෙදරින් ඇරලවගන්න පුළුවන්."

භාවනා තවත් ටික වෙලාවක් සැටියේ ඔහුගේ හිස සමීපයේ ඉඳගෙන උන්නාය.

"අප්පච්චි"

කෙල්ලට අහන්නට හිතෙන්නේම නර්මදා නැන්දා ගැනය. එහෙත් ඇය

අමාරුවෙන් හැඟීම් මැඩගත්තාය. මේ එයට වෙලාව නොවේ.

"පොඩි පුතේ."

"එයා ගැන බයවෙන්න එපා. මං ඉන්නවනේ."

ඇයට කියාගන්නට පුළුවන් වූයේ එපමණය. යුවතියගේ දෑස් පලාගෙන මෙන් කඳුළක් ගලාගෙන ගියේය. ජීවන් ගොස් කෙල්ලගේ හිස අතගෑවේය. භාවනා එහෙම ඉඳගෙන ඉන්නා ගමන්ම ජීවන්ගේ බඳ බදාගත්තේය.

"අනේ පොඩි පුතේ මේ ඇයි."

"ඇයි මට පොඩි පුතා කියන්නේ. ම්"

ජීවන්ට පුදුමත් සිතුණි. කෙල්ල යමක් දන්නවාද?

"දවසක කොල්ලා කියයි පුතේ. ම්

දැන් ගෙදර යන්න."

භාවනා එහෙමම පහත් වී ජීවන්තට වැන්ඳාය. ජීවන් කෙල්ලව නැඟිට්ටවා වැළඳගත්තේය.

"පරිස්සමින් යන්න මැණික. බුදු සරණායි."

"රෑට මොනවාහරි කන්න දීලම බෙහෙත් ටික දෙන්න අප්පච්චි. වමනේ ගියාකඟ පාටට ගියේ. බඩම හිස්."

භාවනා කීවාය.

"අනේ වමනෙත් ගියාද?"

"ම්. මෙතන මේ. මං අස්කළා"

ජීවන්ට පුදුම නැත. මේ රඹුක්වැල්ල පවුලේ වසර විස්සකට වරක් මේ වැනි දෙව්දුවක් උපදී. එක දෙව්දුවක් මීට වසර විසි හතරකට පෙර තමාට ආදරය කළාය. දැන් මේ

කෙල්ලය.

"පව්"

භාවනා දේවකගේ හිස අතගා කීවාය. දමා යා නොහැක්කේ ඇයි?

"පිස්සා වගේ ඇල් වතුරෙන් ඇඟ සෝදයි අප්පච්චි. උණු වතුර ටිකක් හදලා දෙන්න"

"මං කරනවා පුතේ"

භාවනා ඇගේ අත් බෑගය කරට දමාගත්තේ තවත් වරක් දේවකගේ හිස අතගාය.

"යනවා අප්පච්චි බුදු සරණයි"

ජීවන්ත කෙල්ලත් සමඟම පිටතට ආවේය.

"සරත්"

"ජීවන් මහත්තයා"

"මේ මිස්ව පොඩ්ඩක් ඇරලවලා

එනවද? මිස් පාර කියයි."

භාවනා වෑන් රියට ගොඩවූවාය. ඇය වීදුරුව අතරින් බලාග නෙ උන්නේ ජීවන් දෙසය. 'අලුතින් නිධානයක් ලැබුණා වගේ මට ඔයාවයි ඔයාගේ පුතාවයි' ජීවිතයේ ලබන වටිනාම නිධානය මේ වැනි මිනිසුන්ය.

සීගිරි තෙවන කොටස
මින් නිමා වේ.

සීගිරි අවසන් කොටස
දැන් ඩවුන්ලෝඩ් කරගත හැක.